

දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

කෞතුකය
ස්වර්ණභූමියේ අතීතාවලෝකනය අද පත්‍රය සමඟ

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ බිනර අව අටවක ලත් ගුරු දින | කාණ්ඩය 111 පත්‍රය 228 පිටු 40 මිල රු.30 web: www.dinamina.lk ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 සැප්තැම්බර් 10 බ්‍රහස්පතින්දා

වැව් 5,000ක් ප්‍රතිසංස්කරණය කරන්න

ජනපති උපදෙස් දෙයි

ධනුෂ්ක ගොඩකුඹුර

රට පුරා වැව් 5,000ක් පුරාණ තාක්ෂණය සහ නූතන විද්‍යාත්මක ක්‍රමවේදය භාවිත කරමින් කඩිනමින් ප්‍රතිසංස්කරණය කරන ලෙස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ග්‍රාමීය කුඹුරු, ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ඉදිරි සැලසුම් පිළිබඳ ජනාධිපති කාර්යාලයේ දී ඊයේ (09) පැවැති සාකච්ඡාවට එක්වෙමින් උපදෙස් දුන්නේය. පිට 06

ජනතාවට ණය ලබාදීමේදී ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කරන්න

අගමැතිගෙන් රාජ්‍ය බැංකු ප්‍රධානීන්ට උපදෙස්

ධනුෂ්ක ගොඩකුඹුර

ජනතාවට ණය ලබාදීමේදී ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලෙස අගමැති මහින්ද රාජපක්ෂ මහතා මුදල් අමාත්‍යාංශයේ ප්‍රගති සමාලෝචන රැස්වීමට අරලිගයගහ මන්දිරයේදී ඊයේ (09) එක් වෙමින් රාජ්‍ය බැංකු ප්‍රධානීන්ට උපදෙස් දුන්නේය. පිට 06

ගංජා වැටලීමකට ගිය පොලීසියට පහර දුන් කාන්තාවෝ 3ක් අත්අඩංගුවට

හල්තොට සමූහ - විනිතා මානෙල් ගමගේ

බණ්ඩාරගම අටුඑගම ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය වැටලීමකට සහභාගි වූ පොලිස් නිලධාරීන් පිරිසකට පහර දී තුවාල සිදු කළ බව කියන කාන්තාවන් තිදෙනෙකු අත් අඩංගුවට ගත් බව බණ්ඩාරගම පොලීසිය පවසයි. පිට 06

ආනවිලුන්දාව තෙත් බිම ඩෝසර් කිරීම

වැරදිකරුවන්ට තරාතිරම නොබලා දඬුවම් දෙනවා

ඇමැති සී.බී රත්නායක

ස්වර්ණා විජේකෝන්, නුවන් කොඩිකාර, මහින්ද අලුත්ගෙදර

ආනවිළුන්දාව රම්සා තෙත් බිමේ කොටසක් ඩෝසර් කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් පත්කළ පංච පුද්ගල කමිටුව ඉදිරිපත් කළ වාර්තාව වනජීවී සහ වන සංරක්ෂණ ඇමැති සී.බී රත්නායක මහතා විසින් පාර්ලිමේන්තුවට ඊයේ (09) ඉදිරිපත් කළේය. පිට 06

අභය භූමිය හෙළි කර ඇත්තේ ජගත් සමන්තගේ ඉල්ලීමට

විශේෂඥ කමිටු වාර්තාව අනාවරණය කරයි

ආරවිච්කටටුව ආනවිලුන්දාව රම්සා අභය භූමියට අයත් ප්‍රදේශයක් අනීතික ලෙස හෙළි කර ඇත්තේ ආරවිච්කටටුව හිටපු ප්‍රාදේශීය සභා සභාපති ජගත් සමන්ත යන අයගේ ඉල්ලීම මත බව අදාළ පරිසර විනාශය සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා පත් කළ විශේෂඥ කමිටු වාර්තාව අනාවරණය කරයි. පිට 06

11දා කොමිසමට නාවොත් කඩුවෙල හිටපු මහේස්ත්‍රාත්ට නීතිමය ක්‍රියාමාර්ග

ජනපති කොමිසම් සභාපති

අමෝදා ජයමහ

වැඩ තහනමට ලක්වූ කඩුවෙල හිටපු මහේස්ත්‍රාත් ධම්මික හේමපාල මහතා එලඹෙන 11 වැනිදා දේශපාලන පළිගැනීම් පිළිබඳ සොයා බැලීමේ ජනාධිපති කොමිසම හමුවේ පෙනී නො සිටියහොත් කොමිසමට අපහාස කිරීම යටතේ ඔහුට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු, කොමිසම් සභාපති උපාලි අබේරත්න මහතා ඊයේ (09) පැවසුවේය. පිට 06

නැව ගිනි ගැනීමෙන් රජයට වූ පාඩුව ඇස්තමේන්තු කරන්න නීතිපති

කුමුදු හෙට්ටිආරච්චි

නිව් ඩයමන්ඩ් නෞකාවේ හටගත් ගින්න නිසා ශ්‍රී ලංකා රජයට සිදුවූ අලාභය හා වියදම්වල දැනට පවතින තත්ත්වය සලකාබලා පූර්ණවියදම් සම්බන්ධයෙන් ඇස්තමේන්තුවක් අදාළ අයතන වෙත සම්බන්ධීකරණය කර පිළියෙල කිරීමට නීතිපතිවරයා ඊයේ(06) උපදෙස් ලබාදුන්නේය. පිට 06

නිරිත දිග මෝසම සක්‍රීයයි කඩින් කඩ ඉදිරි දිනවල වැසි

උපාලි කරුණාරත්න

නිරිත දිග මෝසම සක්‍රීය වීම හේතුවෙන් වැසි තත්ත්වයන් ඇතිවී තිබෙන බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ මෙරිල් මෙන්ඩිස් මහතා පැවසීය. පිට 06

රවිරාජ් ඝාතන විමර්ශනවලට රනිල් ඇතුළු පිරිසක් මැදිහත් වුණා

නාවික හමුදා බුද්ධි අංශයේ හිටපු නිලධාරී ගාමිණී සෙනෙවිරත්න

අමෝදා ජයමහ පිට 06

පාර්ලිමේන්තු පොලිසියේ නිලධාරීන් කිහිප දෙනකු ස්ථාන මාරු සිද්ධිය

ආරක්ෂක කමිටු රැස්වීමේදී සාකච්ඡා කළේ නැහැ

කථානායක

ස්වර්ණා විජේකෝන්, නුවන් කොඩිකාර, මහින්ද අලුත්ගෙදර

පාර්ලිමේන්තු පොලිසියේ සේවය කරන නිලධාරීන් කිහිප දෙනකු ස්ථාන මාරුවකට ලක්කර ඇතැයි කියන සිද්ධිය ඊයේ (09) පැවැති ආරක්ෂක කමිටු රැස්වීමේදී සාකච්ඡා නොකළ බව කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ (09) ප්‍රකාශ කළේය. පිට 06

සාර්ථකව පාලනය කෙරේ නෞකාවේ ගින්න

උපාලි කරුණාරත්න

අයහපත් කාලගුණයෙන් "New Diamond" නෞකාවේ වර්ධනය වූ ගින්න ඒකාබද්ධ ආපදා කළමනාකරන කණ්ඩායම් මෙහෙයුම් මගින් සාර්ථකව පාලනය කෙරේ. පිට 06

බංග්ලාදේශ් අත්අඩංගුවේ සිටින ධීවරයන් නිදහස් කරගන්නවා

ඇමැති ඩග්ලස් දේවානන්දා

බුද්ධිකා ඉඹුලාන

බංග්ලාදේශයේ අත්අඩංගුවේ සිටින ධීවරයන් 24 දෙනා නිදහස් කර ගැනීමට සියලු පියවර ගන්නා බව ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා මහතා කියයි. පිට 06

සීමාව ඉක්මවා දඩ ගැසූ

සුරාබදු කොමසාරිස් ඇතුළු තිදෙනකුට මුදල් යළි ගෙවන්න වෙයි

නෙල්කා මැදගෙදර

සුරාබදු නීතිය උල්ලංඝනය කිරීමේ වරදට නියම කළ හැකි උපරිම දඩ මුදල ඉක්මවමින් ව්‍යාපාරිකයන් තිදෙනකුගෙන් අය කරගෙන තිබූ රුපියල් තිස්හයලක්ෂ පනස්දහසක මුදලක් ඔවුන්ට ආපසු ගෙවන ලෙස සුරාබදු කොමසාරිස් ජනරාල් ඇතුළු සිව්දෙනකුට අභියාචනාධිකරණය නියම කළේය. පිට 06

වනාතවිල්ලුව පුපුරන ද්‍රව්‍ය සොයාගැනීමෙන් පසු

පැවැති බුද්ධි රැස්වීම්වලට සීඅයිඩීය ආවේ නැහැ

හිටපු ජාතික බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස්

සුහාෂිණී සේනානායක

මාවනැල්ල බුදු පිළිමවලට හානි කිරීමේ හා වනාතවිල්ලුව පුපුරන ද්‍රව්‍ය සොයා ගැනීමේ සිද්ධියෙන් පසු පැවති තමන්ගේ සභාපතිත්වයෙන් යුතු බුද්ධි සම්බන්ධීකරණ රැස්වීම් සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරියකු සම්බන්ධ නොවූ බව හිටපු ජාතික බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස් මහතා ඊයේ (09) පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කරන ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව හමුවේ සාක්ෂි දෙමින් කියා සිටියේය. පිට 06

ප්‍රේමලාල් ජයසේකර මා ගැන කළ ප්‍රකාශයට කනගාටුයි

ස්වර්ණා විජේකෝන්, නුවන් කොඩිකාර සහ මහින්ද අලුත්ගෙදර

පාර්ලිමේන්තු සභා ගර්භයේ නොසිටි අවස්ථාවේ මා පිළිබඳ ප්‍රේමලාල් ජයසේකර මන්ත්‍රීවරයා සිදුකර ඇති ප්‍රකාශය සම්බන්ධයෙන් සිය විරෝධය සහ කනගාටුව පළ කර සිටින බව සමගි ජන බලවේගයේ රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රිනී තලතා අතුකෝරළ මහත්මිය පාර්ලිමේන්තුවේදී ඊයේ (09) ප්‍රකාශ කළාය. පිට 06

පරාජිත මන්ත්‍රීවරුන් රැසක් නිල නිවාස බාර දී නෑ

ස්වර්ණා විජේකෝන්, නුවන් කොඩිකාර සහ මහින්ද අලුත්ගෙදර

මහ මැතිවරණයෙන් පරාජයට පත් වූ මන්ත්‍රීවරුන් රැසක් මන්ත්‍රී නිල නිවාස භාර නොදීම නිසා තමන්ට නවාතැන් ගැනීමට තැනක් නොමැති බව නවක මන්ත්‍රීවරුන්ගෙන් පැමිණිලි ලැබී ඇත. පිට 06

රේඩියෝ ගුරුවරයා ශිෂ්‍යත්ව ප්‍රශ්න පත්‍රය II අද දිනමිණ සමඟ



දකුණු ආසියාවේ වේගවත්ම ක්‍රීඩකයා යුපුන් අබේකෝන්

පිට 16

එයාර් බස් ගනුදෙනුව විමර්ශන වාර්තා දෙසැ 02 දා ඉදිරිපත් කරන ලෙස නියෝග

පිට 06

සුභාෂිණී සේනානායක

කොවිඩ්වලින් මිය යන අය මිහිදන් කිරීමට ඉල්ලූ පෙත්සම් 12ක් නොවැ 26 දා සලකා බැලේ

පිට 06

නෙල්කා මැදගෙදර

20 පරාජය කරන්න නායකත්වය ගන්න රනිල්ට ඇරියුම්

ශිරෝමි අබයසිංහ

20වන ව්‍යවස්ථා සංශෝධනයෙන් රට ඒකාධිපතිවාදයකට රැගෙන යන හෙයින් එය පරාජය කිරීමට ඒකාබද්ධව වැඩපිළිවෙළක් සකස්කොට එයට නායකත්වය දෙන ලෙස විපක්ෂයේ සහ සිවිල් සංවිධාන නායකයෝ හිටපු අගමැති එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතාගෙන් ඉල්ලා සිටිති. පිට 06

බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ තත්ත්ව විමර්ශන වාර්තාව ඇමැති ජී.එල්.ට

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයේ පවතින තත්ත්වය පිළිබඳ විමර්ශනය කිරීම සඳහා පත් කළ කමිටුවේ වාර්තාව එහි සාමාජිකයන් jsiska පෙරේදා (08) එම අමාත්‍යාංශයේදී අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා වෙත පිළිගැන්විණි.

බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පරිපාලනය, විෂය මාලා, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල ක්‍රියාකාරිත්වය, ආයතනික විනය සහ විශ්වවිද්‍යාලයේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ විෂයභාර අමාත්‍යවරයාගේ අවධානයට ලක් කළ යුතු කරුණු රැසක් මෙම කමිටු වාර්තාවට ඇතුළත් කොට ඇත. විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීම, පත් කිරීම් සිදු කිරීම ආදිය සම්බන්ධයෙන් සිදුව ඇති අක්‍රමිකතා සහ මතුව ඇති චෝදනා සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය කඩිනම් පියවර ගැනීමටත් කමිටුව ඉදිරිපත් කර ඇති සංශෝධන අනුව ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනත ඉදිරියේ දී සංශෝධනය කර පාර්ලිමේන්තුවේ සම්මත කිරීමට අවශ්‍ය කටයුතු සැලසීමටත්, විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් කලින් කල සංශෝධනය කරන ලද විෂයමාලාව විෂය භාර අමාත්‍යාංශයේ පුහුණු අධීක්ෂණය යටතට පත් කොට පනතේ අරමුණු ඉටු වන අයුරින් සංශෝධනය වී ඇත්දැයි සොයා බැලීමටත් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතියකින් පසුව එවැන්නක් ක්‍රියාත්මක කිරීමට අවකාශ සඳහා දීමත් ඇතුළු ප්‍රමුඛ කරුණු රැසක් එම කමිටු වාර්තාවේ සඳහන් වෙයි.

කමිටුව පෙන්වා දී ඇති කරුණු ගැඹුරින් නිරීක්ෂණයට ලක් කරමින් ඉදිරි මාස කිහිපය ඇතුළත ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ මතුව පවත්නා තත්ත්වයට ස්ථාවර විසඳුම් ලබා දීමට පියවර ගන්නා බවත් ඒ අනුව ඊට අදාළ අණ පනත්, විධිවිධාන සහ ඉදිරි ක්‍රියා මාර්ග අනුගමය කිරීමට තමා සූදානම් බවත් එහිදී අදහස් දක්වමින් අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා ප්‍රකාශ කළේය.

මෙම කමිටුවේ සභාපති, රාජකීය පණ්ඩිත දර්ශනපති බලංගොඩ සෝභිත නාහිමි, කමිටු සමාජිකත්වය දරන සම්මානිත මහාචාර්ය විශ්‍රාමික මහාචාර්ය තුඹුල්ලේ සීලක්කන්ධ නාහිමි, විශ්‍රාමික මහාචාර්ය ඉත්තදෙමලියේ ඉන්ද්‍රසාර නාහිමි, කන්දෙගොඩ විමලධම්ම අනු නාහිමි, මහාචාර්ය මැදගොඩ අභයතිස්ස යන හිමිවරුනුත් අධ්‍යාපන රාජ්‍ය ඇමැති විජිත බේරුගොඩ හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ජ්‍යේෂ්ඨ නිලධාරීන් ඇතුළු පිරිසක්ද මෙම කමිටුවේ සභාපති, රාජකීය පණ්ඩිත දර්ශනපති බලංගොඩ සෝභිත නාහිමි, කමිටු සමාජිකත්වය දරන සම්මානිත මහාචාර්ය විශ්‍රාමික මහාචාර්ය තුඹුල්ලේ සීලක්කන්ධ නාහිමි, විශ්‍රාමික මහාචාර්ය ඉත්තදෙමලියේ ඉන්ද්‍රසාර නාහිමි, කන්දෙගොඩ විමලධම්ම අනු නාහිමි, මහාචාර්ය මැදගොඩ අභයතිස්ස යන හිමිවරුනුත් අධ්‍යාපන රාජ්‍ය ඇමැති විජිත බේරුගොඩ හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ජ්‍යේෂ්ඨ නිලධාරීන් ඇතුළු පිරිසක්ද මෙම

බෞද්ධ සාහිත්‍ය උත්සවය අගමැති ප්‍රධානත්වයෙන් 15 වැනිදා

මානෙල් පුෂ්ප කුමාරි සහ බන්දුල අලහකෝන් - බොරැල්ල විශේෂ

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය 14 වැනි වරටත් බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සමඟ එකාබද්ධව 10 වැනි වරටත් සංවිධානය කරන බෞද්ධ සාහිත්‍ය උත්සවය මෙවරත් අති උත්කර්ෂවත් ලෙස පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කොට තිබේ.

පුරාවිද්‍යා චක්‍රවර්ති ශාස්ත්‍රපති පූජ්‍ය එල්ලාවල මේධානන්ද නාහිමිගේ මූලාසනාරූඪත්වයෙන්, අග්‍රාමාත්‍ය සහ මුදල් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු, නාගරික සංවර්ධන හා නිවාස ඇමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 15 වැනි දින පස්වරු 2.45ට කොළඹ 07 - සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ බී.එච්. විලියම් ශාලාවේ දී මෙම උත්සවය පැවැත්වේ.

මේ සම්බන්ධයෙන් පෙරේදා (08) සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ශ්‍රවණාගාරයේ පැවැති මාධ්‍ය හමුවේදී සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ සභාපති ජගත් සුමතිපාල මහතා ප්‍රකාශ කළේ පුරාවිද්‍යා සේවාවන් ඇගයීම මෙවර උත්සවයේ ප්‍රධාන අංගයක් බවයි.

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ශත සංවත්සරය වෙනුවෙන් පැවැත්වූ සමස්ත ලංකා දහම් පාසල් රචනා තරගයේ ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් 06 දෙනා සඳහා ත්‍යාග ප්‍රදානය එදින උත්සවයේ දී සිදු කිරීමට නියමිතය. ඊට අමතරව එම උත්සවයට පසුව දිස්ත්‍රික් මට්ටමින් හොඳම රචනාව බැගින් ඉදිරිපත් කර ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ත්‍යාග පිරිනැමෙන අතර තරගයට ඉදිරිපත් වූ සියලු ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සහතික පත්‍ර පිරිනැමීම ද සිදු කෙරේ. එම සම්මේලනයේ හිටපු සභාපති ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර, උප සභාපති උපුල් රූපසිංහ යන මහත්වරුද මෙහිදී අදහස් දැක්වූහ.

මියන්මාරයෙන් වැඩමවූ කිරිගරුඬ බුදු පිළිමය ගණේගොඩාරාම පුරාණ විහාරස්ථානයට

මියන්මාරයේ සිට මෙරටට වැඩම කරවන ලද කිරිගරුඬ බුදුපිළිම වහන්සේ වටිනාපහ ශ්‍රී ගණේගොඩාරාම පුරාණ විහාරස්ථානයට එළඹෙන ඉරිදා (13) පස්වරු 1.00ට වැඩම කරවීමට නියමිතය.

දැනට අස්වාන ශ්‍රී ධර්ම රතනෝදය පිරිවෙනට වැඩම කරවා තාවකාලිකව තැන්පත් කර ඇති මෙම කිරිගරුඬ බුදු පිළිම වහන්සේ රථ පෙරහැරකින් වැඩම කරවා වටිනාපහ ශ්‍රී ගණේගොඩාරාම පුරාණ විහාරස්ථානයේ රන්සිවි ගෙයක් තුළ තැන්පත් කිරීමට කටයුතු යොදා තිබේ.

අපවත් වී වදාළ බස්නාහිර පළාතේ උප ප්‍රධාන සංඝනායක වටිනාපහ ශ්‍රී පියරතන ඤාණාභිදාන ස්වාමීන් වහන්සේගේ 21 වැනි ගුණසමරුවට සමගාමීව විහාරාධිකාරී ඇහැටුවාගම ආනන්ද ස්වාමීන් වහන්සේගේ සහ විහාරාධිපති උඩුදෙණියේ ජිනරතන ස්වාමීන් වහන්සේගේ අනුශාසකත්වයෙන් යුතුව මෙම පින්කම පැවැත්වේ.

ගුවන් හමුදා සේවා මුක්ත සංගම් මහා සභා රැස්වීම

නාමයෝජනා, මෝසම් හා යෝජනා සැප්තැම්බර් 28ට පෙර එවන්න

ශ්‍රී ලංකා ගුවන් හමුදා සේවා මුක්ත සංගමය ඔක්තෝම්බර් 18 වැනි දින පැවැත්වීමට නියමිත සිය 40 වැනි වාර්ෂික මහා සභා රැස්වීම සඳහා ඉදිරිපත් කෙරෙන නාමයෝජනා, මෝසම් සහ විධායක සභාවට අදාළ යෝජනා සැප්තැම්බර් 28 වැනි දිනට පෙර යොමු කරන ලෙස එම සංගමය සියලුම සාමාජිකයන්ගෙන් ඉල්ලා සිටියි. එම මහ සභා රැස්වීම එදින පෙරවරු 10.00ට අත්තිඩිය ශ්‍රී ලංකා ගුවන් හමුදා ඊගල් ලේක් සයිඩ් උත්සව ශාලාවේ දී පැවැත්වෙන බැවින් සියලු යෝජනා සහ මෝසම් ලේකම්, ඊ.එච්.සී. ප්‍රනාන්දු, ගුවන් හමුදා මූලස්ථානය බාරේ, ගුවන් හමුදා සේවා මුක්ත භට සංගමය, තැපැල් පෙට්ටිය 594, කොළඹ යන ලිපිනයට යොමු කරන ලෙසද එම සංගමය දන්වා සිටියේය.

මාර්ග සංවර්ධනයේදී ජල හා විදුලිබල මණ්ඩලත් සම්බන්ධ කරගැනීමට යයි

චන්ද්‍රිමා කරුණාරත්න

මාර්ග පද්ධතිවල සංවර්ධන කටයුතු ජල සම්පාදන මණ්ඩලය, ලංකා විදුලි බල මණ්ඩලය ඇතුළු සියලු ආයතනවල මනා සම්බන්ධතාව යටතේ සිදු කිරීමට වැඩපිළිවෙළක් සකස් කරන බව ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය නිමල් ලාන්සා මහතා පැවැසීය.

ජනතා බදු මුදලින් රටේ සංවර්ධන කටයුතු සිදු කිරීමේ දී මුදල් නාස්තියකින් තොරව සංවර්ධන ප්‍රතිලාභ උපරිම අයුරින් ජනතාවට ලබා දීම වෙනුවෙන් කටයුතු කිරීම වත්මන් රජයේ අපේක්ෂාව බව රාජ්‍ය අමාත්‍යවරයා එහිදී ප්‍රකාශ කළේය. අමාත්‍යවරයා මේ බව ප්‍රකාශ කළේ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාර්ග සංවර්ධන ගැටලු සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන සමඟ අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ දී පෙරේදා (08) පැවැති සාකච්ඡාවේදීය.

මාර්ග පද්ධතිය ඉදිකිරීම අවසන් වී ටික කාලයකින් ජල සම්පාදන මණ්ඩලය හෝ විදුලි බල මණ්ඩලය ඔවුන්ගේ සංවර්ධන කටයුතු වෙනුවෙන් මාර්ගය හැරීම හෝ කැපීම පසුගිය අවුරුදු ගණනාවක් පුරා සිදු කළ බවද හෙතෙම එහිදී කියා සිටියේය. එම කටයුතු නිසා මාර්ග පද්ධතියට විශාල හානියක් සිදු වූ බවත් මහජන බදු මුදල් නිරපරාදේ නාස්ති වූ බවත් පැහැදිලි කළ ඒ මහතා මෙම තත්ත්වය පිළිබඳ හොඳින් සොයා බලා ජල නළ එළීම මෙන්ම භූගත විදුලි රැහැන් එළීම පිළිබඳව අදාළ ආයතන සමඟ නිසි සම්බන්ධීකරණයක් ඇතිව මාර්ග සංවර්ධන කටයුතු සිදු කරන ලෙස අදාළ බලධාරීන්ට උපදෙස් දී තිබෙන බවත් ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේ ය.

ඉංජිනේරු අශෝක ලීලානන්ද විශ්‍රාම ගනියි

කොළඹ මහ නගර සභාවේ නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ වසර 37ක් සේවය කළ අශෝක ලීලානන්ද මහතා අද (10) රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබීමට නියමිතය.

මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු උපාධිය නිම කළ ඔහු විදේශ විශ්වවිද්‍යාලවලද උසස් අධ්‍යාපනය ලබා ඇත. ඉංජිනේරුවරයකු වශයෙන් කොළඹ මහා නගර සභාවට එක් වූ ඒ මහතා විවිධ අංශයන්හි ප්‍රශංසනීය ලෙස සේවය කළ අතර වසර කිහිපයකින් ප්‍රධාන ඉංජිනේරු තනතුරට පත්ව විශ්‍රාම යන විට නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඉංජිනේරු (ව්‍යාපෘති) ලෙස කටයුතු කළේය.

දිනමිණ ටිපි ටිප් ප්‍රහේලිකා තරගයේ ප්‍රහේලිකා අංක- 35 ජයග්‍රාහකයන් තේරීම පසුගියදා දිනමිණ කර්තෘ මණ්ඩල පරිශ්‍රයේදී සිදු විය. එහිදී දිනමිණ ප්‍රධාන කර්තෘ ගාමිණී ජයලත්, ජ්‍යෙෂ්ඨ සමකර්තෘ රත්නසිරි පතිරණ මහත්වරුන් විසින් ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් තෝරාගත් අයුරු. ප්‍රහේලිකා තරගයේ සම්බන්ධීකාරක ගාමිණී රූපානන්ද මහතා ද මේ අවස්ථාවට එක් විය.

ඡායාරූපය - දුෂ්මන්ත මායාදුන්නේ

Uswatte 60 වසරක රණ මිනුරු

උස්වත්ත කන්ෆෑක්ෂනරි වර්ක්ස් ප්‍රයිවට් ලිමිටඩ්හි අනුග්‍රහයෙනි

රුපියල් තිස්දහසක තෑගි

ත්‍යාග රටාව

පළමුවන ත්‍යාගය රුපියල් 10,000 — දෙවන ත්‍යාගය රුපියල් 5000

තෙවැනි ත්‍යාගය රුපියල් 3000 — රුපියල් 1000 බැගින් සැනසිලි ත්‍යාග 11යි.

ජයග්‍රාහකයන් තෝරාගනු ලබන්නේ කුසපත් ඇදීමෙනි. ජයග්‍රාහකයන්ගේ නම් සහ ප්‍රහේලිකාවේ නිවැරැදි විසඳුම් දිනමිණ පත්‍රයේ පළ වේ. ත්‍යාග මුදල් තෙමසක් ඇතුළත පිරිනැමේ.

කොන්දේසි

සතියට දෙවරක් පළවන මෙම ප්‍රහේලිකාව සඳහා මුදලින් රුපියල් තිස්දහසක් මාසිකව පිරිනැමේ. දිනමිණ පත්‍රයේ පළවන ප්‍රහේලිකා විසැඳුම් පුරවා එය 6 X 3 සාමාන්‍ය කවරවල පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. ලිපියේ ඉහළින් වම් කෙළවරේ දිනමිණ ටිපි ටිප් ප්‍රහේලිකා අංක 36 යනුවෙන් සඳහන් කර දිනමිණ ප්‍රහේලිකාව තැ.පෙ. 1134, කොළඹ යන ලිපිනයට 2020 ඔක්තෝබර් මස 31 වැනිදා හෝ ඊට පෙර උස්වත්ත Tipi Tip හෝ බිස්කට් දවටන දෙකක් සහිතව එවිය යුතුය. ලියුම් කවරයේ ඔබේ ආපසු ලිපිනය ද ලියන්න. ඡායාපිටපත් ප්‍රතික්ෂේප කෑරේ. ලේක්හවුස් ආයතනයේ සහ උස්වත්ත සමූහ ව්‍යාපාරයේ සේවක සේවිකාවන්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජික සාමාජිකාවන්ට තරඟයට ඉදිරිපත් විය නොහැකිය.

TipiTip ටිපි ටිප් දිනමිණ

ප්‍රහේලිකා අංක - 36

1	2	■	3	4	■	5	6
■	7				8		
9		■		■	10		■
11		12		■	■	■	13
■	14			15			
16	■		■		■	■	
17	18		■	19	20		
21		■	22			■	

නම: ----------

ලිපිනය: ----------

දිනය: ---------- ----------
අත්සන:

උපකාරක පද

හරහට

1. දේසේ හැටියට . . . . . .
3. වෘක්ෂය/ රුක
5. අමෘතය/ නිවන
7. ශ්‍රී ලංකාවේ මධ්‍ය ලක්ෂ්‍යය යැයි සැලකෙන ස්ථානයේ පිහිටි පුරාවිදු ස්මාරකය
9. කොස්
10. තාලය
11. මුදල් ණයට ගත් තැනැත්තා
14. මාර්ටින් වික්‍රමසිංහයන්ගේ විශිෂ්ට නවකතාවකි.
17. ඉදුණු කොස්
19. වඩාත් ප්‍රසන්න
21. වස්ත්‍ර/ සාටක
22. බටහිරදිග/ සවස් කාලය

පහළට

2. සේනාවට නායක/ හමුදා ප්‍රධාන
3. ලොව ප්‍රථම කෘෂි තාක්ෂණ උද්‍යානය පිහිටියේ මෙහිය.
4. හැමකල්හි
5. පතුල/ පල්ල
6. මා හට අයත්
8. ග්‍රීවාව/ බෙල්ල
9. ප්‍රාණය
12. වියළුණු පුවක්
13. '96 ලෝක ක්‍රිකට් ශූරතාවලියේ අවසන් මහ තරඟයේ වීරයා
15. යම් සේවාවක් හෝ භාණ්ඩයක් හෝ වෙනුවෙන් ඉදිරිපත් කරන නිශ්චිත මිල
16. පිපාසාව
18. කර්කශ/ ගොරෝසු
20. අන්‍ය/ සතුරු

● සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද (අනුරූ මාධ්‍ය සේවා)
072 3561975

ප්‍රහේලිකා අංක - 35

නිවැරදි විසඳුම

1 කො	2 ර	3 ව	ක්	4 ග	5 ල	■
6 රෝ	ද	ය	■	7 ව	ං	ග
8 නා	ල	න්	දා	■	සි	■
■	9 පි	න	■	10 හී	■	11 ප්‍ර
12 සි	ළි	■	13 මි	න	ර්	වා
14 කු	රු	15 මි	ණි	යා	■	හ
16 රු	ව	න්	■	17 න	ය	න

උස්වත්ත - ටිපිටිප් ප්‍රහේලිකාව අංක 35 ජයග්‍රාහකයෝ

පළමු ස්ථානය
එස්.කේ.කළුආරච්චි
අංක - 335/1C,දෙණියාය පාර, යාපා මාවත, ගල්පොත්ත වත්ත,වරල්ල.

දෙවන ස්ථානය
කොඩිකාර හේවගේ පියසීලී
කේ.එම්.කේ.ප්‍රනාන්දු මයා බාරේ,
අංක - 20/7සමාන්තර පාර ,වාද්දුව.

තෙවැනි ස්ථානය
එස්.ඩී.මධුසංඛ මහී බණ්ඩාර
අංක - 126/5, දිවුලපිටිය, බොරලැස්ගමුව.

රුපියල් 1000 බැගින් සැනසිලි ත්‍යාග 11 යි.
1. කේ.එම්.එච්. කාන්ති
සිසිල වැලිහේන,බෝපගොඩ,අකුරැස්ස.
2. කේ.රත්නසීලි
මාදංගහවත්ත, නව නගරය,මාදම්පෙ.
3.සුබසිංහ ජයවර්ධන
සුබසිංහ ස්ටෝර්ස්,ලංකාගම,නෙළුව.
4. ආර්.එච්.ශෂිකලා ලක්මිණී
උතුරු මාගල,පහළවෙල,උෑරගස්මංහන්දිය.
5. සුමනා මහින්දපාල
මොහොට්ටිගෙවත්ත,විල්ගොඩ පාර,කුරුණෑගල.
6. පී.ජී.ඩී.ගිමිහානි
වෝඩ් නො.48A,ජාතික රෝහල,කොළඹ.
7. ඩී.එම්.එස්.පී.තිලකරත්න
අංක 72, ධම්මික වෙළඳ සැල ,දේවාලහිඳ,අම්පාර.
8. ඩී.ජී.ඩබ්.රූපසිංහ
වැලිබිස්ස,කහගොල්ල,දියතලාව.
9. ඒ.පී.එස්.හත්තොටුව මිය
'දර්ශන', උහන්ඕවිට,පිටිගල
10. එල්.එල්.වික්‍රමසිංහ මයා,
E/349/2,අටළුගමිකන්ද,දෙහිඕවිට.
11. ඒ.විතාරණ
50/03/01, හීනැවිකුඹුර පාර,තලංගම උතුර,බත්තරමුල්ල.

වැලිකඩ කාන්තා මැදිරියෙන්
දුරකතන10ක් බැටරි 100ක් හමු වෙයි

බුද්ධිකා ඉඹුලාන

වැලිකඩ බන්ධනාගාරයේ කාන්තා අංශයේ 'එක්ස්' සිරමැදිරියේ සිදු කළ විශේෂ සෝදිසි මෙහෙයුමකදී එහි සූක්ෂ්ම අයුරින් සඟවා තිබූ ජංගම දුරකතන 10ක් බැටරි 100කට අධික ප්‍රමාණයක් සහ සිම් කාඩ් 08ක් සොයා ගැනීමට බන්ධනාගාර බුද්ධි අංශ නිලධාරින් සමත්වී තිබේ.

බුද්ධි අංශ නිලධාරින්ට ලැබුණු තොරතුරක් මත මෙම සෝදිසි මෙහෙයුම සිදු කළ අතර ඉකුත් සති අන්තයේද වැලිකඩ කාන්තා අංශයේ සිදු කළ සෝදිසි මෙහෙයුමකදී 'වයි'සිරමැදිරියේ තිබි ජංගම දුරකතන 13 ක් සහබැටරි 150 ක්ද,සිම්කාඩ් 07ක්ද සොයා ගැනීමට බුද්ධි අංශ නිලධාන්ට හැකි වී තිබිණි. මේ අතර, කොළඹ මැගසින් බන්ධනාගාරයේ සිදුකළ සෝදිසි කිරීම්වලදී හෙරොයින් ග්‍රෑම් එකකට අධික ප්‍රමාණයක් සොයාගෙන ඇති අතර රෑඳවුවකුගේ කලිසම් සාක්කුවක ඉතා සූක්ෂම ලෙස සඟවා තිබිය දී මෙම හෙරොයින් සොයාගෙන ඇති බව වාර්තා වේ.

එජාප නව නියෝජ්‍ය නායක සඳුදා තෝරයි

ශිරෝමි අබයසිංහ

එක්සත් ජාතික පක්ෂයේ නව නියෝජ්‍ය නායක තෝරන කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීම ලබන සඳුදා (14) හවස පක්ෂයේ නායක හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් සිරිකොත පක්ෂ මූලස්ථානයේදී පැවැත්වේ.

එදිනට තෝරා පත් කර ගනු ලබන නියෝජ්‍ය නායකයා නායකත්වයේ අනුප්‍රාප්තිකයා ලෙස කටයුතු කිරීමට නියමිතය. නියෝජ්‍ය නායකයා පත් කිරීම බොහෝ දුරට සාකච්ඡා මාර්ගයෙන් සිදු කෙරෙන අතර ඡන්දයක් පැවැත්වෙනුයේ එකඟතාවයකට එළැඹීමට නොහැකි වුණොත් පමණක් බව පක්ෂයේ ජ්‍යෙෂ්ඨයකු පැවසීය.

දැනට පැවති සාකච්ඡා අනුව එළැඹෙන පළාත් සභා මැතිවරණයෙන් පසුව අනුප්‍රාප්තිකයාට නායකත්වය පැවරීමට අදහස් කර ඇති අතර පළාත් සභා මැතිවරණය ඉක්මනින් නොපැවැත්වුණොත් ලබන ජනවාරි මස අනුප්‍රාප්තිකයාට නායකත්වයේ බලය පැවරීම බොහෝ දුරට සිදු වනු ඇති බවත් එම ප්‍රකාශකයා පැවසීය. නියෝජ්‍ය මහ ලේකම් රුවන් විජේවර්ධන හෝ හිටපු අමාත්‍ය වජිර අබේවර්ධන මහත්වරුන් නියෝජ්‍ය නායක ධුරය සඳහා පත් වීමට ඉඩ ඇති බවද හෙතෙම පැවසීය.

මෛත්‍රී හා ගෝඨාභය ඝාතනයට තැත් කළ
මාකඳුරේ මධුෂ් නිදහස් කරන ලෙස ඉල්ලීම ඉවතට

සුභාෂිණී සේනානායක

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන හිටපු ආරක්ෂක ලේකම් වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහත්වරුන් ඇතුළු ප්‍රභූන් පිරිසක් ඝාතනය කිරීමට තැත් කළ සිද්ධියට අදාළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ රඳවා ප්‍රශ්න කරමින් සිටින මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවකු සහ පාතාල නායකයකු වන මාකඳුරේ මධුෂ් නිදහස් කරන ලෙස සිදු කළ ඉල්ලීම කොටුව මහේස්ත්‍රාත් රංග දිසානායක මහතා ඊයේ 09 ප්‍රතික්ෂේප කළේය.

තම සේවාදායකයාව අයුතු ලෙස රඳවා තැබීමක් සිදු කර ඇති බව කියමින් ඔහු වෙනුවෙන් පෙනි සිටි නිතිඥ ජාලිය සේනාරත්න මහතා ඉකුත් නඩු දිනයේ සිදු කළ ඉල්ලීම් සම්බන්ධ නියෝගය ප්‍රකාශයට පත් කරමින් මහේස්ත්‍රාත්වරයා මෙම නියෝගය සිදු කළේය.

ඔහු නිදහස් කිරීමට මෙම අධිකරණයට නෛතික බලයක් නැහැ. ඔහු සැකකරුවෙක් ලෙස ඉදිරිපත් කරලා නැහැ. රඳවුම් නියෝග මත සිටින සැකකරුවෙක් නුස්තවාදී පනත ප්‍රකාරව අත්අඩංගුවට ගැනීමට හැකියි. එහෙත් එම සැකකරු අත්අඩංගුවට ගැනීමේදී ප්‍රශ්නගත තත්ත්වයක් පවතින්නේ නම් එය විමසිය යුතු වන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් බව මහේස්ත්‍රාත්වරයා සිය තීන්දුව ප්‍රකාශ කරමින් කියා සිටියේය.

එමෙන්ම ආරක්ෂක ඇමැතිවරයෙක් පත් කර නැති අවස්ථාවක ජනාධිපතිවරයා ආරක්ෂඛ ඇමැතිවරයාගේ බරය ආවරණය කිරීමට කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් 19 වන සංශෝධනයට අනුකූලද නැද්ද යන්න විමසීමට මෙම අධිකරණයට බලයක් නැහැ. මධුෂ් යන අය සැකකරුවෙක් ලෙස නම් කර නැති නිසා එසේ කිරීමට බලයක් නැහැ.ආරක්ෂක ඇමැතිවරයා පත් කර නැති අවස්ථාවක එම නියෝගයේ අනුකූලතාවය විමසිය යුතු වන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පමණක් වන බවද මහේස්ත්‍රාත්වරයා නියෝගය ප්‍රකාශයට පත් කරමින් කියා සිටියේය.

මාකඳුරේ මධුෂ් අයුතු අයුරින් රඳවා සිටින බවත් ඔහු කිසිදු ආකාරයකින් ප්‍රභූ ඝාතනයක් සඳහා සම්බන්ධතාවයක් නොමැති බවත් පවසමින් ඔහු වෙනුවෙන් අධිකරණයට කරුණු කියා සිටි නිතිඥ ජාලිය සේනාරත්න මහතා සිදු කළ ඉල්ලීමට අදාළ තීරණය ප්‍රකාශයට පත් කරමින් මෙම නියේගය සිදු කළ මහේස්ත්‍රාත්වරයා සිද්ධියට අදාළ විමර්ශණ සිදු කර ඔක්තෝම්බර් මස 7 වනදා අධිකරණයට වාර්තා කරන ලෙසට නියෝග කළේය.

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා, හිටපු ආරක්ෂක ලේකම්වරයා සහ සහකාර පොලිස් අධිකාරීවරයකු ඇතුලු පොලිස් නිලධාරීන් පිරිසක් ඝාතනය කිරීමට කුමන්ත්‍රණය කළැයි කියන සිද්ධිය සම්බන්ධයෙන් නුස්ත විමර්ශන කොට්ඨාසයේ හිටපු නියෝජ්‍ය පොලිස්පති නාලක සිල්වා මහතා මේ වනවිට ඇප මත මුදා හැර සිටී.

පුරාවස්තු රැකගන්න පාසල් සිසුන්ගේ දායකත්වය
වැඩ බලන අධ්‍යක්ෂ

උපාලි කරුණාරත්න

පුරාවස්තු රැක ගැනීම සඳහා පාසල් සිසුන් සම්බන්ධ කරගැනීමේ වැඩ පිළිවෙළේ මූලික කටයුතු මේ වන විට ආරම්භ කර ඇති බව පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) දීපාල් විජේතිලක මහතා ප්‍රකාශ කරයි. ඒ පිළිබඳ වැඩිදුරටත් අදහස් දක්වන විජේතිලක මහතා-

මෙම වැඩ පිළිවෙළ පුරා විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සෙනරත් දිසානායක මහතාගේ අදහසක්. මේ යටතේ පාසැලට ආසන්න පුරා විද්‍යා ස්ථානය රැකබලා ගැනීම පාසැලේ දරුවන්ට පවරනවා. එවිට අදාළ ස්ථානයේ ශ්‍රමදාන වලට පාසැල් දරුවන්ට සහභාගි වන්න පුළුවන්. ඒ වගේම අදාළ ස්ථානයේ සංරක්ෂණ කටයුතු සහ කැනීම් සිදුවන අවස්ථාවන් වලදී පාසැල් දරුවන් ඒ සඳහා සම්බන්ධකර ගන්නවා. අදාළ පුරා විද්‍යා ස්ථානය පාසැලට අයිති පුරා විද්‍යා ස්ථානයක් ලෙසද නම් කරනවා. එවිට පාසැල් දරුවන්ට එම ස්ථානය තමන්ගේ තැනක් ලෙස හැඟීමක් ඇති වෙනවා. පාසැල් ශිෂ්‍ය, ශිෂ්‍යාවන්ට මේ තුළින් ජාතික උරුමය පිළිබඳ කුඩා කළ සිටම ඇල්මක් ඇති කළ හැකියි.ඒ වගේම අපි එම දරුවන්ට පුරා විද්‍යා උරුමය පිළිබඳ දැනුම ලබාදෙනවා. එහිදී පුරා විද්‍යා උරුමය, ඒ සම්බන්ධව පවතින නීති, සංරක්ෂණ කරන්නෙ කෙසේද, කැනීම් කිරීම පිළිබඳ කියා දෙනවා.

වැස්සෙන් පළාත් රැසක ජනජීවිතයට බාධා

උපාලි කරුණාරත්න

දිවයිනේ පළාත් රැසකට පෙරේදා (08) රාත්‍රියේ සිට ඇද හැලුණු ධාරානිපාත වර්ෂාවෙන් පහත්බිම් හා මාර්ග රැසක් ජලයෙන් යට වී ගමනාගමනයට හා ජනජීවිතයට බාධා ඇති විණි.

ඊයේ (09) පෙරවරු 8. 30 න් අවසන් වූ ගෙවුණු පැය විසි හතරක කාලය තුළ වැඩිම වර්ෂාපතනය කොළඹින් වාර්තා වන බව කාලගුණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ මෙරිල් මෙන්ඩිස් පවසයි.

කොළඹ දිස්ත්‍රික්කයට මිලිමීටර් 150.8 ක වර්ෂාපතනයක් ඇඳ හැළි ඇති අතර රත්මලාන හා කොටුව ප්‍රදේශයට වැඩිම වර්ෂාපතනයක් ලැබී තිබේ. ඒ අනුව රත්මලානට මිලිමීටර් 141.1 ක් හා කොටුවට මිලිමීටර් 141 ක වැසි ඇඳ හැළී ඇතැයි කාලගුණ දෙපාර්තමේන්තුව පවසයි.

පෙරේදා (08) මධ්‍යම රාත්‍රියේ සිට ඊයේ (09)පෙරවරුව දක්වා කොළඹ ප්‍රදේශයට මෙම වැසි තත්ත්වය පැවැති අතර මේ නිසා මාළිගාවත්ත, පංචිකාවත්ත, ඔරුගොඩවත්ත, ග්‍රෑන්ඩ්පාස්, කොළොන්නාව, වැල්ලම්පිටිය මෙන්ම ගම්පහ දිස්ත්‍රික්කයේ වත්තල ප්‍රදේශයේ පහත්බිම් ජලයෙන් යට වී තිබේ. ග්‍රෑන්ඩ්පාස්, වෝඩ් පෙදෙස, බේස්ලයින් සහ තුම්මුල්ල ප්‍රදේශවලට මාර්ග ජලයෙන් යට වී ඇත.

මේ අතර කන්ටේනර් රථයක් මාර්ගයේ පෙරළීමෙන් කොළඹ නුවර ප්‍රධාන මාර්ගයේ නිට්ටඹුව කලගෙඩිහේන ප්‍රදේශයේ ගමනාගමනයට බාධා එල්ල වී තිබූ අතර මාදම්පේ ප්‍රදේශයේ ගසක් කඩා වැටීමෙන් කොළඹ හලාවත මාර්ගය ද අවහිර වී තිබිණි. මේ මාර්ග මේ වන විට යථා තත්ත්වයට පත් කර ගමනාගමනයට පහසුකම් සලසා දී ඇත.

මේ අතර පැවැති වර්ෂාව හේතුවෙන් කසල්රී ජල මට්ටම පිටාර මට්ටම අඩි 3 ක් දක්වාත් මවුස්සාකැලේ ජලාශයේ ජල මට්ටම පිටාර මට්ටම අඩි 8 ක් වශයෙන් ද ඊයේ (09) උදෑසන වන විට පැවැති බව ජලාශ භාර ඉංජිනේරුවෝ සඳහන් කළහ. අත්තනගළු ඔයේ ජල මට්මටම ද මේ වන විට ඉහළ යමින් ඇතැයි වාර්මාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පවසයි.

ශ්‍රීකාන්තගේ ශ්‍රීඋපත

- *'එපා එපා 20 එපා' කියල සහින් පාර්වල් දිගේ මොර දෙනව බං !*
- *බය ඒකාලෙ 'එපා එපා රනිල් එපා' කියල කියපු ඒවයෙ ප්‍රතිඵල තමයි සර් !*

මත් පෙති -මත් වතුර මත් කුඩු — අහුවීම
සමගම බැදුණු පාතාලය — වැටලීම
සිදු නොවිණිනම් එතැනයි දෑ — වැනසීම
කාගෙත් යුතුකමකි මේවා — නැවතීම!

රැක ගනු පිණිස ජාතියෙ — බාල පරපුර
ආරක්ෂක අංශ සිදුකරන — මෙහෙවර
ඇගයිය යුතුයි එහි ආදීනව — සිහිකර
දක්වමු මෙසේ අපි ජාතියෙම — හරසර!
රටේමුල්ලේ මුදන්නායක

දිනමිණ
The Dinamina
1909 ඇරැඹී ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2020 සැප්තැම්බර් 10 බ්‍රහස්පතින්දා

අලුත් තාලයක් අලුත් ජීවයක්!

ශ්‍රී ලංකාව දකුණු ආසියා කලාපයේ නවෝත්පාදන කේන්ද්‍රය බවට පත් කරන බව ද ඊට අවශ්‍ය වැඩ-සටහන් ක්‍රියාත්මක කරන බව ද අගමැතිවරයා කියා සිටී. ඒ මහතා මේ අදහස පළ කළේ නවෝත්පාදන ක්‍රියාවලියට සම්බන්ධ ඉන්දීය අනුග්‍රාහක ආයතනයක නියෝජිතයන් සමඟ සාකච්ඡාවක් පවත්වමින්ය. නවෝත්පාදන බිහි කිරීමට හා ඒවා ව්‍යාප්ත කිරීමට අවශ්‍ය පසුබිම රට තුළ හොඳින් පවතී. එක අතෙකින් අපේ මානව සම්පත දියුණුය. දැනුම හා නිපුණතාව අතින් පොහොසත්ය. තව අතෙකින් නිෂ්පාදනයට අවශ්‍ය මූලික පහසුකම් රාශියක් රට තුළ පවතී. අවශ්‍ය වන්නේ මග පෙන්වීම හා අනුග්‍රහය දැක්වීම පමණි.

'දැනුම ප්‍රාග්ධනය' වේ යන කියමන වසර ගණනාවක් තිස්සේ පටට ගසා ඇත. එහෙත් අපේ දේශීය දැනුමෙන් ප්‍රයෝජනයක් ගැනීමට මෙතෙක් කිසිවකු උනන්දු වී නැත. පාරම්පරික දැනුම විද්‍යාත්මක නැති බවට ද එහි ප්‍රතිඵල ඉතා සීමිත බවට ද විචාර විවේචන නිතර පළ වී ඇත. පාරම්පරික ඥානය මිථ්‍යාවක් ලෙස සලකා බැහැර කරන උගත්තු ද සිටිති. එහෙත් දියුණු රටවල් එබඳු ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නේ නැත. චීනය නිදසුනකට ගත හැකි ය. චීනය ස්වකීය සූප ශාස්ත්‍රය විකුණයි. සටන් කලාව විකුණයි. වෛද්‍ය ශාස්ත්‍රය විකුණයි. දේශීය දැනුමට හා පාරම්පරික තාක්ෂණයට ගරහන සම්ප්‍රදායක් චීන සමාජය තුළ නැත. එය ඔවුන්ගේ දියුණුවේ රහසකි.

රටක් ගොඩනැඟීම සම්බන්ධයෙන් නායකයන්ට හොඳ දැක්මක් තිබිය යුතුය. විශේෂයෙන් ආර්ථික වැඩපිළිවෙළක් නැතිව රටක් ඉදිරියට ගෙන යෑම බොරුය. ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපතිවරණයට ඉදිරිපත් වූයේ ආර්ථික දැක්මක් හා රට ගොඩනගන වැඩපිළිවෙළක් ජනගත කරමින් ය. ඊට රටේ බහුතරයේ අනුමැතිය ලැබී ඇත. අගමැතිවරයා රට එක්සේසත් කොට රටේ සංවර්ධනය දකුණු ආසියාවේ චාර්තාගත ආර්ථික වෘද්ධිය බවට පත් කළ නායකයෙකි. 2014 ආණ්ඩු පෙරළිය වන විට දකුණු ආසියාවේ හොඳම සංවර්ධන වේගය අප සතු විය. එහෙත් යහපාලන ආණ්ඩුවේ අවසන් කාර්තුව වන විට රටේ ආර්ථිකය බංකොලොත් තත්ත්වයක පැවැතිණි. දැන් එය සෙමෙන් වර්ධනය වෙමින් පවතී.

දේශීය ආර්ථිකය පණ ගැන්වීම වත්මන් ආණ්ඩුවේ ඉලක්කය වී ඇත. කොවිඩ් ලෝක වසංගත තත්ත්වය මත දියුණු වෙමින් පවතින රටවල් පමණක් නොව: සංවර්ධිත රටවල් පවා දේශීය ආර්ථිකයට නැඹුරු වී ඇත. අපට විශ්වාසය තැබිය හැක්කේ අපේ අමුද්‍රව්‍ය හා අපේ ම තාක්ෂණය ගැන පමණි. අන්තර්ජාතික වෙළෙඳාම හා සේවා ආර්ථිකය මුළුමනින්ම පාහේ අඩපණ වී ඇත. එය යථා තත්ත්වයට පැමිණීම සඳහා තවත් කාලයක් ගත වනු ඇත. ඒ අනුව දේශීය නිෂ්පාදන හා දේශීය කර්මාන්ත නගා සිටුවිය යුතුය. රාජ්‍ය යාන්ත්‍රණයේ ව්‍යූහය පවා ඊට සරිලන ලෙස වෙනස් කිරීමට ජනාධිපතිවරයා පියවර ගෙන තිබේ. එය සාධනීය ලක්ෂණයකි.

අගමැතිවරයා පෙන්වා දෙන අන්දමට මුළු රට ම නවෝත්පාදන කෙරෙහි යොමු විය යුතුය. සෑම ප්‍රදේශයක ම වැඩ බිම් හා නිෂ්පාදන ආයතන බිහි විය යුතුය. චීනයේ පාසල් දරුවෝ ද නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ වෙති. ඔවුන්ගේ නිෂ්පාදන ලෝක වෙළෙඳපොළෙහි අලෙවි වෙයි. ශ්‍රී ලංකාව යනු දීර්ඝ ශිෂ්ටාචාරයකට උරුමකම් කියන රාජ්‍යයෙකි. අපේ දේශීය තාක්ෂණය ලොව කිසිදු තාක්ෂණයකට දෙවැනි වන්නේ නැත. ශ්‍රී ලංකාවේ පුරාණ වාරි කර්මාන්තය, ඉදි කිරීම් තාක්ෂණය ලෝකය මවිත කරන නිර්මාණවලට හේතු - සාධක වී තිබේ. අපේ පුරාණ වැව්වල බිසෝකොටුවේ ඇති තාක්ෂණය නූතන ඉංජිනේරු විද්‍යාවට හසු නොවන එකක් බව ඕස්ට්‍රේලියානු ඉංජිනේරුවන් කියා ඇත. සාඩම්බර පාරම්පරික ඥානයක් අපට තිබේ.

අපේ ලාක්ෂා කර්මාන්තය ගත හොත් එය ධන උල්පතක් ලෙස පාවිච්චි කළ හැකි ය. මැටි කර්මාන්තය, වේවැල් කර්මාන්තය ඊට නොදෙවැනි තැනෙක පවතී. ලෝකයේ හොඳම ස්වභාවික මී පැණි ඇත්තේ ශ්‍රී ලංකාවේය. හොඳම කිතුල් පැණි ඇත්තේ ද ශ්‍රී ලංකාවේය. මේවා විශේෂ ඖෂධ ලෙස ද භාවිත කරනු ලැබේ. කිතුල් පැණි, මී පැණි ලෝක වෙළෙඳපොළට යොමු කිරීමෙන් සාර්ථක විදේශ විනිමයක් උපයාගත හැකි ය. මෙතෙක් මේ නිෂ්පාදනවලට රාජ්‍ය අනුග්‍රහය විධිමත් ආකාරයකින් ලැබී නැත. වේවැල් කර්මාන්තය මුළුමනින්ම පාහේ අඩාළය. කිතුල් ගස් වඳ වෙන්නට පටන්ගෙන තිබේ.

ජනාධිපතිවරයා අමාත්‍යාංශ වෙන් කර ඇත්තේ රටේ සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන අයුරින් ය. පොල්, කිතුල්, ගම්මිරිස්, බතික්, ස්වර්ණාභරණ යන ක්ෂේත්‍රවලට පවා වග කියන රාජ්‍ය අමාත්‍යවරයෙක් සිටී. ඒ සඳහා වෙනම අමාත්‍යාංශයක් ද තිබේ. කිසිවකුටත් තම වගකීමෙන් බැහැර විය නොහැකිය. තමන්ගේ ක්ෂේත්‍රය තුළ කුමන හෝ සාධනීය වර්ධනයක් පෙන්නුම් කිරීමේ වගකීම සෑම අමාත්‍යවරයකු වෙත ම පැවරී ඇත. දැන් ඔවුන් වැඩ කළ යුතුය. ක්ෂේත්‍රයට යා යුතුය.ගැටලු නිරාකරණය කළ යුතුය. නිෂ්පාදකයාට, ශිල්පියාට ඇහුම්කන් දිය යුතුය. දේශීය ආර්ථිකයට නැවත පණදීමට ඇති හොඳම ක්‍රමය මේ යැයි සිතන්නට පුළුවන.

දේශීය කර්මාන්ත සක්‍රීය කිරීම සඳහා බැංකුවල දායකත්වය නිරන්තරයෙන්ම පැවැතිය යුතුය. ජනාධිපතිවරයාගේ උපදේශනය මත කර්මාන්තකරුවන් සඳහා විශේෂ ණය වැඩසටහන් දැන් ක්‍රියාත්මක වෙයි. කර්මාන්තකරුවන් ණය ගැනීමට මැළි විය යුතු නැත. ණය කළමනාකරණය සාර්ථක නම්: ණය හා පොලී ගෙවා ලාභය උපරිම මට්ටමකින් පවත්වාගෙන යා හැකිය. ආයතන දියුණු වන්නේ ද ඒ ක්‍රමයටය. නව නිෂ්පාදන මෙහිදී ප්‍රමුඛ වටිනාකමක් උසුලයි. අලුත් - අලුත් දෑ නොතනන ජාතිය ලොව නොනගී යන කුමරතුඟවන්ගේ කියමන අපට සිහිපත් වේ.

ඡායාරූප - දම්න්ත ගුණරත්න

අලි-මිනිස් ගැටුම සමාදානයට නව දැනුම

මහාචාර්ය
රංගික හල්වතුර
කොමසාරිස්
නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

සත්තු ද පරිසරයේ ම කොටස්කරුවෝ ය. එහෙත් මිනිසා සෑම සතකු ම මිතුරකු ලෙස හෝ පරිසරයට අවශ්‍ය ජීවී කොට්ඨාසයක් ලෙස හෝ නොදකී. නාගරික මිනිසුන් අලින්, මොනරුන්, දඬුලේනුන්, රිළවුන් වැනි සතුන් බැලීමට යාල, විල්පත්තු යනමුත් ඒ අවට ගම්මානවල මිනිසුන්ට එකී සතුන් විශාල හිරිහැරයකි. ඒ හේතුවෙන් ම නාගරික ජනතාව දකින්නා වූ සුන්දරත්වය ඒ සතුන් තුළින් දකින්නට ග්‍රාමීය ජනතාවට ඉඩක් ඇත්තේ ම නැත. විශේෂයෙන් ම අලි මිනිස් ගැටුමට ප්‍රධානම හේතුව තමන් විසින් අලින්ගේ සීමාවට ගොස් ජනාවාස ඉදිකරගැනීම බව කළුවරගස්වැව, ගල්ගමුව වැනි ප්‍රදේශවල දැනට ජීවත් වන මිනිසුන් හොඳින් දන්නා කරුණකි. එහෙත් ඔවුන්ගෙන් පසු පරම්පරාව පිළිබඳ සලකා බැලුවහොත් කුඩා දරුවන් අලියා සලකනු ඇත්තේ සිය පියා මරාදැමීමට එන සතුරකු ලෙසිනි. ඔවුන් වැඩිහිටියන් බවට පත් වන කලෙක අලිඇතුන් ත්‍රස්තවාදීන් ලෙස සලකනු ඇත. එවැනි සතුන් සමූල ඝාතනය කළ යුතු යැයි සිතන තැනකට ද පත් විය හැකිය.

එබැවින් ශ්‍රී ලංකාවේ වන සතුන් සහ මිනිසුන් අතර ඇති මෙම ගැටලුවට ලබාදිය හැකි පිළිතුරු සොයා, අත්හදාබැලීමට මේ වන විටත් විශේෂ ව්‍යාපෘතියක් දියත්කොට ඇත. එම ව්‍යාපෘතියේ පළමු අදිරය ලෙස ක්‍රියාත්මක වන්නේ අලි මිනිස් ගැටුම නිරාකරණය කිරීමට පිළිතුරක් ලෙස ඒ වෙනුවෙන් ලංකාවේ ඇති නව නිපැයුම් ජනතාවට හඳුන්වා දීම ය. මෙය වූ කලී නව නිපැයුම්කරුවන්ගේ කොමිසම, වනජීවී දෙපාර්තමේන්තුව සහ අමාත්‍යාංශය එක්ව දියත් කරන වැඩසටහනකි. මේ ව්‍යාපෘතිය දියත් වීමත් සමඟ ඒ වෙනුවෙන් බොහෝ නව නිපැයුම් ඉදිරිපත් විය. අලි මිනිස් ගැටුම නැවැත්වීමට නම් අලින් ගම්වැදීම කෙසේ හෝ නවතාලිය යුතු ය. ඒ වෙනුවෙන් අවශ්‍ය ස්ථානවලට සුදුසු පරිදි අලිවැටවල් යෙදීම සිදු කළ යුත්තකි.

සංචාරක ආකර්ෂණය

මෙහිදී මිනිසාට අලියාත් අලියාට මිනිසාත් හිතකර වන අන්දමින් තරමක් දුරට සම්බන්ධ කිරීමට හැකි නම් එය ද මෙකී ගැටලුවට පිළිතුරු සෙවීමේ මාර්ගයක් වනමුත් එය එතරම් පහසු කර්තව්‍යයක් නොවනු ඇත. මේ වෙනුවෙන් අපට සාමාජීය වශයෙන් සිදු කරන්නට වන වෙනස සුළුපටු නොව නමුත් කළ නොහැක්කක් ද නොවේ. වන සතුන් මෙරට ආර්ථිකයට විශාල වාසියක් බවට පත්කර ගැනීමේ ඉඩක් පවතින බව පැහැදිලි ව පෙන්වා දිය හැකි නමි මේ ව්‍යාපෘතිය ඒ ඔස්සේ පහසුවෙන් ම ඉදිරියට ගෙන යා හැකි ය.

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය තුළ වන ජීවීන්ගේ අසිරි සිරියෙන් මුදල් ඉපයීමට වැඩි ඉඩක් වෙන් නොවීම කනගාටුවට කරුණකි. වනජීවීන් යනු හිරිහැරයක් ම නොව විශාල වශයෙන් ආදායම් උත්පාදනයෙහිලා යොදාගත හැකි සම්පතක් බව ජනතාවට ඒත්තු ගැන්වීම මෙම ව්‍යාපෘතියේ එක් අරමුණකි. සංචාරක ව්‍යාපාරය ඇසුරු කරගනිමින්, අලියා හේනට ඒම තුළ තමාට යම් ආදායමක් ලැබිය හැකි බව හේන අයිති ගොවියාට ඉගැන්විය හැකි නම් හේනට වැදී බඩ ඉරිඟු කන අලියා වෙනුවෙන් වැඩිපුර බඩඉරිඟු කොටසක් වැවීම ගොවියාට වාසියක් වනු ඇත. හේනට වදින අලින් ඇතුළු වන ජීවීන් නැරඹීම සඳහා සංචාරකයන් ඇදබැඳ ගැනීමෙන් ආදායම් ඉපයීමේ මාර්ග ගොවීන් වෙනුවෙන් විවරකොට දිය යුතු ය.

මෙවැනි නව අදහස් රැසක් මුල් කර ගනිමින් දියත් වන මෙම ව්‍යාපෘතියේ පළමු පියවර වශයෙන් සිදු කෙරෙනුයේ අලි මිනිස් ගැටුම වළකාලීම සඳහා යොදාගත හැකි නව නිපැයුම් හයක් ජනතාව අතරට ගෙනයෑම ය. මෙහිදී ස්විඩනයෙන්, නවසීලන්තයෙන් ආනයනය කොට යොදනු ලබන අලි වැට වෙනුවට ලංකාවේ බුද්ධිමය දේපළ අයිතිය ඇති අලිවැටවල් අත්හදා බැලීම ද විශේෂත්වයකි. ලාංකිකයන් විසින් නිර්මාණය කරන ලද නවින පන්නයේ අලි වැටවල් තවම අප විසින් අත්හදා බලා නැත. එම අලිවැටවල් දැනට පිටරටින් ආනයනය කොට යොදනු ලබන අලිවැටවලට වඩා උසස් තාක්ෂණයෙන් යුක්ත ය. අලියකු විත් අලිවැට ස්පර්ශ කරනවාත් සමඟ ම මුළු ගමටමත් ළඟ ම පොලිස් ස්ථානයටත් අනතුරු ඇඟවීමේ සංඥාවක් ලබාදිය හැකි තරමට දියුණු කළ අලිවැටවල් ද ලංකාවේ නිපදවා ඇති අතර මෙහිදී ඒවා යොදාගැනීමට උත්සාහ කෙරේ. යම් හෙයකින් අලියා ගම තුළට ඇතුළු වුව හොත් ගමට හානියක් නැතිව නැවත කැලෑව දෙසට යා හැකි අන්දමින් සකස්කොට ඇති අලිවැටවල් ද අලියකුට කිසිසේත් ම කඩා දැමිය නොහැකි අලිවැටවල් ද කඩිනමින් යෙදිය හැකි අලිවැටවල් ද මේ අතර වේ. මෙකී අලිවැටවල් අවශ්‍යතාව අනුව අවශ්‍ය ප්‍රදේශවලට යෙදීමට කටයුතු සම්පාදනය කිරීම මෙම ව්‍යාපෘතිය ඔස්සේ සිදු කිරීමට නියමිත ය. කෙසේ වෙතත් මෙය අලිවැටක් යොදා අලින් ගම්මානවලින් වෙන් කිරීමෙන් පමණක් නවතින සරල ව්‍යාපෘතියක් ලෙස සැලකිය යුතු නොවේ. මේ මඟින් අලින් මෙහෙයවීමේ වැඩ පිළිවෙළක් ද අත්හදා බැලීමට නියමිත ය.

සැබැවින් ම අපට අලින් පිළිබඳ නිවැරදි අවබෝධයක් නැත. එබැවින් ගම්මානවලට ඇතුළු වන අලින් කිහිප දෙනකු තෝරා ගෙන ගෙලට කොලරයක් යොදා ඒ ඔස්සේ අලින් පුහුණු කිරීමක් ඉදිරියේදී අපේක්ෂා කෙරේ. ඒ මඟින් අලි ගමන් ගන්නා දිශාව, ඒ අලින්ගේ චලන, රංචුව තුළ හැසිරීම් රටාව අධ්‍යයනය කිරීම ද මෙම ව්‍යාපෘතියේ ම කොටසකි. එලෙස අලින්ට පැලෙදීමට අපේක්ෂා කරන කොලරය ද ශ්‍රී ලංකාවේ ම නිෂ්පාදනය කරන්නකි. එම කොලරය මඟින් අපේක්ෂා කරනුයේ අලියා ගමට ළං වන විට යම් සංඥාවක් නිකුත් කිරීම ය. ඒ ඔස්සේ අලියා ගමට කිලෝමීටර් 10ක් දුරින් සිටින බව, කිලෝමීටර් 05 දුරින් සිටින බව දන්වමින් ගම්වාසීන් සූදානම් කළ හැකි ය. එතෙකින් නොනැවතී ගමේ තරුණයන් එක්කර ගනිමින්, අලියා ගම්වැදීමට උත්සාහ කරන විට, අලිවැට කැඩීමට උත්සාහ කරන විට ක්ෂණිකව යෙදිය හැකි දෙවැනි අලිවැටක් යොදා අලියා නැවත කැලේට පන්නා දමන ක්‍රමවේදයක් ද අප සතු ය.

සැබැවින්ම අපට අලින් පිළිබඳ නිවැරදි අවබෝධයක් නැත. එබැවින් ගම්මානවලට ඇතුළු වන අලින් කිහිප දෙනකු තෝරාගෙන ගෙලට කොලරයක් යොදා ඒ ඔස්සේ අලින් පුහුණු කිරීමක් ඉදිරියේදී අපේක්ෂා කෙරේ. ඒ මඟින් අලින් ගමන් ගන්නා දිශාව, ඒ අලින්ගේ චලන, රංචුව තුළ හැසිරීම් රටාව අධ්‍යයනය කිරීම ද මෙම ව්‍යාපෘතියේ ම කොටසකි.

කෙසේ වෙතත් අලි මිනිස් ගැටුම ශ්‍රී ලංකාව මුහුණපා සිටින විශාල ගැටලුවක් වන අතර තවදුරටත් මේ සමඟින් ඉදිරියට යෑම තුළ ලංකාවේ කැලෑවල සිටින අලිඇතුන් හෝ ගම්මානවල ජීවත් වන මිනිසුන් අපට අහිමි වනු ඇත. එසේ හෙයින් මෙය වූකලී කඩිනම් විසඳුමක් අවැසි ගැටලුවකි. අලි ගම් වදින ස්ථාන සොයා බලා අලිවැටවල් යෙදීම පමණක් මෙකී ගැටලුවට සාර්ථක පිළියමක් නොවන බව අමුතුවෙන් කිව යුතු නැත. අලියා යනු බුද්ධි මට්ටමෙන් ඉහළ සත්ත්වයකු ලෙස දකින අප උත්සාහ කරනුයේ අලින්ගේ චර්යා පිළිබඳව ද නිරන්තරයෙන් අධ්‍යයනය කරමින් මෙම ගැටලුවට සාර්ථක විසඳුමක් සෙවීමට ය. නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සමඟ සිටින නව නිර්මාණකරුවන් මෙම ව්‍යාපෘතිය පර්යේෂණ ඔස්සේ ඉදිරියට ගෙන යෑමට ඉදිරිපත් වී සිටීම විශේෂත්වයකි. එම සාමූහික ප්‍රයත්නය තුළ අලි මිනිස් ගැටුම් අවම කිරීමට වඩාත් නිවැරදි ක්‍රමවේදයක් සොයාගත හැකි වනු ඇත. ශ්‍රී ලංකාව තුළ අලිඇතුන් සම්බන්ධයෙන් නිර්මාණය වූ නව නිපැයුම් රැසක් ඇති අතර එමඟින් වඩා සුදුසු ක්‍රමවේදය තෝරාගැනීම මෙම පර්යේෂණයේ එක් අරමුණකි.

අලි වැට හා අගල් ඉදිකිරීම සම්බන්ධ ඇති කරන තිබෙන අමාත්‍යාංශයෙන් ද මෙම ව්‍යාපෘතියට ලබාදෙන්නේ නොමද සහයෝගයකි. මෙම ව්‍යාපෘතිය ඉතාමත් සාධනීය ව්‍යාපෘතියක් වන බවට මේ වන විටත් පෙර ලකුණු පෙනෙන්නට තිබෙන බැවින් ඉතාමත් කෙටි කාලයකදී මේ ඔස්සේ ශ්‍රී ලංකාවේ පවතින අලි මිනිස් ගැටුමට පිළිතුරක් ලබාදිය හැකි බව අපගේ විශ්වාසය යි.

වෙනත් රටවල ද අලි මිනිස් ගැටුම් පවතින නමුත් ඒ සෑම රටක් ම අප තරම් දරුණුවට මේ ගැටලුවට මුහුණ පාන්නේ නැත. ශ්‍රී ලංකාවේ ඇති අලිමංකඩවල් ගැසට් කිරීම අතිවාර්යෙන් කළ යුතු නමුත් එය තව ම සපුරාගත නොහැකි ව ඇති අවශ්‍යතාවක් ලෙස දැක්විය යුතු ය. පළමුවෙන් එකී අවශ්‍යතාව සපුරාගත යුතු අතර ඉන් අනතුරුව අලින් නිරන්තරයෙන් ගමන් කරන්නා වූ ප්‍රදේශ අලින් වෙනුවෙන් නිරාවරණය කරදීමට සිදු වේ. අලින්ගේ හා ගම් වැසියන්ගේ සීමා වෙන වෙන ම හඳුන්වා දෙමින් අලින් ගම් වැදීම නවතාලීමේදී අලින්ට ආහාර සහ ජලය සපයන ක්‍රමවේද සෙවීමේ අවශ්‍යතාව ද මතු වනු ඇති. එපමණක් නොව මෙහිදී ග්‍රාමීය ජනයාගේ මනස වෙනස් කළ හැකි ක්‍රමවේද සෙවීම ද අත්‍යවශ්‍ය කාරණාවක් ම ය. ගම්මානවල වැසියන් එක්රැස්කොට කණ්ඩායම් කිහිපයකට බෙදා, අලි මිනිස් ගැටුමට සාර්ථකව මුහුණ දෙන ආකාරය පිළිබඳ පුහුණුවක් ලබාදීමට ද ග්‍රාමීය නිෂ්පාදන ආර්ථිකයක් සමඟ ගම ආර්ථික වශයෙන් නඟාසිටුවීමට ද කටයුතු කළ හැකිය.

ව්‍යාපෘති ගණනාවක එකතුවක් වන මෙම වැඩපිළිවෙළ දැකිය හැක්කේ ඉතා සාර්ථක ව්‍යායාමයක් ලෙසිනි. කෙසේ වෙතත් අවම වශයෙන් සය මාසයක් මේ පිළිබඳ පර්යේෂණ සිදු කළ යුතු ය. අලි වැට කෙසේ විය යුතු ද? අලියාගේ ගමන් මාර්ගය, අලියා අලිවැට කඩාගෙන ගම්වැදුණහොත් මිළඟට ගත හැකි ක්‍රියාමාර්ග ආදිය පිළිබඳ තව දුරටත් පර්යේෂණ පැවැත්විය යුතු ය. මෙය පුහුණු කිරීම් මත පදනම් වන ව්‍යාපෘතියක් වන අතර මේ වෙනුවෙන් ලබාදිය හැකි නායකත්වය නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මඟින් ලබාදී තිබේ. මේ සඳහා අවශ්‍ය සහාය අදාළ සියලු පාර්ශ්වවලින් ලැබෙන්නේ නම් වසර ගණනාවක් මුළුල්ලේ උඩුදුවම්න් පවතින අලි මිනිස් ගැටුමට නිසැක විසඳුමක් සෙවිය හැකි ය.

මෙම ව්‍යාපෘතියේ නියමු ව්‍යාපෘතිය ආරම්භ වන්නේ නිතර අලි කරදරයට මුහුණ පාන ගමක් වන කළුවරගස්වැවෙනි. නියමු ව්‍යාපෘතිය තුළ මෙම ගම වටා අක්කර දෙදහක වපසරියක් ආවරණය කිරීමට නියමිත ය. කළුවරගස්වැවෙන් පසු හැරෙන්නේ අම්පාරට ය.

ජාතික අවශ්‍යතාවක්

ව්‍යාපෘතිය තුළ අලින් ගම්වැදීම නවතාලීමට මෙන් ම ගම්වදින අලින් පලවා හැරීමට ද ක්‍රමවේද සෙවිය යුතු ය. එහිදී අලින් ගම්වැදීම නවතාලීමේ ක්‍රම අත්හදා බැලීම සහ අලින් පලවා හරින ක්‍රම අත්හදා බැලෙනුයේ වෙන වෙනම ගම්මානවල ය. ඉන්පසුව යොමු වන්නේ අලිඇතුන් දුම්රියේ ගැටීම වළකාලීම වෙනුවෙන් මෙරට නිර්මාණය කොට ඇති නව නිපැයුම් අත්හදා බැලීමට ය. අලින්ගෙන් නොනවතින මෙම ව්‍යාපෘතිය තුළ මීළඟ පියවර වන්නේ මොනරුන්, දඬුලේනුන් වැනි වගාවට හානි කරන වෙනත් සතුන් පලවා හරින ක්‍රමවේද ගම්මාන තුළ අත්හදා බැලීමට ය. මෙයාකාරයෙන් පියවර ගණනාවකින් මෙම ව්‍යාපෘතිය ඉදිරියට යනු ඇත.

නව නිපැයුම්කරුවන්ගේ අන්තර්ජාතික තරගාවලියක් ලෙස පැවැත්වූ "සහසක් නිපැයුම්" තරගාවලියේදී රටරටවල නව නිර්මාණකරුවන්, අප හා සම්බන්ධ වූ අතර එම නිර්මාණකරුවන්ගෙන් අය කරගත් මුදල සම්පූර්ණයෙන් ම මෙම ව්‍යාපෘතියට යෙදවීමට නියමිත ය. එසේ ම පෞද්ගලික අංශයෙන් ද අමාත්‍යාංශ කිහිපයකින් ද මේ සඳහා මූල්‍යමය දායකත්වය ලබා දෙන බැවින් මෙය වූකලී ජාතික අවශ්‍යතාවක් ලෙස සලකමින් සියලු පාර්ශ්ව එක්ව දියත් කරන ව්‍යාපෘතියක් ලෙස පෙනෙන්නට තිබීම සුවිශේෂත්වයකි. මේ සඳහා අවශ්‍ය කරන තාක්ෂණික ඥානය ශ්‍රී ලංකාවේ නව නිර්මාණකරුවන්ගෙන් ලැබෙන අතර සියලු සම්බන්ධීකරණ කටයුතු නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මඟින් සිදු වේ. අමුද්‍රව්‍ය ලබාදෙමින් සහයෝගය දැක්වීමට දෙස්විදෙස් පරිත්‍යාගශීලීන් අප හා අත්වැල් බැඳගෙන සිටීම ද සතුටට කරුණකි. මාධ්‍ය දායකත්වය තවත් අතෙකින් මෙම ව්‍යාපෘතිය ශක්තිමත් කරවයි. මේ සියල්ල එක්තැන් වූ කල නුදුරේදීම යහපත් ප්‍රතිඵල අපේක්ෂා කළ හැකි බව පෙනෙන්න තිබේ.

සටහන
කාංචනා සිරිවර්ධන



දිල්රූගෙ සීපීද

අවැසිය රටක් ගොඩ නැඟුමට තුණු	ජවය
හරි දැක්මකට ඕනෑ පරිණත	බවය
මේ දෙක එකිනෙකට සමබර විය	යුතුය
හරියට පෑහුණොත් ඉහළයි	ප්‍රතිඵලය

ඉන්ෆ්ලුඑන්සාව වැලඳුණු විට හා සුව වූ පසු ආහාරය ලෙස හෝර්ලික්ස් සුදුසු බව කියන දැන්වීමක් මෙන්ම උණ වැළඳුන අයට සුදුසු බ්‍රෑන්ඩි හා විස්කි වර්ගවල දැන්වීම් සියල්ල ඉදිරියට පැමිණියේ ඉන්ෆ්ලුඑන්සාවට සහනය ගෙනදෙන අයුරිනි.

ජනතාව බැට කද්දී ව්‍යාපාරිකයන්ට ඉල්ලමක් වූ ස්පාඤ්ඤ උණ

වර්ෂ 1918 දෙසැම්බර් මස 19 වැනිදා රොයිටර් පුවත් සේවයේ ලන්ඩන් වාර්තාකරු ලෝකය පුරා පැතිර යන වසංගතයක් ගැන තීරණාත්මක පුවතක් වාර්තා කළේ මෙසේය. පසුගිය සති දොළහ තුළ ඉන්ෆ්ලුඑන්සා නියුමෝනියාව හේතු කොටගෙන මිලියන හයක් මරණයට පත්වී තිබේ. එහෙත් පසුගිය අවුරුදු හතරහමාර තිස්සේ පැවති ලෝක යුද්ධයෙන් මියගොස් තිබුණේ මිලියන විස්සකි. වාර්තාවලින් පෙනෙන ආකාරයට මේ ඉන්ෆ්ලුඑන්සා වසංගතය ලෝක යුද්ධයට වඩා පස් ගුණයක් දරුණුය. රොයිටර් වාර්තාකරු කී අනාවැකිය සත්‍ය බව නොබෝ කලකින්ම ඔප්පු විය. 1918 සිට 1920 වන තෙක් මුළු ලෝකයම වසාගත් නියුමෝනියා වසංගතය ලෝකයෙන් තුනෙන් එකක් එනම් මිලියන පන්සීයක් පමණ රෝගීන් බවට පත් කළ අතර එයින් මිලියන පනහකට පමණ මරු කැඳවූයේය. මේ නිසා 1918 වසංගතය ලේඛකයන් විසින් හඳුන්වන ලද්දේ සියලු වසංගතවල මාතාව ලෙසය.

පළමුවන ලෝක යුද්ධය පවතින අතරේ ඉස්මතු වුණු මේ ඉන්ෆ්ලුඑන්සා නියුමෝනියාව ඇමරිකානුවන් විසින් හඳුන්වන ලද්දේ ස්පාඤ්ඤ උණ ලෙසය. ස්පාඤ්ඤය ලෝක යුද්ධයට සම්බන්ධ නොවූ ස්වාධීන රටකි. ඔවුන්ගේ රටේ යුද පුවත් වාරණයක් පැවැත්වුණේ නැත. තමන්ගේ රටේ වාර්තා වූ රෝගය ගැන ඔවුන් ජනතාවට සත්‍ය පුවත් සැපයූ අතර යුද සමයේ සොල්දාදුවන්ගේ චිත්ත ධෛර්යය බිඳ වැටෙන නිසා අනෙකුත් රටවල් අලුත් රෝගය ගැනත්ල එයින් මියයන ප්‍රමාණ ගැනත් පුවත් සැඟවූහ. මේ නිසා ඇමරිකාව මේ වසංගතය ස්පාඤ්ඤයෙන් මතුවූ බව පවසමින් එය ස්පාඤ්ඤ උණ ලෙස හංවඩු ගැසීයග ඒ අතර සෙනගාලය මේ වසංගතය බ්‍රසීල උණ ලෙස නම් කරමින් අපහාසාත්මක සතුටක් ලැබීයග කෙසේ වුවත් ලෝකයේ බහුතර මාධ්‍ය විසින් මේ වසංගතය ඉතිහාසයට එකතු කළේ ස්පාඤ්ඤ උණ ලෙසය.

ස්පාඤ්ඤ උණ වසංගත රෝගීන් හා මරණ පැහැදිලි ලෙස පළමුවෙන්ම මතු වන්නේ ඇමරිකාවේ කැන්සාස් නිවියෝක් ඇතුළු ස්ථාන කිහිපයකිනිග ඒ 1918 මාර්තු මාසයේදීයග එහෙත් රෝගීන් පිළිබඳ තොරතුරු ජනවාරි මාසයේ වාර්තාවී තිබුණද යුද්ධය හමුවේ ඒ පුවත් රහසිගතව පවත්වා ගැනුණි.

රෝගයේ පැහැදිලි ගොදුර බවට පත් වූයේ අධික වයස්ගත පිරිස හා ඉතාම තරුණ පිරිසයග ඇමරිකාවෙන් ප්‍රංශය, ඉතාලිය, ස්පාඤ්ඤය, ජර්මනිය, මහා බ්‍රිතාන්‍යය යන රටවලටදල රෝගී යුද සිරකරුවන් නිදහස් කිරීම සමග ජර්මනියෙන් රුසියාවටද රෝගය වේගයෙන් පැතුරුණිග මෙය වසංගතයේ පළමුවැනි රැල්ල ලෙස හඳුනාගැනුණි.

අප්‍රේල් මාසය වනවිට ගිනිකොන ආසියාවටද මැයි මාසය වනවිට උතුරු අප්‍රිකාව ඉන්දියාව හා ජපානය වසංගතයට ගොදුරු විය. ජුනි මාසයේ චීනයෙන්දල ජුලි මාසයේ ඔස්ට්‍රේලියාවෙන්ද රෝගීන් වාර්තා වීම සමග ලොව සෑම කලාපයකම රෝගයේ ගොදුරු බිම් බවට පත්විය. රෝගය මෙතරම් වේගයෙන් පැතිරීමට හේතුව වුණේ ඇමරිකාවල ප්‍රංශය වැනි රටවල සංග්‍රාම මෙහෙයුම්ය. මේ නිසා වසංගතය ඇරඹී පළමු මාස හය තුළ ඇමරිකානුවෝ 75000ක් පමණ මරණයට පත්වූහ. මෙය එතරම් දරුණු ගැටලුවක් ලෙස නොපෙනුණේ ඇමරිකානු සොල්දාදුවන් 63000 ක් පමණ 1915 පළමු මාස හය තුළ ලෝක යුද්ධයෙන් මියගොස් තිබුණු නිසායගකෙසේ වෙතත් ඉන්ෆ්ලුඑන්සා රෝගය නිසා ජන ජීවිතය අඩාල නොකර පවත්වාගන්නට බලධාරිහු උත්සාහ ගත්හග එහෙත් 1918 අගෝස්තු මස අග දෙවෙනි රැල්ල ඇරඹීමත් සමග මේ තත්වයන් වෙනස් විය.

ඉන්ෆ්ලුඑන්සා වසංගත මරණ පාලනය කරන්නට ඇමරිකාව ඇතුළු යුරෝපයට තම රටවල් වසා දමා ජනතාව නිරෝධායනයට ලක්කරන්නට සිදුවියග පාසල් වසා දැමූ අතර දේවස්ථානවල දේව මෙහෙයන් තහනම් කෙරුණි. රංගශාලා හා කායවර්ධන ආයතන වසා දැමුණු අතර අවමඟුල් උත්සවද තහනම් කෙරුණිග සියලු දෙනාට නිවසට වී සිටින ලෙසත් බැහැරට යන්නේ නම් මුඛ ආවරණ පලඳින ලෙසත් දැඩිව නියෝග කෙරුණි. ඉන්ෆ්ලුඑන්සා රෝගය පැතිරෙන නිසා තැන තැන කෙළ නොගසන්නැයි පෝස්ටර් ප්‍රසිද්ධ ස්ථානවල අලවා තැබුණි. රතු කුරුස සංවිධානයට මිනිසුන් දැනුවත් කිරීම සඳහා පෝස්ටර් ව්‍යාපාරයක් අරඹන්නට සිදුවූ අතර කළ නිවසට වී නිරෝධායනය වන්නැයි ඔවුන් ජනතාවගෙන් ඉල්ලා සිටියේය. 1918 ඔක්තෝබර් මාසයේ ඇමරිකානු රතු කුරුස සංවිධානය පුවත් හසුනක් නිකුත් කරමින් සඳහන් කළේ තමන්ට යුද පෙරමුණු දෙකක එකවර සටන් වදින්නට සිදුව ඇති බවයි.

එහෙත්, එච් 1 එන් 1, ලෙස පසුකලෙක නම්කරන ලද වයිරසයේ දෙවෙනි රැල්ල ඇමරිකානුවන් ලක්ෂ තුනක් ජීවිතක්ෂයට පත්කළ අතර නෙදර්ලන්තයේ හැටදහසකට වැඩි පිරිසක්ද ල ඕලන්දයේ හතළිස්දහසකට වැඩි පිරිසක්ද මියගිය අතර ඉන්ෆ්ලුඑන්සා වෛරසය වැඩිම හානිය කරන ලද්දේ ඉන්දියාවටය. 1918 අවසන් වනවිට ඉන්දියානුවෝ මිලියන විස්සක් පමණ වසංගතයෙන් අවාසනාවන්ත ලෙස මියගියහ.

ඉන්ෆ්ලුඑන්සා වයිරසයේ තුන්වන රැල්ල ඕස්ට්‍රේලියාවෙන් ඇරඹුණිග දොළොස්දහසක් පමණ මියගිය අතර ජනතාව නිරෝධායනයට ලක්කර රෝගය පැතිරීම වැළැක්වීමට උත්සාහයක් ගැනුණි. එහෙත් සමුද්‍ර තරණය සම්බන්ධයෙන් ඔවුන් දැක්වූ ලිහිල් බව නිසාම නැවත යුරෝපයට සහ ඇමරිකාවට වසංගතය පැතිරී ගියේය. ලොස් ඇන්ජලීස් හා නිවියෝක් ඇතුළු ප්‍රධාන නගර රැසක් වසාදමා හුදෙකලා කරනු ලැබූ මුත් මරණ ඉහළ යාම නතර කිරීමට එය පොහොසත් වුණේ නැත. කෙසේ වුවත් බලධාරීන් ප්‍රකාශ කළේ තුන්වන රැල්ලෙන් වූ මරණ ප්‍රමාණය දෙවැනි රැල්ලට සාපේක්ෂව අඩු බවය.

වයිරසයේ හතරවන රැල්ල හුදෙකලා කර තිබූ නිවියෝක් නගරය තුළින් ඇරඹී නැවතත් යුරෝපය හා ජපානය වැනි රටවලට පැතිර ගියේය. 1919 දෙසැම්බරයේ සිට 1920 අප්‍රේල් දක්වා සිදුවූ මරණ ප්‍රමාණය 1918 වසර පුරාම සිදුවූ මරණවල එකතුවට වඩා වැඩිබව ප්‍රකාශ වියග අවුරුදු දෙකහමාරකට අධික කාලයක් තිස්සේ ජීවිත මිලියන පනහක්වත් වෛරසයට ගොදුරු වන්නට ඇතැයි පර්යේෂකයෝ අනුමාන කරති.

ඉන්ෆ්ලුඑන්සා වයිරසයෙන් සාමාන්‍ය ජනතාව බට කද්දී වෛරසය ඇතැම් ව්‍යාපාරිකයනට හා මහා පරිමාණ ආයතන කිහිපයකට ඉල්ලමක් බවට පත්විය. පුවත්පත සන්නිවේදන ක්ෂේත්‍රයේ දැවැන්තයා බවට පත්ව සිටි ඒ කාලයේ වෙළෙඳ දැන්වීම් සාමාන්‍ය ජනතාවගේ සිතිවිලි රටාවට මහත් බලපෑමක් එල්ල කළේය.

අද ඇති වෛවර්ණ ඡායාරූපමය වෙළෙඳ දැන්වීම් වෙනුවට එදා පළකෙරුනේ චිත්‍ර කතා හෝ කොමික් කාටුන් මාදිලියේ චිත්‍රයක් ඇතුළත් පුවතකි. ගත යුතු තීරණය කුමක්දැයි එහි එන පුවත සමඟ ඉදිරිපත් විය.

ඉන්ෆ්ලුඑන්සාව පැතිරීම පාලනය කරන්නග නිවසට වී සිටින්න,ග යනුවෙන් අවවාදාත්මක ස්වරයෙන් ඇරඹුණු එක දැන්වීමක පළකර තිබුණේ ඩොලර් සියයක් මිල අඩුකර ඇති තම, ගල්බ්‍රන්සන් පියානෝව, මේ කාලයේ මිලදී ගන්නා ලෙසය.

ස්පාඤ්ඤ උණ - නිවසට වී සිටින්නග රංගශාලාවලින් පිරිස ගැවසෙන තැන්වලින් ඈත් වන්න, ත්‍රෙඩ් ගෝල්ඩ් සමාගමේ, ග්‍රැමෆෝන් යන්ත්‍රය ඔබේ රඟහල බවට පත්කරගන්න. වෛද්‍යවරයාගේ උපදෙස එයයි. එක දැන්වීමක පලවිය.

ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල් විසින් දුරකතනය සඳහා පේටන්ට් ලබාගත්තත් දුරකතනයේ දැවෙන අවශ්‍යතාව මතු කළේ ඉන්ෆ්ලුඑන්සාව විසිනි.

නිවසට වී සිටින්නග දුරකතනයෙන් ඡොපින් කරන්නග, යයි ඇමරිකාවේ සරල දැන්වීමක් පලවිය.

අනතුරුව පළ වුණේ බෙල් දුරකතන දෙන්නේ ගෙදර සිටින අම්මා බව නිර්මාණශීලී ලෙස පළ කළේය.

ඉන්ෆ්ලුඑන්සාවට එරෙහි වන කාන්තා හා පිරිමි බටහිර ඇඳුම් විලාසිතා කිහිපයක් තොග අවසන් වන්නට පෙර මිලදී ගන්නැයි ඩොල්බි හා වයිට් හවුස් කම්පැනි වැනි සමාගම් විසින් දැනුම් දෙද්දී එක්තරා ටයිප් රයිටර් වර්ගයක්ද තොග අවසන් වන්නට පෙර මිලදී ගන්නැයි දැන්වීමක් පළ කර තිබුණි. එහි වෙළෙඳ නාමය වුණේ කොරෝනාය. ඉන්ෆ්ලුඑන්සා වසංගතය නිමාවී හරියටම අවුරුදු සියයකට පසු කොරෝනා ලෝකයම වසාගත්තේය.

පිළිබඳ දැන්වීමකි, නිරෝධායනය වනවිට, යන සිරස්තලය යටතේ මෙසේ සඳහන් වියග ,බෙල් දුරකතනයක් තිබේ නම් නිරෝධායන කාලයේ ඔබ හුදෙකලා වන්නේ නැත. ඔබේ ඇත ළඟ හෝ බොහෝ දුර සිටින හිත මිතුරන් කරා සම්පවන්නට දැන් හැකියග මන්ද බෙල් දුරකථනය විශ්ව සේවාවකි.

උණෙන් වළකින්න සී.සී.එම්. බයිසිකලයක් පැද යන්න. යන උද්ඛාතය යටතේ පල කළ දැන්වීමකින් කියැවුණේ ජනාකීර්ණ වීදි හා පිරිස ගැවසෙන වාහන වෙනුවට නැවුම් වාතයේ සුව විඳිමින් බයිසිකලයකින් ගමන් ගන්නා ලෙසයග වෙනත් විශේෂාංග ලිපියක් ස්වරූපයෙන් ඉදිරිපත් කළ පුවතකින් නැවත කියවුණේ දිනපතා බයිසිකල් පදින්නන්ට ඉන්ෆ්ලුඑන්සාව වැලඳුණේ ඉතාම අඩුවෙන් බවයි.

ඉන්ෆ්ලුඑන්සාව වැලඳුණු විට හා සුව වූ පසු ආහාරය ලෙස හෝර්ලික්ස් සුදුසු බව කියන දැන්වීමක් මෙන්ම උන වැලඳුන ඇහැට සුදුසු බ්‍රෑන්ඩි හා විස්කි වර්ගවල දැන්වීම් සියල්ල ඉදිරියට පැමිණියේ ඉන්ෆ්ලුඑන්සාවට සහනය ගෙනදෙන අයුරිනි.

1889-1890 කාලයේ දරුණු ලෙස මතුවුණු ඉන්ෆ්ලුඑන්සා වෛරස් ආසාදනයට සහනය දුන්නේ වෙපොරබ් බව කියමින් බාම් නිෂ්පාදකයෝ ලිපි පළ කරමින් තම නිෂ්පාදනවල ඉල්ලුම සියයට තුන් හාරසිය ගුණයකින් වැඩිකරගත් අතර මැලේරියා උණට සුදුසු ක්විනින් ඔසුවෙන් ඉන්ෆ්ලුඑන්සාවට සහනයක් ලැබිය හැකි බව කියමින් අදාළ සමාගම් ක්විනින් විස්කි පවා අලෙවියට එවූහ.

රජයේ උපදෙස් පිළිපදින්නැයි සිහිකරමින් තම ස්ප්‍රේ ඉන්ෆ්ලුඑන්සාව සඳහා නියම සහනය බව මිල්ටන් ස්ප්‍රේ සමාගම පැවසූ අතර සන්ලයිට් හා ලයිෆ්බෝයි සබන් වර්ග පිරිස අතරට නොයන්නැයි උපදෙස් දෙමින් තමන්ගේ නිෂ්පාදන සඳහා වෛද්‍ය උපදෙස්

ඇගයුමට ලක් නොවූ අපේ කොවිඩ් මර්දනය

මෑත ඉතිහාසයේ සමස්ත ලෝකය එක සේ මුහුණ දුන් දරුණුතම අර්බුදය ලෙස කොවිඩ් වසංගතය හැඳින්විය හැකිය. සංවර්ධිත, සංවර්ධනය වෙමින් පවතින, ඌන සංවර්ධිත යනාදි වශයෙන් බේදයකින් තොරව සියලු රටවල් කොවිඩ් වසංගතය ඉදිරියේ අසරණ වී සිටින අතර ඇතැම් අවස්ථාවල ඌන සංවර්ධිතය යැයි හංවඩු ගැසූ රටවල් සංවර්ධිත රටවලට වඩා නිර්භයව හා විධිමත්ව කොවිඩ් සතුරාට මුහුණ දුන් ආකාරයත් දක්නට ලැබුණි. චීනයේ වුහාන් නගරයෙන් ආරම්භ වී කෙටි කාලයකින් ලෝකය පුරා පැතිර ගිය කොවිඩ් සතුරා හමුවේ අප ලැබූ ජයග්‍රහණය සියලු රටවල් අතර අපේ රට ඉහළයටම ඔසවා තබන්නට සමත්විය.

එහෙත් කොවිඩ් වසංගතය මර්දනයේ දී ශ්‍රී ලංකාව දැක් වූ සමත්කම් නිසි ලෙස ඇගයුමට ලක්කිරීමට බොහෝදෙනා මැලි වන සෙයක් දක්නට ලැබේ. අන්තර්ජාතික මට්ටමින් ශ්‍රී ලංකාව ජයග්‍රහණ ලැබූ සෑම අවස්ථාවකම පාහේ මෙවැනි කෙණෙහිලිකම් සිදුවීම සාමාන්‍ය දෙයක් වී ඇත. ත්‍රස්තවාදය පරාජය කිරීම, ක්‍රිකට් ලෝක කුසලානය දිනාගැනීම ඇතුළු ජයග්‍රහණවල දී පවා බොහෝදෙනා හැසිරුණේ ඒවා ගණනකට නොගන්නා වූ ස්වභාවයකිනි.

කොවිඩ් වසංගතය හමුවේ අප ලැබූ ජයග්‍රහණය නොතකා කටයුතු කරන්නට එකී දෙස් විදෙස් බලවේග දත කමින් සිටින්නේ ද ඊට නොදෙවෙනි ආකාරයකිනි.

කොවිඩ් වසංගතය ලොව පුරා පැතිර යාම ආරම්භවත්ම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා එම වසංගතයට එරෙහි සටන ආරම්භ කළේය. ඒ අනුව ලෝකයේ පළමු වරට කොවිඩ් මර්දනයට කාර්ය සාධක බළකායක් පිහිට වූ රට බවට ශ්‍රී ලංකාව සමත්විය. අනතුරුව සියලු අධ්‍යාපන ආයතන වසා දැමීමට පියවර ගැනුණු අතර ගුවන්තොටුපොළ ද වසා දැමිණි. අවසානයේ දී රට පුරා ඇදිරි නීතිය පැනවූවා පමණක් නොව අඩාළ වූ ජන ජීවිත නගා සිටුවීමට නොයෙක් සහනාධාර ද පිරිනැමිණි. නිසි වේලාවට අනුගමනය කළ නිසි ක්‍රියාමාර්ග තුළින් කොවිඩ් පරාජය කළා පමණක් නොව මැතිවරණය පවත්වා රට ස්ථාවර කිරීමටත් ජනාධිපතිවරයා සමත්විය.

කොවිඩ් පරාජය කිරීමට රජය කටයුතු කරමින් සිටියදී එය විවේචනයට ලක්කළ ඇතැමුන් කිවේ කේරළය දෙස බලා පාඩම් ඉගෙන ගත යුතු බවය. එම කේරළය ද අයත් ඉන්දියාව අද එක් දිනක දී කොවිඩ් රෝගීන් 90,000 ඉක්මවා වාර්තා වන රටක් බවට පත්ව තිබේ. මෙරට ගුවන්තොටුපොළ වසා දමන විට අමෙරිකාවවත් ගුවන්තොටුපොළ වසා දමා නැතැයි ඇතැමිහු කීහ. අමෙරිකාව අදත් කොවිඩ් වසංගතයෙන් පීඩා විඳිමින් සිටියි. එහෙත් ශ්‍රී ලංකාව අද කොවිඩ් වසංගතයට සාර්ථකව මුහුණ දුන් රාජ්‍යයන් අතර ප්‍රමුඛස්ථානයට පත්ව සිටියි.

එසේ නම් අපේ රට ලෝකයේ දියුණුතම රාජ්‍ය අතරට ඔසවන්නට නොහැකිවීමට හේතුවක් නැත. ජනාධිපතිවරයාගේ සහ අගමැතිවරයාගේ සෘජු නායකත්වයන් ගැන සිතා බලන විට එම ගමන යා හැකි බවට දැන් ජනතාවට විශ්වාසයක් ඇති වී තිබේ. මේ මොහොතේ කළ යුත්තේ රජයේ වැඩපිළිවෙළ කඩාකප්පල් කිරීම නොව ඔවුන්ට වැඩ කරන්නට කාලය ලබා දී සාධාරණ විවේචන කිරීමය. අපට එරෙහිව විවේචන කරන කවුරුත් ඒ සම්බන්ධයෙනුත් සිතා බැලිය යුතුය යන්න අපගේ යෝජනාවයය.

ධනුෂ්ක ගොඩකුඹුර

ගොවිසෙත	සුපිරි වාසනා	ලග්න වාසනාව	කෝටිපති කප්රුක	සංවර්ධන වාසනාව	ජයෝදා	ශනිදා වාසනාව	සුපර් බෝල්	ජාතික සම්පත	අද කෝටිපති	වාසනා සම්පත	දරු දිරි සම්පත
2020 - 09 - 08	2020 - 09 - 07	2020 - 09 - 07	2020 - 09 - 06	2020 - 07 - 31	2020 - 08- 04	2020 - 09 - 07	2020 - 09- 07	2020 - 09-02	2020 - 09 - 07	2020 - 09 - 07	2020 - 07 - 30
දිනුම් වාරය - 2534	දිනුම් වාරය - 1533	දිනුම් වාරය - 2915	දිනුම් වාරය - 621	දිනුම් වාරය - 354	දිනුම් වාරය - 1678	දිනුම් වාරය - 3364	දිනුම් වාරය - 1208	දිනුම් වාරය - 1051	දිනුම් වාරය - 1034	දිනුම් වාරය - 1611	දිනුම් වාරය - 013
13 32 39 68	05 20 33 60	17 21 37 56	05 15 40 45	22 23 40	01 06 36 52	19 25 38 55	25 43 48 66	6 4 8 3 9 6	19 20 22 75	10 11 37 57	04 12 33 63
අක්ෂරය O	සුපිරි අංකය -01	ලග්නය-වෘෂභ විශේෂිත අංක රු 500 ත්‍යාග සඳහා-2945 රු 100 ත්‍යාග සඳහා-710	ඉංග්‍රීසි අක්ෂරය- Q	දෛව අංකය - 02 අක්ෂරය- L	අක්ෂරය-I	අක්ෂරය - A	අක්ෂරය - U	අක්ෂරය -K	අක්ෂරය - H රු 500 ත්‍යාග සඳහා-4676 රු 100 ත්‍යාග සඳහා-521	අක්ෂරය - Z	අක්ෂරය - U

කොවිඩ්වලට මිය යන මුස්ලිම් හා කතෝලික අය මිහිදන් කිරීමට ඉල්ලූ

පෙත්සම් 12ක් නොවැ 26 දා සලකා බැලේ

නෙල්කා මැදගෙදර

කොවිඩ් 19 වසංගතයට ගොදුරු වී මිය යන අයගේ සිරුරු ආදාහනය නොකර මිහිදන් කරන ලෙස ඉල්ලා මුස්ලිම් සහ කතෝලික බැතිමතුන් පිරිසක් ගොනු කළ මූලික අයිතිවාසිකම් පෙත්සම් 12ක් ලබන නොවැම්බර් මස 26 වැනිදා සලකා බැලීමට ශ්‍රේෂ්ඨාධිකරණය ඊයේ (09) තීරණය කළේය.

එම පෙත්සම්වල වගඋත්තරකරුවන් වූ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් ධුරයට වෙනත් අය පත්ව සිටින බැවින් ඔවුන්ට පෙත්සම් සම්බන්ධ නොතීසි දන්වා යවන ලෙස නියම කෙරිණි. සිසිර ද ආබෘ, එස්. තුරෙයිරාජා සහ එල්.ටී.බී. දෙහිදෙනිය යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඬුල්ල හමුවෙහි මෙම පෙත්සම් කැඳවන ලදී.

01 වැනි පිටුවෙන්...

වැරදිකරුවන්ට.....

එමෙන්ම ආනවිලුන්දාව රම්සා තෙත් බිම් විනාශ කිරීමේ සිදුවීම සම්බන්ධයෙන් මේ වනවිට විමර්ශන සිදුකෙරෙන බවත් පරිසරය විනාශ කරන කවර තැනැත්තකුට වුවද තරාතිරම නොබලා දඬුවම් ලබාදෙන බවත් ඇමැතිවරයා සඳහන් කළේය.

අදාළ ප්‍රදේශයේ ඩෝසර් කිරීම සඳහා යොදා ගත් බැකෝ යන්ත්‍රය, ක්‍රියාකරු හා උපදෙස් දුන් තැනැත්තා අත්අඩංගුවට ගත් බවත් අදාළ පුද්ගලයන් අධිකරණයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ බවත් අමාත්‍යවරයා වැඩිදුරටත් පැවැසීය.

ඇමැති සී බී රත්නායක මහතා මේ බව සඳහන් කළේ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා 27/2 යටතේ මතුකරන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා

ආනවිලුන්දාව අභයභූමිය වන සත්ව හා වෘක්ෂ ලතා ආඥා පනත යටතේ අභය භූමියක් ලෙස පිළිගත් ස්ථානයක්. ඒ වගේම රම්සා සම්මුතියට ඇතුළත් තෙත් බිමක් ලෙස පිළිගෙන තිබෙනවා. අක්කර එකයි දශම හයකට ආසන්න ප්‍රමාණයක් 2020-08 -25 දින ඩෝසර් කර එළි පෙහෙළි කර තිබෙනවා. මේ සම්බන්ධයෙන් ප්‍රදේශයේ වනජීවි නිලධාරීන් පරීක්ෂණ සිදුකර තිබෙනවා. දින දෙකක් තිස්සේ මෙය ඩෝසර් කරන බව සඳහන් කිරීම අසත්‍යයක්. මේ සම්බන්ධයෙන් විමර්ශන 2020-08-26 වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කැර තිබෙනවා. මේ සම්බන්ධයෙන් වන බී වාර්තාව ද අධිකරණයට ඉදිරිපත් කර තිබෙනවා. ඒ වගේම මෙම භූමිය ඩෝසර් කිරීම සඳහා යොදාගත් ඩෝසරය, එහි ක්‍රියාකරු ඒ සඳහා උපදෙස් දුන් තැනැත්තා අත්අඩංගුවට ගෙන තිබෙනවා. ඒ වගේම මේ පිළිබඳ විමර්ශන කටයුතු පොලිසිය හා වනජීවි හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හා පොලිසිය විසින් විමර්ශන සිදු කරනවා. ඒ වගේම මේ ප්‍රදේශ ආශ්‍රිතව සිදුකරන මුර සංචාර වැඩිකරන ලෙසද වනජීවි අධ්‍යක්ෂවරයා නිලධාරීන්ට දැනුම් දී තිබෙනවා. ඒ වගේම මේ සඳහා පොලිසියේ සහය දෙන ලෙස ඉල්ලීම් සිදුකර තිබෙනවා.

ඔබත් මමත් අපි හැමෝම ජීවත් වන මේ මිහිතලය තුළ මෙවැනි අක්‍රමිකතා, අකටයුතුකම් සිදු වෙනවනම් ඒ දේවල් නතර කිරීම, වළක්වාලීම අපි හැමෝගෙම වගකීමක්. ඒ වගේම කව්රුන් වුනත් මෙවැනි සිදුවීම් සිදුකරනව නම් අපි තරාතිරම බලන්නෙ නැහැ. ඒවට ඉඩ දෙන්නෙ නැහැ . අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නවා. ඒ වගේම ඔබතුමා කිව්වා, අක්කර දෙසියයක භූමියක් වනාත විල්ලුවේ. ඒක වනජීවියට අයිති නැහැ. පරිසර අමාත්‍යාංශයට අයිති එකක්. එම ඉඩමෙන් අක්කර 5660ක් සිමෙන්ති කර්මාන්තය වෙනුවෙන් ලබා දී තිබෙනවා. ඒකෙන් අතුරු බද්දක් ලබාගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන්ද විමර්ශනයක් සිදුකර තිබෙනවා. ඒ වෙනුවෙන්ද දැඩි තීන්දු ගැනීමට අපි පැකිලෙන්නේ නැහැ. මිනිසුන් ලෙස අපි හැමෝම ආදරෙයි. ජනාධිපතිතුමා, අගමැති තුමා අපි හැමෝම පරිසරයට ආදරෙයි. වෙලේ දොලේ ඉපනැල්ලේ සුවඳ දැනුණු මිනිසුන් ලෙස අපි හැමෝම පරිසරයට ගහට කොළට ආදරෙයි. සතා සිව්පාවට ආදරෙයි. ඒ නිසා කිසිම ආකාරයකට පරිසරය විනාශ කිරීමට අපි ඉඩ දෙන්නෙ නැහැ. ඒ වගේම ආනවිලුන්දාව රම්සා තෙත් බිම් ඩෝසර් කිරීම සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා අපි පංච පුද්ගල කමිටුවක් පත්කළා. එම කමටුවේ විමර්ශන වාර්තාව මම අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා.

වැව් 5,000ක් ...

වැව් පිළිසකර ව්‍යාපෘතිය කඩිනම් කිරීමට සිවිල් ආරක්ෂක බළකායේ සහාය ලබාගැනීමට නියමිත අතර පුරන් කුඹුරු අක්කර 120,000ක් ආශ්‍රිතව ජාතික ආහාර නිෂ්පාදන දායකත්ව වැඩසටහනත් මීට සමගාමීව ක්‍රියාත්මක කෙරේ. මීට පෙර ක්‍රියාත්මක කෙරුණු වැව් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය විද්වතුන්ගේ සහ ජනතාවගේ බලවත් දෝෂ දර්ශනයට ලක් වූයේ වැව් භාරා ගැඹුරු කළත් ජලය රඳවා තබාගැනීමේ පුරාණ තාක්ෂණ සහ විද්‍යාත්මක ක්‍රමවේද භාවිත නොකිරීම බව ජනාධිපතිවරයා මෙහිදී පෙන්වා දුන්නේය.

එබැවින් එවැනි අඩු පාඩු මග හරිමින් පොදු නිර්ණායකයක් යටතේ ඒ ඒ ප්‍රදේශවලට සහ වැව්වලට ආවේණික ක්‍රමයකට ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකළ යුතු බවත් ජනාධිපතිවරයා පැහැදිලි කළේය. වැව් ගොඩවීමෙන් ඒවායේ ධාරිතාව අඩු වී තිබෙන අතර ඉවුරු කැඩී ගිය වැව් විශාල සංඛ්‍යාවක් ඇති බවත් මහ කන්නය ඉලක්ක කොට ගෙන ඒවා කඩිනමින් පිළිසකර කළ යුතු බවත් ආර්ථික පුනර්ජීවනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බළකායේ ප්‍රධානී බැසිල් රාජපක්ෂ මහතා අවධාරණය කළේය.

කුඹුරු වගාව සඳහා පමණක් නොව පානීය ජල සම්පාදනය හා සෙසු වාරි අවශ්‍යතා සපුරාලීමට ද වැව් ජලය භාවිත කිරීමේ හැකියාව ජනාධිපතිවරයා මෙහිදී පෙන්වා දුන්නේය.

වාරි මාර්ග පද්ධතියෙන් නඩත්තුවන කෘෂි ඉඩම් පරිහරණ රටාවක් පිළිබඳ ඉඩම් පරිහරණ දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව එක්ව සමීක්ෂණයක් කර ඇත. ඉන් අනාවරණය වූ තොරතුරු පදනම් කර ගනිමින් මනා ජල කළමනාකරණයක් ඇතිව මැද කන්න සහ අතුරු කන්නවලදී හඳුනාගත් කෘෂි බෝග 17ක් වගා කිරීමට සැලසුම් කර තිබේ.

වැව් ප්‍රතිසංස්කරණය, වැව් ආශ්‍රිත කර්මාන්ත ආරක්ෂාවන අයුරින් කළයුතු අතර අනුබද්ධ ආයතන සහ ගොවි සංවිධාන සමග එකගතාවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය කරුණක් බව පෙන්වා දුන් ජනාධිපතිවරයා වැව් ප්‍රතිසංස්කරණයට සමගාමීව ඇළ වේලි ඇතුළු වාරි පද්ධතිය ද ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නා ලෙස උපදෙස් දුන්නේය.

නව කෘෂි තාක්ෂණය හඳුන්වා දෙමින් තරුණ ව්‍යවසායකයන් 500ක් කාබනික කෘෂිකර්මයට යොමු කිරීම පිණිස සැලසුම් කළ "තරුණ ගොවි සෞභාග්‍ය, කාබනික ගොවිපල වැඩසටහන" ද මෙහිදී විමර්ශනය කෙරිණ. මාදුරු ඔය දකුණු ඉවුරේ අක්කර 5000ක් ආවරණය වන පරිදි ව්‍යාපෘතිය සැලසුම් කර තිබේ. ඊට අවශ්‍ය යටිතල පහසුකම් සම්පාදනයට එකගත්වය පළ විය.

අමාත්‍ය චමල් රාජපක්ෂ, රාජ්‍ය අමාත්‍ය අනුරාධ ජයරත්න, ආර්ථික පුනර්ජීවනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බළකායේ ප්‍රධානී බැසිල් රාජපක්ෂ, ජනාධිපති ලේකම් පී.බී. ජයසුන්දර යන මහත්වරුන්, කැබිනට් හා රාජ්‍ය අමාත්‍යාංශවල මෙන්ම රේඛීය ආයතනවල නිලධාරීහු සහ ගොවි සංගම් නියෝජිතයෝ ඇතුළු පිරිසක් සාකච්ඡාවට එක්ව සිටියහ.

එයාර් බස් ගනුදෙනුව විමර්ශන වාර්තා දෙසැ 02 දා ඉදිරිපත් කරන ලෙස නියෝග

සුභාෂිණී සේනානායක

ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ සිදු වූ එයාර් බස් ගනුදෙනුවට අදාළව අමෙරිකානු ඩොලර් මිලියන 2 වංචාවක් සිදු වූ බව කියන සිද්ධිය සම්බන්ධයෙන් සංදේශය ගොනු කරන ලෙස කොටුව මහේස්ත්‍රාත් රංග දිසානායක මහතා ඊයේ (09) නියෝග කළේය.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් රක්ෂිත බන්ධනාගාර ගත කර සිටි ඇප මත මුදා හැර ඇති හිටපු ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ හිටපු ප්‍රධාන විධායක නිලධාරි කපිල චන්ද්‍රසේන මහතා සහ දෙවන සැකකාරිය වන ප්‍රියංකා නියොමාලි විජේනායක යන දෙදෙනා ඊයේ09 දා අධිකරණයේ පෙනී සිටියේය.

රවිරාජ් ඝාතන විමර්ශනවලට රනිල් ඇතුළු පිරිසක් මැදිහත් වුණා

නාවික හමුදා බුද්ධි අංශයේ හිටපු නිලධාරී ගාමිණී සෙනෙවිරත්න

අමෝදා ජයමහ

දෙමළ ජාතික සන්ධානයේ යාපනය දිස්ත්‍රික් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී නඩරාජ් රවිරාජ් 2006 වර්ෂයේ ඝාතනය කිරීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කළ විමර්ශනවලට හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ ඇතුළු පිරිසක් මැදිහත්ව කටයුතු කළ බව නාවික හමුදා බුද්ධි අංශයේ හිටපු නිලධාරී ගාමිණී සෙනෙවිරත්න මහතා ඊයේ (9) කොමිසම ඉදිරියේ සාක්ෂි ලබා දෙමින් පැවසුවේ ය.

2006 වසරේ සිදුවූ දෙමළ ජාතික සන්ධානයේ යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නඩරාජ් රවිරාජ් ඝාතන සිද්ධිය සම්බන්ධයෙන් ඇසින් දුටු සාක්ෂිකරුවකු සිටියදී තමා ඇතුළු නාවික හමුදාවේ බුද්ධි අංශ නිලධාරීන් දෙදෙනකුට වරද පටවමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කළ බව නාවික හමුදා බුද්ධි අංශයේ හිටපු නිලධාරි ගාමිණී සෙනෙවිරත්න මහතා සාක්ෂි දෙමින් කීවේ ය.

වර්ෂ 2015.03.15 වැනිදා තමා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා උප පොලිස් පරීක්ෂක අමරවංශ නැමැත්තා තමන් අමතා 'නඩරාජ් රවි රාජ්ට වෙඩි තිබ්බෙ උඹ එහිදී උඹේ අතේ තුවාලයකුත් වුණා. DNA ටෙස්ට් එකක් කරලා ඒ ගැන ඔප්පු කරනවා. ගෝඨාභය රාජපක්ෂගේ උවමනාවට වසන්ත කරන්නාගොඩ මහත්තයාගේ අනුදැනුම ඇතිව නඩරාජ්ට වෙඩි තිබ්බා යැයි පවසා රජයේ සාක්ෂිකරුවකු වෙලා ගෙදර යන්න.' යනුවෙන් ඔහුට බලපෑම් කළ බව ද ඒ මහතා පැවසුවේ ය.

01 වැනි පිටුවෙන්...

ආරක්ෂක කමිටු රැස්වීමේදී...

කෙසේ වුවද මේ සම්බන්ධයෙන් සොයා බලා පාර්ලිමේන්තුවට දැනුම් දෙන බවද කතානායකවරයා පැවසිය.

කතානායකවරයා මේ බව සඳහන් කළේ කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නලින් බණ්ඩාර මහතා මතුකළ ප්‍රශ්නයකට පිළිතුරු දෙමිනි.

එහිදි අදහස් දැක්වූ නලින් බණ්ඩාර මහතා මේ බව සඳහන් කළේ පාර්ලිමේන්තු සංකීර්ණයට ගෙන ආ පාර්සලයක් පරීක්ෂාවට ලක්කරන ලද පොලිස් නිලධාරීන් තිදෙනෙක් මෙලෙස ස්ථාන මාරුවකට ලක්කර ඇති බවයි .ආණ්ඩු පක්ෂයේ වුවද, විපක්ෂයේ වුවද පාර්ලිමේන්තුවට රැගෙන එන පාර්සල් පරීක්ෂාවට ලක්කළ යුතු අතර එලෙස සිදුකිරීමට ඉඩ නොදීම නරක පූර්වාදර්ශයක් විය හැකි බව බවද නලින් බණ්ඩාර මහතා පැවසීය.

නෞකාවේ ගින්න...

නෞකාවේ පවතින ආපදා තත්ත්වය සම්පූර්ණයෙන් පාලනය වීමෙන් පසු නෞකාවට ඇතුළු වී එහි තත්වය නිරීක්ෂණය කිරීම හා අවශ්‍ය ඉදිරි කටයුතු සොයා බැලීම සඳහා නාවික හමුදාධිපති වයිස් අද්මිරාල් නිශාන්ත උළුගේතැන්නගේ උපදෙස් මත ආපදා කළමණාකරණය පිළිබඳ විශේෂඥ පුහුණුව ලත් ශ්‍රී ලංකා නාවික හමුදාවේ තවත් කණ්ඩායමක් ඊයේ(09) එම මුහුදු ප්‍රදේශය වෙත යාමට නියමිතව තිබිණ.

පෙරේදා (07) දිනයේ අයහපත් කාලගුණය මත නැවතත් වර්ධනය වූ MT New Diamond බොරතෙල් ප්‍රවාහන නෞකාවේ ගින්න සාර්ථක ලෙස පාලනය කිරීමට ඊයේ(09) අළුයම් කාලය වන විට ආපදා කළමණාකරන කණ්ඩායම් සමත් විය. එමෙන්ම මේ වන විට නෞකාවෙන් ගිනිදැල් නිකුත්වීමක් හෝ දුම් පිටවීමක් නිරීක්ෂණය නොවන අතර, ටග් යාත්‍රාවක් යොදා ගනිමින් ආපදාවට පත් නෞකාව නැවතත් ගැඹුරු මුහුදු වෙත ඇදගෙන යාම සිදු කරමින් පවතී. ඒ අනුව ආපදාවට පත් නෞකාව ඊයේ පෙරවරුව වන විට සංගමන්කන්දතුඩුවේ සිට නාවික සැතපුම් 37ක් වූ ගැඹුරු මුහුදට රැගෙන ගොස් ඇති අතර, එම මුහුදු ප්‍රදේශයේ පවතින ඉතාමත් රළු ස්වාභාවය සහ දැඩි සුළං ප්‍රවාහයද හමුවේ මෙම මෙහෙයුම් ක්‍රියාත්මක වන බව ශ්‍රී ලංකා නාවුක හමුදාව පැවසීය.

ප්‍රේමලාල් ජයසේකර...

2001 වර්ෂයේ සිදුව ඇතැයි කියන ප්‍රේමලාල් ජයසේකර මහතාගේ ඥාතිවරයකුගේ ඝාතනය සම්බන්ධයෙන් ජයසේකර මහතා නියෝජනය කළ ආණ්ඩුව විසින් විධිමත් පරීක්ෂණයක් නොකළේ මන්දැයි විමසූ මන්ත්‍රීවරිය මන්ත්‍රී වරප්‍රසාදවලට මුවා වී අසත්‍ය ප්‍රකාශ සිදුකරමින් අනුකම්පාව දිනා ගැනීමේ වෑයමක නිරතව සිටින බව කියා සිටියේය.

ප්‍රේමලාල් ජයසේකර මහතා පෙරේරා (08) දිනයේ සිය නම සම්බන්ධ කරගනිමින් සිදුකළ ප්‍රකාශයට පාර්ලිමේන්තුවේදී ඊයේ (09) පිළිතුරු දෙමින් තලතා අතුකෝරළ මහත්මිය එසේ කීවාය.

20 පරාජය කරන්න...

විශේෂයෙන්ම ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තු යෑමේ අවසරය ලබාදීම, විගණන කොමිසම අහෝසි කිරීම සහ 19න් පනවා තිබූ කැබිනට් මණ්ඩල සාමාජිකත්වය සීමා ඉවත්කිරීම සම්බන්ධයෙන් සිය අසතුට ප්‍රකාශ කර ඇති මෙම පිරිස රනිල් වික්‍රමසිංහ මහතාට මේ සම්බන්දයෙන් කරුණු දක්වා ඇත . ඔවුන් තවදුරටත් දක්වා ඇත්තේ 19 සාධනීය වගන්ති තවදුරටත් පවත්වාගෙන යමින් අවශ්‍යම සංශෝධන පමණක් ඉදිරිපත් කරමින් ප්‍රජාතන්ත්‍රවාදය තව දුරටත් ශක්තිමත් කළයුතු බවයි .

මේ අතර විපක්ෂයේ දේශපාලන නායකයන් ගණනාවක්ම රනිල් වික්‍රමසිංහ මහතාගෙන් ඉල්ලා ඇත්තේ දෙමළ ජාතික සන්ධානය ඇතුළු සියලු බලවේග ඒකරාශිකොට පුළුල් වැඩපිළිවෙළක් හරහා 20 වැනි සංශෝධනය පැරදවීමට ශක්තිමත් බලවේගයක් ගොඩනැඟීමට ඉදිරිපත්වන ලෙසයි .

එසේම පසුගියදා රනිල් වික්‍රමසිංහ මහතා මුණගැසුණු සිවිල් සංවිධාන සහ තරුණ සංවිධාන නියෝජිතයන් ගණනාවක්ම 20 තුළින් රටට සිදුවන හානිය කරුණු කාරනා සහිතව පෙන්වාදෙමින් මේ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කොට එහි ආදීනව රට හමුවේ තැබීමට පියවර ගන්නා ලෙස ඉල්ලා තිබේ .

මේ අතර 20 වැනි සංශෝධනය සම්බන්දයෙන් කරුණු අධ්‍යයනය කොට දින 03ක් ඇතුළත තමන්ට වාර්තාවක් ලබාදීමට ජ්‍යෙෂ්ඨ නීතිවේදීන් 05 දෙනකුගෙන් යුතු කමිටුවක් රනිල් වික්‍රමසිංහ මහතා විසින් පත්කර ඇති අතර අදාළ වාර්තාව ලද විගස ඒ සම්බන්ධ ඉදිරි පියවර ගැනීමට නියමිතය. එසේම 20 වන සංශෝධනයේ ජනතා පරමාධිපත්‍ය විනාශ කරන කරුණු සම්බන්දයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පැවරීමට කටයුතු කරන ලෙසද රනිල් වික්‍රමසිංහ මහතා විසින් එක්සත් ජාතික පක්ෂයේ නීතිවේදීන්ට උපදෙස් දී ඇත.

පැවැති බුද්ධි රැස්වීම්වලට ...

එම සිදුවීම් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා ගෙන ගියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව බව කියා සිටි සිසිර මෙන්ඩිස් මහතා එම සිද්ධිය සම්බන්ධයෙන් තමන්ට දැනුවත් කිරීමේ වාර්තාවක් හෝ නොලැබුණු බවද කොමිසම හමුවේ සඳහන් කළේය.

යන්න පිළිබඳ කොමිසම විසින් කළ ප්‍රශ්න කිරීමට පිළිතුරු දෙමින් හිටපු ජාතික බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස් මහතා මේ බව කියා සිටියේය.

පාස්කු ප්‍රහාරය පිළිබඳ සොයා බැලීමට පත් කළ කොමිසම සභාපති විනිසුරුවරයා ඇතුලු විනිසුරුවරුන්ගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කෙරුණු අතර එහිදි සිසිර මෙන්ඩිස් මහතා මාවනැල්ල බුදු පිළිම වලට හානි කිරිම සහ වනාතවිල්ලුව පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීම සම්බන්ධයෙන් මතු කළ ප්‍රශ්න වලට පිළිතුරු ලබා දෙමින් මේ බව පැවසුවේය.

නැව ගිනි ගැනීමෙන්....

තවද මෙම නෞකාව තිබෙන ස්ථානයට ගොස් මුහුදු ප්‍රදේශය නිරීක්ෂණ කර සමුද්‍ර දූෂණයක් සිදුව ඇද්ද යන්න සොයා බලා කටයුතු කරනලෙසට නීතිපතිවරයා සමුද්‍ර පරිසර අධිකාරියට උපදෙස් ලබා දුන් බව නීතිපතිවරයාගේ සම්බන්ධීකරණ නිලධාරිණී රජයේ නීතිඥ නිශාරා ජයරත්න මෙනෙවිය පැවසුවාය.

නෞකාවේ මුහුදේ පිහිටීම සම්බන්ධයෙන් නෞකාවේ ස්ථාවරභාවය හා මෙම සිද්ධියෙන් නෞකාවට සිදුවිය හැකි අලාභය හා ඉදිරියට සිදුවිය හැකි අලාභය නිසා තෙල් කාන්දුවක් ඇති වීටම් සම්භාවිතාව හා පරිසරයට සිදුවිය හැකි හානිය පිළිබඳ තක්සේරුවක් ලබාගන්නා ලෙසටත් නීතිපතිවරයා අදාළ අංශ වෙත උපදෙස් ලබාදීමක් සිදු කළ බව රජයේ නීතිඥ නිශාරා ජයරත්න මෙනෙවිය පැවැසුවාය. එවැනි අවස්ථාවක් ඇතිවූවොත් ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් ක්‍රමවේද නිසි අයුරින් සකස් විය යුතු බවටත් නීතිපතිවරයා උපදෙස් ලබාදී ඇත.

නෞකාවේ ගින්න සම්බන්ධයෙන් නාවික හමුදාපතිවරයා, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති, වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ සමුද්‍ර පාරිසරික ආරක්ෂණ අධිකාරියේ සභාපතිවරයා සමග පැය තුනක කාලයක් පුරාවට ඊයේ (06) පැවැති සාකච්ඡාවේදී නීතිපතිවරයා මෙම උපදෙස් ලබාදී ඇත.

නෞකාවේ ගින්නට අදාළ කටයුතු සිදුකිරීමේදී විදේශ කණ්ඩායම් මෙරටට පැමිණීමේදී කොවිඩ් 19 ට අදාළ ක්‍රියා මාර්ග උපදේශ අනුව කයුතු කරන ලෙසත් නීතිපතිවරයා උපදෙස් ලබාදී ඇත.

ඇමැති සිරිපාල ගම්ලත්ගේ මෑණියෝ අභාවප්‍රාප්ත වෙති

මහවැලි කලාප ආශ්‍රිත ඇළ වේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය ඇමැති පොළොන්නරුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සිරිපාල ගම්ලත් මහතාගේ මෑණියන් වූ පොළොන්නරුව ගල්කොරියාව ගම්මානයේ පදිංචිව සිටි පී. ඩී.දයාවතී (90) උපාසිකා මාතාව කලුරිය කළාය. අවසන් කටයුතු හෙට (12) සවස 4.30ට පොළොන්නරුව පලුගස්දමන මහජන ක්‍රීඩාංගණයේදී සිදු කෙරේ. දේහය ගල්කොරියාව ගම්මානයේ නිවසේ තැන්පත්කොට ඇත.

01 වැනි පිටුවෙන්...

නිරිත දිග මෝසම...

දිවයිනේ නිරිත දිග කොටසේ වැසි තත්ත්වයන් කඩින් කඩ ඉදිරි දින වල බලාපොරොත්තු විය හැකි බවද නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා කීය.

බස්නාහිර, සබරගමුව සහ මධ්‍යම පළාත් වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක වලත් අද(10) දිනයේ විටින් විට වැසි ඇතිවේ. වයඹ පළාතේද වැසි වාර කීපයක් ඇතිවිය හැකි බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පැවසීය.

සුරාබදු කොමසාරිස් ඇතුළු ...

සුරාබදු පනත ඉක්මවා යමින් තමන්ගෙන් දඩ මුදල් අයකර ගැනීමට එරෙහිව මෙම ව්‍යාපාරිකයන් තිදෙනා ගොනු කළ පෙත්සමක් විභාග කර එහි තීන්දුව ප්‍රකාශ කරමින් අභියාචනාධිකරණය මෙම නියෝගය කළේය.

සුරාබදු පනත යටතේ ගැනෙන වැරදි සම්බන්ධයෙන් නිලධාරීන්ට අභිමත පරිදි දඩ මුදල් නියම කළ නොහැකි බවට මෙම නඩු තීන්දුව මගින් පෙන්වා දී ඇත.

පොලීසියට පහර දුන්...

බණ්ඩාරගම, මාරාව ප්‍රදේශයේ පුද්ගලයෙකු කාලක සිට ගංජා ජාවාරමේ යෙදෙන බවට ලද තොරතුරකට අනුව 09 දා උදෑසන මෙම වැටලීම් සිදු කර තිබේ.

බණ්ඩාරගම පොලිසියේ නිලධාරීන් 05 දෙනකු මාරාව ප්‍රදේශයේ නිවසකදි ගංජා සමග පුද්ගලයකු අත් අඩංගුවට ගෙන අත් මාංචු දැමීමට සැරසෙන විට ඔහුගේ බිරිය දියණිය බෑණා සහ තවත් පුද්ගලයන් දෙදෙනෙකු විසින් නිලධාරීන් සමග පොර බදා අතපය සපාකා නිලඇඳුම් ඉරා දමමින් කළහකාරි ලෙස හැසිරී එම පුද්ගලයා මුදා ගෙන ඇති බව උසස් පොලිස් නිලධාරියෙක් පැවසුවේය . සිද්ධියෙන් තුවාල ලැබූ පොලිස් නිලධාරිනියන් දෙනෙකු හා නිලධාරින් දෙදෙනෙකු රෝහල් ගත කිරීමට කටයුතු කර තිබෙන අතර සිද්දීයට සම්බන්ධ කාන්තාවන් තිදෙනෙකු අත් අඩංගුවට ගෙන තිබේ .

පලා ගිය සැකකරු සොයා මෙහෙයුම් ආරම්භ කර ඇති අතර පහර දීමට සම්බන්ධ තවත් පුද්ගලයන් අත් අඩංගුවට ගැනිමට කටයුතු කරන බව පොලිසිය පවසයි .

11දා කොමිසමට නාවොත්...

ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ හිටපු ලේකම් වෛද්‍ය නිහාල් ජයතිලක මහතා කළ පැමිණිල්ල ඊයේ (09) කොමිසම හමුවේ කැඳවූ අවස්ථාවේදී සභාපතිවරයා මේ බව අවධාරණය කර සිටියේ ය.

මේ අතර හිටපු අමාත්‍යවරුන් වන ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා, රවුෆ් හකීම් සහ දෙමළ ජාතික සන්ධානයේ නායක ආර්.සම්බන්ධන් යන මහත්වරුන්ට කොමිසම හමුවේ පෙනී සිටීමට යොමුකළ නොතිසි පාර්ලිමේන්තු මහලේකම්වරයා හරහා ඔවුන් වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස ද සභාපතිවරයා නියෝග කරනු ලැබුවේ ය.

දිවි නැගුම දෙපාර්තමේන්තුවක් බවට පත්කිරීමේ දී ස්වෙච්ඡාවෙන් ඉවත් වූ සේවකයන්ට වන්දි සහ පාරිතෝෂිත දීමනා ලබාදීම හා 'ඉසුරුමත් නිවාස ව්‍යාපෘතියෙන්' සහන ලබාදීමේ සිද්ධීන්වලට, දේශපාලන බලපෑම් මත තමා අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කළ බවට වෛද්‍ය නිහාල් ජයතිලක මහතා කොමිසමට පැමිණිලික් ඉදිරිපත් කර තිබිණි. එමෙන්ම 'දූෂණ විරෝධී කමිටුව' ලේකම් ලෙස කටයුතු කළ ආනන්ද විජේපාල මහතාට නොතිසි නිකුත් කළද ඔහු එම ලිපිනයේ නො මැති බව මෙහිදී කොමිසමට දන්වා සිටි හෙයින් ඔහු අවසන්වරට පදිංචිව සිටි නිවසේ සිතාසිය ඇලවීමට ද කොමිසමේ සභාපතිවරයා නියෝග කළේ ය.

පරාජිත මන්ත්‍රීවරු...

මෙවර මහ මැතිවරණයෙන් පක්ෂ විපක්ෂ නියෝජනය කරමින් තේරී පත් වූ නවක මන්ත්‍රීවරුන් රැසක් දුර පළාත් නියෝජනය කරන හෙයින් ඔවුන්ට පාර්ලිමේන්තු සැසිවාරයට සහභාගි වීමේදී පෞද්ගලික ස්ථාන හෝ හොටෙල් වැනි ස්ථාන භාවිතයට ගැනීමට සිදුව ඇති බව නවක මන්ත්‍රීවරු පවසති.

තමන් පත්ව ඇති දුෂ්කරතාව පිළිබඳ සභානායක, ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරුන් දැනුවත් කිරීමට නවක මන්ත්‍රීවරුන් පියවර ගෙන ඇති අතර ඒ සඳහා කඩිනමින් විසඳුමක් ලබාදෙන්නැයි ඔවුන් ඉල්ලා සිටිති.

මේ සඳහා විසඳුමක් ඉල්ලා සිටින බවත් මන්ත්‍රීවරුන් හිටපු මන්ත්‍රීවරුන්ගෙන් අදාළ නිල නිවාස ලබාගැනීමට කටයුතු කරන ලෙස ආණ්ඩුවට දැනුම් දුන් බවද කීය.

අභය භූමිය ...

ජගත් සමන්ත යනු රාජ්‍ය අමාත්‍ය සනත් නිශාන්ත මහතාගේ සොහොයුරාය. ආරච්චිකට්ටුව ආනවිලුන්දාව රම්සා අභය භූමියට අයත් ප්‍රදේශයක් ඉස්සන් වගාවට අයත් ප්‍රදේශයක් ඉස්සන් වගාවට අනුමැතියකින් තොරව ඩෝසර් කිරීම සිදු කර තිබේ. ඒ අනුව මේ පිළිබඳ සොයා බැලීම සඳහා වනජීවී සහ වන සංරක්ෂණ ලේකම්වරයාගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමට විෂය භාර අමාත්‍ය සී.බී. රත්නායක මහතා විසින් තීරණය කරන ලදී. එම කමිටුවේ වාර්තාව පෙරේදා (08) විෂය භාර අමාත්‍යවරයා වෙත ලබාදීමෙන් අනතුරුව ඊයේ (09) පාර්ලිමේන්තුවේ සභා ගත කිරීම සිදු කර ඇත.

බංග්ලාදේශ්...

එම ධීවරයන්ගේ පවුල්වල ඥාතීන් පෙරේදා (07) ඇමැති දේවානන්දා මහතා හමුවූ අවස්ථාවේදී ඒ මහතා මේ ප්‍රතිඥාව ලබා ද තිබේ.

අම්බලන්ගොඩ ධීවර වරායෙන් පසුගිය පෙබරවාරි 05 පිටත්ව ගිය බහුදින ධීවර යාත්‍රා 04 ක්සහ ධීවරයන් 24ක් දැනට බංගලාදේශ රජයේ අත්අඩංගුවේ පසුවෙයි. මෙම ධීවරයන් නිදහස් කර ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනම් කරන ලෙස ඇමැතිවරයා ධීවර දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටඋපදෙස් ලබා දී ඇත.

ජනතාවට ...

විවිධ ආර්ථික අපහසුතාවට මුහුණ පා සිටින ජනතාවට ණය ලබාදීමේදී මෙම කාරණය කෙරෙහි අවධානය යොමු කරන ලෙස උපදෙස් දුන් අගමැතිවරයා ණය ගෙවා ගැනීමට අපහසුව සිටින සහ අලුතින් ණය ලබා ගැනීමට පැමිණෙන ජනතාව අනවශ්‍ය ලෙස අපහසුතාවයට ලක් නොකරන ලෙසත් දැනුම් දුන්නේය. ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ දත්ත පරීක්ෂා කිරීමේ කාර්යය තුළ මහජනතාවට සිදු වන අපහසුතාවන් පිළිබඳ මුදල් රාජ්‍ය ඇමැති අජිත් නිවාඩ් කබ්රාල් මහතා මෙහිදී අග්‍රමාත්‍යවරයාගේ අවධානයට යොමු කළේය.

ණය නොගෙවූ පුද්ගලයෙකුගේ ඇපකරුවකු වූ පමණින් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ නම ඇතුළත් වීම නිසා ණයක් ලබා ගැනීමට එම පුද්ගලයා නුසුදුස්සකු කිරීම ඇතුළු කරුණු පිළිබඳ අවධානය යොමු කළ අගමැතිවරයා ඒ සඳහා සුදුසු සහන ක්‍රමවේදයන් පිළිපදින්නැයි උපදෙස් දුන්නේය.

පසුගිය රජය සමෘද්ධි ලබාදීමේදී පාක්ෂිකයින්ට විශේෂිත කොට එම ආධාර පිරිනමනා ඇති බව සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌන උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය ඇමැති ෂෙහාන් සේමසිංහ මහතා පෙන්වා දුන් අතර මේ පිළිබඳ සොයා බලා දේශපාලන බේදයකින් තොරව අඩු ආදායම්ලාභී සියලුම පවුල් සඳහා සමෘද්ධි ලබාදීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අගමැතිවරයා දැනුම් දුන්නේය.

සෞභාග්‍යයේ දැක්ම යටතේ සපිරි ගමක් ව්‍යාපෘතිය සඳහා රුපියල් බිලියන 28ක මුදලක් වෙන් කර තිබේ. ඒ අනුව දිවයිනේ ග්‍රාම නිලධාරී කොට්ඨාස 14021 ක් සඳහා රුපියල් මිලියන 2 බැගින් බෙදා දීමට නියමිතය. අගමැතිවරයාගේ උපදෙස් මත ග්‍රාමීය ප්‍රජා කමිටු විසින් තෝරා ගත් ව්‍යාපෘති ක්‍රියාවට නැංවේ. ඒ අතර ග්‍රාමීය මාර්ග, පඩි, බොක්කු, කුඩා පාලම්වල පැති කාණු සංවර්ධනය, කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා අවශ්‍ය ගබඩා පහසුකම් සංවර්ධනය, ග්‍රාමීය මට්ටමේ ආර්ථික මධ්‍යස්ථාන හා සති පොළවල වෙළඳපොළ ස්ථාන සංවර්ධනය, කුඩා වැව්, ඇළ මාර්ග, අමුණු, පොකුණු, කෘෂිකාර්මික ළිං ප්‍රතිසංස්කරණය, ප්‍රජා පානීය ජල සම්පාදන ව්‍යාපෘති, ග්‍රාමීය වෛද්‍ය මධ්‍යස්ථාන නවීකරණය හා වැඩි දියුණු කිරීම, පාසල් සඳහා විදුලිය, ජලය සහ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම, වන සතුන්ගෙන් මිනිස් වාසස්ථානවලට සිදු වන අනතුරු ඉවත් කිරීම හෝ අවම කිරීම සඳහා වන ව්‍යාපෘති වේ.

මුදල් අමාත්‍යාංශ ලේකම් එස්. ආර්. ආටිගල, මහ බැංකු අධිපති දේශමාන්‍ය මාහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්, රාජ්‍ය බැංකු සභාපතිවරුන් ඇතුළු නිලධාරී මහත්ම මහත්මීහු රැසක් එක්ව සිටියහ.

මේ දවස්වල කවුරුත් කතා කරන 20

ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මේ දක්වා මෙරට ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. මෙහි කරුණු යම් යම් කාලවලදී සංශෝධනයට ලක් කර ඇති අතර මේ වන විට එය 20 වැනි සංශෝධනය දක්වා ඉදිරියට පැමිණ ඇත. නව රජය ඉදිරිපත් කළ 20 වැනි සංශෝධනය සම්බන්ධයෙන් මේ දිනවල වැඩියෙන් කතා කරනු දක්නට ලැබේ. එම සංශෝධනය පිළිබඳ මෙරට විශ්වවිද්‍යාල ආචාර්ය මහාචාර්යවරුන් කිහිප දෙනකු දැක්වූ අදහස් මෙසේය.

19න් ඇති වූ අර්බුදය එදා යහපාලන ආණ්ඩුව තේරුම් ගත්තේ නෑ

හිටපු මහාචාර්ය **එම්.ඕ.ඒ. ද සොයිසා**

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යාව පිළිබඳ හිටපු මහාචාර්ය එම්.ඕ.ඒ. ද සොයිසා මහතා-

ජේ.ආර්. ජයවර්ධන මහතාගේ ජනාධිපතිධුර කාලයේදී රටේ දේශපාලන ස්ථාවරය ආරක්ෂා කර ගැනීම කොපමණ අගාධයට ගියාද කියනවා නම් 1977 ව්‍යවස්ථාව ගොඩනැඟුවා. විධායක ජනාධිපතිට පැවරුණු බලය, වගකීම බැලුවාම එය අමෙරිකාව, ප්‍රංශය ජනාධිපති තනතුරට වඩා ඉහළ ගිය බලයක් වුණා. ශක්තිමත් විධායකයක් අවශ්‍ය බව පිළිගන්නවා. ජාතික පැවැත්මට බලපාන සෑම තීන්දු තීරණයකටම විධායකය වැදගත්. නමුත් එය ආඥාදායකත්වයක් නොවිය යුතුයි. ජේ.ආර්. ජයවර්ධන මහතා හැදුවේ ආඥාදායකත්වයක්. එහි තිබූ භයානකකම වුණේ බලතල තුලනය නොකිරීමයි. ජනාධිපතිවරණය අවුරුදු 05කට වරක් පැවැත්වීම හා වාර 02ක් පමණක් ජනාධිපතිවරණයට ඉදිරිපත්වීමේ අවස්ථාව, ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිවයුතු බව, ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට පටහැනිව කටයුතු කරන්නේ නම් දෝෂාභියෝගයක් ගෙනැවිත් ජනාධිපතිවරයා ඉවත් කිරීමේ හැකියාව පැවැතුණා. මින් ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකියන බව ව්‍යාජ ප්‍රදර්ශනයක් පමණයි. පසුව මේ ආඥාදායකත්වය දිගටම වර්ධනය වීමත් සමඟ බරපතළ ගැටලු රැසකට මුහුණ දෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත වන්නේ නැහැ. මෙවැනි තත්ත්වයක් යටතේදී එය වෙනස් කළ යුතුයි යන මතය ආවා. ඒ අනුව 17 වන ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. එමඟින් ජනාධිපතිවරයා පත්කිරීමේ බලතලවලට සීමා දැමුණා. ස්වාධීන කොමිෂන් සභා පත්කළා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පත් කළා. පසුව මහින්ද රාජපක්ෂ මහතාගේ ආණ්ඩු කාලයේදී 18 වන ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. පසුව එම ව්‍යවස්ථා සංශෝධනය වෙනස් කිරීම 2015 මැතිවරණයේ මූලික කරුණක් බවට පත්වුණා.

යහපාලන ආණ්ඩුව 19වන ව්‍යවස්ථා සංශෝධනය නිසා තනි පවුලකට ගොඩනැඟෙන්න තිබූ ඉඩකඩ සීමා කළා. ජනාධිපතිවරණයට ඉදිරිපත් විය හැකි වයස සීමාව 35 කළා. ජනාධිපතිවරණයට ඉදිරිපත් විය හැකි වාර ගණන 02ක් කළා. නමුත් එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දිශාව සම්බන්ධව ප්‍රශ්නයක් තිබුණා. නැවත පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයකට යනවාද කියා ප්‍රශ්නයක් තිබුණා.

ජනාධිපතිවරයාගේ බලතල ඉවත් කළා. ජනාධිපතිවරයා ආණ්ඩුවේ නායකයා. නමුත් ඔහුට ඇමැති ධුරයක් දරන්න බැහැ. ආරක්ෂාව සම්බන්ධව කටයුතු කරන්න බැහැ. එය ව්‍යාකූල තත්ත්වයක්. එය වෙනස් කළ යුතුයි. 19 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් ඇති වූ ඒ අර්බුදය එදා යහපාලන ආණ්ඩුව තේරුම් ගත්තේ නැහැ. ඒ නිසා මුළු රටේම අර්බුදයක් ඇතිවුණා. ඒ ආකාරයට රටකට ගමන් කරන්න බැහැ. විධායකය ස්වාධීනව කටයුතු කරන්න අවශ්‍යයි.

ඒ නිසා 19 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් ඇති කළ අර්බුදය ලිහිල් කළ යුතුයි.

ඒ නිසා 20 වන ව්‍යස්ථා සංශෝධනය ගෙනා යුතුයි. රටේ ප්‍රජාතන්ත්‍රවාදය පවත්වාගැනීමට නම් හොඳ ආණ්ඩු ක්‍රමයක් අවශ්‍යයි. ඒ නිසා 19 වන ව්‍යවස්ථා සංශෝධනයේ දුර්වල තැන් ශක්තිමත් කළ යුතුයි.

ජාතික ආරක්ෂාව තහවුරු කිරීම ජනාධිපතිගේ කාර්යභාරයක්: දහනවයේ ඒක නැහැ

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය **සම්පත් රාජපක්ෂ**

කැලණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය සම්පත් රාජපක්ෂ මහතා -

ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය අනාගතයේදී වෙනස් වේවි. මම දකින විදියට මේ ව්‍යවස්ථා සංශෝධනයේ දේශපාලනයක් තියෙනවා. මේක ලංකාවේ ආණ්ඩුකරණය හා ජාතික ආරක්ෂාව අර්බුදයකට ලක්වුණු එකට විසඳුම් සෙවීමට මේක කර තියෙන්නේ. ඒත් ව්‍යවස්ථාවක් කියන්නේ දේශපාලන ප්‍රශ්නවලට විසඳුම් හොයන එකක් නොවෙයි. ව්‍යවස්ථාව කියන්නේ මඟ පෙන්වන දෙයක්. මේ නව ව්‍යවස්ථාව ගැන විශාල චෝදනාවක් තියෙනවා. ජනපති බලතල වැඩිකිරීම ගැන. ඒත් පාස්කු ඉරිදා ප්‍රහාරයත් එක්ක විධායකයට ආරක්ෂාව සම්බන්ධව වගකීම පැවරීමට නොහැකිවීම නිසා පුරවැසියන්ගෙන්ම තමයි අධික බලතල සහිත ශක්තිමත් විධායක ධුරයක් අවශ්‍යයි කියන අදහස ආවේ. ව්‍යවස්ථාවේ තියෙනවා ජාතික ආරක්ෂාව තහවුරු කිරීම ජනාධිපතිවරයාගේ කාර්යභාරය කියා.19 වැනි ව්‍යවස්ථාවේ ඒක තිබුණේ නැහැ. 20 වැනි සංශෝධනයේ ඒකට ප්‍රතිපාදන තියෙන එක හොඳ තත්ත්වයක්.

20න් රට නිවැරැදි මාවතකට ගමන් කරනවා

මහාචාර්ය **ගාමිණී සමරනායක**

දේශපාලන විද්‍යාව පිළිබඳ හිටපු මහාචාර්ය ගාමිණී සමරනායක මහතා-

ගිය ආණ්ඩුව 19 වන ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කළේ එහි සැඟවුණු අරමුණු කිහිපයක් නිසයි. ඒ අතර ජනාධිපතිවරයාට ජනාධිපතිවරණයට ඉල්ලන්න පුළුවන් අවස්ථා 02කට සීමා කිරීම , ජනාධිපති ධුර කාලය වසර 05කට සීමා කිරීම ආදිය සුවිශේෂී වෙනවා. පසුගිය ආණ්ඩුවට රාජපක්ෂ භීතිකාවක් තිබුණා. රාජපක්ෂවරුන්ට නැවත ඉදිරිපත් වෙන්න බැරි වෙන්නත් , ද්විත්ව පුරවැසියන් දේශපාලනයට සම්බන්ධ කරගැනීම වැළැක්වීම 19වන ව්‍යවස්ථා සංශෝධනයේ අරමුණ වුණා. බැසිල් රාජපක්ෂ මහතා ජනාධිපතිවරණයට ඉදිරිපත් වීම වැළැක්වීම ඒ අයගේ අරමුණක් වුණා. නමුත් අප දන්නවා මැතිවරණ කොමිසමේත් , පාර්ලිමේන්තුවේත් අදටත් ද්විත්ව පුරවැසියන් ඉන්නවා. නමුත් අවාසනාවට ගීතා කුමාරසිංහ මහත්මියට විතරක් ද්විත්ව පුරවැසිභාවය නිසා පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය අහිමි වුණා.

ලංකාවේ ජනවාර්ගික ප්‍රශ්නයට එකම විසඳුම ෆෙඩරල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියා ඔවුන් සිතුවා. මේ රටේ ස්ථාපිත වූ ඒකීය ආණ්ඩුක්‍රමයක් තිබුණා. එක ජනකොටසක් ඉලක්ක කර සමස්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවම වෙනස් කළ යුතු නැහැ. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දිගු කාලීන අරමුණ එයයි. නිසි වෙලාවට මැතිවරණ නොපැවැත්වීමෙන් ඒ බව තහවුරු වුණා.

අද 19 වන ව්‍යවස්ථා සංශෝධනය හදන්න මූලික වූ පිරිස් ලංකාවේත් නැහැ. පාර්ලිමේන්තුවේ ධුර කාලය ඉවර වෙන්න පෙර සමහර පුද්ගලයන් අයින් වුණා.

දේශපාලන පක්ෂවලින් පලිගන්න ආකාරයට ව්‍යවස්ථා සංශෝධනයක් සකස් නොවිය යුතුයි. ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයට , මහජන කැමැත්තට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නිර්මාණය විය යුතුයි. සමාජ , ආර්ථික ගැටලුවලට විසඳුම් ව්‍යවස්ථා සම්පාදනයෙන් ලැබෙයි කියා පසුගිය ආණ්ඩුව සිතුවා. නමුත් 19 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් එම ගැටලුවලට විසඳුම් ලැබුණේ නැහැ. 19 වන ව්‍යවස්ථා සංශෝධනය ඉවත් විය යුතුයි.

20 වන සංශෝධනයෙන් පුද්ගලයන්ට හෝ පක්ෂවලට හානිවන ආකාරයේ දේවල් ඉවත් කර තිබෙනවා. රටට හොඳක් වන දේවල් ඇතුළත් කර තිබෙනවා කියා පවසනවා. කොමිෂන් සභා ඉවත් කර නැහැ, ජනාධිපති ධුර කාලය වසර 05 පැවැතීම වෙනස් කර නැහැ , ජනාධිපතිවරණයට තරග කළ හැකි අවස්ථාව දෙකකට සීමා කිරීම ඉවත් කර නැහැ. 20 වන සංශෝධනයේ අභිලාෂය වන්නේ රට නිවැරැදි මාවතකට ගමන් කරවීමයි. ව්‍යවස්ථාවක අරමුණ විය යුත්තේ එයයි. 20 වන සංශෝධනයෙන් බලාපොරොත්තු වන්නේ 19 වන ව්‍යස්ථා සංශෝධනයෙන් කළ අයුක්තිය නිවැරැදි කිරීමයි. 20 වන සංශෝධනය හරහා ප්‍රජාතන්ත්‍රවාදය නැතිවෙනවා කියා වැරැදි මතයක් සමාජගත කර තිබෙනවා. නමුත් එයට ජනතාව ඇහුම්කන් දෙන බවක් නම් පෙනෙන්න නැහැ. තුන්වන ලෝකයේ රටක් වන අපේ රට ප්‍රජාතන්ත්‍රවාදී රටක්. උතර දකුණ කැරලි කෝලහාල අතීතයේ සිදුවුණා. ඒවා එදා සාර්ථක වුණා නම් ඒකාධිපතියෙක් බිහිවෙන්න තිබුණා.

ගිය අවුරුදු පහේ දී 19 වන ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම ඇතුළු රජයේ ක්‍රියාකාරිත්වය ඊනියා ජනවාර්ගික ක්‍රමයට විසඳුම් ලෙස සිදුවුණා. නමුත් 20 වන සංශෝධනය ඒකීයභාවය ස්ථාපිත කිරීමට ගෙන එන්නක්.

අනාගත අභිවෘද්ධිය සඳහා 19 වැනි සංශෝධනය ඉවත් කළ යුතුයි. විරුද්ධ පක්ෂය ඇතුළුව සියලු පක්ෂ 19වන ව්‍යවස්ථා සංශෝධනය ඉවත් කිරීමට පක්ෂපාතීව සහාය දිය යුතුයි.

හැම ව්‍යවස්ථාවක් පිටුපසම තිබෙන්නේ වෙනම චින්තනයක්

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය **නිර්මාල් රංජිත්**

කොළඹ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි මහතා-

20ට මම පක්ෂත් නෑ, විපක්ෂත් නෑ. මහජනතාවගේ ඉදිරියේ මේවා ක්‍රියාත්මක වෙලා ප්‍රකාශයට පත්වෙනතුරු මම බලාගෙන ඉන්නවා. මම ව්‍යවස්ථාවක් දිහා බලන්නේ හොඳ හෝ නරක කියලා නොවෙයි. හැම ව්‍යවස්ථාවක් පිටුපසම වෙනම චින්තනයක් තියෙනවා. අප ඒ චින්තනය තේරුම් ගන්න ඕනෑ. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ක්‍රියාත්මක වෙද්දි සාමාන්‍යයෙන් බලයට පත්වෙන අය තමතමන්ගේ අභිලාෂ උඩ යම් යම් දේවල් කරනවා. ඔවුන් ඒ හරහා බලය අවභාවිත කරන්න පුළුවන්. ඒ සඳහා යම් යම් ක්‍රියාමාර්ග අවශ්‍ය වෙනවා. නිදසුනක් විදියට සංවරණය හා තුලනය ගන්න පුළුවන්. ස්වාධීන කොමිෂන් සභා වගේ දේවල් හැදුණේ තුලනයට. 17 හා 19 කියන ව්‍යවස්ථා ආවේ ඒ චින්තනය එක්ක.

1978 ව්‍යවස්ථාවෙන් ජනාධිපති කියන තනතුරේ බලය ඉහළට සංකේන්ද්‍රණය වුණා. දැන් 20 වැනි සංශෝධනය වෙනුවෙන් පෙනී ඉන්න අය පවා ඒ කාලේ එක විවේචනය කළා. ඒ ව්‍යවස්ථාව අහෝසි කරන්න ඕනෑ කියන එක මැතිවරණ ප්‍රකාශනවල පවා තිබුණා. 20 වැනි සංශෝධනය පිටුපස තියෙන චින්තනය 1978 තිබුණු, ප්‍රජාතන්ත්‍රවාදය පිළිගත්තු, ස්ථාවර ආණ්ඩු ක්‍රමයක් ඇති කරන්න ඕනෑ, ආර්ථිකය සකස් කර ගන්න ඕනෑ චින්තනයම තමයි. ඊට අමතරව ජාතික ආරක්ෂාව, පාතාල මර්දනය, මත්කුඩු උවදුර තුරන් කිරීම වගේ කාරණා වගේම බලයේ ඉන්න අයගේ පෞද්ගලික අභිලාෂ සාක්ෂාත් කර ගැනීමත් ඒ අතර තියෙනවා.

චන්දිමා කරුණාරත්න, නදී මාණික්කගේ

දිනුම් වාරය 606 නිල පුතිඵල

දිනය: 2020.09.08

ඉංග්‍රීසි අකුර: C

සුපිරි අංකය: 14

ජයග්‍රාහී අංක: 10 12 47 80

	තෑගෑ රටාව	තෑගෑ මුදල් රු.	ජයග්‍රාහකයන් සංඛ්‍යාව
1 වන තෑගෑය	අංක 4 ක් පමණක් ගැළපේ නම්	1,000,000.00	-
2 වන තෑගෑය	අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	100,000.00	05
3 වන තෑගෑය	අංක 3 ක් පමණක් ගැළපේ නම්	1,000.00	142
4 වන තෑගෑය	අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	500.00	329
5 වන තෑගෑය	අංක 2 ක් පමණක් ගැළපේ නම්	100.00	8,467
6 වන තෑගෑය	අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	40.00	5,607
7 වන තෑගෑය	අංක 1 ක් පමණක් ගැළපේ නම්	20.00	139,710
8 වන තෑගෑය	ඉංග්‍රීසි අකුර පමණක් ගැළපේ නම්	20.00	25,371

ලංකාවේ විශාලම සුපිරි තෑගෑය

මීළඟ මෙගා සුපිරි තෑගෑය රු. 233,679,350.75

මීළඟ පවර් සුපිරි තෑගෑය රු. 10,514,317.60

මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි තෑගෑය රු. 13,905,796.80

දිනා ඇති මුළු මුදල රු. 5,179,100.00

- රු. ලක්ෂ 5 හෝ ඊට වැඩි තෑගෑ රජයේ බදු නීති රීති වලට යටත් වේ.
- තෑගෑ මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6 ක කාල සීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
නො. 32,එන්.ඩබ්.ජේ මුදලිගේ මාවත, කොළඹ 01
දුරකථන: 011-2 470 662, 011-4 607 000, 0112-458 585
ෆැක්ස්: 0112 433 631,
වෙබ් අඩවිය: www.nlb.lk

2020-09-08 - ජාතික ලොතරැයි මණ්ඩලය බිහිකල මුළු තෑගෑ ලාභීන් සංඛ්‍යාව 719,487

ජයග්‍රාහකයින් අතර බෙදාදුන් මුළු තෑගෑ මුදල 28,868,890.00

රු. 2,000,000.00 තෑගෑ 01 | රු. 1,000,000.00 තෑගෑ 02 | රු. 100,000.00 තෑගෑ 27

www.nlb.lk

දිනුම් වාරය 701 | දිනය 2020/09/08 නිල ප්‍රතිඵල — නීරෝගා ලග්න ජය

ලග්නය: සිංහ

ජයග්‍රාහී අංක: 02 10 31 32

	තෑගෑ රටාව	තෑගෑ මුදල	ජයග්‍රාහකයින් සංඛ්‍යාව
1 වන තෑගෑය	අංක 4 ම ගැළපේ නම්	රු. 1,000,000/-	1
2 වන තෑගෑය	අංක 3 ක් සමඟ ලග්නය ගැළපේ නම්	රු. 10,000/-	9
3 වන තෑගෑය	අංක 3 ක් ගැළපේ නම්	රු. 2,000/-	68
4 වන තෑගෑය	අංක 2 ක් සමඟ ලග්නය ගැළපේ නම්	රු. 200/-	290
5 වන තෑගෑය	අංක 2 ක් ගැළපේ නම්	රු. 100/-	3,385
6 වන තෑගෑය	අංක 1 ක් සමඟ ලග්නය ගැළපේ නම්	රු. 60/-	4,597
7 වන තෑගෑය	අංක 1 ක් ගැළපේ නම්	රු. 20/-	50,378
8 වන තෑගෑය	ලග්නය පමණක් ගැළපේ නම්	රු. 20/-	18,636

මෙවර දිනා ඇති මුළු තෑගෑ මුදල රු. 3,278,600.00

මීළඟ සුපිරි තෑගෑය රු. 17,355,320.50

රුපියල් ලක්ෂ 5 ක් හෝ ඊට වැඩි තෑගෑ රජයේ බදු නීති රීතිවලට යටත් වේ. තෑගෑ මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
ජයග්‍රාහී ලොතරැයි පත් වලංගු වන්නේ දිනුම් අදින දින සිට මාස 6 ක කාල සීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන: 011 2324324, 011 4607000
වෙබ් අඩවිය: www.nlb.lk

දිනුම් වාරය - 4239 නිල ප්‍රතිඵල — මහජන සම්පත

දිනය: 2020-09-08

ජයග්‍රාහී අක්ෂරය: H | ජයග්‍රාහී අංක: 9 0 3 6 1 1

තෑගෑ රටාව - අග සිට මුලට

			ජයග්‍රාහකයන් ගණන
1 වැනි තෑගෑය	9 0 3 6 1 1	රු. 2,000,000/-	01
2 වැනි තෑගෑය	0 3 6 1 1	රු. 100,000/-	11
3 වැනි තෑගෑය	3 6 1 1	රු. 10,000/-	107
4 වැනි තෑගෑය	6 1 1	රු. 1,000/-	1,058
5 වැනි තෑගෑය	1 1	රු. 100/-	10,680
6 වැනි තෑගෑය	1	රු. 20/-	105,629

තෑගෑ රටාව - මුල සිට අගට

			ජයග්‍රාහකයන් ගණන
7 වැනි තෑගෑය	9 0 3 6 1	රු. 10,000/-	12
8 වැනි තෑගෑය	9 0 3 6	රු. 1,000/-	103
9 වැනි තෑගෑය	9 0 3	රු. 100/-	1,081
10 වැනි තෑගෑය	9 0	රු. 50/-	10,551
11 වැනි තෑගෑය	H	රු. 20/-	42,282

දිනා ඇති මුළු තෑගෑ මුදල - රු. 10,112,870.00

රුපියල් ලක්ෂ 5 හෝ ඊට වැඩි තෑගෑ රජයේ බදු නීති රීතිවලට යටත් වේ. තෑගෑ මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්යය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගුවන්නේ දිනුම් අදින දින සිට මාස 06ක කාල සීමාවකට පමණි.

මීළඟ දිනුම් වාරයේ සුපිරි තෑගෑය රු.33,447,342.00

ජීවිතයේ සිහිනයට - වාසනාවේ ආශීර්වාදය

ජාතික ලොතරැයි මණ්ඩලය
32, දේශමාන්‍ය N. W. J. මුදලිගේ මාවත, කොළඹ - 01
දුරකථන: 011-4607000, 011-2324324. Fax: 011-4669416.
www.nlb.lk

ගොවි සෙත නිල ප්‍රතිඵල

දිනුම් වාරය 2534 | දිනුම් අදින ලද දිනය 2020.09.08

ඉංග්‍රීසි අක්ෂරය: O | ජයග්‍රාහී අංක: 13 32 39 68

	සංයෝගය	තෑගි මුදල	ජයග්‍රාහකයන් ගණන
1 තෑගෑය	අංක 4 ම නිවැරදි	රු. 1,000,000.00	01
2 තෑගෑය	ඉංග්‍රීසි අකුර සමඟ අංක 3 ක් නිවැරදි	රු. 100,000.00	10
3 තෑගෑය	අංක 3 ක් පමණක් නිවැරදි	රු. 2,000.00	180
4 තෑගෑය	ඉංග්‍රීසි අකුර සමඟ අංක 2 ක් නිවැරදි	රු. 1,000.00	414
5 තෑගෑය	අංක 2 ක් පමණක් නිවැරදි	රු. 100.00	10083
6 තෑගෑය	ඉංග්‍රීසි අකුර සමඟ අංක 1 ක් නිවැරදි	රු. 40.00	6664
7 තෑගෑය	අංක 1 ක් පමණක් නිවැරදි	රු. 20.00	166225
8 තෑගෑය	ඉංග්‍රීසි අකුර පමණක් නිවැරදි	රු. 20.00	30535

මෙම දිනුම් වාරයේ බිහි වූ ජයග්‍රාහකයන් ගණන 214,112

මෙවර දිනා ඇති මුළු තෑගි මුදල රු. 7,984,060.00

ලබන දිනුම් වාරයේ සුපිරි තෑගෑය රු. 63,784,640.80

ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාල සීමාවකට පමණි. රුපියල් ලක්ෂ 05 සහ ඊට වැඩි තෑගෑ රයේ බදු නීති වලට යටත්වේ. තෑගෑ මුදල් ලබා ගැනීමේ දී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යයේ.

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
නො. 32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන : 0114 607 000, 0112 324 324
ෆැක්ස් : 0114 663 416 වෙබ් : www.nlb.lk

ධන නිධානය නිල ප්‍රතිඵල

දිනය - 2020/09/08

දිනුම් වාරය - 313

ඉංග්‍රීසි අක්ෂරය: O | ජයග්‍රාහී අංක: 25 40 42 44

	සංයෝග	තෑගි	ජයග්‍රාහකයන් ගණන
1 තෑගෑය	අංක 04 ගැළපේ නම්	රු. 1,000,000.00	-
2 තෑගෑය	අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	රු. 100,000.00	01
3 තෑගෑය	අංක 3 ක් ගැළපේ නම්	රු. 3,000.00	56
4 තෑගෑය	අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	රු. 1,000.00	137
5 තෑගෑය	අංක 2 ක් ගැළපේ නම්	රු. 100.00	3,502
6 තෑගෑය	අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	රු. 60.00	2,392
7 තෑගෑය	අංක 1 ක් ගැළපේ නම්	රු. 20.00	59,692
8 තෑගෑය	ඉංග්‍රීසි අකුර පමණක් ගැළපේ නම්	රු. 20.00	11,085

දිනා ඇති මුළු තෑගෑ මුදල රු. 2,314,260.00
බිහිවූ මුළු ජයග්‍රාහකයන් ගණන 76,865

මීළඟ වාරයේ සුපිරි තෑගෑය 116,281,987.84

- රු. ලක්ෂ 5 හෝ ඊට වැඩි තෑගෑ රජයේ බදු නීතිරීතිවලට යටත් වේ.
- තෑගෑ මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාලසීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
ඇක 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ.මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන 011 460 7000 011 232 4324

සහන පැකේජයෙන් ආර්ථිකය නව දිශානතියකට යොමු වෙලා

සෞභාග්‍යයේ ඉදිරි දැක්මට විපක්ෂයේ සහාය දෙන්න

වෙළෙඳ ඇමැති, ආචාර්ය **බන්දුල ගුණවර්ධන**

පාර්ලිමේන්තුව

ස්වර්ණා විජේකෝන්, නුවන් කොඩිකාර සහ මහින්ද අලුත්ගෙදර

ආයෝජන ප්‍රවර්ධන බදු සහන පැකේජය සහ පෞද්ගලික අංශයට දුන් විශාල දිරිගැන්වීම් හේතුවෙන් පසුබෑමට ලක්ව තිබූ ආර්ථිකය නව දිශානතියකට ගමන් කරමින් තිබෙන බව වෙළෙඳ ඇමැති, ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා පාර්ලිමේන්තුවේ දී ඊයේ (09) පැවැසීය.

ඒ අනුව සෞභාග්‍යයේ ඉදිරිදැක්ම වැඩපිළිවෙළ ජාතික වැඩපිළිවෙළක් ලෙස සලකා එය ක්‍රියාත්මක කිරීමට සහාය දෙන්නැයි විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් හෙතෙම ඉල්ලා සිටියේය.

ශ්‍රී ලංකාවේ නිදහසින් පසුව විචක්ෂණශීලී රාජ්‍ය මූල්‍ය කළමනාකරණයක් පැවතියේ මහින්ද රාජපක්ෂ මහතාගේ පාලන සමයේ දී බව පෙන්වාදුන් ඒ මහතා එම කාලයේ දී රජයේ ආදායම පහළ මට්ටමක පැවතිය ද වියදම් නිසි ලෙස කළමනාකරණය කොට ආර්ථික වර්ධනය ඉහළ නංවා ගැනීමට සමත් වූ බවද පෙන්වා දුන්නේය.

වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා විසින් සෙංකෝලය තැන්පත් කිරීමෙන් අනතුරුව කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් ඊයේ (09) පස්වරු 1.00 ට පාර්ලිමේන්තුව රැස්විය. දිනට නියමිත යෝජනා, නිවේදන දැනුම්දීමෙන් පසු දිනට නියමිත කටයුතු ආරම්භ විය.

නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමයන් නමයක් සහ සුරාබදු ආඥා පනත (52 අධිකාරය) යටතේ නිවේදන දහයක් සම්බන්ධයෙන් වූ විවාදය ආරම්භ විය.

වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා - මුදල් සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම පාර්ලිමේන්තුවට පැවරෙනවා. ආදායම, වියදම, දේශීය හා විදේශීය වශයෙන් ණය ගැනීම ආදිය වශයෙන් අපිට වගකීමක් තිබෙනවා. දිගු කාලීන ඉතිහාසය තුළ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය තුළ රජයට සියයට 85 ටත් වඩා බදු මඟින් ආදායම් ලැබෙනවා.

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල මඟින් ආදායම් ලැබෙනවා. රජයේ ආදායමට වඩා වියදම් හැම අවස්ථාවකම වැඩි වෙනවා. වියදමේ ප්‍රතිඵලය වියදම දරණ කාලයට පමණක් නොව නැවත නැවතත් රාජ්‍ය සේවක වැටුප්, රාජ්‍ය ණය පොලිය, සහනාධාර ආදිය වෙනුවෙන් වියදම් වැය වෙනවා. මේ නිසා රාජ්‍ය අයවැයේ වර්තන ගිණුමේ හැම අවස්ථාවකම හිඟයක් තිබෙනවා. දේශීය හා විදේශීය වශයෙන් ණය අරගෙන තමයි අතිරික්ත වියදම් දරන්නේ. දිනකට එදිනෙදා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් බිලියන 8ක් වැය වෙනවා. පසුගිය වසරේ එක් දිනක් වෙනුවෙන් බිලියන පහක ආදායමක් ලැබෙන විට බිලියන අටක් වියදම් වෙනවා. බිලියන තුනක් මදි එක් දිනකට.

ගෝඨාභය රාජපක්ෂ මහතා පත්වීමෙන් පසුව බදු අවම කිරීම නිසා විපක්ෂය විශාල වශයෙන් චෝදනා එල්ල කරනවා. එය අසාධාරණයි. අධික ලෙක බදු අයකරන්න බැහැ. අපේ රටේ ඉතිහාසය ගත්විට 1977 විවෘත ආර්ථිකය හඳුන්වා දීමෙන් පසුව රජයේ ආදායම සියයට 28.9ක් වුණා. බිලියන 41.5ක් වියදම් කළා. අයවැය පරතරය බිලියන 12.5ක් වුණා. දිගු කාලීන ආවෘත්ත ආර්ථිකය විවෘය කිරීමත් සමඟ සියයට 8ක ආරථික වර්ධනයක් තිබුණා. 1979 වසරේ දී සියයට 1.6 ක් අයවැය පරතරය වුණා.

නමුත් මහින්ද රාජපක්ෂ යුගයේ දී රජයේ ආදායම අඩුවුණ බව ඇත්ත. පුරා වසර ගණනක් යුද්ධය පැවතිලා, සම්පූර්ණයෙන් වෙළෙඳපළ විකෘති වෙලා තිබුණු රටක් යුද්ධය නිම කළ පසුව ගොවියන්, ව්‍යාපාරිකයන්ට බදු සහන දෙන්න වෙනවා. යුද්ධය නිම වූ පසුව විශාල සහන දෙන්නත් වෙනවා. ඒ නිසා මහින්ද රාජපක්ෂ රජය සමයේ ව්‍යාපාර නැඟිටින්න පටන් ගත්තා. බදු සහන දුන්නා. ලංකාවේ නිදහසින් පසුව විචක්ෂණශීලී රාජ්‍ය මූල්‍ය කළමනාකරණයක් තිබුණේ මහින්ද රාජපක්ෂ පාලන සමයේදී. අපේ කාලයේ දී ආදායම අඩුවුණත් වියදම නිසි ලෙස කළමනාකරණය කොට ආර්ථික වර්ධනය ඉහළ නංවාගෙන තිබෙනවා.

පසුගිය රජය විසින් බදු වැඩි කළත් ආර්ථිකය වර්ධනය වුණේ සියයට 3.6කින්. 2018 දී 3.5යි ආදායම 1.7 වියදම. 2019 ආදායම 12.6 වියදම 18.9යි. නිදහසින් පසුව කිසිම ආණ්ඩුවක් යටතේ අඛණ්ඩව ආර්ථික වර්ධනය පහත වැටුණු ඉතිහාසයක් ලංකාවේ නැහැ. එහෙම කිසිදා වෙලා නැහැ. නමුත් 2011 වසරේ සිට 2014 දක්වා ආර්ථිකය වර්ධනය සියයට 7.4යි. නමුත් යහපාලන රජය සමයේ ආර්ථික වර්ධනය 2019 දී සියයට 2.3ක් වුණා. ලංකාවේ කිසිම රජයක් යටතේ අඛණ්ඩව ආර්ථිකය කඩා වැටීමක් වෙලා තිබෙන්නේ යහපාලන ආණ්ඩුව සමයේදී වෙනවා. ඒක පුද්ගල ආදායම 2014 දී 3819ක් වුණා. නමුත් 2005 දී ඩොලර් 1242ක් වුණා. වසර 66ක් තුළ ලංකාවේ ඒක පුද්ගල ආදායම ඩොලර් 1000 ට අඩු වුණා. 2005දී 1242ක් වුණා. නමුත් වසර පහකට පසුව 3852ක් වුණේ ඩොලර් 33කින් වසර පහක් දී ඒක පුද්ගල ආදායම වැඩි වී තිබෙනවා.

යුද්ධය නිමකර රට වැඩබිමක් බවට පත්වීමේ ප්‍රතිඵලයක් ලෙස ඒක පුද්ගල ආදායම 2000 ට වැඩි ප්‍රමාණයකින් පසුගිය කාලයේ වැඩිවුණත් යහපාලන සමයේ වැඩි වුණේ ඩොලර් 33කින් පමණයි. 2005 දී ඩොලර් බිලියන 24ක් වූ ලංකාවේ දේශීය නිෂ්පාදනය 2015 ආණ්ඩුව බාර දෙන විට ඩොලර් බිලියන 80ක් පමණ වුණා. නමුත් පසු- ගි ය 2019 වනවිට වැඩිවී තිබෙන්නේ ඩොලර් බිලියන 4කින් පමණයි. විරැකියාව ද මහින්ද රාජපක්ෂ මහතාගේ සමයේ දී සියයට 4.7 දක්වා පහත වැටී තිබෙන නමුත් 2019 වන විට සියයට 4.8 දක්වා ඉහළ ගියා. ණය පොලී අනුපාතය තනි ඉලක්කමේ පැවැතියා මහින්ද රාජපක්ෂ සමයේ දී. නමුත් ණය පොලී අනුපාතය පසුගිය කාලයේ ශීඝ්‍රයෙන් ඉහළ ගියා. සෘජු විදේශ ආයෝජන 2014 වනවිට ඩොලර් බිලියන 893.6ක් වුණා. රට වැටෙමින් තිබිය දී පාස්කු ප්‍රහාර එල්ල වුණා. සංචාරකයන් පැමිණීම නැවතුණා. නමුත් දැන් ලෝකයේ විශාලම විනාශය කොවිඩ් නිසා සිදුව තිබෙනවා. රැකියා තොග වශයෙන් නැති වෙනවා. ඇමෙරිකාවේ පමණක් ලක්ෂ 46කට රැකියා අහිමිව තිබෙනවා.

ඉන්දියාව විශාල වශයෙන් පීඩාවට පත්ව තිබෙනවා. මේ වසංගත තත්ත්වය තුළ වුවද වත්මන් රජය යටතේ ජනතාවට සහන සැලසීම වෙනුවෙන් ප්‍රධාන ක්‍රියාමාර්ග දෙකක් ගත්තා. බදු සහන පැකේජයක් දුන්නා. ණය සහන පැකේජයක් දුන්නා. පසුගිය කාලයේ රට කඩා වැටී තිබුණ නිසා මිනිසුන්ගේ දේපළ සින්න වෙමින් තිබුණා. මිනිසුන්ට හුස්ම ගන්න නොහැකි තත්ත්වයක් තිබුණා. ඒ වෙනුවෙන් බදු සහන පැකේජයක් දුන්නා. බද්දක් ගන්න නම් ව්‍යාපාරයක් තිබෙන්න ඕන. ඒ නිසා බදු සහන දීලා රජයේ ආදායම අවම කරගත්තා කියන චෝදනා ප්‍රතික්ෂේප කරනවා. හැම බදු සහනයක්ම දීලා තිබෙන්නේ ජනතාව සහ ව්‍යාපාරිකයන් ආරක්ෂා කර ගන්නයි. 160000 ට රජයේ රැකියා දෙන්න මේ වනවිට පියවර ගෙන තිබෙනවා. කිසිදු භේදයකින් තොරව රැකියා දෙනවා. සාමාන්‍ය පෙළ අසමත්, අඩු ආදායම්ලාභී පවුල්වල අය රජයේ සේවය සඳහා බඳවා ගන්නවා. මේ අමාරු ඉලක්කටය සපුරා ගන්න රජය පියවර ගෙන තිබෙනවා.

ණය පොලිය අවමකර තිබෙනවා. සියදිවි නසාගත් අයට එවැනි තත්ත්වයක් නොවන්න ණය පොලිය සියයට 7දක්වා අවම කොට ලබන අයවැයේ දී විශාල බදු සහන පැකේජය හා දිරි ගැන්වීම තුළ නිෂ්පාදනය වැඩිකරන නව දිශානතියකට රට ගමන් කරන වැඩපිළිවෙළකට සහාය දෙන්න කියා ඉල්ලනවා.

කොළඹ දිස්ත්‍රික් මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා (ස.ජ.බ) - අපි පසුගිය පාර්ලිමේන්තු සැසියේ දී තර්ක කළා අගෝස්තු මාසයේ 31 වන තෙක් රජය මුදල් වැය කළේ කෙසේ ද යන්න හා ඒ පිළිබඳ නීතිමය තත්ත්වය විමසා සිටියා. මුදල් සම්බන්ධයෙන් සම්පූර්ණ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවටයි. මේ පාර්ලිමේන්තුවෙන් සම්මත කරගත් පසුව මුදල් ඇමැතිවරයා අත්සන් කළ පසුව ලේකම්වරයාට වියදම් කිරීමේ හැකියාව තිබෙනවා. නමුත් මාර්තු මාසයේ 31 සිට අගෝස්තු මාසය දක්වා මුදල් වියදම් කරන්න මේ පාර්ලිමේන්තුව අනුමැතියක් දී නැහැ. ඒ නිසා වියදම් කරන්නේ කොහොමද,

වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා - විසර්ජන පනතක් ඉදිරිපත් නොකළ අවස්ථාවක ජනාධිපතිවරයාට පැවරෙන බලතල අනුව ජනාධිපතිවරයා වොරන්ට් එකට අත්සන් කර තිබෙනවා.

කොළඹ දිස්ත්‍රික් මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා (ස.ජ.බ) - නමුත් කොමිසන් සභාවක් සම්බන්ධයෙන් තමයි මෙහිදී කියන්නේ. මේ සභාවට තමයි සම්පූර්ණ බලය තිබෙන්නේ. ජනතාවගේ සල්ලි අපි වියදම් කරන්නේ. එය ජනාධිපතිට අවශ්‍ය පරිදි කරන්න බැහැ. එහෙමනම් කොහොමද භාණ්ඩාගාර ලේකම් මේ මුදල් වියදම් කරන්නේ. එසේ නම් මුදල් ඇමැතිවරයා අත්සන් කළ වොරන්ට් බලපත්‍රය කෝ. අද හෝ හෙට ඉදිරිපත් කරන්න. අපි නියෝජනය කරන්නේ මේ රටේ මහජනතාවයි. ජනාධිපතිට ඒ වොරන්ට් එකට අත්සන් කරන්න පුළුවන් කියා ව්‍යවස්ථාවේ සඳහන්කර නැහැ.

ඒ නිසා පසුගිය මාස හතර සඳහා මේ වොරන්ට් එකට අත්සන් කරන්න කියා ඉල්ලනවා. රට සංවර්ධනය වුණා නම් දුප්පත් මිනිසුන් ඉන්න විදියක් නැහැ. උතුරු හා නැගෙනහිර පළාත් ශීඝ්‍රයෙන් සංවර්ධනය වුණා. 2013 දී සියයට 3.0 ට ආර්ථික වර්ධනය කඩා වැටුණා. 1950 වසරේ සිට ප්‍රාථමික ශේෂය පහත වැටී තිබෙනවා. 1992 වසරේ දී අතිරික්තයක් තිබෙනවා. නමුත් වසර කිහිපයක අතිරික්ත තිබිලා තියෙනවා.

මේ වසරේ සිදුව තිබෙන්නේ කුමක්ද ? පසුගිය වසර පහටම ණය ප්‍රමාණය වැඩිවෙලා තිබෙනවා රුපියල් බිලියන 5,500 කින්. මේ වසර මුල් භාගයේ දී ණය ප්‍රමාණය රුපියල් බිලියන 13031ක් වෙනවා. ජූනි මාසය වනවිට මෙරට සම්පූර්ණ ණය ප්‍රමාණය රුපියල් බිලියන 14,052 ක් වෙනවා.

වරාය හා නාවික ඇමැති රෝහිත අබේගුණවර්ධන මහතා - පසුගිය කාලයේ වරාය වසාගෙන සිටීම නිසා පාඩුව මිලියන ගණනක් වෙනවා. අපි 2014 වසරේ දී බහාලුම් මිලියන දෙකක් මෙහෙයුම් කරනවා. පසුව වාර්ෂිකව බහාලුම් අඩු වෙනවා. එක එක ඇමැතිවරයාගේ තමන්ට රිසි පරිදි නොවන විට තමන් ගන්නා තීන්දු තීරණ කෙතරම් බලපා තිබෙනවා ද කියා පැහැදිලි වෙනවා. ඒ ගත් තීන්දු තීරණ ගැන අපි ජනතාව දැනුවත් කරනවා.

(නියෝජ්‍ය කාරක සභා සභාපති අංගජන් රාමනාදන් මහතා මුලසුනට පැමිණියේය)

පුත්තලම දිස්ත්‍රික් මන්ත්‍රී නිරෝෂන් පෙරේරා මහතා (ස.ජ.බ) - අද වන විට අපේ රටේ සංචාරක කර්මාන්තය, විදෙස් රටවල සේවය කරන සේවකයන්ගෙන් එන ආදායම විශාල වශයෙන් අභියෝගයට ලක්ව තිබෙන අවස්ථාවක අතීතය ගැන පමණක් කතා නොකර අනාගත අභියෝග සම්බන්ධයෙන් ද සිතා බැලිය යුතු වෙනවා.

බදුල්ල දිස්ත්‍රික් මන්ත්‍රී චාමර සම්පත් දසනායක මහතා (ශ්‍රී.පො.පෙ) - මේ වන විට බැංකුවලට, අනෙකුත් සමාගම්වලට ප්‍රශ්න තිබෙනවා. වාහන ආයනයනය කර තවදුරටත් වෙනත් රටවලට මුදල් යෙදවීම සම්බන්ධයෙන් අපි සිතා බැලිය යුතු වෙනවා. අපේ ජනාධිපතිවරයා රට ගොඩනඟන්න විශාල උත්සාහයක් ගන්නවා. විවිධ ව්‍යසන ලෝකයට පැමිණෙනවා. අපේ රටේ සම්පත් විදේශයන්ට දීම ටිකෙන් ටික අවම කළයුතු වෙනවා. පැල්වත්ත සීනි සමාගම අද වන විට ලාභ ලබන තත්ත්වයට පැමිණ තිබෙනවා. එය මොණරාගල දිස්ත්‍රික්කයට, රටේ ආර්ථිකයට විශාල ශක්තියක් වී තිබෙනවා.

කළුතර දිස්ත්‍රික් මන්ත්‍රී රාජිත සේනාරත්න මහතා (ස.ජ.බ) - පැණි බීම තමයි බෝ නොවන රෝගවලට ප්‍රධාන හේතුව. මේ නිසා අපි බදු නියම කළා. ඒ වනවිට පළතුරු බීම නිෂ්පාදිකයන්ට යම් පිටිවහලක් දෙන්න කිව්වා. ඒ අනුව අපි පැණි බීමවලට සීනි ග්‍රෑමයකට ශත 50 ක් බදු අයකළා. ඇතැම් සමාගම්වලට සීනි රහිත පැණි බීම නිපදවන්න සිදුවුණා.

කොළඹ දිස්ත්‍රික් මන්ත්‍රී ප්‍රේම්නාත් සී දොළවත්ත මහතා (ශ්‍රී.පො.පෙ) - 2014 අපේ ආර්ථික වර්ධනය සියයට 5ක්ව තිබුණ විට අද වන විට සියයට 3ක් පමණ වෙනවා. මේ වසර පහක කාලයේ දී ඒක පුද්ගල ආදායමේ වර්ධනය ඩොලර් 300ක් පමණ වෙනවා. නමුත් වක්‍ර බදු අයකිරීම විශාල වශයෙන් ඉහළ ගොස් තිබෙනවා. 2014 වසරේ පැවැති විදේශ සංචිත ප්‍රමාණය පසුගිය වසර පහක කාලයේ දී විශාල වශයෙන් පහත වැටී තිබෙනවා.

පත්කළ මන්ත්‍රී මහාචාර්ය රංජිත් බණ්ඩාර මහතා (ශ්‍රී.පො.පෙ) - ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා බාර දුන් ආර්ථිකය නොවෙයි අපිට 2019 වසරේ දී ලැබුණේ. අපි කතාකරන ආර්ථික පසුබෑම අපි විසින් කළ දෙයක් මෙන් කතා කරනවා. පසුගිය කාලය තුළ මේ රටේ ලක්ෂ 5කට ආසන්න තරුණ තරුණියන් රැකියා නොමැතිව ඉන්නවා. විශ්ව විද්‍යාලවලින් එළියට පැමිණි 60000ක් පමණ රැකියා නොමැතිව ඉන්නවා. මේ ගැටලුවට කඩිනම් විසඳුම් දෙන්න ජනාධිපතිවරයා පියවර ගෙන තිබෙනවා.

රත්නපුර දිස්ත්‍රික් මන්ත්‍රී හේෂා විතානගේ මහතා (ස.ජ.බ) - රාජ්‍ය ආදායම වැඩි නොකර රටක ජාතික ආර්ථිකය නඟා සිටුවන්න බැහැ. ආර්ථික වශයෙන් මේ රට ගොඩගන්න පුළුවන් කියන කාරණයේ දී ගතයුතු පියවරයන් තිබෙනවා. අද මේ රටට මහා බරක් වුණු සූරියවැව ක්‍රීඩාංගණය අපිට සම්පතක්ද. එවැනි ව්‍යාපෘති නිසා තමයි අපි සිරවී තිබෙන්නේ. හම්බන්තොට සම්මන්ත්‍රණ ශාලාව, මත්තල ගුවන් තොටුපළ ආදිය නිසා විශාල වශයෙන් ණය ගන්න සිදුව තිබෙනවා. අද වන විට 20 සංශෝධනය කරළියට පැමිණ තිබෙනවා. මේ දිනවල උපාධිධාරීන්ට රැකියා දෙනවා. එය ඉතාම හොඳයි. ඔවුන්ගේ පත්වීම සහ අනාගතයේ සිදුවන්නේ කුමක් ද කියා අපෙන් අහනවා.

නුවරඑළිය දිස්ත්‍රික් මන්ත්‍රී එස්. රාධාක්‍රිෂ්ණන් මහතා (ස.ජ.බ) - බදු පැනවීම සාමාන්‍ය ජනතාවට කොරතම් බරක් ද කියා අපි දන්නවා. විශාල ආදායම් තිබෙන අයට බදු වැඩිකරනවා කියමින් සාමාන්‍ය ජනතාවට බදු පටවා තිබෙනවා. අද වනවිට බඩුමිල ඉහළ ගොස් තිබෙනවා. සල්ලි තියෙන අයගෙන් තමයි බදු අයකරන්න ඕන. දුප්පත් අයගෙන් බදු අයකිරීමෙන් ඔවුන් තවදුරටත් පීඩාවට පත්වෙනවා. නුවරඑළිය දිස්ත්‍රික්කයේ වැවිලි අංශයේ ජනතාවගේ ආදායම් තත්ත්වය පහත වැටී තිබෙනවා. කොරෝනා තත්ත්වය තුළ ලෝක ආර්ථිකය කඩා වැටීමකට ලක්ව තිබෙනවා. කෘෂිකර්මාන්තය කරගෙන යන්න අවශ්‍ය පරිදි පොහොර ලැබෙන්නේ නැහැ. ඒ නිසා ජනතාවගේ ආදායම් තත්ත්වය ඉහළ නැංවිය යුතු වෙනවා.

(හම්බන්තොට දිස්ත්‍රික් මන්ත්‍රී අජිත් රාජපක්ෂ මහතා මුලසුනට පැමිණියේය)

පුත්තලම දිස්ත්‍රික් මන්ත්‍රී අශෝක ප්‍රියන්ත මහතා (ශ්‍රී.පො.පෙ) - නව වැනි පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225 ම බදු ගෙවන ආදර්ශමත් කණ්ඩායමක් වෙන්න පුළුවන්. කැමැත්තෙන් බදු ගෙවන රටක් නිර්මාණය කරන්න අපිට පුළුවන්. නෝර්වේ රාජ්‍යය කැමැත්තෙන් බදු ගෙවන රටක්.

බදුල්ල දිස්ත්‍රික් මන්ත්‍රී චමින්ද විජේසිරි මහතා (ස.ජ.බ) - වියදම් අනුමත කිරීමේ දී රාජ්‍ය ගිණුම් කාරක සභාවට ඉදිරිපත් කොට අනුමත කරගෙන නීත්‍යානුලව කරගන්න පාර්ලිමේන්තුව තුළ සිදුවිය යුතු වෙනවා. පනත්, ස්ථාවර නියෝග කුණු කූඩයට දාලා මේ ආණ්ඩුව කටයුතු කරනවා. පිටස්තර පුද්ගලයෙක් දිවුරුම් දිය හැකි ද යන්න සම්බන්ධයෙන් විමසා බැලීමට හෝ අවස්ථාව නොදීම සම්බන්ධයෙන් කනගාටු වෙනවා.

ගම්පහ දිස්ත්‍රික් මන්ත්‍රී හර්ෂණ රාජකරුණා මහතා (ස.ජ.බ) - අද රටේ ජනතාවට ජීවත්වන්නට නොහැකි තත්ත්වයට ආර්ථිකය පිරිහී තිබෙනවා. විදේශ රටවලත් රැකියා කරන්න නොහැකි තත්ත්වයක් තිබෙනවා. අද සංචාරකයින් මෙරටට එන්නේ නැහැ. අද වනවිට ගුවන් තොටුපළ විවෘත කරගන්න නොහැකි තත්ත්වයක් තිබෙනවා. රුපියලේ අගය පාලනයේ දී ගන්නා පියවරක් ලෙස ආනයන නතර කර තිබෙනවා. මෙතන දී රුපියලේ අගය ශක්තිමත් වුණාට විශාල පිරිසක් තමන්ගේ ජීවනෝපාය කරගෙන තිබෙන තත්ත්වය තුළ ගැටලු ඇතිවෙනවා. මෙවැනි අයට යම් සාධාරණයක් ඉටුවන්න ඕන. ප්‍රධාන කර්මාන්ත ශාලා රැසක් මේ වනවිට වැසීගෙන යනවා.

යාපනය දිස්ත්‍රික් මන්ත්‍රී සී.වී. විග්නේෂ්වරන් මහතා (දෙ.ජ.ජා.ස) - දේශීය කර්මාන්ත සඳහා නව පණක් දෙන්න රජය පියවර ගෙන තිබෙනවා. අපි ඒ වෙනුවෙන් සහාය ලබාදෙනවා. ආර්ථික අංශය අපේ රටට අවශ්‍යයි. ස්වංපෝෂිත ආර්ථිකයක් ඇති කරන්න ණය ගෙවා දැමිය යුතු වෙනවා. වී වගාව ප්‍රචලිතව අපි කළා. ඒ ප්‍රදේශයේ සහල් අඩු මිලට දෙන්න පුළුවන් වුණා. නිෂ්පාදන වියදම අවම කළා. නිෂ්පාදනය තුළින් වියදම අවම කළයුතු වෙනවා. නිෂ්පාදනය අවම නිසා තමයි ස්වයං පෝෂිත කරන්න නොහැකි වී තිබෙන්නේ. කොවිඩ් ආසාදනය නිසා අපේ රටේ ආහාර නිෂ්පාදනය බලපෑමක් ඇතිවුණා. අපේ රටේ වැඩියෙන් නිෂ්පාදනය කළයුතු වෙනවා. අගය එකතු කිරීම තුළින් අපේ නිෂ්පාදන අපනයනය කරන්න කටයුතු කළයුතු වෙනවා.

දිගාමඩුල්ල දිස්ත්‍රික් මන්ත්‍රී මොහොමඩ් මහරූෆ් මහතා (ශ්‍රී.ම.කො) - අම්පාරට ඔබ්බෙන් වූ තෙල් නැවේ ඇතිවූ ගින්න නිවා දැමීම සම්බන්ධයෙන් ගුවන් හමුදාවට සහ නාවික හමුදාවට මගේ ප්‍රණාමය පිරිනමනවා. ඒ වගේම කොවිඩ් පාලනය කරන්නට සමත්ව තිබෙන රටක් ලෙස අපේ රට එවැනි ජයග්‍රහණයක් ලබා තිබෙනවා. මේ තත්ත්වයට සියලුදෙනා මුහුණ දියයුතු වෙනවා. පාතාලය, මත්ද්‍රව්‍ය මර්දනය වෙනුවෙන් රජය පියවර ගෙන තිබෙනවා. මේ රටේ ඉතිහාසය ගෙන බලනවිට තමන්ගේ පාලනය ස්ථාවර කර ගන්න සෑම රජයක්ම උත්සාහ කර තිබෙනවා. ජාතීන් අතර සමඟියක් ඇති කරන්න අවධානය යොමු කරන්නේ නැහැ. නව ව්‍යවස්ථාවක් සම්බන්ධයෙන් සංවාදයක් ඇති කරන්න වැඩි කාලයක් වැය වනවා පමණක් නොව වැඩි මුදලක් වැය වෙනවා. නමුත් කාර්යක්ෂම උත්සාහයන් තුළින් අපි රට දියුණු කරන්න පියවර ගතයුතු වෙනවා.

කුරුණෑගල දිස්ත්‍රික් මන්ත්‍රී සමන්ප්‍රිය හේරත් මහතා (ශ්‍රී.පො.පෙ) - අද මේ ලෝකයට බලපා තිබෙන වසංගත තත්ත්වය තුළ ලෝක ආර්ථිකය පහත වැටී තිබෙනවා. අපේ රටද ඒ තත්ත්වයට මුහුණ දෙමින් සිටිනවා. මේ රටට විශාල වශයෙන් විදේශ විනිමය ගේන්නේ විදේශ රටවල රැකියා කරන සේවකයන්. තේ දලු නෙළන කාන්තාවන්. මේ සියලු දෙනා විශාල සේවයක් කරනවා. ඒ සියලු අවස්ථාවන් අහිමිව තිබෙන මොහොතක මේ රට ඉදිරියට ගෙන යන්න ජනාධිපතිවරයා සහ අගමැතිවරයා උත්සාහ ගනිමින් ඉන්නවා. කර්මාන්තවලට අවස්ථාව දීම හේතුවෙන් අපේ රටේ ආර්ථිකය ඉදිරියට ගියා. නීත්‍යනුකූල නොවන වගාවන් අපි ගලවා විසි කරනවා. නමුත් කංසා වැනි වගාවන්ගෙන් අපිට ප්‍රයෝජන ගන්න පුළුවන්. මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න ඕන.

ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය ඇමැති රොෂාන් රණසිංහ මහතා - සෞභාග්‍ය යේ දැක්ම තුළ පොරොන්දු වුණ සහන ඒ ආකාරයෙන් දුන්නා කියන එක අවබෝධ වෙනවා. සියයට 17ක්ව පැවැති බදු සියයට 8 දක්වා පහත හෙළා තිබෙනවා. අවිධිමත් කළමනාකාරිත්වය සහ මහ බැංකුවේ සිදුවූ මංකොල්ලය සහ රුපියලේ අගය දිගින් දිගටම වැටුණා. රුපියල බාල්දුවීම තුළත් අපේ ජනතාව ආර්ථික වශයෙන් අවපාතයකට පත්වුණා. පසුගිය වසර පහක කාලයේ දී අපේ රටේ ණය ප්‍රමාණය විශාල වශයෙන් ඉහළ ගියා. මේ රටට ඔබින විදියට තීන්දු තීරණ අරගෙන වැඩ කරන්න පාර්ලිමේන්තුවට තුනෙන් දෙකක ජනවරමක් දෙන්න රටේ ජනතාව පියවර ගත්තා. රටට අහිතකර ව්‍යවස්ථා සංශෝධන ඉවත් කොට නව අණපනත් ගෙනත් ඉදිරියට යන්න ඒ අනුව අවස්ථාව ලැබී තිබෙනවා. 19 වැනි සංශෝධනය වහලා ගැසීම තුළ මේ රටට සිදුව තිබෙන හානිය ගැන අපි කනගාටු වෙනවා. එදා මෙදා තුර බලයට පැමිණි සෑම ජනාධිපතිවරයෙකුටම වගකීමක් තිබුණා තීන්දු තීරණ ගන්න.

කොළඹ දිස්ත්‍රික් මන්ත්‍රී ප්‍රදීප් උඳුගොඩ මහතා (ශ්‍රී.පො.පෙ) - පසුගිය ආණ්ඩුව සමයේ දී බුද්ධි අංශ කඩා වට්ටලා, ඔවුන් සිරගත කොට රටක ආරක්ෂාව සහතික කරන රණවිරුවිනට පහරදීමේ අවසන් ප්‍රතිඵලය තමයි පාස්කු ප්‍රහාරයට මේ රටේ ජනතාව මුහුණ දෙන්නේ. අපේ රටේ 300 දෙනෙකු අමු අමුවේ ඝාතනය වන්නේ පසුගිය රජයේ අදූරදර්ශී ක්‍රියා පිළිවෙත හේතුවෙන්. ත්‍රස්තවාදීන්ගේ, යන එන තැන්, ප්‍රහාර එල්ල කරන ස්ථාන හා වෙලාව පැහැදිලිව ප්‍රකාශකර තිබිය දී ඒවා ශත පහකට හෝ ගණන් ගත්තේ නැහැ. මේ නිසා ජනතාව දන්නවා දශක තුනකට ආසන්න කාලයක් පැවැති ත්‍රස්තවාදය අවසන් කොට සාමය උදාකරන්න 2009 වසරේ දී හැකිවුණා. ඒ නිසා මේ රටේ පැවැති සෑම අභියෝගයක්ම ජයගන්න කැපවුණු නායකයන් අපේ පක්ෂයේ ඉන්නවා. පසුගිය වසර පහක කාලය තුළ ආන්ඩුව කළ අය බදු ප්‍රත්පත්තිය සම්බන්ධයෙන් කතා කරනවා.

පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය ඇමැති ඩී.බී හේරත් මහතා - රටේ ඉදිරි ගමනට මුදල් උපයා ගැනීම වෙනුවෙන් බදු උපයා ගැනීම අවශ්‍ය වෙනවා. එහිදී ජනතාව පීඩාවට පත් නොකොට ආයෝජනයන් බවට පත්කළ යුතු වෙනවා. මහින්ද රාජපක්ෂ මහතා ආණ්ඩුව බාර ගන්නා විට තිබුණු තත්ත්වයට සාපේක්ෂව විශාල වර්ධනයක් ලඟාකර ගනිමින් තමයි එතුමා ආණ්ඩුව බාරදුන්නේ. බදුබර නොදී රටට හොඳ පාලන ක්‍රමයක් නිර්මාණය කොට රටේ මූල්‍ය ප්‍රතිපත්තිය රටට ගැලපෙන ලෙස මහින්ද රාජපක්ෂ මහතා හැසරවූ ආකාරය අපි දැක්කා. ශක්තිමත් ලෙස ආර්ථිකයට වටිනාකම් එකතු වුණා. පසුගිය කාලයේ අපේ රටට හැම දෙයක්ම ආනයනය කළා. ජාතික සම්පත් විකුණන ක්‍රමවේදයකට ගියා. බහුජාතික සමගම්වලට රටේ පාලනය යටත් වුණාම ජනතාව දුක්ඛිත තත්ත්වයට පත්වුණා. අනාගතය පළිබඳ අවධානමක් පැවැති පසුබිමක හොඳ ජනාධිපතිවරයෙක් පත්කර ගන්න ජනතාව පියවර ගත්තා. තුනෙන් දෙකක පාර්ලිමේන්තුවක් හදන්නත් ජනතා වරම ලබාදුන්නා.

සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන, රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය ඇමැති ශෙහාන් සේමසිංහ මහතා - උපාධිධාරීන් බඳවා ගැනීමේ දී වසරක පුහුණු කාලයකට යටත්ව පත්වීම් ලබා රාජ්‍ය සේවයේ සාමාන්‍ය සේවකයෙකු ලෙස පත්වීම් දෙන බවට ජනාධිපතිතුමා කිවුවා. ඒ අනුව ඔවුන් මේ දිනයේ සිට රාජ්‍ය සේවකයන් වෙනවා. නමුත් අද විපක්ෂය කියනවා ඔවුන්ගේ ඉරණම කුමක් ද කියා. අද මේ මහ පොළොවේ ඉටුවන්නේ ගෝඨාභය රාජපක්ෂ මහතා වෙනුවෙන් ලක්ෂ 69ක් දෙනා දුන් ඡන්දයට අනුව පොරොන්දු ක්‍රියාත්මක කිරීමක්. මුදල් වැය කිරීම සම්බන්ධයෙන් රජය නීත්‍යානුකූල නොවන ලෙස මුදල් වැය කරනවා නියනවා. අපේ රජය බාර ගනිද්දී අතුරු සම්මත ගිණුමකින් මුදල් වෙන්කළේ. නමුත් ජනාධිපතිවරයාට තිබෙන බලය අනුව මුදල් වෙන් කිරීම කළා.

ඒ නිසා ලබන ආදායම්, විදයම් සියල්ල අය වැය ලේඛනයක් ආශ්‍රියෙන් වෙන වෙනම විසර්ජන පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීම සිදුවෙනවා. මේ බදු අඩු කිරීම හරහා රාජ්‍ය ආදායම අඩු වුණා කියන්න කිසිදු සාධකයක් නැහැ. කිසිදු ගෝලීය අභියෝගයකට මුහුණ නොදී සියයට 2.3 දක්වා පසුගිය කාලයේ වැටුණා. ඒ සමඟ තමයි අපි රට බාර ගත්තේ. පසුව තමයි මේ ගෝලීය වසංගතය ඇතිවුණේ. එසේ වුවද මේ රටේ ආර්ථිකය සෘණ ආර්ථිකයක් වෙයි කියා හිතනවා නම් එය වෙන්නේ නැහැ. සෘණ ආර්ථිකයක් වෙන්නේ නැහැ. මුළු ආදායම 2020 වසර දඳහා රුපියල් බිලියන 1500 ක් හා වියදම රුපියල් බිලියන 3085ක් ලෙස ඇස්තමේන්තු ගතකර තිබෙනවා. 2019 වසර තුළත් රජය විසින් කළ වියදම් ද ඇතුළත්ව තිබෙනවා. ඒ වගේම පසුගිය කාලයේ නොගෙවා තිබෙන බිලියන 247.2ක මුදලක් මේ වසරේ ගෙවන්න අපි පියවර ගෙන තිබෙනවා. 2019 වසර වෙද්දි රුපියල් බිලියන 13031 දක්වා අපේ ණය ප්‍රමාණය වැඩි වී තිබෙනවා.

විදේශීය ණය ප්‍රමාණය මෙහිදී වැඩිව තිබෙනවා 2014 වසරේ සියයට 30ක්ව තිබුණත් සියයට 40 ට වැඩි ප්‍රමාණයකින් වැඩිව තිබෙනවා. මේ රටේ දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 80 ට වැඩි ප්‍රමාණයකින් ණය වැඩි වී තිබෙනවා යහපාලන ආණ්ඩුව සමයේ. 2020 වසර සඳහා මේ වනවිට රුපියල් බිලියන 1091ක් ණය වාරික හා පොළිය වශයෙන් රුපියල් බිලියන 951ක් මේ වසරේ දී අපි ගෙවා තිබෙනවා. නමුත් අපි ගෝලීය අර්බුදය හමුවේ මූල්‍ය කළමනාකරණය කර තිබෙනවා. 2019 ජනාධිපතිවරණයෙන් පසුව සපිරි රටක් වැඩසටහන ක්‍රියාත්මක කරන්න පියවර ගෙන තිබෙනවා. මේ රටේ ජනතාව තුළ ක්‍රය ශක්තිය වැඩි කරන්න ඒ තුළින් හැකියාව ලැබී තිබෙනවා. සපිරි ගමක් වැඩසටහන යටතේ ව්‍යාපෘති 36232ක් ක්‍රියාත්මක කර තිබෙනවා. රුපියල් මිලියන 20000 ට වැඩි මුදලක් මේ වෙනුවෙන් වෙන්කර තිබෙනවා. නිතර නිතර බදු ප්‍රතිපත්තිය වෙනස් නොකර ඉදිරියට යන්න අවශ්‍යයි. ආයෝජකයන්ට මේ රටට එන්න හැකි බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරනවා.ඒ අනුව නැවත රට ක්‍රමානුකූලව ගොඩනැඟීම සහ ඉදිරියට යාම සම්බන්ධයෙන් විපක්ෂයට ඊර්ෂ්‍යාවක් තිබෙනවා.

ගම්පහ දිස්ත්‍රික් මන්ත්‍රී කාවින්ද ජයවර්ධන මහතා (ස.ජ.බ) - දැන් පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් පරීක්ෂණ සිදුවෙනවා. මේ අයට පුපුරන ද්‍රව්‍ය, මුදල් ආධාර ලැබුණේ කොහෙන්ද කියා සොයා බලන්න කියා තමයි මම ඉල්ලීමක් කළේ.

පාර්ලිමේන්තුව අද (10) පෙරවරු 10.30 ට යළි රැස්වීමට නියමිතයි.

දේශීය කර්මාන්ත නංවන්න රජයට සහාය දෙනවා

සී.වී. විග්නේශ්වරන් (දෙ.ජ.ජා.ස)

රුපියල ශක්තිමත් වුණාට විරැකියාව ඉහළ ගිහින්

හර්ෂණ රාජකරුණා (ස.ජ.බ)

යහපාලන කාලයේ දී විදේශ ණය ඉහළ ගියා

රාජ්‍ය ඇමැති රොෂාන් රණසිංහ

මුදල් වෙන් කළේ ජනපති බලතල අනුවයි

රාජ්‍ය ඇමැති ශෙහාන් සේමසිංහ

20 ගේන්නේ රටේ යහපතට

● අමාත්‍ය ප්‍රසන්න රණතුංග

විසි වැනි සංශෝධනය ගැන ආණ්ඩුවට එල්ල වන චෝදනා, විසිවන සංශෝධනය සිදු කිරීමට හේතු වූ දහනවයේ අඩුපාඩු? මෙම ව්‍යවස්ථා සංශෝධනය රටේ සෙසු ගැටලුවලට විසඳුමක් ද? සහ ආණ්ඩුවේ නව සැලසුම් පිළිබඳව සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා අදහස් දැක්වූයේ මෙසේ ය.

● ආණ්ඩුවේ ප්‍රධාන අරමුණ වෙලා තියෙන්නේ 20 වැනි සංශෝධනය. මේ වෙලාවේ 20 වැනි සංශෝධනය රටට අවශ්‍ය ද?

20 වැනි සංශෝධනය ගැන කතා කරන්න ඉස්සර අපි 20 වැනි සංශෝධනය ගෙන ඒමට මූල් වූ කාරණා ගැන කතා කරන්න ඕනේ. 20 වැනි සංශෝධනය ගෙන එන්නේ 19 වැනි සංශෝධනය තුළින් රට තුළ හටගත් අවුල් වියවුල් සහගත තත්ත්වය සමනය කරන්නයි. අපි දන්නවා 18 වැනි සංශෝධනය අහෝසි කරලා 19 වැනි සංශෝධනය ගෙන එන්න යහපාලන ආණ්ඩුව කටයුතු කළේ ඇයි කියලා. ඔවුන්ගේ ප්‍රධාන අරමුණ වුණේ රාජපක්ෂවරුන් දේශපාලනයෙන් ඉවත් කොට සඳහටම බලයේ සිටීමයි. ඒ වෙනුවෙන් රටේම, ජාතියේම ඉරණම උගහට තියලා තමයි යහපාලන ලොක්කෝ 19 වැනි සංශෝධනය ගෙනාවේ.

විපක්ෂයටවත් ජනතාවටවත් කතා කරන්න, හදාරන්න ඉඩක් නොතියා කඩිමුඩියේ ගෙනැවිත් සම්මත කරපු 19 වැනි සංශෝධනය නිසා රටට වුණු විනාශය අපි පසුගිය අවුරුදු පහේදී දැක්කා. 19 සම්මත කරපු දවසේ ඉඳලා අපි හිටියේ 19 වැනි සංශෝධනය වහාම ඉවත් කළ යුතුයි කියන මතයේ. පසුගිය ජනාධිපතිවරණයේ දී මෙන්ම මහ මැතිවරණයේදිත් අපි ඒ මතය සෘජුවම ජනතාවට ඉදිරිපත් කළා. ජනාධිපතිවරණයේ දී ලක්ෂ 69කුත් මහ මැතිවරණයේ දී තුනෙන් දෙකක බලයකිනුත් ඒ අදහස සම්මත වෙලා තිබෙනවා. ඒ නිසා අපි 19 වැනි සංශෝධනය ඉවත් කිරීමට 20 වැනි සංශෝධනය ගෙන ඒමට ප්‍රමුඛස්ථානයක් දීලා කටයුතු කරනවා.

● ඔබ සඳහන් කළා 19 වැනි සංශෝධනය ගෙනාවේ රාජපක්ෂ පවුල ඉලක්ක කරගෙන කියලා. නමුත් ස්වාධීන කොමිෂන් සභා, තොරතුරු දැනගැනීමේ පනත වගේ සාධනීය ලක්ෂණත් 19 වැනි සංශෝධනයේ තිබුණා නේද?

මම එදත් කිව්වා අදත් කියනවා 19 ගෙනාවේ රාජපක්ෂ පවුල දේශපාලනයෙන් ඉවත් කිරීම උදෙසා කියලා. මම ඒක කියන්නේ 19 වැනි සංශෝධනය ගැන දැඩි අවධානයකින් හිටපු කෙනෙක් විදියටයි. නිකමට හිතලා බලන්න යහපාලන ආණ්ඩුව තිබුණු ලොකුම දේශපාලන බාධකය තමයි මහින්ද රාජපක්ෂ මහතා. ජනාධිපති ධුරයට දෙවරකට වඩා තරග කරන්න බැහැ කියන යෝජනාව ගෙනාවේ එතුමා ඉලක්ක කරගෙන. ජනාධිපති ධුරයට ඉදිරිපත් විය හැකි වයස් සීමාව සංශෝධනය කළේ නාමල් රාජපක්ෂ මහතා ඉලක්ක කරගෙන. බැසිල් රාජපක්ෂ මහතා ඉලක්ක කරගෙන ගෙනාවා ද්විත්ව පුරවැසියන්ට මැතිවරණවලට ඉදිරිපත් වෙන්න බැහැ කියලා වගන්තියක්. මේවා දිහා බැලුවම පැහැදිලියි 19 වැනි සංශෝධනය ගෙනාවේ මොකටද කියලා.

දැන් බලන්න 19 වැනි සංශෝධනයෙන් ස්ථාපිත කරපු ස්වාධීන යැයි කියන කොමිෂන් සභා ගැන මම මේ රටේ ජනතාවට අමුතුවෙන් කියන්න ඕනේ නැහැ.

අල්ලස් කොමිසම වගේ කොමිෂන් යහපාලන ආණ්ඩුවේ අල්ලේ නැටව්විව හැටි ජනතාව දන්නවා. දඩයම් සභා පිහිටුවාගෙන දේශපාලන විරුද්ධවාදීන් දඩයම් කරපු හැටි අපට අමතක නැහැ. අපි 20 වැනි සංශෝධනය ගේන්නේ රටේ සුබසිද්ධිය උදෙසා මිසක් වෙන හේතුවකට නෙමෙයි.

20 වැනි සංශෝධනය වේවා වෙනත් ඕනෑම නීතියක් වේවා අපි ගේන්නේ ජනතාවගේ කැමැත්ත මතයි. යහපාලන ආණ්ඩුව කළා වගේ කොළේ වහලා ගහන්න අපට ඕනෑකමක් නැහැ.

● ඔබ මොනවා කිව්වත් 20 වැනි සංශෝධනයට විරුද්ධ පක්ෂය දැඩි විරෝධයක් එල්ල කරමින් ඉන්නවා. 20 තුළින් ප්‍රජාතන්ත්‍රවාදය වළපල්ලට යනවා කියලා තමයි ඒ අය චෝදනා කරන්නේ?

අද විරුද්ධ පක්ෂය කියලා හඳුන්වා ගන්න සියලුදෙනාම එදා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය පාගා දමන්න කටයුතු කරපු යහපාලන ආණ්ඩුවේ කොටස්කාරයෝ කියන එක අපට අමතක කරන්න බැහැ. එක්සත් ජාතික පක්ෂය, සමගි බලවේගය, දෙමළ ජාතික සන්ධානය, ජනතා විමුක්ති පෙරමුණ කියලා පක්ෂවලට බෙදිලා හිටියට මේ සියලුදෙනා එදා නියෝජනය කළේ යහපාලන ආණ්ඩුවයි. 19 වැනි සංශෝධනය ගෙනාවේ මේ සියලුදෙනා එකතුවෙලයි. ඒ නිසා ඒ අයට සදාචාරාත්මක අයිතියක් නැහැ 20ට විරුද්ධ වෙන්න. ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරන්න කටයුතු කරපු කණ්ඩායමක් එකතු වෙලා ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කඳුළු හෙළීම තරම් තවත් විහිළුවක් නැහැ.

● ආණ්ඩුව 20 වැනි සංශෝධනයේම එල්ලීගෙන ඉන්නවා මිසක් රටේ පැවැත්ම වෙනුවෙන් කිසිම දෙයක් කරන්නේ නැහැ කියලත් චෝදනාවක් තියෙනවා?

මේ රටේ විරුද්ධ පක්ෂය හිතාගෙන ඉන්නේ විරුද්ධ පක්ෂයේ රාජකාරිය හැම එකටම විරුද්ධ වෙන එක කියලයි. ගෝඨාභය රාජපක්ෂ මහත්තයා ජනාධිපති ධුරයට පත්වෙලා තවම වසරක් පිරිලත් නැහැ. හැබැයි මේ කාලය තුළ විශාල වැඩකොටසක් එතුමා රට වෙනුවෙන් ඉටුකරලා තිබෙනවා. කොවිඩ් වසංගතයට අපේ රට මුහුණ දුන්නු ආකාරය වගේම එම අභියෝගය ජයග්‍රහණය කරපු ආකාරයත් අද ලෝකයේ සියලු රටවලට ආදර්ශයක් බවට පත්වෙලා තිබෙනවා.

19 අඩුපාඩු නිවැරදි වෙන්න ඕනෑ

● හිටපු ඇමැති වජිර අබේවර්ධන

විසිවන සංශෝධනය පිළිබඳව සමාජයේ ඇතිව ඇති කතා බහ, එම සංශෝධනය කෙරෙහි එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිචාරය කුමක්ද සහ පසුගිය මහ මැතිවරණයෙන් පසු එම පක්ෂය මුහුණ දී ඇති ගැටලු පිළිබඳව එක්සත් ජාතික පක්ෂයේ ජ්‍යෙෂ්ඨයකු සහ හිටපු ඇමැතිවරයකු වන වජිර අබේවර්ධන මහතා සමඟ කළ සංවාදයකි.

● විසිවන සංශෝධනය ගැන මේ වන විට ආණ්ඩු පක්ෂය සහ විපක්ෂයේ පක්ෂ ප්‍රතිචාර දක්වනවා 1978 ව්‍යවස්ථාව නිර්මාණය කළ පක්ෂය නියෝජනය කරන කෙනෙකු ලෙස 20 වන සංශෝධනය ගැන ඔබේ අදහස කුමක් ද?

1978 දී තමයි ඒ ආර් ජයවර්ධන මහතා ඇතුළු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව දෙවන ජනරජ ව්‍යවස්ථාව ඇති කළේ. එදා මේ ව්‍යවස්ථාවට එරෙහිව ප්‍රබලම විරෝධය පළ කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු විපක්ෂයේ දේශපාලන පක්ෂයි. එතැන් සිට මේ ව්‍යවස්ථාවට විරුද්ධව විවිධ අදහස් මතු වුණා මතවාද ඇති වුණා. 1991 දී දෝෂාභියෝගයක් මඟින් එවක සිටි ජනපති වූ ප්‍රේමදාස මහතාට විරුද්ධව අභියෝගයක් ආවා. ඒ අභියෝගය විධායක බලය නිසා පරාජය වුණා. 1994 දී 1978 ව්‍යවස්ථාව වෙනස් කරන බවට ලොකු මතයක් රටේ ඇති වුණා. එදා බලය ගත් චන්ද්‍රිකා ජනාධිපතිනිය නව ව්‍යවස්ථාවක් ඇති කරන බවට පොරොන්දු වුණා. ඒත් අලුත් ව්‍යවස්ථාවක් ඇති කිරීමට හැකියාවක් ලැබුණේ නැහැ.

ජනමත විචාරණයට තුඩු නොදෙන කරුණු රැසක් සහිතව 19 වන සංශෝධනය ඇති කළේ 2015 දී බලයට පත් වූ යහපාලන ආණ්ඩුව විසිනුයි. එදා මේ ව්‍යවස්ථා සංශෝධනයට සරත් විරසේකර මහතා හැර අනෙක් සියලු මන්ත්‍රීවරු ඡන්දය දුන්නා. ඒ නිසා මෙම ව්‍යවස්ථා සංශෝධනය වැරැදි කියල පාර්ලිමේන්තුවට කියන්න බැහැ. එදා අපට හිටියේ මන්ත්‍රීවරු 44 යි. ඒත් එදා 2/3 අභිබවන බහුතරයකින් අපිට මේ ව්‍යස්ථා සංශෝධනය ඇති කිරීමට හැකියාව ලැබුණා.

● එදා විපක්ෂය නියෝජනය කළ, අද ආණ්ඩු පක්ෂය ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධ වෙන්නේ කුමන පදනමකින් ද?

ඒක තමයි: ගැටලුව එදා හොඳ නම් අද නරක් වෙන්නේ කොහොමද කියන එක ප්‍රශ්නයක්. ඒ වගේම එදා ජයවර්ධන ජනාධිපතිතුමා වැරැදියි කියල අද ඉන්න ආණ්ඩු පක්ෂයේ අය අද යළිත් පිළි අරන් තියෙනවා ජයවර්ධන මහතා හරි කියලා. සැප්තැම්බර් මාසයේ දාහත්වනදා ජේ ආර් ජයවර්ධන මහතා ගේ සමරු දිනය නිසා එදාට ආණ්ඩු පක්ෂයේ අයට පුළුවන් මල් කළඹක් අරන් ගිහින් එතුමාට ගරු කරන්න කියලා. 1978 ව්‍යවස්ථාව තුළ තිබුණ දැඩි කොටස් අප 2015 ව්‍යවස්ථා සංශෝධනයෙන් අයින් කළා. ඒ ඉවත් කළ දේවල් ආයේ ගේනවා කියන්නේ ජේ ආර් ජයවර්ධන මහතා නිවැරැදි යි කියන එක.

● එහෙත් ආණ්ඩු පක්ෂය කියන්නේ 2015 , 19 වන සංශෝධනය මඟින් රට අරාජික වූ බවයි. ඒ ගැන ඔබේ අදහස කුමක් ද?

එදා පාර්ලිමේන්තුවේ අති බහුතර ඡන්දයෙන් අනුමත වූ මේ සංශෝධනය හිතුමනාපයට වෙනස් කරනවාට අප විරුද්ධයි. සංශෝධනය කරනවා නම් සියල්ලන් සමඟ සාකච්ඡා කර පොදු මතය විමසා බලා අඩාළ සංශෝධන කළ යුතුයි. ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ පොදු මතය පොදු එකඟතා කියන එකයි. ඒ උසස් මූලධර්මය ආණ්ඩුව විසින් ආරක්ෂා කරයි කියල මම විශ්වාස කරනවා. දහනව වන සංශෝධනය සර්ව සම්පූර්ණ සංශෝධනයක් කියල මම කියන්නේ නැහැ එහිත් අඩුපාඩු තියෙනවා. ඒ අඩුපාඩු නිවැරැදි වෙන්න ඕනෑ. කොමිෂන් සභා ගනිමු ඒ කොමිෂන් සභාවල අඩුපාඩු නිවැරැදි විය යුතු තැන් තියෙනවා කියල මම පෞද්ගලිකව විශ්වාස කරනවා. ඒ ගැන දීර්ඝ කාලීන සංවාදයක් ගොඩ නඟන්න ඕනෑ. එහෙම නැතිව මේ සතියේ කෙටුම්පත දාල සතියකින් නැතිනම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා නම් ඒ ගැන කුකුසක් තියෙනවා. අපි කතා කරමු. එකතු වෙමු. හරි දෙයක් වෙනුවෙන් වැඩ කරමු. එහෙම වුණොත් අපට පුළුවන් විසිවන සංශෝධනය යහපත් දිශාවකට යොමු කරන්න.

● ඔබ මේ සංශෝධන ගැන විවේචනාත්මකව කතා කළත් විපක්ෂය ශක්තිමත් නැති බව පෙනෙනවා. මේ ගැන ඔබේ අදහස කුමක් ද?

විපක්ෂයේ ශක්තිය අපට ප්‍රමාණයෙන් හෝ සංඛ්‍යාවෙන් කියන්න බැහැ. 2015 ආණ්ඩුව පෙරළද්දි එක්සත් ජාතික පක්ෂයට සිටියේ මන්ත්‍රීවරු හතලිස් හතර දෙනෙක් පමණයි. 1994 අපේ ආණ්ඩුවට අභියෝග කළ ශ්‍රීලනිපයට තිබුණේ ආසන හැට ගණනක් පමණයි. ඒත් පැවැති ආණ්ඩුවලට අභියෝග කරන්න වගේම ආණ්ඩු පෙරළා දමන්නත් පුළුවන් වුණා. ඒ නිසා විපක්ෂයේ සංඛ්‍යාත්මක ප්‍රමාණයෙන් ප්‍රබලත්වය කියන්න බැහැ. අපට පාර්ලිමේන්තුව ඇතුළත වගේම ඉන් පිටතත් අරගලයක් තියෙනවා. එක්සත් ජාතික පක්ෂය සූදානම් ජනතාගේ අයිතීන් සුරක්ෂිත කරන්න කැප වෙනවා.

අප අනුගමනය කරන්නේ ජනප්‍රිය මාවත නොවෙයි හරි මාවතයි. ප්‍රතිපත්ති ගරුක දේශපාලනයක් වෙනුවෙනුයි අප පෙනී සිටින්නේ. අප උත්සාහ කරන්නේ ප්‍රතිපත්ති ඔස්සේ එක්සත් ජාතික පක්ෂය ප්‍රවර්ධනය කිරීමයි.

> එදා පාර්ලිමේන්තුවේ අති බහුතර ඡන්දයෙන් අනුමත වූ මේ සංශෝධනය හිතුමනාපයට වෙනස් කරනවාට අප විරුද්ධයි. සංශෝධනය කරනවා නම් සියල්ලන් සමඟ සාකච්ඡා කර පොදු මතය විමසා බලා අඩාළ සංශෝධන කළ යුතුයි. ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ පොදු මතය පොදු එකඟතා කියන එකයි. ඒ උසස් මූලධර්මය ආණ්ඩුව විසින් ආරක්ෂා කරයි කියල මම විශ්වාස කරනවා.

● දේශීය කර්මාන්ත දේශීය ආර්ථිකය වැනි කලක් කතා බහට ලක්ව යටපත් වූ ප්‍රතිපත්ති නැවත කරළියට පැමිණ තියෙනවා. මේ ගැන ඔබේ මතය පැහැදිලි කළ හැකිද.?

එක්සත් ජාතික පක්ෂය තමයි දේශීයත්වය ගැන මුලින්ම කතා කළේ. ගොවියාට ගොවි ජනපද ව්‍යාපාරය මඟින් නව වැඩපිළිවෙළක් ඇති කළේ අප. ඒ නිසා දේශීය ප්‍රතිපත්ති ගැන මුලින්ම විශ්වාස කළ ඒ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවූ පක්ෂය තමයි අපේ පක්ෂය.

● එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය ගැන අර්බුදයක් ඇති බව පේනවා. මේ අර්බුදයට විසඳුමක් ලැබෙන්නේ කවදා ද.?

එක්සත් ජාතික පක්ෂයට ජ්‍යෙෂ්ඨ නායකත්වයක් තියෙනවා ඒ රනිල් වික්‍රමසිංහ මහතායි. ඔහු අවුරුදු විසිහයක් අතිශය දුෂ්කර කාලවල පවා පක්ෂය වැටෙන්න නොදී ස්ථාවරව පවත්වා ගෙන ගියා. ඔහුට පුළුවන් වුණා පක්ෂයට ආණ්ඩු බලය දිනා දීමට. ඒ නායකත්වය තාමත් පක්ෂයට ලැබෙනවා. අවශ්‍යතාවයක් ඇති වූ විටක ප්‍රජාතන්ත්‍රවාදී ලෙස අවශ්‍ය වෙනස්කම් කිරීමට අපට පුළුවන්. ඒ නිසා නායකත්ව අර්බුදයක් ඇති බවට සමහරු මත කළත් අපේ පක්ෂයේ නායකත්ව අර්බුදයක් නැහැ.

කෙටි කාලයකට ජනප්‍රසාදය දිනා ගැනීම කාලයත් සමග නැති වෙන්න පුළුවන්. ඒත් ප්‍රතිපත්තියක් දර්ශනයක් ඇතිව වැඩ කරන එක්සත් ජාතික පක්ෂයට තිබෙන්නේ කෙටි කාලීන ඉලක්ක නොවෙයි. දීර්ඝ කාලීනව රට දිනවීමට අවශ්‍ය කරන ප්‍රතිපත්ති. ඩී එස් සේනානායක, ඩඩ්ලි සේනානායක, ජේ ආර් ජයවර්ධන ඇතුළු අපේ නායකයන් රටත් පක්ෂයත් දිනවීමට වැඩ කළ පිරිසක්. එවැනි පක්ෂයක් එක් පසුබෑමකින් සම්පූර්ණයෙන් යටපත් කරන්න බැහැ.

උදිත ගුණවර්ධන

> විපක්ෂයටවත් ජනතාවටවත් කතා කරන්න, හදාරන්න ඉඩක් නොතියා කඩිමුඩියේ ගෙනැවිත් සම්මත කරපු 19 වැනි සංශෝධනය නිසා රටට වුණු විනාශය අපි පසුගිය අවුරුදු පහේදී දැක්කා. 19 සම්මත කරපු දවසේ ඉඳලා අපි හිටියේ 19 වැනි සංශෝධනය වහාම ඉවත් කළ යුතුයි කියන මතයේ. පසුගිය ජනාධිපතිවරණයේ දී මෙන්ම මහ මැතිවරණයේදිත් අපි ඒ මතය සෘජුවම ජනතාවට ඉදිරිපත් කළා.

පිඟන් සංස්ථාව පැරැණි නිෂ්පාදනවලට

නැවත ප්‍රවේශවීම ඉදිරිදැක්ම කරගත යුතුයි

ඇමැති විමල් වීරවංශ

රක්ෂණ ශ්‍රියන්ත

ලංකා පිඟන් සංස්ථාව මීට වසර ගණනාවකට පෙර නිෂ්පාදනය කළ නිෂ්පාදන වර්ග 30ක් තිබූ බවත්, අද වනවිට එය උළු සහ ගඩොල් යන නිෂ්පාදන දෙක දක්වා අඩුවී ඇති අතර ඉදිරියේ දී පැරණි නිෂ්පාදනයන් වෙත නැවත ප්‍රවේශවීම පිඟන් සංස්ථාව සිය ඉදිරි දැක්ම කරගත යුතු බවත් කර්මාන්ත ඇමැති විමල් වීරවංශ මහතා පැවසීය.

ඇමැතිවරයා මේ බව පැවසුවේ පසුගියදා ලංකා පිඟන් සංස්ථාවේ නිලධාරීන් සහ ඇමැතිවරයා අතර අමාත්‍යාංශයේ දී පැවති සාකච්ජාවකදීය.

මේ අතර පෙර පාසල් සහ පාසල් දරුවන්ට අධ්‍යාපනයට අවශ්‍ය වන, චීනයෙන් ගෙන්වා ලබාදෙන ප්‍රමිතියෙන් තොර 'මැටි ක්ලේ' වෙනුවට ලංකා පිඟන් සංස්ථාවෙන් සෞඛ්‍යාරක්ෂිත 'මැටි ක්ලේ' ලබා දීමට ඉදිරියේ දී පියවර ගන්නා ලෙස ඇමතිවරයා නිලධාරීන්ට උපදෙස් ලබා දුන්නේය.

භූ විද්‍යා හා පතල් කාර්යාංශයත්, විශ්ව විද්‍යාලවල සහ උසස් තාක්ෂණික විද්‍යාලවල ශිෂ්‍යයන් ද සහභාගී කර ගනිමින් ඉදිරියේ දී ලංකා පිගන් සංස්ථාවට අවශ්‍ය භූගත මැටි සොයාගැනීම පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙසත් පිගන් සංස්ථාවට නව ආදායම් උපයා ගැනීමේ සැලැස්මක් ද සකසන ලෙසත් මෙහි දී ඇමැතිවරයා නිලධාරීන්ට උපදෙස් ලබා දුන්නේය.

ඇමැති උපදේශක සුනිල් හෙට්ටිආරච්චි, ලංකා පිගන් සංස්ථාවේ සභාපති ජූඞ ප්‍රනාන්දු ඇතුළු නිලධාරීහු පිරිසක් දමේ අවස්ථාවට සහභාගී වූහ.

මගීන්ගේ සුව පහසුවට කොටුව දුම්රිය ස්ථානය සංවර්ධනය කරනවා

ඇමැති ගාමිණී ලොකුගේ

නිමල් රාජපක්ෂ

මගී ජනතාවගේ හා විදේශීක සංචාරකයන්ට ආකර්ශනීය සහ සුව පහසුව සපිරි ගමන් ආරම්භයක් හා ගමනාන්තයක් සැලසෙන පරිදි කොටුව දුම්රිය ස්ථානය සංවර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව ප්‍රවාහන ඇමැති ගාමිණී ලොකුගේ මහතා පවසයි.

ඇමතිවරයා මේ අදහස් පළකළේ කොටුව දුම්රිය ස්ථානයේ ඊයේ නිරීක්ෂණ චාරිකාවක නිරතවූ අවස්ථාවේදීය.මේ අවස්ථාවට වෙළෙඳ ඇමැති බන්දුල ගුණවර්ධන මහතාද සහභාගී වුහ.

මෙහි ප්‍රධාන අරමුණ වුයේ දැනට කොටුව දුම්රිය ස්ථානයෙන් මගීන් වෙත සැලසෙන සුව පහසුව සොයා බැලීම සහ වර්තමානයට ගැලපෙන ලෙස මගී අවශ්‍යතා හඳුනාගෙන ඒවාට පිළියම් සෙවීමයි.මෙහිදි ඇමැතිවරුන් දෙපළ විසින් දුම්රිය ස්ථාන සහ ඉන් පිටත, දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල වත්මන් තත්වය පිළිබඳව සෙයා බැලූහ.

වැඩිදුරටත් අදහස් දැක් වූ ඇමැතිවරයා, කොළඹ කොටුව දුම්රිය ස්ථානයෙන් ගමන් කරන ජනතාවගේ දෛනික අවශ්‍යතාවන් සැපිරීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා දුම්රිය ස්ථාන තුළදීම සපුරා ගැනීමට අවශ්‍ය කරන පහසුකම් වෙළඳ අමාත්‍යාංශය හා එකාබද්ධව කිරීමට ඇති හැකියාව පිළිබඳව සොයා බලා කටයුතු කිරීමට අදහස් කරන බව පැවසීය.

කොටුව දුම්රිය ස්ථානයට අමතරව ශ්‍රී ලංකාවේ ප්‍රධාන දුම්රිය ස්ථානවල මේ පහසුකම් ඇතිකිරීමටත්, කැලණිවැලි දුම්රිය මාර්ගයේ අමතර දුම්රියක් යොදා මගී ජනතාවට සුව පහසු සේවාවක් සැලසීමටද ළඟදීම කටයුතු කරන බවත් මගී ජනතාවගේ අවශ්‍යතා සපුරාලීමට තම රජය බැඳී සිටින බවද පැවසීය.

මේ අවස්ථාවට සහභාගී වූ වෙළෙඳ ඇමැති අචාර්ය බන්දුල ගුණවර්ධන මහතා අදහස් දක්වමින් කියා සිටියේ ,රාජ්‍ය දේපළ හා රාජ්‍ය සම්පත් වඩාත් ඵලදායි ලෙස යොදා ගන්නේ කෙසේද යන්න පිළිබඳව සොයා බලා ජනතාවට එහි ප්‍රතිලාභ ලබාදීමට තම රජය කටයුතු කරන බව පැවසීය.

"දුම්රිය දෙපාර්තමේන්තුව සතුව විශාල දේපළ හා වත්කම් ප්‍රමාණයක් තිබෙනවා. ඒවායින් ජනතාවට සේවාවක් සැපයීමටත් දුම්රියට ආදායමක් ලබා ගැනීමේ වැඩපිළිවෙළක් අපි සකස් කරන්නයි සූදානම. ඓතිහාසික කොටුව දුම්රිය ස්ථානයට ඉදිරිපිට තිබූ අනවසර ඉදිකිරීම් ඉවත්කර රාජ්‍ය ආයතනවල ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු භාණ්ඩ සැපයීම සඳහා වෙළඳසැලක් ඉදි කිරීමයි අරමුණ. එක "රජවාසල" කියලා නම් කරන්නයි අදහස් කරන්නේ.

ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම් මොන්ටි රණතුංග, දුම්රිය සාමාන්‍යාධිකාරි ඩිලන්ත ප්‍රනාන්දු, දුම්රිය ගමනා ගමන අධිකාරි ඒ.ඩී. ජී. සෙනෙවිරත්න, නියෝජ්‍ය දුම්රිය සාමාන්‍යාධිකාරි වී.එස්. පොල්වත්ත,කොටුව ප්‍රධාන දුම්රිය ස්ථානාධිපති ජී.එස්. වික්‍රමතිලක මහත්වරු ඇතුළු නිලධාරීන් පිරිසක් මේ අවස්ථාවට සහභාගී වූහ.

රටවල් තුනකට නව තානාපතිවරුන් පත්කිරීමට යයි

මහින්ද අලුත්ගෙදර

රටවල් තුනක් සඳහා නව තානාපතිවරුන් පත්කිරීමට රජය තීරණය කරයි.

ඒ අනුව ප්‍රංශය, ඇෆ්ගනිස්ථානය සහ ජපානය යන රටවල් සඳහා මෙලෙස නව තානාපතිවරුන් පත්කිරීමට පියවර ගෙන තිබේ.

ප්‍රංශයේ නව ශ්‍රී ලංකා තානාපතිනිය වශයෙන් මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම මහත්මිය පත්කර තිබෙන අතර ඇෆ්ගනිස්ථානයේ ශ්‍රී ලංකා තානාපතිවරයා වශයෙන් අද්මිරාල් පියල් ද සිල්වා මහතා පත්කර ඇත.

ඊට අමතරව ජපානයේ නව ශ්‍රී ලංකා තානාපතිවරයා වශයෙන් සන්ජීව ගුණසේකර මහතා පත්කර තිබේ.

මේ පත්කිරීම් වලට අදාළ අනුමැතිය ලබාගැනීම සඳහා එම නම් මේ වනවිට උසස් නිලතල පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවට යොමුකර තිබෙන අතර අදාළ අනුමැතිය ලැබුණු වහාම ඔවුන් අදාළ ධුරයන්හි රාජකාරි සඳහා පිටත්ව යනු ඇත.

ඕනෑම ආපදා තත්ත්වයකට මුහුණ දෙන්න කණ්ඩායම් සූදානම්

නියෝජ්‍ය අධ්‍යක්ෂ ප්‍රදීප් කොඩිප්පිලි

උපාලි කරුණාරත්න

ඕනෑම ආපදා තත්ත්වයකට මුහුණ දීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය තම කණ්ඩායම් සූදානම් කර ඇති බව එහි නියෝජ්‍ය අධ්‍යක්ෂ ප්‍රදීප් කොඩිප්පිලි මහතා පැවසීය.

08,09 දිනවල ඇති වූ අධික වැසි තත්ත්වය හේතුවෙන් කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර ආදී දිස්ත්‍රික්ක රැසක ජනතාව අපහසුතාවට පත් වූ බ වද කී නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ජල ගැලීම් නිසා අවහිර වූ මාර්ග යථා තත්ත්වයට පත්වී තිබෙන බවද ප්‍රකාශ කළේය.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ අදාළ කණ්ඩායම් ඇතිවිය හැකි ඕනෑම ආපදා තත්ත්වයකට මුහුණ දීම සඳහා පැය විසි හතර පුරා සූදානම් යයිද කී කොඩිප්පිලි මහතා 117 දුරකතන අංකය අඛණ්ඩව ක්‍රියාත්මක බවත් කඳකර ප්‍රදේශවල ජනතාව නායයාම් ලක්ෂණ පිළිබඳව විමසිලිමත් වන ලෙසත් ඉල්ලා සිටී.

විස්සේ ගැටලු ගැන ජාතික සංවිධාන එකමුතුවෙන් ජනපතිට ලිපියක්

20 වැනි ව්‍යවස්ථා සංශෝධනය සහ ඒ ආශ්‍රිත ගැටලු පිළිබඳව ජාතික සංවිධාන එකමුතුව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට ලිපියක් යොමු කරයි.

ජාතික සංවිධාන එකමුතුවේ කැඳවුම්කරු සාහිත්‍යශූරී ගුණදාස අමරසේකර මහතාගේ අත්සනින් යවා ඇති එහි මෙසේ සඳහන් වේ.

ඔබතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් රටට නව ව්‍යවස්ථාවක් අවශ්‍ය බවට සහ ඒ මඟින් රාජ්‍ය තුළ පුළුල් ප්‍රතිසංස්කරණ සිදු කළ යුතු බවට මහජනයා අතර බලවත් අපේක්ෂාවක් ජනිත කරන ලදී. ඔබතුමාගේ අධිෂ්ඨානය ජනතාව විසින් දෙවරක්ම ඉතා ඉහළින්ම අනුමත කරන ලද්දේ ඒ නිසාය. ඔබතුමා එදා එස්.ඩබ්.ආර්. ඩී. බණ්ඩාරනායක මහතා මෙන්, ඉතිහාසය විසින් යුගයේ ප්‍රබල අවශ්‍යතාවයක් සඳහා නිර්මාණය කරන ලද චරිතයක් හෙවත් භූමිකාවකි. ඒ නිසා නව ව්‍යවස්ථාවක් සම්මත කිරීම මඟින් ව්‍යවස්ථා විප්ලවයක් සිදු කිරීම සඳහා මීට වඩා මනරම් අවස්ථාවක් ඉතිහාසය විසින් නිර්මාණය කරනු ඇතැයි සිතිය නොහැක.

අප රටේ අද සිටින සියලු විපක්ෂ බලවේගවලට මහජනයා විසින් ඉතා දරුණු ලෙස දඬුවම් ලබා දෙන්නේ ඔවුන් විසින් සිදු කළ මහා ඓතිහාසික පාවාදීම්වලට එරෙහිව අවසන් ප්‍රතිචාරයක් ලෙස යැයි අපි සිතමු. ඒ නිසා ඔබතුමාට ඉතිහාසයේ අන් කවර පාලකයෙකුටත් වඩා සෑම ක්‍රියාවකදීම පරිස්සම් වීමට සිදු වේ. ඔබතුමා විසින් ඉටු කළ යුතු සහ ඉතිහාසය විසින් ඉල්ලා සිටින ජාතික වගකීම් ඉටු කිරීමේදී මානසික බාධක පනවාගත යුතු බවත් ඉන් අදහස් නොවේ. ඔබතුමාට ජනතාව විසින් මහා ජනවරමක් ලබා දෙන විට අප රටේ දීර්ඝ කාලයක් තිස්සේ පරිහානියට ලක් වූ නිලධාරී තන්ත්‍රය වෙනස් කිරීමක් සිදු වූයේ නැත. ඒ සඳහා ජනවරමේ ගුණය සහ ඔබතුමාගේ ගුණය එක්කළ දීර්ඝ කාලීන ප්‍රතිකාරයක් අවශ්‍ය වනු ඇත. එතෙක් ඔබතුමාට ගමන යාමට සිදු වන්නේ ඔවුන් විසින් දැනුවත්ව සහ නොදැනුවත්ව කපන ලද බොරු වළවල් මඟහරිමිනි. ඒ නිසා අප විසින් අවධාරණය කරනු ලබන්නේ ජනතා අපේක්ෂාවන්ට ඉතා තීරණාත්මක ලෙස බලපාන ජාතික වැදගත්කමක් සහිත තීන්දු පිළිබඳව දෙවරක් සිතා බලන ලෙස පමණි. නව ව්‍යවස්ථාවක අවශ්‍යතාවය ඉතා බලවත් වන්නේ එම තත්ත්වය නිසාය. එසේම නව ව්‍යවස්ථාවක් සම්මත කරන තෙක් ඔබතුමාට කාර්යක්ෂමව සහ ප්‍රතිඵලදායක ලෙස තීන්දු තීරණ ගැනීම සඳහා ඉඩ සලසන ව්‍යවස්ථා සංශෝධනයක අවශ්‍යතාවය අප පිළිගනිමු.

එහිදී ජනතාව විසින් පරාජයට පත් කළ බලවේග විසින් සිදු කළ වැරදි කිසිවක් ඔබ විසින් නොකළ යුතු බවට විවාදයක් නැත. ඔබතුමාට ඉතිහාසය විසින් පවරා ඇති භූමිකාව වන්නේ ඔවුන් විසින් සිදු කළ යහපත් දෙයක් ඇත්නම් එය ආරක්ෂා කරන අතර ඔවුන් විසින් සිදු නොකළ සහ ඔබ අපේක්ෂා කරන යහපත් දේ සිදු කිරීම යැයි අපි විශ්වාස කරමු.

එම අර්ථයෙන් අප ඔබතුමාට පහත සඳහන් කරුණු අවධාරණය කරන්නෙමු. ඊට අමතරව නව ව්‍යවස්ථාවක් හෝ ප්‍රතිපත්තියක් සඳහා මහජන කැමැත්ත ලබා ගැනීමේදී එහි අන්තර්ගතය තරමට එම අන්තර්ගතයට ළඟා වීම සඳහා යොදා ගන්නා ක්‍රමවේදය ද ඉතා වැදගත් වන බව ද සඳහන් කරන්නෙමු.

නිෂ්පාදන බදු නියම ගැන ජන්දයකට සූදානම්

සභානායක දිනේෂ් ගුණවර්ධන

නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමයන් නවයක්, සහ සුරාබදු ආඥා පනත යටතේ නියෝග දහයක් පිළිබඳ විවාදය ඊයේ (09) පාර්ලිමේන්තුවේ දී පැවැත්විණි.

මේ නියෝග සහ නියමයන් වලට අදාළව ඡන්ද විමසීමක් අවශ්‍ය නම් අද (10) දින ලබාදීමට හැකි බව සභානායක දිනේෂ් ගුණවර්ධන මහතා සභාවට දැනුම් දුන්නේය. අදාළ නියෝග හා නියමයන්ට අදාළ විවාදය වෙළඳ ඇමැති බන්දුල ගුණවර්ධන මහතා ආරම්භ කළේය.

රතු කුරුසයෙන් මහර බන්ධනාගාරයට උපකරණ තොගයක්

රාගම සමූහ

මහර බන්ධනාගාරයේ රැඳවියන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම වෙනුවෙන් කටයුතු කරන මහර බන්ධනාගාර රෝහල් කාර්ය මණ්ඩලයට සහාය දක්වමින් ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය විසින් පරිත්‍යාග කරන ලද සෞඛ්‍ය ආරක්ෂිත උපකරණ තොගයක් මහර බන්ධනාගාරය වෙත භාර දීම 09 වැනිදා උදෑසන මහර බන්ධනාගාරයේ දී සිදු කරන ලදී.

ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ කොළඹ පිහිට මෙරට කාර්යාලයේ නියෝජිතයන් පිරිසක් මේ අවස්ථාවට එක් වූ අතර මහර බන්ධනාගාරය වෙනුවෙන් බන්ධනාගාර අධිකාරි ජගත් වීරසිංහ, ප්‍රධාන ජේලර් සුභාෂ් උපුල්දෙණිය සහ වෛද්‍ය මිනොල් ගුණවර්ධන, වෛද්‍ය නයනා පුෂ්පරාණි මහත්මිය ඇතුළු බන්ධනාගාර රෝහල් කාර්ය මණ්ඩලයේ නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.

මේ අනුව බන්ධනාගාර ගතව සිටින රැඳවියන් සහ ඔවුන් සමඟ රාජකාරි කටයුතු සිදු කරන නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා මුහුණු ආවරණ 1200, අත්ආවරණ 1200, ආරක්ෂිත ඇඳුම් 1200 ඇතුළු සෞඛ්‍ය උපකරණ රැසක් මහර බන්ධනාගාරය වෙත භාර දෙන ලදී.

කැප්ෂන්-

රතු කුරුස සංවිධානයේ නියෝජිතයන් මහර බන්ධනාගාර අධිකාරි ජගත් වීරසිංහ, ප්‍රධාන ජේලර් සුභාෂ් උපුල්දෙණිය මහත්වරුට භාණ්ඩ ලබාදුන් අයුරු.

මහනුවර භූ කම්පනයෙන් නිවාසවලට හානි නොවීමෙන් වන්දි අවශ්‍ය නැහැ

භූවිද්‍යා හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ

මානෙල් පුෂ්පා කුමාරි

මහනුවර දිස්ත්‍රික්කයේ දිගල, හාරගම ප්‍රදේශ ආශ්‍රිතව ඇති වූ භූකම්පනයෙන් ඒ අවට නිවාසවලට කිසිදු හානියක් සිදු වී නොමැති බවත්, එම නිසා වන්දි මුදල් ගෙවීමට අවශ්‍ය නොවන බවත් භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ (ඛනිජ සම්පත්) නලින් ද සිල්වා මහතා ප්‍රකාශ කළේය.

අවට නිවාසවල පැලුම් ඇති වී ඇති බවට සඳහන් කළත් මේ කම්පනයෙන් එවැනි පැලීම් සිදු නොවී ඇති බවත් අනාවරණය වේ.

එහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් ඒ මහතා කියා සිටියේ,

අපි ඉන්නේ භූමිකම්පන කලාපයෙන් බැහැර ප්‍රදේශයකයි. එනිසා මේ තත්ත්වය තුළ කිසිදු වන්දි ගෙවීමේ අවශ්‍යතාවක් පැන නඟින්නේ නැහැ. ඒවායේ පැලීම් සිදු වී තිබෙන්නේ එම නිවාස ඉදිකිරීමේදී ඇති වූ තත්ත්වයක් නිසායි.

භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අක්‍රමිකතා පිළිබඳව සොයා බැලීම සඳහා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් ත්‍රිපුද්ගල කමිටුවක් පත් කර ඇති බව එහි සභාපති අනුර වල්පොල මහතා පැවසීය.

ජනාධිපතිවරයාගේ සෞභාග්‍යයේ ඉදිරි දැක්ම ක්‍රියාවට නැංවීම සඳහා මෙරට ඇති සියලු ඛනිජ සම්පත් හඳුනා ගැනීමට සිදු වී තිබේ. මෙම කාර්ය කිරීමට සිදු වී ඇත්තේ මෙරට සීමිත සම්පත් උපයෝගී කරගෙන බවත් ඒ මහතා මෙහිදී වැඩිදුරටත් සඳහන් කළේය.

එප්පාවල පොස්පේට් නිධියෙන් ශ්‍රී ලංකාවට අවශ්‍ය පොහොර ප්‍රමාණය වසර 200කට නිෂ්පාදනය කළ හැකි බව මෙම අවස්ථාවට සහභාගි වෙමින් භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් සද්ජනන ද සිල්වා මහතා පැවසීය.

පොහොර සඳහා වසරකට විදේශයන්ට ඇදීයන රුපියල් බිලියන දහයක මුදල මෙරට පොහොර නිෂ්පාදනය කිරීමෙන් ඉතිරි කර ගත හැකි බවත්, ලබන වසර එක හමාර තුළ පොහොර නිෂ්පාදනය කර එය ඉටු කර ගත හැකි බවත් ඒ මහතා වැඩිදුරටත් සඳහන් කළේය.

රටවල් පහක ශ්‍රී ලංකා තානාපතිවරුන් මෙරටට කැඳවීමට පියවර

විදෙස් රටවල් පහක ශ්‍රී ලංකා තානාපතිවරුන් වශයෙන් කටයුතු කරන රාජ්‍යතාන්ත්‍රිකයන් යළි මෙරටට කැඳවීමට විදේශ අමාත්‍යාංශය පියවර ගෙන තිබේ.

ඒ අනුව කයිරෝ, ස්ටොක්හෝම්, වර්සෝ, නිව්යෝර්ක් හා හේග් නගරවල පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයන්හි සේවයේ නියුක්ත රාජ්‍ය සේවයේ අනිවාර්ය විශ්‍රාම ගතයුතු වයස් සීමාව ඉක්ම වූ හා ඉක්මවීමට ආසන්න තානාපති කාර්යාල ප්‍රධානීන් වෙත තම සේවා කාලය නිමවා ඇති බැවින් මෙරටට නැවත වාර්තා කරන ලෙසට දන්වා යවා තිබෙන බව විදේශ අමාත්‍යාංශය පවසයි.

විදෙස් රටවල් 10ක 60 පැන්න තානාපතිවරුන් ආපසු කැඳවයි යන ශීර්ෂය යටතේ දිනමිණ පුවත් පතේ ඊයේ (09) මේ පුවත පළවූයේ ප්‍රමාද දෝෂයකිනි.

ගංජා කිලෝ 68ක් සමඟ සැක දෙදෙනකු අත්අඩංගුවට

රක්ෂණ ශ්‍රියන්ත

ගංජා කිලෝ 68ක් සමඟ සැකකරුවන් දෙදෙනකු පුත්තලම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් පෙරේදා (08) සිදුකළ මෙහෙයුමක දී පුත්තලම පොලිස් වසමේ පුලිදිවාය ප්‍රදේශයේ දී අත්අඩංගුවට ගෙන තිබේ.

වාහන කිහිපයකින් ගංජා ප්‍රවාහනය කරන බවට පුත්තලම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පුත්තලම පුලිදිවාය ප්‍රදේශයේදී පුත්තලම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ජීප් රථයක් සහ මෝටර් රථයක් නවතා පරීක්ෂා කර එම එථ දෙක තුළ තිබී ගංජා කිලෝ 68ක් සොයාගෙන ඇත. ජීප් රථය සහ මෝටර් රථය සමඟ සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට ගත් බව පොලිසිය පවසයි.

අත්අඩංගුවට ගත් සැකකරුවන් ඊයේ (09) පුත්තලම මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර දින 03ක රැඳවුම් නියෝග ලබාගෙන පුත්තලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරයි.

පළාත් සභා විරෝධී කථිකාව සැලසුම්ගත කුමන්ත්‍රණයක්

පොදුජන පෙරමුණේ පළාත් සභා මන්ත්‍රී සංසදයේ සභාපති කාංචන ජයරත්න

සමන්මලී ප්‍රියශාන්ති

ඇතැම් අය මතු කරන පළාත් සභා විරෝධී කථිකාව සැලසුම්සහගතව ඉදිරිපත් කරන සියුම් දේශපාලන කුමන්ත්‍රණයක් යැයි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පළාත් සභා මන්ත්‍රී සංසදයේ සභාපති කාංචන ජයරත්න මහතා පැවැසීය.

වත්මන් රජය නව ව්‍යවස්ථාවක් ගැන සාකච්ඡා කළත් පළාත් සභා අහෝසි කිරීමක් ගැන අදහසක් ඉදිරිපත් කර නැති බවත්, පළාත් සභා අහෝසි කිරීමේ කථිකාව ආණ්ඩුවේ ශක්තිය හීන කිරීමට කල්වේලා ඇතිව ගැසූ ගැටයක් බවත් හෙතෙම කීවේය.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු කාර්යාලයේ දී ඊයේ (9) පැවැති මාධ්‍ය හමුවේ දී ඒ මහතා මේ බව කියා සිටියේය.

එහිදී වැඩිදුරටත් අදහස් පළ කළ ඒ මහතා මෙසේ ද කීවේය.

පළාත් සභා විරෝධයක් මතු කිරීම සැලසුම් සහගතව ආණ්ඩුවේ ශක්තිමත් භාවය බිඳ දමන්න ගෙන යන වැඩපිළිවෙළක් ලෙස අප දකිනවා. රජයට අවශ්‍ය නම් පළාත් සභා ක්‍රමය අහෝසි කරන්න එය ව්‍යවස්ථානුකූලව සිදු විය යුතුයි. ජාතික සංවිධාන හෝ වෙනත් පාර්ශ්ව එළියේ ඉඳගෙන මෙය අහෝසි කරන්න හදන එක වැරදියි.

පළාත් සභා ක්‍රමය සමාජයේ මුල් බැහැ ගත් දෙයක්. මධ්‍යම ආණ්ඩුවේ කටයුතු සිදු වන විට සාමාන්‍ය ජනතාවට වඩා සමීප වූ ආයතනක් ලෙස අද පළාත් සභාව මුල් බැසගෙන තිබෙනවා.

එදා පැවැති අපේ රජයක් සමයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ හා බැසිල් රාජපක්ෂ මහතා උතුරු වසන්තය, නැගෙනහිර නවෝදය වැනි වැඩසටහන් ගෙන ගියා. වසර තිහක යුද්ධය ජය ගෙන එම පළාත්වලට අහිමි වූ සංවර්ධනය නැවත ඇති කරන්න, සාමකාමී රටක් බිහි කරන්න හදන අවස්ථාවක අපේ රජය පරාජයට පත් වී යහපාලන රජය බලයට ආවේ.

අපේ පක්ෂයේ ප්‍රතිපත්තිවල පළාත් සභා අහෝසි කරන බව කොතැනකවත් සඳහන් කර තිබුණේ නැහැ.

අප පළාත් සභා සංසදයක් ලෙස පොදුජන පෙරමුණ ගොඩනගන්න දර දිය ඇද්ද කණ්ඩායමක් ලෙස පක්ෂය සමග එක්ව විවිධ අවස්ථාවල අරගල කළා. ගෝඨාභය රාජපක්ෂ මහතාට නාමයෝජනා නොදී ඉන්න සිදු කළ අරගලය ජය ගන්න අප කටයුතු කළා. මෙවර මැතිවරණයේ දී පළාත් සභාවල නියෝජිතයන් 28 දෙනකුට පාර්ලිමේන්තු වරම් ලැබුණ තැනටත් අප ආවා. මේ පක්ෂය ඉදිරියට අරගෙන යන බැසිල් රාජපක්ෂ මහතාවත් අපට කියලා නැහැ පළාත් සභා පවත්වන්නේ නැහැ කියා. පැරණි ක්‍රමවේදය යටතේ පළාත් සභා මැතිවරණය ඉතා ළඟදීම රජය ලබා දෙයි කියලා අප විශ්වාස කරනවා.

මේ පළාත් සභා ක්‍රමවේදය තුළ යම් යම් අඩුපාඩු දකිනවා නම් එය විසඳිය යුතු වන්නේ නව ව්‍යවස්ථාවක් සකස් කරන අවස්ථාවේ දීයි. මේ ආණ්ඩුව තුළ පළාත් සභාවලට පක්ෂපතීව කටයුතු කළ සහාය දුන් අය ඉන්නවා. සහාය නොදුන් අය ඉන්නවා. ඒ නිසා පළාත් සභා ක්‍රමය ගැන විවිධ මත තිබෙන්න පුළුවන්.

පළාත් සභාව විසුරුවා හැර පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ නිල කාලය අවසන් කර අවුරුදු ගණනාවක් ගත වී තිබෙන මේ අවස්ථාවේ ගෙන එන මේ කතිකාව සැලසුම් සහගත ව ක්‍රියාත්මක කරන සියුම් දේශපාලන ක්‍රමන්ත්‍රණයක් ලෙස අප දකිනවා. විශේෂයෙන් මේ හරහා ආණ්ඩුව අපහසුතාවට පත් වෙනවා වගේම, රාජ්‍ය තාන්ත්‍රිකවත් ආණ්ඩුව බරපතළ අර්බුදයකට ලක් වන අවස්ථාවක් වෙයි.

ව්‍යවස්ථා සංශෝධනයක් ගැන අප සාකච්ඡා කළත් පළාත් සභාව අහෝස කරන්න සාකච්ඡා වුණේ නැහැ. එසේ තිබියදී පළාත් සභා ඉවත් කළ යුතුයි කියන යෝජනාවක් ඇතිවීම ආණ්ඩුවේ ශක්තය හීන කරන්න ගෙනා සැලසුම් සහගතව ගහපු ගැටයක් ලෙසයි අප දකින්නේ. මේ අර්බුද නිසා රජය සමඟ ඉන්දියාව රාජ්‍ය තාන්ත්‍රික ප්‍රශ්නයකට පැටළෙන තැනකට දැන් ඇවිත්. සහෝදර සුළු පක්ෂ පවා අද ඒ අය ඒ අයගේ ප්‍රදේශවල අපහසුතාවට පත් වෙලා. අපේ කඳවුර එක්ක කටයුතු කළ මහජන, කොමියුනිසට්, සමසමාජ වැනි පක්ෂ එදා පළාත් සභාවට සහාය දෙමින් කටයුතු කළා වගේම අද ආණ්ඩුව තුළ පළාත් සභාවට සහාය නොදුන් පිරිසක් ද මේ රජයේ ඉන්නවා. මේ සියලු දෙනා අද මතවාදී ගැටුමකට ඇවිත් තිබෙනවා.

අද මෙවන් කථිකා දෙකක් ගොඩනැඟීම නිසා මතවාදී ගැටුමකට රජය ඇවිත් තිබෙනවා. පළාත් රාජ්‍ය සේවයේ අද විශාල පිරිසක් ඉන්නවා. ඒ අය පළාත තුළ කටයුතු කරන්න තමයි රස්සාවට බැඳිලා ඉන්නේ. ඒ අය මාරු කරන්න ගිහාම උසාවි ගිය අවස්ථා පවා අප දැක්කා. මේ නිසා රජය කෙරෙහි කලකිරීමක් ඇති වන තත්ත්වයක් අපට පේනවා. උතුරු මැද, නැගෙනහිර විසුරුවා හැර දැන් අවුරුදු 3 කට ආසන්නයි. මෙය අහෝසි කරනවා නම් විධිමත් වැඩපිළිවෙළක් යටතේ කථිකාවක් ආරම්භ කර, අදහස් ලබා ගෙන මෙවැනි යෝජනාවක් ගෙන ආ යුතු බව අපේ මතයයි. මහජන නියෝජිතවරු නැතිව අද පළාත් සභා අයාලේ යන තත්ත්වයක් තිබෙනවා. පැරණි ක්‍රමයට ඉක්මනින් මේ මැතිවරණය පවත්වන්න කියා තමයි අප ඉල්ලන්නේ. මේ ක්‍රමය අහෝසි කරනවා නම්, නව ව්‍යවස්ථා සංශෝධනයක් සමග මේ යෝජනාව ඇතුළත් කර, විධිමත් කථිකාවකට ගිහින් රාජ්‍ය තන්ත්‍රික අර්බුදවල යන්නේ නැතිව කටයුතු කිරීම තමයි අවශ්‍ය වන්නේ. ඒ සඳහා යම් කාල සීමාවක් ගත වෙන බැවින් එතෙක් කාලයේ පළාත් සභා පවත් වී පියවරෙන් පියවර ක්‍රියාත්මක වීම තමයි වැදගත් වන්නේ. ඒ නිසා පැරණි ක්‍රමයට ඉතා ඉක්මනින් මේ මැතිවරණය පවත්වන්න කියා අප ඉල්ලා සිටිනවා.

බස්නාහිර පළාත් සභාවේ හිටපු මන්ත්‍රී ගුණසිරි ජයනාත් මහතා- පළාත් සභාව සුදු අලියෙක්, සල්ලි විශාල ලෙස අපතේ යවන තැනක් කියා අද සමාජය තුළ මතයක් පැතිරී තිබෙනවා. බස්නාහිර පළාත් සභාවේ 2019 වසරේ පුනරාවර්තන වියදම මිලියන 73000යි. බස්නාහිර පළාත් සභාවේ මහ ඇමැතිවරයා ඇතුළුව අමාත්‍යවරු 4ක් සහ මහජන නියෝජිතවරු 104 මෙන්ම සභාවාර රැස්වීම් සියල්ලට වැය වන්නේ මිලයන 673.8ක් වගේ වියදමක්. ඒ හරහා අපේ ජනතාවට වන සේවය වැඩියි. පාර්ලිමේන්තුව පනත් හරහා ක්‍රියාත්මක වෙනවා. බස්නාහිර පළාතේ කෘෂිකර්මාන්තයට තිබෙන ප්‍රශ්න නොවෙයි දකුණට තිබෙන්නේ. ඒ ගැටලු විසඳන්න ප්‍රඥප්තියක් හදන්නේ පළාත අනුවයි. හැම ක්ෂේත්‍රයක් ගැනම ඒ පළාතට ආවේණික ප්‍රඥප්තියක් හදාගෙන ඒ ගැටලුවලට විසඳුම් දෙන්න පළාත් සභා තුළත් පුළුවන්. පාර්ලිමේන්තුවේ 225 ග්‍රාමීය ජනතාවට ළංවෙනවාට වඩා වැඩි ප්‍රමාණයක් ජනතාවට ළංවෙලා සේවය කරන්න පළාත් සභා මන්ත්‍රීවරුන්ට පුළුවන්.

පළාත් සභාව සුදු අලියෙක් නමින් පට බැන්දට එයට කිසිම සාධකයක් හේතුවක් කාරණාවක් පෙන්නලා නැහැ. නඩුවක් නැහැ. දූෂණයක් කවුරුවත් පෙන්නලා නැහැ. නමුත් සුදු අලියෙක් කියලා කියනවා. මා දකුණු පළාත් සභාව නියෝජනය කරන අයෙක්. අධ්‍යාපනය අතින් දකුණු පළාත ඉතා දුර්වලව පැවැතුණා. නමුත් අලුත් ප්‍රඥප්තිය සකස් කරගෙන අප ක්‍රියාත්මක කළ වැඩසටහන් සමඟ අපට අධ්‍යාපනයෙන් ලංකාවෙන්ම පළමු ස්ථානයට එන්නට හැකි වුණා. හම්බන්තොට පිට පිට වාර තුනක් ලංකාවෙන් එක වුණා. පළාත් සභාව තුළින් යමක් ප්‍රදේශයට සිදු වන බව පෙන්වන්න එය හොඳ අවස්ථාවක්. පළාත් සභාව අහෝසි වුවොත් අප ක්‍රියාත්මක කළ වැඩසටහන් රැසක් ආපසු හැරෙනවා.

දකුණු පළාත් සභාවේ හිටපු මන්ත්‍රී චම්ලි විතානාච්චි මහතා- මා ඉන්දු ලංකා ගිවිසුම ගහන වෙලාවේ එයට විරුද්ධව හඬ නැගූ අයෙක්. මට දකුණු පළාත් සභාව නියෝජනය කරන්න අවස්ථාව ලැබුණා. පළාත් සභා ක්‍රමය හොඳයි කියය මේ රටේ ප්‍රධාන පෙළේ පක්ෂ ගණනාවක් පළාත් සභා නියෝජනය කළා. පසුගිය මැතිවරණ කිහිපයකටම අප ලාබාල දේශපාලන පක්ෂයක් ලෙස පොදුජන පෙරමුණ යටතේ මුහුණ දුන්නා. පළාත් සභා විසි කරනවා කියා සඳහන් කර තිබ්බේ නැහැ. ඒ නිසා ජනතාව අපේ නායකයන්ට ඡන්දය දුන්නා. මේ පළාත් සභා ගැන ඇතැම් අය අද ගෙනෙන්නේ ඒ අයගේ පෞද්ගලික මතයක් පමණයි. අපේ පක්ෂයේ මතය නොවෙයි දැන් මේ ක්‍රමයට ජනතාව හැඩ ගැහිලා. මේ ජනතාව දැන් පළාත් සභාවෙන් කර ගන්න වැඩ කොළඹට ඇවිත් කර ගන්න වෙනවා. මේ තතත්ත්වයට ජනතාව කැමැති නැහැ. යහපාලන රජය තමයි මේ පළාත් සභා එපා කියන මතය ආරම්භ කළේ. එය අද අපේ පැත්තට දාලා. මේ ගැන ජාත්‍යන්තරය බලා ඉන්නවා. අවධානයෙන් ඉන්නවා. විවිධ මත ප්‍රකාශ කළ විට රජයට විශාල අභියෝගයක් වෙනවා. මේ අය එහෙනම් ආණ්ඩුකාරවරුත් අවශ්‍ය නැහැ කියලා කියන්න ඕනේ. පළාත් සභා ක්‍රමය අවශ්‍යයි කියන එක ජනතාවගේ මතයයි. පළාත් සභා අහෝසි කරන්න පක්ෂය ප්‍රතිපත්තිමය තීන්දුවක් ගෙන නැහැ. ජනතා සේවය සඳහා පළාත් සභා ක්‍රමය ඉතා වටිනවා.

දකුණු පළාත් සභාවේ හිටපු මන්ත්‍රී ආරියවංශ චම්මු මහතා- පළාත් සභා මැතිවරණය පවත්වන්නේ නැහැ කියන තැනට අද මතයක් ගෙනවිත් තිබෙනවා. අප කිසි ලෙසකින් එයට එකඟවන්නේ නැහැ. එය හඳුන්වා දුන්නේ ගම්මට්ටමේ නියෝජිතයන් වෙනුවෙන් නොවෙයි. ජනතාව වෙනුවෙන්. උතුරු නැගෙනහිර ඇති වෙලා තිබුණු තත්ත්වයට යම් වෙනසක් දෙන්නයි මෙය ගෙනාවේ. අද එය ව්‍යවස්ථාපිත ආයතනක් ලෙස ක්‍රියාත්මක වෙනවා. මෙය සුදු අලියෙක් කියන මතයට අප එකඟ වෙන්නේ නැහැ. අප මේ කාලය තුළ අධ්‍යාපන, කෘෂි, සෞඛ්‍ය ක්ෂේත්‍රවල විශාල වැඩ කොටසක් සිදු කර තිබෙනවා. අප ජනතාවට සේවය කරයි කියා ජනතාව විශ්වාස කරනවා. ආවට ගියාට පළාත් සභා අහෝසි කළාම ඊට විසඳුම මොකක්ද? ආපසු ජාතිවාදී බෙදුම්වාදී අර්බුදයකට අප ගමන් කළ යුතු නැහැ. ඒ කථිකාව වෙනස් කරන්න අප කැප වෙනවා. පළාත් සභාව තුළ අප විවිධ ක්ෂේත්‍රවල විවිධ ආකාරයේ කාරණා ඉටු කර තිබෙනවා. අධ්‍යාපන අංශය ගත හොත් අප දරුවන්ගේ, පාසැල්වල මෙන්ම ගුරුවරුන්ගේ ගැටලු විසඳන්නට කටයුතු කර තිබෙනවා. අප ඉහළ කාර්යක්ෂම සේවාවක් ලබා දෙන බව අප විශ්වාස කරනවා.

පාර්ලිමේන්තුවේ 225ම දියවන්නාවට දාන්න ඕනේ කියා මතයක් ගෙන ආවා. අද ඒ මතය යටපත් වෙලා ප්‍රජාතන්ත්‍රවාදීව පාර්ලිමේන්තුව පිහිටුවා තිබෙනවා. ලාබ ජනප්‍රියත්වයට පළාත් සභා ගැන අනවශ්‍ය කථිකාවන් නිර්මාණය කර තිබෙන බව අපට පේනවා. අප දෙවන පිලක් ලෙස ජනතාවට සාධාරණය ඉටු කර තිබෙනවා. යහපාලන ආණ්ඩුව අතුරුදන් කළ පළාත් සභා මැතිවරණය ඝාතනයට ලක් වුවැයි කියන අනුවේදනීය කතා පුවත සමාජ ගත වන්න දෙන්න එපා කියා අප රජයෙන් ඉල්ලීමක් කරනවා.

පළාත් සභාව සුදු අලියෙක් කීවාට අපට රටේ කොහෙවත් නඩු දමා නෑ

බස්නාහිර හිටපු මන්ත්‍රී ගුණසිරි ජයනාත්

පළාත් සභා අහෝසිය ආණ්ඩුවේ මතය නොවේ එය කාගෙ හරි පෞද්ගලික මතයක්

දකුණු පළාත් හිටපු මන්ත්‍රී චම්ලි විතානාච්චි

අධ්‍යාපන - කෘෂි - සෞඛ්‍ය ක්ෂේත්‍රවලින් පළාත් සභා රටට විශාල සංවර්ධනයක් කළා

දකුණු පළාත් හිටපු මන්ත්‍රී ආරියවංශ චම්මු

විසි වැනි සංශෝධනය පක්ෂ අතර වන පටු අරගලයක් කර ගත යුතු නැහැ

මන්ත්‍රී ඉම්තියාස් බාකීර් මාකාර්

ශිවන්ති ප්‍රනාන්දු

විසි වැනි ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ වන වාතාවරණය සමගි ජන බලවේගය හා අනෙකුත් පක්ෂ අතර පටු අරගලයක් කර ගත යුතු නැතැයි සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ඉම්තියාස් බාකීර් මාකාර් මහතා ඊයේ (9) පැවසීය.

කොළඹ පිහිටි විපක්ෂ නායක කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකට සහභාගී වෙමින් මේ බව අවධාරණය කළ මන්ත්‍රීවරයා එහිදී වැඩි දුරටත් මෙසේද ප්‍රකාශ කළේය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රටක පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරකින ලියවිල්ලක් වෙන්න ඕනේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගේන්නේ රටක පාලකයෝ පුරවැසි අයිතිවාසිකම්වලට එරෙහි වෙලා ගමනක් යන එක වළක්වන්නයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගේන්න කමිටුවක් පත් කර තියෙන අවස්ථාවක ජනතාවගේ, පුරවැසියන්ගේ, ප්‍රබුද්ධ උදවියගේ අදහස්වලට කන් දෙන්න ඕනෑ. 19 වැනි ව්‍යවස්ථාව ගේනකොට මට මතක් වෙන්නේ විසුම්පායයි. ලාල් විජේනායක මහත්මයා රට පුරා ගියා සිවිල් පුරවැසියන්ගේ අදහස් අරගන්න. පක්ෂ භේදයකින් තොරව වාමාංශික කඳවුරේ නායකයෝ පවා මුණගැහුණා. සරත් වීරසේකර හැරෙන්න පාර්ලිමේන්තුවේ සියලු දෙනා 19 වැනි සංශෝධනයට පක්ෂ වුණා. ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන විදිහට, ජනතා අයිතීන් ආරක්ෂා වෙන විදිහට ප්‍රජාතන්ත්‍රවාදීව පියවරක් ගන්නවා නම් පක්ෂ භේදයෙන් තොරව හැමෝටම එයට සහාය දෙන්න පුළුවන්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගේන විදිහ බලන්න. මොකක්ද මේකේ අවශ්‍යතාව? මට ආරංචි විදිහට කැබිනට් මණ්ඩලයේ රැස්වීමට පෙර දවසේ 'ප්‍රි කැබිනට් එකකට' ඒ කියන්නේ තෝරා ගත් පිරිසකට මේක ඉදිරිපත් කර තියෙනවා. ව්‍යවස්ථාව සම්මතයි. කවුද අදෘෂ්‍යමාන හස්තය? කවුද මේක සූදානම් කළේ? මට ලැබුණ ආරංචිය ඇත්ත නම් ඇමැතිවරුන්ගේ හෘද සාක්ෂිය අවදි කරන්න

ජනාධිපතිතුමා පත් වෙන්න හේතු වෙච්ච ප්‍රධාන චරිතයක් වුණු මහින්ද රාජපක්ෂ මහතාගේ තත්ත්වයට මොකද වෙන්නේ? මේක සම්මත වුණාම අගමැතිතුමා රූකඩයක්, පඹයෙක් බවට පත් වෙනවා. මේ සංශෝධනයෙන් අගමැතිවරයාගේ උපදෙස් පරිදි ඇමැති මණ්ඩලය පත් කිරීමක් වෙන්නේ නෑ. ජනතා ස්වාධිපත්‍යයට මොකද වෙන්නේ? ඇයි මිනිස්සුන්ට මේ ගැන සාකච්ඡා කරන්න ඉඩ නොදෙන්නේ? හරි දෙයක් කරනවා නම් මන්ත්‍රීවරු බිලී බාගෙන කටයුතු කරන්න ඕනෑ නෑ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මෛත්‍රීපාල සිරිසේන මහත්මයා දායක වෙච්ච එකක් තමයි 19 වැනි සංශෝධනය. එය ඉදිරිපත් කළ වෙලාවේ මෛත්‍රීපාල සිරිසේන මහත්තයා කියූ කතා ටික අහන්න කියා මා ආරාධනා කරනවා.

පාලකයෙක්ගේ බලය සීමා කරමින් පුරවැසියා ශක්තිමත් කරන විදිහටයි 19 වැනි සංශෝධනය ගෙනාවේ. පසුව 19ට පක්ෂව කතා කළ, ඡන්දය දුන් උදවිය කොහොමද ජනතාවට එරෙහිව පාර්ලිමේන්තුවේ අත් ඔසවන්නේ? මං ළඟ තියෙනවා ජී.එල්. පීරිස් මහත්තයා කළ කතාව. ඊයේ ඉංග්‍රීසි ජාතික පත්තරයක තියෙනවා ජනාධිපතිතුමාට නඩු දාන්න බැරි තත්ත්වයක් ගෙනල්ලා තියෙන්නේ එවැනි අවස්ථාවක ජනාධිපතිවරයා රස්තියාදු කරන්න බැරි නිසයි කියා. ජනාධිපතිවරයාට නඩු දැම්මම නීතිපතිවරයයි යන්නේ. බලන්න ජනතාවගේ බුද්ධිය කොච්චර අවතක්සේරු කරනවද? එදා 19 වැනි සංශෝධනය ගෙනෙද්දි ජී.එල්. පීරිස් මහත්තයා පාර්ලිමේන්තු සාකච්ඡාවේදී කතා කරපු ආකාරය හැන්සාඩ් වාර්තාවේ සඳහන්. මේ ගැන ගැඹුරින් හිතන්න ඕනෑ. ගැඹුරින් හිතන්න කැබිනට් මණ්ඩලයට දුන්නේ පැය දෙකයි. ජනතාවට කාලයක් දුන්නේම නෑ. මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරලා කියා උසාවි යන්නවත් වෙලාවක් දෙන්නේ නෑ.

ඉස්සර ගෙනාවා වගේ පැකර්ලාගේ කැසිනෝ පනත වැනි හදිසි පනතක් ගෙනාවොත් මූලික අයිතිවාසිකම් නඩු පවරන්න බෑ. මුක්තිය ලබා දෙනවා. පරිසරය විනාශ කරනකොට අපට පියවරක් ගන්න බෑ. මුක්තිය ලබා දෙනවා.

පුරවැසියන්ගේ අයිතිය ගැන ඉහළ හැඟීමකින් කතා කරපු ජී.එල්. පීරිස් මහත්තයා අද හදන්නේ මිනිසුන්ගේ යුක්තියට මං අහුරන්නයි. විගණන කොමිසම අහෝසි කිරීමෙන් දූෂණයට මඟ පැදෙනවා. පාලකයන්ට ඕනෑ විදිහට ජනතාවගේ මුදල් පාවිච්චි කිරීමේ නිදහස තියෙනවා. විනිසුරුවරු පත් කිරීම, අගවිනිසුරු පත් කිරීමට එක් පුද්ගලයකුට බලය කේන්ද්‍රගත කරන්න හදනවා.

19 වැනි සංශෝධනයෙන් පස්සේ සංසන්දනාත්මකව සාධාරණ මැතිවරණයක් දැක්කා. ජනාධිපතිවරයා පත් කරන කොමිසමකින් මොකක්ද බලාපොරොත්තු වෙන්න පුළුවන් සාධාරණය? මේක ප්‍රජාතන්ත්‍රවාදීව රටේ නිදහසින් පස්සෙ ආදර්ශ පාර්ලිමේනතුවක් හැටියට කලාපය තුළ දැක්කා. අද අපේ රට ගැන ඉකොනොමික් වැනි ජාත්‍යන්තර සඟරා කියන්නේ කොහොමද? කැලෑ නීතිය ඇති, ගෝත්‍රික නීති ඇති රටක් බවට පත් වෙලා. අපේ ආයෝජනවලට, ආර්ථිකයට මොනවද වෙන්නේ? කාලයක් ආයෝජකයන් දේශපාලනඥයන්ට කොමිස් දෙන්න ඕනෑ කී කාලයක් තියෙනවා. ඒ යුගයට අපේ රට ආයේ ගෙනයන්න හදනවද? මේ ගැන කලබලේ වැඩ කරන අයට කියනවා, කරුණාකර ඔබගේ බුද්ධිය අවදි කරන්න කියා. හෘද සාක්ෂිය අවදි කරන්න කියා.

අප ලෝකය ඉදිරියේ හුදකලා වෙනවාද? අපේ ප්‍රතිපත්ති බිඳ වැටෙන්නට දෙනවාද? යන්න අප තීරණය කළ යුතුයි.

ජායාරූපය- කැළුම් ලියනගේ

විසි වැනි සංශෝධනය රාජ්‍ය විගණනයට බාධාවක්

හිටපු මන්ත්‍රී සමන් රත්නප්‍රිය

මැද කොළඹ සමූහ - ආරියරත්න ගනේගොඩ

විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වයට හා රාජ්‍ය විගණනයට සිදු වී ඇති හානිය හේතුවෙන් රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳ පාර්ලිමේන්තුවේ කාර්ය භාරය හා රටේ මහජන අපේක්ෂාවන් ඉටු කිරීම පිළිබඳ පරීක්ෂා කිරීමට පවතින යාන්ත්‍රණයට දැඩි හානි සිදු වී තිබෙන බව හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සමන් රත්නප්‍රිය මහතා ප්‍රකාශ කළේය.

මන්ත්‍රීවරයා මේ බව ප්‍රකාශ කළේ සිවිල් සංවිධාන හා වෘත්තීය සමිති එකමුතුවේ මෙහෙයැවීමෙන් ඊයේ (9) වැලිකඩ රාජගිරියේ කාර්යාලයේ පැවැති මාධ්‍ය හමුවේ දීය.

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සමන් රත්නප්‍රිය මහතා මෙසේ ද කීය.

රටේ වත්මන් ජනාධිපතිවරයාට 2019 නොවැම්බර් 16 වැනි දා බලය ලබා දුන්නා. 2020 අගෝස්තු 5 වැනි දා මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍යවරයා ප්‍රමුඛ පිරිසක් බලය ලබා ගත්තා. මේ ජනවරම් දෙකෙන්ම බලය ලබා ගත් දොසොහොයුරෝ රාජ්‍ය ආණ්ඩුවක් ඇති කිරීම සඳහා කටයුතු කරගෙන යන බවක් පේන්න තියෙනවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි සංශෝධනය අහෝසි කොට 20 වැනි සංශෝධනය ගෙන ඒමෙන් දෙසොහොයුරෝ නටන්න යන නාඩගම පිළිබඳ ඉදිරි කාලයේ රටේ ජනතාවට දැන ගැනීමට ලැබේවි. එපමණක් නොවෙයි, රාජ ආණ්ඩුවක් ගොඩනැඟීම තුළින් සිදුවන්නේ කුමක්ද? යන්න රටේ බහුතර ජනතාවක් ඉතා විමසිල්ලෙන් පසු වනවා.

පසුගිය කොරෝනා කාලයේ මෙරට ඇඟලුම් ක්ෂේත්‍රයේ සේවක සේවිකාවන් තරුණ තරුණියන් ලක්ෂ සංඛ්‍යාත ජනතාවකට රස්සා අහිමි වුණා. එදා අඩු මිලට තිබුණු හාල්, පරිප්පු, සැමන්, බී ලූනු, රතු ලූනු, පොල් සහ අනෙකුත් ද්‍රව්‍යවල මිල ගණන් පිළිබඳ දොසොහොයුරන්ගේ ආණ්ඩුවේ වෙළෙඳ ඇමැතිවරයා කියන්නේ කුමක් දැයි ප්‍රශ්න කළ යුතුයි.

පසුගිය යහපාලනය රජය සේවක සේවිකාවන්ට වැටුප් වැඩි කළත්, 2020 ජනවාරි මාසයේ ලබාදිය යුතු වැටුප් වැඩිවීම මෙතෙක් දී නෑ. අප්‍රේල් මාසයේ ලබාදිය යුතු සිංහල අවුරුදු ණය දීමනාව ලබා දීමට පියවරක් ගැනීමට දෙසොහොයුරන්ගේ ආණ්ඩුවට නොහැකි වුණා. වත්මන් විපක්ෂයවත් ඒ පිළිබඳ අග්‍රාමාත්‍යවරයාගෙන් ප්‍රශ්න කළ බවක් දකින්න නෑ.

එපමණක් නොව, රටේ වෙසෙන විශ්‍රාමික ජනතාවට වැඩි කළ දීමනා, වැඩිහිටි ජනතාවට වැඩි කළ දීමනා පවා ලබා දීමට වත්මන් ආණ්ඩුව ක්‍රියා කර නෑ. මෙවැනි අවස්ථාවකදී පාර්ලිමේන්තුවේ විපක්ෂය සිදු කරන්නේ කුමක්ද යන්න ප්‍රශ්න කළ යුතුයි.

වත්මන් ආණ්ඩුව මුදල් වෙන් කරගෙන හිටියට විපක්ෂය ඒ පිළිබඳ කිසිම ප්‍රශ්නයක් නොඅසන බව කිව යුතුයි. අඩුම ගානේ ඒ පිළිබඳ විවාදයක්වත් ඉල්ලා සිටි බවක් විපක්ෂයෙන් පෙනෙන්න නෑ.

ගෝඨාභය රාජපක්ෂ, මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ නිෂ්පාදනය කඩා වැටීමත් අපනයන ක්‍රමය ලත් තැනම ලොප් වෙලා. රටේ ජනතාව සිය ඡන්දය ලබා දී කටයුතු කළාට රටේ ජනතාව තුට්ටුවකට මායිම් කර නෑ.

ජාතික ජන බලවේගය විස්ස ගැන මහජන සංවාද වේදිකාවක් හදනවා

හිටපු මන්ත්‍රී බිමල් රත්නායක

නදී මාණික්කගේ

ජාතික ජන බලවේගය 20 වැනි සංශෝධනය සම්බන්ධයෙන් මහජන සංවාද වේදිකාවක් ලෙස පාර්ලිමේන්තුවේත් එයින් පිටතදීත් ක්‍රියා කිරීමට බලාපොරොත්තු වන බව හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක මහතා පසුගිය දා ජනතා විමුක්ති පෙරමුණ පක්ෂ කාර්යාලයේදී පැවති ජන හමුවක දී පැවසීය.

හෙතෙම වැඩි දුරටත් මෙසේද කීවේය.

මේ ආණ්ඩුවට 2/3ක බලය ලැබීම අපේ රටේ පාර්ලිමේන්තුවත්, නීතියේ ආධිපත්‍යයත්, රාජ්‍ය මූල්‍ය පාලනයත්, මහජනතාවගේ අදහස් සාකච්ඡා කරන අවස්ථාවත් යන කරුණුවලින් එක දෙයක් හැර සියලු අවස්ථා නැති කර තියෙනවා. ඉතිරි කර තිබෙන්නේ ජනතාවගේ අදහස් පාර්ලිමේන්තුව තුළ සාකච්ඡා කිරීමේ අවස්ථාව පමණයි. රාජ්‍ය මූල්‍ය පාලනය සම්බන්ධයෙන් අපේ රටේ පමණක් නෙවෙයි ලෝකයේ බොහෝ රටවල පාර්ලිමේන්තුවට බලයක් තිබෙනවා. නමුත් අපේ රටේ එම මූල්‍ය බලය 20වැනි සංශෝධනයෙන් අහෝසි කර දමනවා.

රට තුළ වංචාව නාස්තිය හා දූෂණය පිරුණු වටපිටාවක් තුළ මේ තත්ත්වය අතිශය තීරණාත්මකයි. ජාතික ජන බලවේගය 20 වැනි සංශෝධනය සම්බන්ධයෙන් මහජන සංවාද වේදිකාවක් ලෙස පාර්ලිමේන්තුවත් එයින් පිටත් ක්‍රියා මාර්ග අනුගමනය කිරීමට බලාපොරොත්තු වෙනවා.

ජනාධිපති ධුරයේ ආධිපත්‍යය යටතට අතිශය වැදගත් ආයතන රැසක් පත් කරීමට නියමිතයි. රාජ්‍ය මූල්‍ය පාලනයට ප්‍රධාන වශයෙන්ම අදාළ වන විගණන කොමිසම අහෝසි කිරීම බරපතළ තත්ත්වයක්. පාර්ලිමේන්තුවේ මූල්‍ය පාලනයට අදාළව විගණකාධිපතිවරයා මේ දක්වා කරගෙන ගිය කාර්යභාරය විගණන නිලධාරියෙක් නොවන තැනැත්තකුට පවා පවරා දීමේ හැකියාව නිර්මාණය වී තිබෙනවා. ඒක රාජ්‍ය විගණන කොමිසම අහෝසි කිරීමේ බරපතළ තත්වයක් . ඒ වගේම මැතිවරණ කොමිසම සම්බන්ධයෙන් එහි නිලධාරීන්ගේ සුළු සුළු අඩුපාඩු තිබුණත් පක්ෂ භේදයෙන් තොරව සියලු දෙනාගේ ඇගයීමට ලක් වී තිබුණා. නමුත් 2/3 ජනවරම යොදාගෙන අධිකරණය විගණනය සහ මැතිවරණය සම්බන්ධ කොමිසන් සහා 3ම විධායකයට සහමුලින්ම යටත් කිරීමට මේ යෝජනාවෙන් උත්සාහ දරා තිබෙනවා.

අඩුම ගානේ පොදුජන පෙරමුණ කියන පක්ෂයටවත් යම් බලයක් ලැබෙන තත්ත්වයක් නැහැ. ජේආර්ටත් වඩා බලගතු පාලන තත්ත්වයක් පවුලක් තුළ ගොඩනගා ගැනීමේ උත්සහයක්, වෛවර්ණ ප්‍රචාරණ කටයුතු පිටුපස ගොඩනැගෙමින් තිබෙනවා. එහි අනිටු ප්‍රතිවිපාක මේ රටේ ලේ ගංගා මතින් උතුරේදීත් දකුණේදීත් අත්දැකින්න ලැබුණා. ජනවරමක් ඇති පළියට මේ තත්ත්වයට ඉඩදිය යුතු නැහැ.

රාජ්‍ය මූල්‍ය පාලනයට අදාළ 19 වැනි සංශෝධනය මඟින් සලසා තිබූ අවස්ථාවන් හකුලා දැමීමේ ක්‍රියාමාර්ග කිහිපයක්ම ගැන උදාහරණ දෙන්න පුළුවන්. ජනාධිපතිවරයාගේ සහ ජනාධිපති කාර්යාලයේත්, අග්‍රාමාත්‍යවරයාගේ සහ අග්‍රාමාත්‍ය කාර්යාලයේත් මූල්‍ය විගණනයන් 20න් ඉවත් කර තිබෙනවා. ඒකාබද්ධ අරමුදලෙන් මේ කාර්යාලවලට වෙන් කරන මුදල් පිළිබඳ විගණනයට ඉඩක් නැහැ. ජනාධිපති සහ අගමැති ජනතාවගෙන් පත් වූ අය වෙනුවට සූර්ය දිව්‍යරාජයාගෙන් පහළ වූ අය ද කියා අහන්න වනවා. පහුගිය කාලයේ ජනාධිපතිවරයා සතුව ආයතන පද්ධතියක් තබා ගැනීමේ ප්‍රතිඵල අප දැක්කා. වර්තමාන ආණ්ඩුව යටතේත් ජනාධිපතිවරයාත්, අගමැතිවරයාත් යටතේ ආයතන පද්ධතියක් තබාගෙන විශාල කාර්ය මණ්ඩලයක් නඩත්තු කරමින් යනවා. ඒ ගැන කිසිම මූල්‍ය වගකීමක් දරන්නේ නැහැ. 2014ට පෙරත් තිබුණේ මේ වගේම තත්ත්වයක්. කිසිම මූල්‍ය විනයක් තිබුණේ නැහැ.

ඒ වගේම 20 වැනි සංශෝධනයෙන් රාජ්‍ය සමාගම් විගණනය කිරීමේ අවස්ථාව විගණකාධිපතිවරයාගෙන් ඉවත් කරලා. එයාර් ලංකා සමාගම වැනි දූෂණ අක්‍රමිකතාවලින් පිරුණු රාජ්‍ය සමාගම් කෝප් කමිටුව ඉදිරියට ගෙනඒමේ හැකියාව එදා තිබුණා. දැන් එයාර් ලංකා, විදුලිබල මණ්ඩලය යටතේ තිබෙන සමාගම් වගේ රාජ්‍ය සමාගම් සම්බන්ධයෙන් යොදවන මහජන මුදල් විගණනය කිරීමේ අවස්ථාව අහිමි වෙනවා. මේ නිසාම කෝප් කමිටුවට පැවරී තිබුණු භූමිකාව සහ රාජ්‍ය ගිණුම්කාරක සභාවේ භූමිකාව සැලකිය යුතු ප්‍රමාණයකින් අහෝසි වී යනවා. රාජ්‍ය විගණනය වැඩක් නැති දෙයක් බවට පත් වනවා. විගණකාධිපතිවරයාට රාජ්‍ය සංස්ථා සහ දෙපාර්තමේන්තුවලට ගිණුම් පරීක්ෂා කිරීමේ බලය පමණක් 20 වැනි සංශෝධනයෙන් ඉතිරි කර තිබෙනවා. ඒ ආයතනවල කළමනාකාරිත්වය පරීක්ෂා කිරීමට ඉඩක් ඉතිරි කර නැහැ. කලින් ආණ්ඩුවේ මහා මාර්ග අමාත්‍යාංශය යටතේ සම්බන්ධීකරණ නිලධාරීන් 90ක් පත් කර තිබුණා. ඒ සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ වාර්තා අනුව ප්‍රශ්න කිරීමේ හැකියාව තිබුණා. නමුත් එම කළමනාකරණ පරීක්ෂාව ඉදිරියේදී කරන්න බැහැ. මේ රටේ දූෂණයට ඔටුණු පලඳවා තිබෙනවා.

යෝජිත ව්‍යවස්ථා කෙටුම්පත මගින් අයවැය යෝජනාවක් පැරදුනාම පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය අහෝසි කර තිබෙනවා. දෙවැනි වරත් පැරදුණොත් පමණක් විසුරුවා හරින්න පුළුවන්. මූල්‍ය විනය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට තිබෙන වගවීම අත්හරින ප්‍රමාණය මෙයින් පැහැදිලියි. ජේ.ආර්. ජයවර්ධන ඡන්දෙයෙන් අගමැති වී පාර්ලිමේන්තුවෙන් ජනාධිපති වුණා. දැන් ඡන්දයෙන් ජනාධිපති වී පාර්ලිමේන්තුවෙන් රජ වෙන්න යනවා. ජනතාවගේ මූලික අයිතීන්, පාර්ලිමේන්තුවේ මූල්‍ය බලය වගේම අධිකරණයේ ස්වාධීනත්වයත් අහෝසි කරමින් ගමන් කරන්නේ ඒ දිහාවටයි.

2010 ඉඳලාම ලෝකය පුරාම ප්‍රජාතන්ත්‍රවාදය හකුලා අන්ත දක්ෂිණාංශික නායකයන් බිහිවෙන ප්‍රවණතාවක් අප දැක්කා. අපේ රටේ ජනතාවත් අවුරුදු 40ක් පුරා අසීමිත කැප කිරීම් කරමින් උගතුන් බුද්ධිමතුන් කලාකරුවන් වැනි අයගේ මඟ පෙන්වීම මත ප්‍රජාතන්ත්‍රවාදය දෙසට මහා ගලක් තල්ලු කරමින් කන්ද නැගීමේ අසීරු ව්‍යායාමයක යෙදී සිටියා.



කිතුනු මිණ

kithunumina@gmail.com

පශ්චාත් කොවිඩ් යුගයේ කෝටි ගණනක් වටින ‘රන් කාසි දහය’

රන් කාසි දහයේ උපමාව හෙවත් තලෙන්තු උපමාව ගැන අසා නැති කිතුනුවකු සිටීදැයි සැක සහිතය. ඒ තරමට අපි ඒ ගැන අසා ඇත්තෙමු. එහෙත් එය ප්‍රායෝගික කරගෙන ඇත්තේ කීයෙන් කී දෙනාද යන ගැටලුව අප හමුවේ ඇත. රන් කාසි දහය (ලූක් 19 : 11-27) උපමාව ගැන අප අසා ඇතත් කිතුනු මිණ කියවන සෙසු ආගමික පාඨකයන් උදෙසා එකී උපමා කතාව සැකෙවින් මෙහි සටහන් කිරීම වටී යැයි සිතේ.

රාජ පෙළපතට අයත් එක් මනුෂ්‍යයෙක් රජකමට සුදුසුකම් ලබා එනු පිණිස වෙනත් රටකට යන්නට සූදානම්ව සිය දාසයන් දස දෙනකු කැඳවා රන් කාසිය බැගින් දුන්නේය. ඔහු පිටත්ව ගිය පසු මොහු රජකමට නුසුදුසු යැයි ඔහු යන රටට දන්වන්නට දූත පිරිසක්ද රහසේ පිටත් වූහ. කෙසේ වුවද අවසානයේ ඔහු රජකම පිණිස සිය රට පැමිණියේය. තමා දුන් රන් කාසිවලින් දියුණු වී ඇත්තේ කවුද යන්න ගැන විමසීමට ඔහුට අවැසි විය. පළමු සේවකයා තමා ඉන් රන් කාසි දහයක් ඉපැයූ බව පැවසා සිටි අතර, ඔහු ගැන ප්‍රසන්න වූ රජතෙම, ගම් දහයක පාලනය ඔහුට බාර දුන්නේය. දෙවැන්නා රන් කාසි පහක් දක්වා සිය රන් කාසිය වැඩි දියුණු කරගෙන තිබූ හෙයින් ඔහුටද ගම් පහක පාලනය බාර විය. ඒත් තෙවැන්නා සිය ස්වාමියා ගැන අමනාප හා බයාදු සිත් ඇතිව එකී රන් කාසිය රෙදි කඩක ඔතා තැබුවේය. ඒ ගැන අප්‍රසන්න වූ රජතෙම ඒ කාසියද ගෙන පළමුවැන්නාට දුන්නා පමණක් නොව සිය රජකමට විරුද්ධ වූවන්ට මරණ දණ්ඩනයද පැමිණෙවිවේය.

මේ උපමාව පශ්චාත් කොරෝනා සමයට ආදේශ කරගන්නේ කෙසේද යන්න ගැන සලකා බැලීම වටී. කොරෝනා වසංගතය සමඟ බොහෝ පුද්ගලයන් ආර්ථික අතින් කබලෙන් ලිපට වැටුණ බව අමුතුවෙන් කිව යුතු නැත. ලෝකයේ දියුණු රටවල් හා සාපේක්ෂව බලන කල, මෙරට බහුතරයකගේ ආර්ථිකය ඇත්තේ පහළ මට්ටමකය. එවැනි තත්ත්වයක් යටතේ කොරෝනා වසංගතය අපට දරුණු පහරකි. පාස්කු ප්‍රහාරයෙන් අඩපණ වී තිබුණ මෙරට ආර්ථිකය යළි හිස ඔසවන්නට උත්සාහ දරන විටම, කොවිඩ් ප්‍රහාරය එල්ල විය. මේ කුමන ප්‍රහාරයක් එල්ල වුවද, නැවත නැගිටීම කළ යුතුමය. රන් කාසි දහයෙන් වැඩි දියුණු කර ගත යුතු යැයි හැඟවූ අපගේ කුසලතා වැඩිදියුණු කර ගැනීම අතිශය වැදගත් වන්නේ මෙහිදීය.

පවතින අධ්‍යාපන ක්‍රමය දැනුම මෙන්ම ආකල්ප සහ කුසලතා මත පදනම් වුවද, අප දැඩි අවධානය යොමු කරන්නේ දැනුමට පමණය. එනම් වර්තමානයේ අධ්‍යාපනය කේන්ද්‍ර වී පවතින්නේ දැනුමට පමණි. මවුපියන්, වැඩිහිටියන්, උපකාරක පන්ති පවත්වන ගුරුවරුන් මෙන්ම පාසල්ද අද ප්‍රමුඛත්වය දී ඇත්තේ දැනුමට හෙවත් විභාග ප්‍රතිඵලවලට පමණි. එබැවින් කුසලතා මෙන්ම ආකල්ප ගැන වැඩි තැකීමක් නැත. මේ නොතකා හැරීම හේතුකොට ගෙන කුසලතාවලින් හීන පිරිසක් බිහිවෙමින් සිටිති.

කොවිඩ් හේතු කොට ගෙන, ඇතැමකුගේ රැකියාව අහිමි විය. ඇතැමකුගේ වැටුප කප්පාදුවට පත් විය. තිබූ රැකියාවෙන්ද අවම අවශ්‍යතා සපුරා ගනිමින් ජීවත් වූ පුරවැසියන්ට මෙය දරුණු පහරක් විය. එහෙත් කුසලතාවලින් පූර්ණ මිනිසුන්ට මෙය මහත් ගැටලුවක් නොවීය. ඔවුහු පෙර ආදායමට කිටිටු ආදායමක් හෝ අනුන්ට අත නොපා ජීවත්වීමට සරිලන ආදායමක් සොයන්නට සිය කුසලතා උපයෝගී කරගත්හ. එක් උදාහරණයක් මෙලෙසය.

මෙරට සුප්‍රසිද්ධ ඡායාරූප ශිල්පියකු සිය ජීවනෝපාය කරගත්තේ සිය වෙනත් කුසලතාවකි. කොරෝනා සමයේ ඡායාරූප පාඨමාලා පැවැත්වීමෙන් මෙන්ම ඡායාරූප ගැනීමෙන් ඔහු ලද ආදායම නැවතිණි. එහෙත් මේ ඡායාරූප ශිල්පියා සූපශාස්ත්‍රය යම් තරමකට ප්‍රගුණ කර තිබීම නිසා කුඩා ව්‍යාපාරයක් ආරම්භ කළේය. සිය නිවෙසේ තමා විසින්ම සැකසූ ආහාර වාහනයෙන් පාර අද්දර තබා විකිණීමට පටන් ගත් ඔහු ජීවිතය පවත්වා ගෙන යෑමට සෑහෙන ආදායමක් සොයා ගත්තේය. එපමණක් නොව, ඔහු රටේ ප්‍රසිද්ධ ඡායාරූප ශිල්පියකු බැවින් ඔහුගේ නව ව්‍යාපාරය බොහෝ දෙනකුගේ ජීවිකාව බවට පරිවර්තනය විය. එහිදී තවත් දෙයක් සිදු විය. එකම ව්‍යාපාරය, එකම තැන බොහෝ දෙනකු ආරම්භ කිරීමට යෑමෙන් එකී ව්‍යාපාරය බංකොලොත් විය.

ඒ අනුව බලන විට, කුසලතා එකිනෙකාට වෙනස් බව අප හඳුනා ගත යුතුය. එතැනදී ආකල්පද ඉතා වැදගත්ය. අනුකරණයට වඩා, වැදගත් වන්නේ සිය කුසලතා හඳුනා ගැනීමය. එය හඳුනා නොගන්නාට සිදුවන්නේ රිදී කාසි උපමාවේ තුන්වැනි සේවකයාට සිදු වූ දෙයමය. එබැවින් කුසලතා දියුණු කර ගැනීම, ආකල්ප වර්ධනයත් සමඟ සිදු විය යුතුය.

කිතුනුවන්ට බයිබලයෙන් ලැබිය හැකි පණිවිඩ මෙලෙසය. මේ අවස්ථාවේදී අපට සිහිවන්නේ ජාතක කතා සංග්‍රහයයි; එහි එන චුල්ල සෙට්ඨි ජාතකයද එවැනි අපූරු පණිවිඩයක් අපට ලබා දෙයි. මේ කතාවේ එන චුල්ල සිටාණෝ නුවණැතිය. ඔහු පාන්දර සිය නගරය වටා යන්නේ එහි තොරතුරු විමසන අටියෙනි. දිනක් ඔහු එලෙස යන අවස්ථාවක පාර අද්දර වැටී හිඳගෙන සිටින දුගියකු දුටුවේය; මේ චුල්ලන්තේවාසික තෙම සමීපයේ මී කුණක්ද තිබෙන වග දුටුවේය.

"දියුණු වන මිනිසකුට මේ මී කුණත් ප්‍රමාණවත්. මේ මී කුණෙන් පවුලක් නඩත්තු කිරීමට මෙන්ම වෙළෙඳාම් කිරීමටත් පුළුවනැ" යි පවසමින් සිටාණෝ යන්නට ගියහ.

චුල්ල සිටාණෝ යමක් පවසන්නේ නිකමට නොවන බව මේ දුගියාද කල්පනාවට ගත්තේය. එබැවින් ඔහු මේ වදන් ගැන කල්පනා කළේය. ඊළඟට මී කුණත් රැගෙන පූසකු ඇති කරන තැනැත්තකු සමීපයට ගොස් වී ඇට දෙකහමාරක රන්වලට එය විකුණා දැමීමේය.

එකී වී ඇට දෙකෙන් උක් සකුරු හා පැන් කළයක් මිලදී ගත් ඔහු, මල් කඩන පිරිසකට ඒවායින් නොමිලේ සංග්‍රහ කළේය. ඒ ඇත්තෝ තම මල්වලින් අහුර බැගින් ඔහුට දුන්හ. දින කිපයක් ඒ මල් විකුණා කහවනු අටක් ලබා ගත් ඔහුට ඊළඟ දවසේ මල්වත්තෙන් භාගයක්ම ඉතිරි කර යන්නට තරම් මල් නෙළන්නෝ කාරුණික වූහ. ඒ මල් විකුණා කහවනු දාසයක් උපයා ගැනීමට හේ සමත් විය. මේ අතර, මහ වැස්සක් සමඟ ආ සුළඟකින් රාජ උද්‍යානයේ ගස්වැල් කොටසක් පෙරළී හියේය. එතැනට ගිය ඔහු ඒවා අස්කර දීමට ඉල්ලූ අවසරය උයන්පල්ලාගෙන් ලැබුණු හෙයින්, කෙළිසෙල්ලමෙහියෙදී සිටි කොලුගැටුවන්ට උක්සකුරු දී ඒවා අස් කරගැනීමට සමත් විය. පිටත අස්පස් කළ දැව උද්‍යානයෙන් පිටත තැබූ පසු කුඹල්කරුවා ඒවා මිලදී ගත්තේ, වළං පන්සියයක්ද ඔහුට පිරිනමන ගමන්ය. මේ චුල්ලන්තේවාසික තෙම සිය වස්තුව කහවණු 24 දක්වා වැඩි කරගෙන පැන්සලක් සාදවා තණ කැපීමට යන මනුෂ්‍යයන්ට ඒ පැන් දුන්නේය. මේ සත්කරුණාවට අවශ්‍ය උපකාරයක් අවශ්‍යදැයි ඔවුන් විමසන විට ඔහු කියා සිටියේ අවැසි විටෙක පවසන බවය.

නොබෝ දිනකින් අශ්වයන් පන්සියයක් සමඟ වෙළෙන්දකු එන වග ඔහුට දැන ගන්නට ලැබිණි. ඔහු තණ කපන්නන්ගෙන් ඉල්ලීමක් කළේය. ඒ තණ මිටි පන්සියයක් තමන්ට ලබා දෙන ලෙස හා තමා ඒ තණ මිටි විකුණන තෙක් ඔවුන්ගේ තණ නොවිකුණන ලෙසය. තණ කපන්නෝද ඊට එකඟ වූහ. අශ්ව වෙළෙන්දා නගරය පුරා ඇවිද, තණ නොලබා මේ චුල්ලන්තේවාසික වෙත අවුත් රන් කහවණු දහසක් දී, තණ ගෙන ගියේය.

ගෙවුණු දිනක් පාසා ඔහු සිය සම්බන්ධතා ජාලයද වැඩිදියුණු කර ගත්තේය. එනම්, වෙළෙඳ ප්‍රජාව සමඟද සෙසු ප්‍රජාව සමඟද ඔහු සිය සම්බන්ධතා දියුණු කරගත්තේය. එසේ කොට වෙළෙඳ නැවක් ආ අවස්ථාවේ ඒ වෙළෙඳ නැවටම අත්තිකාරම් දී, සෙසු වෙළෙඳුන්ට තමන් හරහා භාණ්ඩ විකිණීමට කටයුතු කළේය. මේ සඳහා ඔහු සිය සම්බන්ධතා ජාලය උපයෝගී කර ගත්තේය. මෙතැනදී ඔහු සිය අන්තර් සබඳතා කුසලතාව මනාවට වැඩි දියුණු කර ගත්තේය. සිඟන්නකුව සිටි ඔහුට ලෝකය දිනන්නට මාවත සැකසුණේ, සිය කුසලතා දියුණු කර ගත් බැවිනි. වෙළෙඳ නැවෙන් ලක්ෂ දෙකක කහවණු සොයා ගත් ඔහු, කෘතඥ සැලකීම වස් චුල්ල සිටාණෝ සමීපයට ගිය කල්හි, පිටත යෑමට ඔහුට ඉඩ දිය නොදිය යුතු යැයි සිතා සිය දියණියද ඔහුටම විවාහ කරදුන්නේය. කාලයාගේ ඇවෑමෙන් සිටු තනතුරද චුල්ලන්තේවාසික තෙමට හිමි විය.

මේ අනුව බලන කල, බයිබලයේ රන් කාසි උපමාව හෝ ජාතක කතා පොතේ චුල්ල සෙට්ඨි ජාතකය හෝ කියවා, අසා තිබීම පමණක් ප්‍රමාණවත් වන්නේ නැත. ඒවා ජීවිතයට ප්‍රායෝගික විය යුතුය. ඒ ප්‍රායෝගිකත්වය ජීවිතය සාර්ථක කරනු ඇත.

සුමේධා නවරත්න

මරියතුමිය සෑම මවකටම ආදර්ශයක්

● අගරදගුරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ

චන්දිමා කරුණාරත්න

මරිය මවු ආදර්ශයට ගත් ජීවිතයක් ගත කිරීමට අද සමාජයේ මවුවරුන් සිතට ගත යුතු බව කොළඹ අගරදගුරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ පැවැසූහ. ජීවිතයේදී මුහුණ දීමට වන සියලු වේදනාවන් දරාගනිමින් ජීවත් වීමට මරියතුමිය ජීවිත සිය ආදර්ශයෙන් පෙන්වා දුන් බවත් කාදිනල් හිමිපාණෝ පෙන්වා දුන්හ.

උන්වහන්සේ මෙසේ පැවැසුවේ කන්‍ය මරියෝත්තමාවන්ගේ උපන්දිනය සමරමින් 08දා පැවැත්වූ දිව්‍ය පූජාවට සහභාගී වෙමිනි. දිව්‍ය පූජා යාගය සිදුකිරීමෙන් අනතුරුව මරියතුමියගේ උපන්දිනය සමරමින් කේක් කැපීමද උන්වහන්සේගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි.

ලෝකයේ සිටින සියලුම අම්මලාගේ ආදරය එකතු කළද එය දේව මෑණියන්ගේ ආදරයට සම කළ නොහැකි බවත් දේව මෑණියන් හැම අම්මා කෙනෙකුටම වඩා දුක දරාගත් බවත් පැවැසූ උන්වහන්සේ එදා කුරුසය ගමනේදී මරිය තුමිය, ජේසුතුමා සමඟම සිටිමින් උන්වහන්සේ ශක්තිමත් කළ බවත් ප්‍රකාශ කළෝය. ඒ ආකාරයටම අද සමාජයේ අම්මාවරුන්ද දුක වේදනාව දරාගනිමින් අභියෝග ජය ගනිමින් කටයුතු කළ යුතු බව උන්වහන්සේ පැහැදිලි කළහ.

වැඩිහිටියන්ගේ ආතතිය දරුවන්ට ගැටලු ඇති කරනවා

● හලාවත පදවි රදගුරු

වැලන්ස් මෙන්ඩිස් හිමිපාණෝ

වර්තමාන සමාජය සංකීර්ණ වීමත් සමඟ ඇති වෙමින් පවතින ගැටලුද සංකීර්ණ ස්වභාවයක් ගෙන ඇති බව දක්නට තිබෙන බවත් එබැවින් මනෝ උපදේශනය වෙනදාට වඩා දරුවන්ට සහ වැඩිහිටියන්ට අවශ්‍ය වී තිබෙන බවත් හලාවත රදගුරු වැලන්ස් මෙන්ඩිස් හිමිපාණෝ පසුගියදා හලාවතදී පැවති මනෝ උපදේශන කම්පු රැස්වීමේදී පවසා සිටියේය. අධ්‍යාපනය, රැකියාව, ආර්ථිකය යනාදි කරුණු හේතු කොට ගෙන මවුපියන් මෙන්ම දරුවන්ද දැඩි ආතතිමය තත්ත්වයට පත්ව සිටින බවත් ඒ නිසාම ඇති වන ගැටලු ඉහළ ගොස් ඇති බවත් උන්වහන්සේ කීය.

“මේ තත්ත්වය නිසා වෙනදාටත් වඩා දරුවන්ගේ ජීවිත ගැන සොයා බැලීමට පැවිදි, පූජක වගේම උගත් බුද්ධිමත් වැඩිහිටියන් වගකීමෙන් යුතුව කටයුතු කරන්න ඕනේ. තම ගැටලු විසඳා දෙන ලෙසට දරුවන්ම ඇවිත් අපට පවසන්නනේ නෑ. මොකද දරුවෝ කියන්නේ වැඩිහිටියන්ට නොවේ. තම ගැටලුව විසඳා ගත යුත්තේ කෙසේද කියන කාරණය ගැන ඔවුන්ට බොහෝ විට අවබෝධයක් නැති වෙන්න පුළුවන්. ගැටලුව විසඳා ගත යුත්තේ ඇයිද යන්නත්, ගැටලුව විසඳිය යුත්තේ කෙසේද යන්න ගැනත් ඔවුන්ට අවබෝධයක් නෑ.

දරුවන් කියන්නේ නිසි රැකවරණය, ආරක්ෂාව, ආදරය ලැබිය යුතු පිරිසක්. ඒ නිසා අප දරුවන් වෙත ගොස්, ඔවුන්ගේ ගැටලු මොනවාද යන්න ගැන අධ්‍යයනය කරන්න ඕනේ. ඒ ගැටලු නිසි ලෙස හඳුනාගෙන ඔවුන්ගේ ගැටලුවලට පිළිතුරු සෙවීම හැකි උපරිම ලෙස කළ යුතුයි. නගරබද දරුවන්ගෙ වගේම ගම්බද දරුවන්ගේ ජීවිත ගොඩ නැංවීමට මීට වඩා කැපවීමෙන් යුතුව වැඩ කිරීම ඉතා වැදගත්.

කොරෝනා කාලයේ දරුවන් නිවෙස්වලට කොටු වුණා. ඒ නිසා ඇතැම් දරුවන්ට තිබුණ ගැටලු වැඩි වී තිබෙන්න පුළුවන්. අධ්‍යාපනය ගැන විභාගය ගැන ගැටලු ඇති වී තියෙන්න පුළුවන්. මේ ගැටලු ඔවුන්ගේ ජීවිතවලට බලපානවා. ඒ වගේම කොරෝනා නිසා වැඩිහිටියන්ගේ රැකියාවට, ආර්ථිකයට බලපෑම් එල්ල වී තිබෙනවා. ඒ නිසා වැඩිහිටියන්ටත් විවිධ ගැටලු ඇති වෙලා තියෙනවා. ඒ නිසා මේ ජීවිත ගොඩ නැගීමට මනෝ උපදේශනය බෙහෙවින් වැදගත් වෙනවා. මාර්විල ශ්‍රී කුරුස උපදේශන මධ්‍යස්ථානය තව දුරටත් දරුවන්ට මෙන්ම වැඩිහිටියන්ට අවශ්‍ය උපදේශනය ලබා දීමට කටයුතු කළ යුතුයි.

සමාජ ගැටලු සංකීර්ණ වීම කියන්නේ තනි තනි පුද්ගලයන්ගේ ගැටලු සංකීර්ණයි කියන එකයි. එය නැවත චක්‍රයක් පවුලට වගේම සමාජයට බලපානවා. ඒ නිසා ජනතාවගේ ගැටලු විසඳීමට මනෝ උපදේශනය හැකි උපරිම ලෙස යොදා ගන්න ඕනේ. මාර්විල ශ්‍රී කුරුස උපදේශන මධ්‍යස්ථානය තව දුරටත් ඒ වෙනුවෙන් කැප වෙන්න ඕනේ. ඒ වගේම තමන්ට අවශ්‍ය ජීවිත අවබෝධය ලබාගන්න මාර්විල ශ්‍රී කුරුස මධ්‍යස්ථානයට එන ලෙසටත් අපි ජනතාවටත් ආරාධනා කරනවා” යැයි හලාවත රදගුරු වැලන්ස් මෙන්ඩිස් හිමිපාණෝ පවසා සිටියහ.

සහෝදරත්වයේ සිහිල් දියෙන් වාර්ගික ගිනි නිවා දමමු

ඉතාලිය අඳුරු කරමින් පැතිරුණු කෝවිඩ් වසංගතය නිසා එරට ජනතාව මුළුමනින්ම නිවාසවලට 'කොටු' කිරීමටත් සෞඛ්‍ය ආරක්ෂණ නීති ක්‍රියාත්මක කිරීමටත් ඉතාලි ආණ්ඩුවට සිදු විය. ඊට අවනත වූ වතිකානුයද සුදතුම් පියතුමාගේ ප්‍රසිද්ධ හමුවීම්, දිව්‍ය පූජා, දේව මෙහෙයන් සේම පොදු හමුවද අවලංගු කළේය.

මාස හයකට පසු සුදතුම් පියතුමා සහභාගි වන විවිධ අවස්ථා, ක්‍රමයෙන් ජනතාවට විවෘත වෙමින් තිබේ. ඒ අනුව පසුගියදා පවත්වන ලද පොදු හමුවට සහභාගීවීමට ප්‍රථම වතාවට ජනතාවට අවසර දී තිබිණි. කෙසේ වුවත් එය පවත්වන ලැබුවේ 30,000කට පමණ එක් විය හැකි සාන්ත පීතර චතුරශ්‍රයේ නොව වතිකාන උද්‍යානය ඇතුළත පිහිටි සන් දමාසෝ අංගණයේදීය. අවසර පත්‍රයක් ලබා ගැනීමෙන් තොරව ඕනෑම කෙනකුට ඊට සහභාගීවීමේ අවස්ථාව ලබා දී තිබිණි. එහෙත් ඊට එක්වන සියල්ලන් මුහුණු ආවරණ පැලඳ සිටීම අනිවාර්ය විය. හයසියයකට අධික පිරිසක් මෙම ප්‍රථම පශ්චාත්-කෝවිඩ් පොදු හමුවට සහභාගී වූහ.

"ජනතාව තිරයෙන් නොව මුහුණට මුහුණ දකින්නට ලැබීම සතුටක්" යැයි පොදු හමුව ආරම්භ කරමින් සුදොතුම් පියතුමා කීවේය. "කෝවිඩ් සීමා ක්‍රමයෙන් ලිහිල් කිරීම ප්‍රදර්ශනය කරන්නේ සමාජ ජීවියකු වන මිනිසාට තවත් මිනිසුන් අවශ්‍ය වන බව දැනවීමට"යැයිද උන්වහන්සේ කීය. සුදොතුම් පියතුමාගේ මෙවර පොදු හමුවේ නව ධර්මෝපදේශ දේශන මාලාවේ තේමාව "ලෝකය සුවපත් කිරීම" යන්නය.

අන්තර්-යැපීම සහ වසංගතය

වර්තමාන වසංගතය විසින් එක සාධකයක් ඉස්මතු කර ඇති බව සිය දේශනය අරඹමින් සුදොතුම් පියතුමා කීවේය. එනම් මිනිසුන් අතර පවතින අන්තර්-යැපීම (Interdependence) සහ ඒ මගින් ගොඩ නැගෙන සහෝදරත්වයයි.

“වර්තමාන වසංගතය විසින් මිනිස් අප අතර ඇති අන්තර්-යැපීම ඉස්මතු කරනු ලැබ තිබේ. යහපතට හෝ අයහපතට, අප එකිනෙකා එකිනෙකාට සම්බන්ධ වී සිටිමු. එබැවින්, පෙර සිටියාට වඩා හොඳින් මේ අර්බුදයෙන් ගොඩ ඒමට නම්, අප ක්‍රියා කළ යුත්තේ එකාවන්වය. එනම් අප සියල්ලන් සහෝදරත්වයෙන් එක්ව මිස තනිව නොවේ. එකට ය.” යැයි එතුමා කීවේය.

"අප සියල්ලන් ජීවත්වන්නේ දෙවියන් වහන්සේ විසින් අපට වාසය කිරීමට දෙන ලද මේ උද්‍යාන-ග්‍රහයා මතය. එය අපගේ පොදු නිවහනය. එමෙන්ම අපට ක්‍රිස්තුන් වහන්සේ තුළ පොදු ගමනාන්තයක් තිබේ. එහෙත් මිනිසාට එය අමතක වන විට අන්තර්-යැපීම නොසලකා හැරෙන අතර විෂමතාව සහ කොන් කරනු ලැබීම වර්ධනය වේ; සමාජ ජාලය දුර්වල වේ; පරිසරය විනාශ වේ. මේ අන්තර්-යැපීම නිතරම සහෝදරත්වයට පරිවර්තනය නොවේ. ඊට පටහැනිව, පෞද්ගලික හෝ ජාතික හෝ බල කණ්ඩායම්වල ආත්මාර්ථකාමීත්වය නිසා සහ න්‍යායාත්මක දෘඪ බව නිසා පාපයේ ව්‍යුහ ගොඩ නැගෙනවා. අනෙක් අතින් සහෝදරත්වය මුල් බැස ඇත්තේ දෙවියන් වහන්සේ සියලු මනුෂ්‍යයන් සහ මිහිතලය මැවූ සේක යන සත්‍යය තුළය. මේ නිසා සහෝදරත්වය අනෙකාට ගෞරවයෙන් සලකයි. එසේම උපද්‍රවයකදී අනෙකාගේ සහායට පැමිණෙයි."

සහෝදරත්වයේ මානසිකත්වය

බයිබලයේ උත්පත්ති පොතේ එන බාබෙල් කොත ඉදිකිරීමේ කතාව සිහිපත් කළ සුදොතුම් පියතුමා කියා සිටියේ "අහසට ලංවන්නට අප දරන උත්සාහය තුළ අපගේ සහෝදර ජනතාව අමතක කරන බවයි. "අපි අහස සූරන කුලුනු සහ මන්දිර ගොඩ නගමු; එහෙත් ඒ අතර අපි අපගේ මානව ප්‍රජාව විනාශ කරමු; අපි මිහිතලයේ ස්වාමිවරුන් වන්නට උත්සාහ කරමු; එහෙත් ඒ සඳහා අපි ජෛව විවිධත්වයත් පරිසරයේ තුල්‍යතාවත් විනාශ කරමු."

කිතුනුවන්ට සහෝදරත්වයේ උල්පත ශුද්ධාත්මයාණන් වහන්සේ බවද පූජ්‍ය ෆ්‍රැන්සිස් සුදොතුම් පියතුමා පෙන්වා දුන්නේය. "මාවත මෙයයි: එනම්, සංවාදයෙන් සම්බන්ධ වූ විවිධත්වය සහ සහෝදරත්වයයි. එක් එක් පුද්ගලයාගේ තනි පුද්ගලභාවයට අවශ්‍ය කරන 'ප්‍රතිදේහ' විවිධත්වය සහ සහෝදරත්වය තුළ තිබේ."

පෙන්තකොස්ත දිනයේ දී ශුද්ධාත්මයාණන් ශ්‍රාවකයන් මත වැඩම කර ඇදහිල්ල තුළ එක්සත් වූ ප්‍රජාවක් ගොඩ නැගුවේ ය."එම ප්‍රජාව විවිධත්වයෙන් සහ සහෝදරත්වයෙන් එක්සත්ව සිටියේය. මාවත මෙයයි: එනම්, සංවාදයෙන් සම්බන්ධ වූ විවිධත්වය සහ සහෝදරත්වයයි. එක් එක් පුද්ගලයාගේ තනි පුද්ගලභාවයට අවශ්‍ය කරන 'ප්‍රතිදේහ' විවිධත්වය සහ සහෝදර තුළ තිබේ. එම ප්‍රතිදේහ පවතින විට පුද්ගලයකු ස්වාර්ථවාදයෙන් හෝ ආත්මාර්ථකාමයෙන් රෝගී වන්නේ නැත" යි ෆ්‍රැන්සිස් සුදොතුම් පියතුමා පෙන්වා දුන්නේ ය.

"අර්බුදය මධ්‍යයේ, විශ්වාසය මඟින් මඟ පෙන්වන සහෝදරත්වය, මන්දිර හෝ පවුරු ඉදිකිරීමෙන් නොව, ප්‍රජා එකට සම්බන්ධ කිරීමෙන් සහ සැබවින්ම මානුෂික සහ ස්ථිර වූ ක්‍රමවේද ඔස්සේ, අපගේ සංස්කෘතිය තුළ දෙවියන් වහන්සේගේ ප්‍රේමය පරිවර්තනය කිරීමට අට හැකියාව ලැබේ" යැයි එතුමා පැහැදිලි කළේය. "මේ කාලයේ අප වෙන් කිරීමට කෙතරම් පවුරු ඉදි වන්නේද? ඒවා කෙතරම් විනාශ වන්නේ ද?" එතුමා ප්‍රශ්න කළේය.

මේ නිසා පුද්ගලාර්ථය වෙනුවට සහෝදරත්වය ගොඩ නැගීමට ක්‍රියා කරන්නැයි එතුමා කිතුනු ජනතාවට ආරාධනා කළේය.

සමන් කපිල විජේසූරිය

ඇගස්ගවිව

වින්දනීය සිනමාවේ වර්තමාන කියවීම

සිනමාවේ නොමියෙන මිනිසා
ගාමිණී ෆොන්සේකා

වැලිකතරෙහි වික්‍රම රන්දෙනියත්, සරුංගලේහි නඩරාජා මහත්තයාත්, ගම්පෙරළියේ ජිනදාසත්, පරසතුමල්හි බොනී මහත්තයා මෙන්ම චණ්ඩියාහි චුට්ටටේත් හුලවාලියේ ධාරාත්, යුගාන්තයේ සවිමන් කබලානත් ඔබ සිත්හි පැලපදියම් ඇතුවාට සැකයක් නැත. මේ චරිත රංගනයන් අතරේ ඔහු තවමත් සිනමාවේ නොමියෙන මිනිසාය.

සිහින් සරයෙන් කියූ ප්‍රේමය

හැටේ දශකය අග භාගයේදී සුගතපාල සෙනරත් යාපා තම නවතම සිනමාපටය සඳහා නවක නළු නිළියන් තෝරා ගැනීමේ අරමුණින් සම්මුඛ පරීක්ෂණයක් පිළිබඳව පුවත්පත් දැන්වීමක් පළකර තිබිණි. ඒ ඔස්සේ කෝවිලගේ ඇන්ටන් විජය කුමාරණතුංග තම ප්‍රථම සිනමා නිර්මාණය වූ හන්තානේ කතාව චිත්‍රපටය හා සම්බන්ධ විය. 1968දී මේ හා සම්බන්ධ සිදුවීම වුවත් චිත්‍රපටය තිරගත වූයේ 1969දීය. එතැන් පටන් විජය තම සිනමා ආගමනය තුළ තමන්ගේ ආස්ථානය සනිටුහන් කිරීමට සමත් විය. හන්තානේ කතාව චිත්‍රපටයෙන් සිනමාවට පිවිසි විජය කුමාරණතුංග මාලනී ෆොන්සේකා හා එක්ව රඟපෑ මුල්ම චිත්‍රපටය වූයේ "මේ දෙඇස" චිත්‍රපටයයි.

කෙසේ වුවත් "මේ දෙඇස" චිත්‍රපටයෙන් මාලනිය සමඟ රංගනයට පිවිසි අලුත් හාදයා පුරා වසර විසි ගණනකටත් වඩා කාලයක් ඇය සමඟ රංගනයේ යෙදෙන්නට සමත්විය. ඔහු ඇයගේ පෙම්වතා විය. ඇය ඔහුගේ පෙම්වතිය විය. සිනමාවේ කුමාරයා විජය වනවිට මාලනිය සියලු සිනමා රසිකයන් වශීකෘත කරගත් සිනහවකින් යුත් කාගේත් පෙම්වතිය විය. විජය වීරයාත්, පෙම්වතාත්, සිහින කුමරාත් වන විට සියල්ලන්ගේම බලාපොරොත්තුව වූයේ කටකාර මාලනිය විජයගේ පෙම්වතිය සේ දැක බලා ගන්නට වූ අපේක්ෂාවයි. ඔවුන්ගේ මුල්ම සිනමා පටය වූ "මේ දෙඇස කුමටද" චිත්‍රපටයේ දෑස් නොපෙනෙන අහිංසක තරුණයකු ලෙස විජය රංගනයෙන් එක්වන විට මාලනිය ගැමි තරුණියක ලෙස ඔවුන්ගේ මංගල හමු වූ සිනමා පටය හා සම්බන්ධ විය

"නිල් අහසේ
උමතු වලා
ගොළු වී දුක සේ පාවෙනවා
ගිම්හානේ හිරු නැඟලා
පිපුණු කුසුම් පෙති පරවෙනවා"

රෝයි පීරිස්, සුමනා අමරසිංහ සමඟ ආවරණය නොමැති විවෘත කාරයක නැගී විජය මේ ගීතය ගායනා කරන්නේ "මේ දෙඇස කුමටද" චිත්‍රපටයේය. එපමණක් නොව "ආලෝකයේ අතීතයේ", "මා තැනු රුවන් විමන් බිඳී" යන ගීත මේ සිනමාපටයේ ජනප්‍රියත්වය උදෙසා ඉවහල් විය. "මේ දෙඇස කුමටද" චිත්‍රපටය පිළිබඳ කතා කිරීමට පෙර කතා කළ යුතු චිත්‍රපටය වන්නේ හතරදෙනාම සූරයෝ චිත්‍රපටයයි. මන්ද විජය- මාලිනී මුලින්ම රංගනයෙන් එක් වූ චිත්‍රපටය "මේ දෙඇස කුමටද" වුවත් එයට පෙර තිරගත වූයේ "හතරදෙනාම සූරයෝ" චිත්‍රපටයයි.

හන්තානේ කතාවෙන් ජනප්‍රියව හුන් විජය මුල්ම වරට මාලනිය සමඟ රසිකයන්ට දැකගත හැකි වූයේ මෙම චිත්‍රපටයෙනි. "මේ දෙඇස කුමටද" මුලින්ම රූ ගත කළත් තිරගත වූයේ පසුව නිසා හතර දෙනාම සූරයෝ චිත්‍රපටය අතිශය ජනප්‍රිය වූ බැවින් නැවුම් එක්වීමේ දෙවැනි අදියර දැක බලා ගන්නට ප්‍රේක්ෂකයා නැවත මේ දෙඇස කුමටද චිත්‍රපටය හා එක් රොක් වන්නට ඇත.තවත් ලෙසකින් කිවහොත් හතරදෙනාම සූරයෝ චිත්‍රපටයෙන් ලැබූ ඒ රසයම ලබන්නට මේ චිත්‍රපටය හා රසිකයන් එකත වූණා යැයි අනුමාන කිරීමටද හැකිය. හතරදෙනාම සූරයෝ, මේ දෙඇස කුමටද චිත්‍රපට දෙක විජය මාලනීගේ ප්‍රේමාන්විත සිනමා අම්බරයේ එක, දෙක ලෙස අංක ගත වුවද විජය ප්‍රධාන නළුවකු සේ පෙනී සිටී "හන්තානේ කතාව" චිත්‍රපටය විජය මාලනී මුණගැසුණු මංගල චිත්‍රපටය වන්නටද ඉඩ තිබිණි. ඒ බැව් වරක් ප්‍රකාශ කර තිබුණේ මාලනියම විසිනි. ඒ ඇයට ද ඒ සඳහා ආරාධනාවක් ලැබුණු බවත් කවර හෝ හේතුවක් නිසා එය මඟ හැරී ගිය බවයි. එයත් එසේ වූවා නම් විජයගේ ආරම්භයම යම් විටක වෙනස් වන්නටද ඉඩ තිබිණි..

"අහා අහා ආදරණීය සිනා ඔබේ
අහා අහා ආදරණීය සිනා
මගේ නෙත්තුරුල්ලේ
නිදැල්ලේ සැතපෙනා
අහා අහා ආදරණීය සිනා ඔබේ
අහා අහා ආදරණීය සිනා
හදේ මල් ලතාවේ සුගන්දේ විහිදෙනා
අහා අහා ආදරණීය සිනා"

ඒ විජය මාලනී ෆොන්සේකා සමඟ හතර දෙනාම සූරයෝ චිත්‍රපටයේ පෙනීසිටි අතිශය ජනප්‍රිය වූ ගීතයකි.මෙකී සියල්ල තුලින්ම යසපාලිත නානායක්කාරගේ උකහා ගැනීම තුළින් අත්වූ අවසන් ප්‍රතිඵලය වන්නේ 1973 දී ප්‍රේක්ෂකයන් හමුවට ආ තුෂාරා චිත්‍රපටය බොක්ස් ඔෆිස් වාර්තා තබමින් අතිශය සාර්ථක ලෙස තිරගත වූ චිත්‍රපටයක් වීමයි. නමුත් එය තවත් එක් බොක්ස් ඔෆිස් තැබූ චිත්‍රපටයක් නම් නොවීය. සිනමා ප්‍රේමය ජය ගත්තද විජය හා මාලනීට තම දිවි මං තලාවේ ප්‍රේමය නිසි අයුරින් සලකුණු කරගත හැකි නොවීය. විජය මාලනී විවාහය ඔවුන් ජනප්‍රියත්වයට පත්ව හුන් 70 දශකයේ දීම සිදු වන්නට ගිය ද එය කවර හෝ හේතුවක් නිසා මඟ හැරී තිබිණි. ඒ කරුණු සම්බන්ධයෙන් මෙන්ම ඊට පෙර හා පසුව ඊට අදාල දෑ මෙන්ම විජය මාලනී ප්‍රේමයට අදාළ නොවන දෑ ද කතා වස්තූන් ලෙස සමාජ ගත වන්නට විය. ඒ කාලයේම ඒවා කට කතාය. පසුව කලක් ගතවන විට ඒවා හරිහැටිම විනිශ්චය කර ගත් පසු රසවත් කතාය. දැන් ඒවා අතීත කතාය. අතීත කතාවන් හා සිදුවීම් බොහෝ රසවත් ය. එහෙත් මේවා අනුන්ගේ කතාය. පෞද්ගලික දෑය. ඒ නිසා ඒ පරිච්ඡේදයට පමණක් මෙතැනින් තිත තබමු.

ඒ අසිරිමත් කාලය ලාංකේය සිනමාව අලුත් හුස්මක් ගත් කාලයයි. විජය මාලිනී හා එක්ව ප්‍රධාන චරිතයත් රඟපෑ තරමට හා සමානව වෙනත් තරු යුගලක් නම් සිංහල සිනමාවෙන් සොයා ගැනීමට හැකියාවක් නැත. විජය- මාලනී සිනමාවට නවමු පෙම් පුවතක් ගෙනා තරු යුගලක් පමණක් නොවීය. සිනමාවේ කුමාරයා විජය වන විට කුමාරයාගේ නෙත් සිත් පැහැරගත් ප්‍රියම්බිකාව මාලනිය විය. කාලය වියැකී ගියද මේ ප්‍රේමය සදාතනික සිහිවටනයක් විය. හිමි මීදුම් අතරින් සවන් පත් සනහා තවමත් රැව් දෙන්නේ ඒ ප්‍රේමයේ සිහින සරයයි.

"කලක් තිස්සේ හිතක් පත්ලේ
පිපී රන්වන් මලක් දිලුණේ
තුෂාරා පත් මුදු මුදුන් සරසා
සුපෙම් හැඟුමන් හිතේ ගවසා
කලක් තිස්සේ හිතක් පත්ලේ
පිපී රන්වන් මලක් දිලුණේ"



"කලක් තිස්සේ හිතක් පත්ලේ
පිපී රන්වන්
මලක් දිලුණේ
තුෂාරා පත් මුදුන් සරසා
සුපෙම් හැඟුමන්
හිතේ ගවසා
කලක් තිස්සේ
හිතක් පත්ලේ
පිපී රන්වන්
මලක් දිලුණේ"

රජිත බස්නායක

පුංචි බබාට පසු හතර දෙනාම සූරයෝ

කාලයක් තිස්සේ සිට වර්තමානය දක්වා හෙළ සිනමාවේ නිළි රැජන ලෙස නම් දරා සිටින්නේ එකම නිළියකි. එනම් ඒ මාලනී ෆොන්සේකා ය. මාලනී ෆොන්සේකා සිනමාවට අවතීර්ණ වූයේ තිස්ස ලියනසූරිය අධ්‍යක්ෂණය කරනු ලැබූ පුංචි බබා චිත්‍රපටයෙනි. මාලනී හා මෙම චිත්‍රපටයට සම්බන්ධ අනෙකුත් ජනප්‍රිය ශිල්පීන් වූයේ ජෝ අබේවික්‍රම, අනුලා කරුණාතිලක, සහ ඩොමී ජයවර්ධනයි. කෙසේ වුවද මේ පවසන්නට යන සිදුවීම පිටුපස ඇත්තේ අපූරු කතාවකි. මේ චිත්‍රපටයේ එක් දර්ශනයක ජෝ අබේවික්‍රම කුඩා දරුවකු අත තබාගෙන නලවන දර්ශනයකි. එය යොදාගෙන ඇත්තේ එම චිත්‍රපටයේ එන එක් ගීතයක් උදෙසාය. මේ ගීතය වන්නේ

"මාගේ පුතුට මල්
යහන සදන්නේ
දෑසෙ සිහින වැල්
පාවී එන්නේ
රෝස කැලේකින්
හමුවූ වැන්නේ
මට මේ කුමරුන්
කවුදෝ දුන්නේ"

යන ගීතයයි.

ධර්මසිරි ගමගේ මේ ගීතය රචනා කළ අතර ගීතය ගායනා කරනු ලැබුවේ සිසිර සේනාරත්නයි. දර්ශනයට පෙනී සිටි ශිල්පියා වූයේ ජෝ අබේවික්‍රමයි. නමුත් මෙම සිදුවීම චිත්‍රපටයට අදාළ වූ දෙයක් නොවූවත් එය චිත්‍රපටයෙන් පරිබාහිරව සාමාජීය ජීවිතය තුළ සිදු වූ සත්‍ය සිදුවීමකි.

මෙම චිත්‍රපටය රෑ ගත වන කාලයේදී චිත්‍රපටය නිෂ්පාදනය කරන ලද සුගතදාස මාරසිංහ ගේ බිරිය දරුවකු අපේක්ෂාවෙන් සිටි කාලයක්ද නොවීය. නමුත් මේ ගීතය හා සම්බන්ධ වුණු ජෝ අබේවික්‍රම, සිසිර සේනාරත්න, ධර්මසිරි ගමගේ පිය පදවිය ලබන්නට පෙරුම් පුරමින් සිටි කාලයකි. කෙසේ හෝ මේ සියල්ල සිදු වී අවසන් වන විට මේ සිව් දෙනාම පිය පදවියට පත්ව සිටියාය. එපමණක් නොව මේ සිව් දෙනාටම ලැබී තිබුණේ පුතුන් සිව් දෙනෙකි. එය අපූරු සිදුවීමක් ලෙස චිත්‍රපටය හා සම්බන්ධ වූ බොහෝ දෙනෙක් පවසන්නට විය. එම ගීතය ඔවුනට ආශිර්වාදයක් වූවා යයි කෙනෙකු පැවසුවහොත් කිසිවකුටත් එය බැහැර කිරීමට හැකියාවක් ලැබෙන්නේද නැත..

කෝ මා පැතූ ඔබෙ ආදරේ...

කෝ මා පැතූ ඔබෙ ආදරේ
කෝ මා පැතූ ඔබෙ ආදරේ
කෝ මා පැතූ

ආවේ එදා මා තනිවී ලොවේහී
නැතිවී ගියා ඒ හැඟුමන් මෙහී
ආවේ එදා මා තනිවී ලොවේහී
නැතිවී ගියා ඒ හැඟුමත් මෙහී
යළි මා අනාතයි උතුරා ගලා යයි
සංවේදනා

කෝ මා පැතූ ඔබෙ ආදරේ
කෝ මා පැතූ ඔබෙ ආදරේ
කෝ මා පැතූ

පායා පහන් වූ රන් තාරකවෝ
අඳුරේ දමා මා නොපෙනී ගියා
පායා පහන් වූ රන් තාරකාවෝ
අඳුරේ දමා මා නොපෙනී ගියා
කවදාද ආයේ පායා දිලෙන්නේ
රන් තාරකා

කෝ මා පැතූ ඔබෙ ආදරේ
කෝ මා පැතූ ඔබෙ ආදරේ
කෝ මා පැතූ

ගේය පද-
රංජිත් වීරසිංහ
සංගීතය-
ආචාර්ය ප්‍රේමසිරි කේමදාස
ගායනය-
ටී. එම් .ජයරත්න
චිත්‍රපටය-
ජනක සහ මංජු
තිර රචනය, නිෂ්පාදනය හා අධ්‍යක්ෂණය
කේ ඒ ඩබ්ලිව් පෙරේරා
රංගනය -
ජයන්තදාස් පෙරේරා ගෝතමී පතිරාජ
කැමරාකරණය සහ සංස්කරණය -
එම්. ඒ. ගෆූර්, එම්.ඒ. රූපසේන

සිංහල සිනමාවේ 374 වැනි චිත්‍රපටය ලෙස ජනක සහ මංජු චිත්‍රපටය සැවෝයි, ලීඩෝ, ක්‍රවුන්, විජිත ඇතුළු හතරවැනි මණ්ඩලයේ සිනමාහල් වල තිරගත විය. 1978. 01.27 කළු සුදු මි.මි.35 ප්‍රමාණයෙන් නිපදවුණු ජනක සහ මංජු චිත්‍රපටය ශ්‍රී ලාංකේය සමාජයේ අතිශය ජනප්‍රිය ගීත කිහිපයක් බිහි කරනු ලැබීය.

ක්ලැරන්ස් විජේවර්ධන සහ ලතා වල්පොළ ගායනා කරන "ලෝකේ ජීවත් වන්නට"

එච් ආර් ජෝතිපාල ගායනා කරන "සීත මෝසම් ගීත නාදෙන්"

ඩබ්ලිව්. ඩී. අමරදේව ගායනා කරනු ලබන "මේ ගී එදා ඇගේ හඬින්"

ක්ලැරන්ස් විජේවර්ධන ගායනා කරන "සුවඳක් දැනේවි හදේහි"

මේ ගීත හතරට අමතරව තවත් එක් සුවිශේෂ ගීතයක් නිර්මාණය වූ අතර එය ටී.එම්. ජයරත්න ගායනා කරන "කෝ මා පැතූ ඔබේ ආදරේ" ගීතයයි. ජනක සහ මංජු චිත්‍රපටයෙහි පෙම්වතිය වන මංජු සමගින් උරණ වූ පෙම්වතා වන ජනක ඒ මොහොතේ ඇති වූ හැඟීම දනවන අයුරින් පරිසරය හා සම්බන්ධ කරමින් රූපරාමු මවමින් නිර්මාණ මානය වූ ගීතයක් ලෙස මෙය නම් කළ හැක.

ටී.එම්. ජයරත්න ගේ ජීවිතයේ ඉතා වටිනා සංධිස්ථානයක් සටහන් කළ ගීයක් බවට කෝ මා පැතූ ඔබෙ ආදරේ ගීතය පත්වන්නේ ලංකාවේ පැවති ප්‍රථම ජනාධිපති සිනමා සම්මාන උළෙලේදීම 1979 වසරේ හොඳම චිත්‍රපට පසුබිම් ගීත ගායනයට හිමි ජනාධිපති සම්මානය හිමි වීම නිසාය.

" ආචාර්ය ප්‍රේමසිරි කේමදාස මට ගීතය ගායනා කරන්න කතා කළා. ඒ ආරාධනයෙන් කෝ මා පැතූ ඔබේ ආදරේ ගීතය ගායනා කළා. චිත්‍රපටයකට ගීතයක් ගායනා කරන බව දැනගෙන සිටියත් ජනක සහ මංජු චිත්‍රපටයට මේ ගීතය නිර්මාණය වන බව දැනගෙන හිටියේ නැහැ .මට එහෙම අදහසක් තමයි ගීතය ගැන තියෙන්නේ"

මීට කලකට පෙර ටී.එම්. සඳහන් කර තිබුණේ එසේය.

බැලූ බැල්මට සරල ගීතයක් ලෙස මෙම ගීතය පෙනුනද චිත්‍රපටයෙහි අතිශය හැඟීම් දැනවිය යුතු අවස්ථාවක ස්ථානෝචිතව අධ්‍යක්ෂවරයා විසින් මෙම ගීතය යොදා ගෙන ඇති බව පේන්න තියෙනවා. පෙම්වතිය සමග පොඩි දේටත් නොහොඳ නෝක්කාඩු වෙන බව සැබෑය. නමුත් තමාගේ පෙම්වතිය තමා හට සදහටම අහිමි වන තත්ත්වයකට එම නෝක්කාඩු උත්සන්න වූ විට සැබෑම අවංක ප්‍රේමවන්තයකුට එය දරාගත නොහැකිය. එවැනි මොහොතක හිතේ ඇතිවන හැඟීම් පිට කර ගැනීමට සාමාන්‍ය ජීවිතයේදී පෙම්වතුන් බොහෝ දේ කරන්නට පුළුවන. නමුත් චිත්‍රපටයක පෙම්වතාගේ වේදනාව හෝ ඒ මොහොතේ ඇතිවන පෙන්නුම් කිරීමට අධ්‍යක්ෂවරයා විසින් යොදා ගන්නා ප්‍රමුඛ උපක්‍රමය වන්නේ ඒ මොහොතට වඩාත් අදාලවන පසුබිම් සංගීතයක් හෝ ගීතයක් යොදාගැනීමයි. බොහෝ අවස්ථාවල දී මිනිසුන් නොමැති ස්වාභාවික පරිසරයක කාලය ගත කිරීම ආදියත්, හදවතේ රිද්මය කලාත්මකව සුව කිරීමත් කෝ මා පැතූ ගීත රූප රචනය තුළින් මතුකර ඇති බව පෙනේ. කෝ මා පැතූ ගීතයේ අර්ථය බැලුවහොත් එය ජනක සහ මංජු චිත්‍රපටයේ එම අවස්ථාවට උචිත ජනක ගේ හැඟීම් ජනනය වන අයුරු දැකීමට හැකිය.

"පායා පහන් වූ රන් තාරකාවෝ
අඳුරේ දමා මා නොපෙනී ගියා
කවදාද ආයේ පායා දිලෙන්නේ
රන් තාරකා "

විනාඩි තුනක පමණ කාලයක් දර්ශනය වන කෝ මා පැතූ ඔබේ ආදරේ ගීතය, චිත්‍රපටය තුළ අතිශය ප්‍රේක්ෂක රස උද්දීපනයට අදාළම ගීතය බව ජනාධිපති සම්මානය උලෙළේදී හොඳම පසුබිම් ගීත ගායනයට හිමි සම්මානය ලැබීමෙන් ම පසක් වේ.

ජෝන් දිනේෂ් සඳරුවන්



ඇස්ට්‍රාසෙනෙකා සමාගම සහ ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය එක්ව එක්සත් රාජධානියේ කොරෝනා එන්නතක් නිපදවීමට ගෙන ගිය පරීක්ෂණ අවසාන අදියරට ළංව තිබියදී හදිසියේ අත්හිටුවීමට සිදු වී ඇත. පරීක්ෂණවලට සහභාගි වූ අයෙකුට අහිතකර ප්‍රතික්‍රියාවක් ඇතිවීම නිසා මෙසේ එම පරීක්ෂණ අත්හිටුවා තිබේ.

හරිහැටි විස්තර කළ නොහැකි රෝගයක් සඳහා එය සාමාන්‍ය විරාමයක්යැයි ඇස්ට්‍රාසෙනෙකා පවසයි. මේ එන්නත සම්බන්ධ පරීක්ෂණවල ප්‍රගතිය ගැන මුළු ලොවම බලා සිටියේය. ලොවපුරා නිපදවෙන කොරෝනා එන්නත් අතර ඇස්ට්‍රාසෙනෙකා සහ ඔක්ස්ෆර්ඩ් එක්ව පරීක්ෂණවල නිරතව සිටින මේ එන්නත ගැන වැඩි අවධානයක් දිනා ගත්තේය.

1 වැනි සහ 2 වැනි අදියරවල දී සාර්ථක ප්‍රතිඵල පෙන් වූ මේ එන්නත ලොව මුලින්ම වෙළෙඳපොළට එන කොරෝනා එන්නත වෙතැයි බොහෝ දෙනා විශ්වාසය පළ කළේය. 3 වැනි අදියරේ පරීක්ෂණ සිදු කෙරෙමින් පැවැති මෙය අමෙරිකාවේ, එක්සත් රාජධානියේ, බ්‍රසීලයේ සහ දකුණු අප්‍රිකාවේ 30,000කට වැඩි පිරිසකගේ සහභාගිත්වයෙන් සිදු කරමින් පැවැතිණි. තුන්වන අදියරට වසර ගණනාවක් ගත වනු ඇතැයි බලාපොරොත්තු විය.

එක්සත් රාජධානිය කොරෝනා එන්නත නිපදවීම හදිසියේ අත්හිටුවයි

බොලිවුඩ් නිළි රියා චක්‍රබෝර්ති අත්අඩංගුවට ගනී

ඇය සියදිවි නසාගත් බොලිවුඩ් නළු සුෂාන්ත් සිංගේ පෙම්වතියයි

සියදිවි නසාගත් බවට විශ්වාස කළ බොලිවුඩ් නළු සුෂාන්ත් සිං රාජ්පුත්ගේ පෙම්වතිය වූ බොලිවුඩ් නිළි රියා චක්‍රබෝර්ති ඉන්දීය මත්ද්‍රව්‍ය නිවාරණ ඒකකය විසින් අත්අඩංගුවට ගෙන ඇත. ඇය අත්අඩංගුවට ගෙන ඇත්තේ සුෂාන්ත්ගේ මරණයට අදාළව මත්ද්‍රව්‍ය සිද්ධියකටය.

මුම්බායි නුවර සිය මහල් නිවෙසේ දී සිදුවූ සුෂාන්ත්ගේ මරණයට රියා පෙලඹවීමක් සිදුකර ඇතැයි ඔහුගේ පවුලේ අය චෝදනා කරති. මේ ගැන ඇය විස්තරයක් කියා නැතත්, තමන් කිසිදු වරදක් සිදුකර නැතැයි කලින් ප්‍රකාශ කළාය. බලධාරීන් තවමත් මේ ගැන නිවැරැදි තොරතුරක් අනාවරණය කරගෙන නැත.

ග්‍රීසියේ ලෙස්බෝස් දූපතේ විශාලතම සරණාගත කඳවුර ගින්නකින් අළු වෙයි

ග්‍රීසියේ ලෙස්බෝස් දූපතේ පිහිටි එරට විශාලතම සරණාගත කඳවුර වන, පමණ ඉක්මවා සරණාගතයන්ගෙන් පිරී පැවැති මෝරියා කඳවුර ගින්නෙන් විනාශ වී ගොස් ඇත. ගිනි නිවීමේ භටයන් 25ක් ගිනි නිවන රථ 10ක් ගින්න නිවීමට කටයුතු කර ඇති අතර සරණාගතයන් ඒ ස්ථානයෙන් ඉවත් කර තිබේ. ගින්නෙන් නැගුණු දුමට හසුවීම නිසා සරණාගතයන් පිරිසක් තුවාල ලබා ඇත. කොරෝනා වයිරස් නීතිවලට එරෙහිව උද්ඝෝෂණය කළ සරණාගතයන්ගේ ක්‍රියාකලාපය නිසා ගින්න හටගෙන ඇතැයි විශ්වාස කෙරේ. එහෙත් එය තහවුරු කොට නොමැත. මෝරියා කඳවුරේ සරණාගතයන් 13,000ක් රඳවා සිටින අතර එය එම කඳවුරට දරාගත හැකි ප්‍රමාණය මෙන් සිව් ගුණයකි.

සුපිරි පාපන්දු ක්‍රීඩක රොනල්ඩෝ වාර්තා පොතට

පෘතුගාලයේ සුපිරි පාපන්දු ක්‍රීඩක ක්‍රිස්ටියානෝ රොනල්ඩෝ අන්තර්ජාතික තරගවල දී ගෝල 100ක් ලබාගත් පළමු යුරෝපීය ක්‍රීඩකයා ලෙස වාර්තා පොතට එක් වී තිබේ. නේෂන්ස් ලීගයේ ස්ථිවනයට එරෙහිව ක්‍රීඩා කරමින් ගෝල් 2ක් ලබාගනිමින් ඔහු මේ වාර්තාව පිහිටුවීය. නිදහස් පහරක් ඉහළ අන්තයෙන් ගෝලයක් බවට පත් කරමින් මේ දක්ෂතාව පෙන්නුම් කළේය. දෙවැනි ගෝලය ඔහු වාර්තා කළේ කොටුවෙන් පිට සිටය. එම තරගයේ විනාඩි 81ක් ක්‍රීඩා කළ රොනාල්ඩෝ ලොව වැඩිම අන්තර්ජාතික ගෝල වාර්තාවට ගෝල 8ක් පිටුපසින් සිටියි. මේ වන විට ඒ වාර්තාව හිමිකරගෙන සිටින්නේ අන්තර්ජාතික ගෝල 109ක් වාර්තා කර ඇති ඉරාන ක්‍රීඩක අලී ඩායිය.

වොෂිංටනයේ ළැවිගින්නෙන් කුඩා නගර මුළුමනින්ම දැවී යයි

බටහිර අමෙරිකාවේ කැලිෆෝනියාවේ සහ වොෂිංටනයේ ඇති වූ ළැවිගින්නට බිලි වී ඇතැම් කුඩා නගර මුළුමනින්ම දැවී ගොස් ඇත. වොෂිංටන් ප්‍රාන්තයේ, මෝල්ඩන්හි, විටිමන් ප්‍රදේශයේ පොලිස් මුලාදෑනී බ්‍රෙට් මයර්ස් ඇස්තමේන්තු කරන පරිදි ළැවි ගින්න නිසා නගරයේ ඉදිකිරීම්වලින් සියයට 80ක්ම විනාශ වී ගොස් ඇත. මේ අතර කැලිෆෝනියාවේ බිග් ක්‍රීක්හි ප්‍රාථමික පාසල කිසිදු හානියකට ලක් නොවී පවතින බව වාර්තා වේ. එය බලාපොරොත්තුවේ ආලෝකයක් යැයි විදුහල්පතිවරයා කියා ඇත. මේ අතර කැලිෆෝනියාවේ ගින්නට කොටු වී සිටි කඳු නගින්නන් 200කට අධික පිරිසක් හෙලිකොප්ටර් යොදා මුදාගෙන තිබේ.

චීනයේ නිපැයුම්වලට අමෙරිකාවෙන් තහනමක්

බලහත්කාර ශ්‍රමය යොදාගෙන නිෂ්පාදන සිදු කරන්නේයැයි කියමින් චීනයේ සින්ජියැන්හි නිපදවන භාණ්ඩ අමෙරිකාවට ආනයනය කිරීම තහනම් කිරීමට තීරණයක් ගෙන ඇත. චීනයේ ප්‍රධානතම අපනයන භාණ්ඩ වන කපු නිෂ්පාදන සහ තක්කාලි නිෂ්පාදන මෙසේ තහනමට ලක් වී තිබේ. මිනිස් ජාවාරම, ළමා ශ්‍රමය සහ අනිත් මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට ප්‍රතිචාර වශයෙන් මෙම තහනම පනවා ඇති අතර භාණ්ඩ ආනයනයේ දී ඒවා එසේ නොවූ භාණ්ඩ බව සහතික කළ යුතු බවත් අමෙරිකාව කියයි. සින්ජියැන්හි උයිගර් මුස්ලිම් වැසියන්ගේ ප්‍රශ්නය මත ට්‍රම්ප්ගේ පරිපාලනය චීනයට දැඩි පීඩනයක් එල්ල කරයි. බෙදුම්වාදය සහ ත්‍රස්තවාදය උත්සන්න වීම නිසා පසුගිය කාලයේ චීනය මේ ප්‍රදේශයට ඇඩි ආරක්ෂක රැකවරණ යෙදවීය. මිලියනයකට වැඩි පිරිසක් සිරගත කර තිබෙන අතර චීනය පවසන්නේ මේ පිරිස නැවත අධ්‍යාපනය ලබාදීමේ වැඩසටහනකට යොමුකර ඇති බවයි. ලෝක කපු නිෂ්පාදනයෙන් සියයට 20ක් සපයන්නේ චීනයයි.

කාබුල් නුවර බෝම්බයෙන් 10ක් මිය ගිහින්

ඇෆ්ගනිස්තාන් උප ජනාධිපති අම්රුල්ලා සලේ ඝාතනය කිරීමේ ඉලක්කය ඇතිව කාබුල් නුවර බෝම්බයක් පුපුරුවා හැරීම නිසා 10 දෙනකු පමණ මියගොස් ඇත. එරට බුද්ධි අංශයේ හිටපු නායකයකු වන සලේ මුහුණේ සහ අත්වල සුළු පිලිස්සුම් තුවාල ඇතිව බේරී ඇත. සිද්ධියෙන් අනතුරුව ලබාගත් වීඩියෝ දර්ශනවල විශාල දුම්රොටු ඉහළ නඟින ආකාරය දක්වා ඇත.

පිපිරීම සිදු වී ඇත්තේ ඇෆ්ගන් රජය සහ තලෙයිබාන් ත්‍රස්ත සංවිධානය අතර සාකච්ඡාවල පළමු වටයට සූදානම් වෙමින් සිටියදීය. තලෙයිබාන්වරුන් තදබල විවේචනය කළ වන සලේව මීට පෙර අවස්ථා කිහිපයක දී ද ඝාතනය කිරීමට උත්සාහ දැරූ අතර පසුගිය වසරේ ඔහුගේ කාර්යාලයේ දී ඔහු ඉලක්ක කර පුපුරා ගිය බෝම්බයකට 20 දෙනෙක් බිලි වූහ. මේ පිපිරීමට තමන් සහභාගිත්වයක් නොදැක් වූ බව තලෙයිබාන් මාධ්‍ය ප්‍රකාශක සබිහුල්ලා මුජාහිඩ් කීය.

ලොව දෙවැනි වැඩිම කොරෝනා ආසාදිතයන් හමු වන ඉන්දියාව

බුද්ධි කරුණාරත්න

ලෝකය මීට කලින් අසා නොතිබූ කොරෝනා වසංගතයට මුහුණ දෙන විට කෝටි 135ක ලොව දෙවැනි වැඩිම ජනගහනයක් ඇති ඉන්දියාව ද තම රටේ එම වසංගතය පාලනයට ඉතාම තදබල ක්‍රියාමාර්ග ගත්තේය. මේ ක්‍රියාමාර්ග නිසා පීඩාවට පත් වූ ජනතාවගෙන් සමාව ඉල්ලීමට ද එරට අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි නිහතමානී වූ අතර එය දරාගන්නා ලෙසද ජනතාවගෙන් ඉල්ලා සිටියේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඉහළ ජනගහනයට සාපේක්ෂව ඉන්දියාවේ මුල් කාලයේ කොවිඩ් -19 යම් ලෙසකට පාලනය වී තිබිණි.

රැකියා වෙනුවෙන් ප්‍රධාන නගරවලට පැමිණ සිටි මිලියන ගණන් ජනතාවට සැතපුම් දහස් ගණනක් ඈත පිහිටි තම ගම්බිම්වලට යාම අභියෝගයක් වූයේ එරට ජනප්‍රියම ප්‍රවාහන ක්‍රමය වන දුම්රිය සේවය සහ බස් සේවා සම්පූර්ණයෙන්ම නතර වී තිබූ නිසාය. නගරවල හුදෙකලා වූ ඇතැම් අය පාගමනින්ම ගම්බිම් කරා යාමට උත්සාහ දැරූහ. සමහරු මෙය සාර්ථක කරගත් අතර සමහරු මඟදී අනතුරට ලක්වූහ.

පවුල් පිටින් දරුමල්ලන් කර තබාගෙන මේ දුෂ්කර කර්තව්‍යයට මේ අය පෙලඹුණේ වසා දැමූ නගරවල මනුෂ්‍යයාට ජීවත්වීමට සුදුසු පරිසරයක් නොතිබුණු නිසාය. තම පියා පාපැදියක තබාගෙන සැතැපුම් දහස් ගණන් දුර ගෙවා දැමූ වීර දියණියන් ගැනද මේ අතර අහන්නට ලැබිණි.

එක් පිරිසක් ජීවිතය දිනීමට ඒ අසීරු අවස්ථාවේ මෙසේ උත්සාහ දරද්දී තවත් පිරිසක් කොරෝනා වසංගතයට ලක් වූ ජනතාවට පිහිට වූ වෛද්‍යවරු සහ හෙද වෘත්තිකයන්ට පහරදීමට ද උත්සාහ කළ බව වාර්තා විය. නිවාසවලින් ඒ අය එළවා දැමූ අවස්ථාද මාධ්‍ය අනාවරණය කළේය. කොරෝනා පැතිරීම වැළැක්වීමට ඇති කළ වසා දැමීම්වලට එරෙහිව විරෝධතා සහ උද්ඝෝෂණ සිදු කළ පිරිසක් ද විවිධත්වයෙන් පිරි මේ රටේ හමුවීම අරුමයක් නොවේ. වෛද්‍ය සහ හෙද සේවකයන් තම කටයුතු සිදු කළේ ප්‍රමාණවත් තරම් ආරක්ෂිත ඇඳුම් පවා නොමැතිව වූ බැවින් ඔවුන්ගේ ජීවිතවල අවදානමද ඉහළය.

කොරෝනා වසංගතයට එන්නතක් සොයාගැනීමට ඉන්දියාව නිරන්තර පර්යේෂණ සිදු කරයි. ආදායම් විෂමතාවට අතින් අහසට පොළොව මෙන් පවතින ඉන්දියාවේ රන්වලින් මැණික් ඔබ්බවා මුඛ ආවරණ සෑදීමට ව්‍යාපාරිකයෙක් පියවර ගන්නා විට තමන්ගේ මුව ආවරණය කර ගැනීමට මිලෙන් අඩුම මුඛ ආවරණයක් මිල දී ගැනීමට ද නොහැකි අය හමු විය. ගම්බිම්වලට යාමට නොහැකිව අතරමං වී සිටි ජනතාවට ආහාර පාන පවා සොයා ගැනීම අපහසු වූ අවස්ථාවක ඒ සඳහා මැදිහත් වී ක්‍රියා කළ රජයේ සහ පෞද්ගලික අංශයේ අය කටයුතු කිරීම දක්නට ලැබිණි. එසේ වුවත් කුසගින්න නිසා ද ජනතාව කලබල වූ අවස්ථා බහුලව දක්නට ලැබිණි.

ක්‍රම ක්‍රමයෙන් ආසාදිතයන් ප්‍රමාණය වැඩි වන විට ප්‍රතිකාර ලබාදෙන පහසුකම් ප්‍රමාණවත් නොවීමෙන් රෝගීන් මියයාමේ ශෝචනීය සිද්ධීන් බහුලව වාර්තා විය. රෝහල්වල ධාරිතාව ඉක්මවා රෝගීන් වැඩිවීම නිසා මරණ සංඛ්‍යාව වේගයෙන් වැඩිවිය. අද දවස වන විට 4,374,314ක් රෝගීන් සහ මරණ 73,953ක් එරටින් වාර්තා වී ඇති අතර සුවය ලැබූ පිරිස 3,398,844ක් ලෙස සටහන් වේ. ඉන්දියාවේ කොවිඩ් වසංගතය වැඩි වශයෙන්ම වාර්තා වී ඇත්තේ දිල්ලිය, මුම්බායි වැනි ජනාකීර්ණ බවින් ඉහළ ප්‍රාන්තවලය. තදබදය වැඩි පැල්පත් ප්‍රදේශවල කොවිඩ්-19 ව්‍යාප්තිය සුලබය. අද වන විට ලොව දෙවැනි වැඩිම කොරෝනා ආසාදිතයන් හමු වන්නේ ඉන්දියාවෙනි.

දිනමිණ BL IBIZ LINE

2020 සැප්තැම්බර් 10 බ්‍රහස්පතින්දා

දිනමිණ

පිටුව 15

biz.dinamina@lakehouse.lk

Made in ශ්‍රී ලංකා

අභියෝග නොතකන සපත්තු ව්‍යවසායකයෝ

විදෙස් රටවලින් සපත්තු ආනයනය කිරීම නවත්වන්න ඕනෑ. අපි එහෙම කියන්නේ මොකද ඔවුන්ට බද්දක් අය කළත් ඒවා ආනයනය කරන මිල බොහොම අඩුයි. ඒ ගෙන්වන මිලට අපට කිසිම දවසක සපත්තුවක් නිෂ්පාදනය කරන්න බැහැ.

පසුගිය දා දියත උයනෙහි කුඩා කර්මාන්තකරුවන් නඟා සිටුවීමේ අරමුණෙන් විශේෂ පාවහන් සල්පිලක් දින කිහිපයක් පුරා පැවැත්විණි.

IDB හුඩ වෙයා ඇසෝසේෂන් මඟින් සංවිධාන කරන ලද මේ පාවහන් සල්පිල සඳහා කොළොම්පුරවරයේ විවිධ ප්‍රදේශවලින් පාවහන් නිෂ්පාදකයෝ දියත උයනට පිවිසියහ. ඒ අය අතර ඩී.එස්.අයි, බාටා වැනි ශ්‍රී ලංකාවේ නමක් දිනා සිටින පාවහන් නිෂ්පාදකයෝ ද එහි පිවිස සිටියහ. මේ සියලු දෙනා අතර සුළු ව්‍යාපාරිකයන් ලෙස පාවහන් නිෂ්පාදනයේ යෙදෙන කිහිපදෙනෙක් ද සිය වෙළෙඳාම් කටයුතුවල නිරත වූහ. මේ පාවහන් සල්පිල අවසාන දිනයේ අප දියතට පිවිසියේ කොරෝනාවලින් පසු මේ නිෂ්පාදකයන්ගේ ව්‍යාපාර තත්ත්වය හා ඔවුන් මුහුණ පා ඇති ගැටලු හඳුනා ගැනීමටයි.

පළමුව අපට හමු වූයේ ලෙදර් භාවිතයෙන් පාණදුර ප්‍රදේශයේ පාවහන් නිෂ්පාදනයේ යෙදී සිටින එච්. ආර්. දිල්හාන් මහතාය. ඔහු ප්‍රදර්ශනය පිළිබඳ පළ කළේ මෙවැනි අදහසකි.

“අපි ස්වදේශීය කර්මාන්තකරුවන්. මේ වගේ පාවහන් සල්පිලක් පැවැත්වීම හොඳ උත්සාහයක්. මාස තුනෙන් තුනට මෙවන් පාවහන් සල්පිල් පවත්වනවා නම් අප වැනි කර්මාන්තකරුවන්ට අතහිත දීමක් විදියටයි මා එය දකින්නේ.”

දිල්හාන් මහතා අලෙවි කරන්නේ රශ්මි ෂූ නම් ඔහුගේම පාවහන් සන්නාමයේ නිෂ්පාදනයි. පාවහන් නිෂ්පාදකයා වෙන්නේත් දිල්හාන් මහතායි.

“මගේ ළඟ සේවකයන් පස්දෙනෙක් පමණ වැඩ කරනවා. ඔවුනුයි මේ සපත්තු හදන්නේ. කොරෝනා නිසා සපත්තු කර්මාන්තය වැටුණා. මේ වන විට සේවක පඩිනඩි විතරක් නොවෙයි ලයිට් බිල්, වතුර බිල් ගෙවන්න මුදල් හිඟකමකුයි පවතින්නේ. රජය මඟින් ණය දෙන බව පැවැසුවත් ඒවා ගන්න බැංකුවට ගියාම අපට රටේ නැති ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදු වෙලා. එතැනදි බැංකු කියන්නේ වෙනම කතාවක්. මා බැංකුවෙන් ලක්ෂ 20ක ණයක් ඉල්ලුවා. නිකන් නොවෙයි. අපෙන් බැංකුවට ණය අය කර ගන්න ක්‍රමයකට. මොකද අපි ණය ඉල්ලන්නේ ණය ගෙවන්න පුළුවන් නිසා. ඒ මුදල් අරගෙන නොගෙවා ඉන්න නොවෙයි. ඒත් ඔවුන් මට දුන්නේ ලක්ෂ දෙකයි. ඒ ගණන අපට ලයිට්බිල්, වතුර බිල් ගෙවන්නවත් ප්‍රමාණවත් නැහැ. ඒ නිසා බැංකුව දුන්න මුදලෙන් අපේ ව්‍යාපාර දියුණු කරන්න බැහැ. මෙහෙම කළොත් අපේ දේශීය සපත්තු ව්‍යාපාරය බිඳ වැටෙවි.”

දිල්හාන් මහතා ප්‍රකාශ කළේ ඔහු සිය නිෂ්පාදනය දියුණු කිරීම මඟින් ඉදිරියේ කිරීමට සිටි සියලු කාර්යයන් ව්‍යර්ථ වූ බවය.

“මේ වන විට කොරෝනා ප්‍රශ්නය නිසා සම් ආනයන කටයුතු සුපුරුදු පරිදි සිදු වෙනවා ද?”

“ලෙදර් ආනයනය සිදු වන්නේ බොහොම හෙමින්. ඒ කාරණය මේ වෙලාවේ ප්‍රශ්නයක් නොවුණත් තවත් මාස කිහිපයක් යන විට එය ප්‍රශ්නයක් බවට පත් වේවි. පාරිභෝගිකයන්ගේ ඉල්ලුමට සරිලන සැපයුමක් දෙන්න නොහැකි වුණොත් අපේ ව්‍යාපාර කඩා වැටේවි. ඒත් දෙසැම්බර් වන විට ඒ ප්‍රශ්නය විසඳේවි කියන බලාපොරොත්තුවක් අපට නැතිවම නොවෙයි. අපේ දේශීය වශයෙන් සිදු වන ලෙදර් සැපයුම අද සිදු වන්නේ බොහොම අඩුවෙන්. ඒ නිසා ඒවා විදේශ රටවලින් ආනයනය කිරීමටයි අද සිදුව තිබෙන්නේ.”

සපත්තු නිෂ්පාදකවරුන් ලෙස මේ පවතින විවිධ ගැටලු නිසා දේශීය සපත්තු කර්මාන්තය පවතින්නේ ගැටලුකාරී ස්වභාවයකය. සපත්තු කර්මාන්තයේ නියැළෙන නම හෙළි කිරීමට අකැමැති වූ වෙළෙන්දෙක් මේ කාරණය ලියන්නැයි අපෙන් ඉල්ලීමක් ද කළේය.

“අපේ දේශීය සපත්තු කර්මාන්තයට ගොඩක් ප්‍රශ්න තිබෙනවා. පසුගිය කාලයේ අපේ සපත්තු නිෂ්පාදකයන්ට බදු සහනයක් දුන්නත් අනෙක් දේවල්වලට යන මුදල් එක්ක ඒක වැඩකට නැති සහනයක් බවට පත්වෙලයි තිබෙන්නේ. මේ සෑම කාරණයකටම වඩා අද ප්‍රශ්නයක් බවට පත් වී තිබෙන්නේ පිටරටින් ආනයනය කරන සපත්තු. මේ විදෙස් රටවලින් සපත්තු ආනයනය කිරීම නවත්වන්න ඕනෑ. අපි එහෙම කියන්නේ මොකද ඔවුන්ට බද්දක් අය කළත් ඒවා ආනයනය කරන මිල බොහොම අඩුයි. ඒ ගෙන්වන මිලට අපට කිසිම දවසක සපත්තුවක් නිෂ්පාදනය කරන්න බැහැ. ඒ නිසා ආනයනය කරනවා නම් ආනයනය කළ යුත්තේ අපේ රටේ නිෂ්පාදනය නොවන ෆුට් බෝල්, ටෙනිස්වලට දමන සපත්තු වගේ නිෂ්පාදන. දේශීය සපත්තු හිමියන් විදියට අපි රජයෙන් ඉල්ලන එකම ඉල්ලීම මෙයයි. විදෙස් රටවලින් ගෙනෙන සපත්තු තහනම් කරන්න.”

ඔවුන් එවැනි ඉල්ලීම් කළ ද ශ්‍රී ලාංකික පාරිභෝගිකයන් අපේ සපත්තු නිෂ්පාදකයන්ට එල්ල කරන චෝදනාවක් ද තිබේ. ඒ අපේ රටේ නිෂ්පාදනය කරන සපත්තුවල නිමැවුම් පවතින්නේ බාල තත්ත්වයක යන්නය. ඒ ප්‍රශ්නයට ඔහු මෙසේ පිළිතුරු දුන්නේ ය.

“මට නම් හිතෙන්නේ ඔය කාරණය පාරිභෝගිකයන්ගේ මනසේ තැන්පත් වෙලා තිබෙන වැරදි අදහසක්. ඉතාලි සපත්තුවකුයි ශ්‍රී ලංකාවේ සපත්තුවකුයි අරගෙන බැලුවොත් එකම විදියටයි නිමාව හැදිලා තිබෙන්නේ. කොලිටියත් එකමයි. හැබැයි මෙහෙම කාරණයක් තිබෙනවා. ශ්‍රී ලංකාවේ සපත්තුවල මිල ගණන් විමසන කොට විවිධ කැටගරිවලට අයත්. අඩුම මුදලටත් සපත්තු මිලදී ගන්න පුළුවන්. මධ්‍යස්ථ මුදලටත් සපත්තු මිලදී ගන්න පුළුවන්. වැඩිම මුදලටත් සපත්තු මිල දී ගන්න පුළුවන්. ඒ සියල්ල සැකසී තිබෙන්නේ පාරිභෝගිකයාගේ අතේ ඇති මුදල අනුවයි. හොඳ සපත්තු දෙකක් යම් මිලක් වෙනවා. එහෙම ගන්න සපත්තු ඉක්මනින් කැඩෙන බවක් මා අසා නැහැ. සපත්තුවල කාලය අවසන් වුණාට පස්සේ කොහොමත් කැඩෙනවා. හැබැයි අඩුම මිලක් යටතේ තිබෙන සපත්තුවක් මිලදී ගත්තොත් ඔබ පැවසුව ප්‍රශ්නයට පාරිභෝගිකයාට නිතරම මුහුණ දීමට සිදු වේවි.”

මේ ගැටලුවත් සමඟ දිල්හාන් මහතා යළිත් පවසන්නේ සපත්තු නිෂ්පාදනයේ මෙවැනි තත්ත්වයක් ඇති වීමට මේ රටට ගෙන්වන භාණ්ඩ කොලිටි විය යුතු බවය.

“ඇත්තම කිව්වොත් අපේ රටේ සපත්තු නිෂ්පාදනයට ලෙදර් ආනයනය කරන්නේ ගුණාත්මක තත්ත්වයෙන් අඩු භාණ්ඩවලින්. ඒ ලෙදර් ආනයනය කරන සමාගමට ප්‍රමිතියෙන් අඩු ලෙදර් එකක් පෙන්වලා ඒ විදියේ ලෙදර් නිර්මාණය කරන්න කියලා මේ අය කියනවා. ඒ ආකාරයට පැවසීමෙන් පස්සේ ඔවුන්ගේ අදහසට අනුවයි ඒ ලෙදර් නිෂ්පාදකයන් ලෙදර් නිෂ්පාදනය කරන්නේ. ඒවා ආනයනය කර පස්සේ හොඳම ලෙදර් අමුද්‍රව්‍ය මිලට ඔවුන් ඒවා අපට විකුණනවා. ඒ ලෙදර්වලිනුයි අපට සපත්තු නිෂ්පාදනය කරන්න වෙන්නේ. ඒ නිසා අප රජයෙන් ඉල්ලන්නේ මේ අමුද්‍රව්‍ය ආනයනය කිරීමට යම් ප්‍රමිතියක් නිර්මාණය කරන්න යන්නයි. එකයි මේ රටට වෙන්න ඕනෑ එකම කාරණය. එහෙම වුණා නම් මේ රටේ සපත්තු ප්‍රශ්නයට වගේම වෙනත් ප්‍රශ්නවලටත් විසඳුමක් රජයට ලැබේවි. අපට හොඳ සපත්තු නිර්මාණය කරන්නත් පුළුවන්. මේ ආකාරයෙන් සපත්තු නිෂ්පාදකවරුන්ට අත දෙන්න කියලා අප රජයෙන් ඉල්ලනවා.”

ඊළඟට අපට හමු වූයේ ගෘහස්තව වෙසෙමින් සපත්තු නිෂ්පාදනයේ නියැළෙන කාන්තාවකි. ඈ ශානිකා පෙරේරාය.

“අපේ කර්මාන්තශාලාව තිබෙන්නේ බණ්ඩාරගම. බොහොම පොඩියටයි මේ ආයතනය අපි පවත්වාගෙන යන්නේ. ශ්‍රී ලංකාවේ තිබෙන අමුද්‍රව්‍ය යොදාගෙන, වර්තමානයේ වෙළෙඳපොළේ ඉල්ලුම පිළිබඳ සැලකිලිමත් වෙමිනුයි අපි සපත්තු නිෂ්පාදනය කරන්නේ.

මේ දවස්වල තිබෙන එකම ප්‍රශ්නය සපත්තුවලට අවශ්‍ය බකල් වගේ කොටස් වෙළෙඳපොළේ නැති වීමයි. ඒ කොරෝනා ප්‍රශ්නය නිසා තවම විදේශ රටවලින් මේ දේවල් ආනයනය කරන්නේ නැහැ. ඒකයි මෙහෙම දේවල් සිදුවන්නේ.”

කාන්තාවක ලෙස ඒ ගැටලුවලට අමතරව සපත්තු නිෂ්පාදනය කිරීමේදී සේවක ප්‍රශ්නවලට ද ඈට මුහුණ දීමට සිදු වෙයි.

“සපත්තු නිෂ්පාදනය කරන කොට සේවක ප්‍රශ්නය අද බොහෝ ගැටලු ඇති කරනවා. අපි සේවකයකු පුරුදු පුහුණු කරන්න යම් පිරිවැයක් දරනවා. එහෙත් එවැනි අයකු නොපැමිණ සිටියොත් අපට බොහොම පාඩුයි. මේ නිසා මා කරන්නේ වරුවක් වැඩ කරන මවිවරුන් මේ කර්මාන්තයට යොදවා ගැනීමයි. ඔවුන් තමන්ගේ දරුවන්ව පාසලට යවලා වරුවක් වැඩ කරලා ළමයත් අරගෙන ගෙදර යනවා. අපේ වැඩෙත් කෙරෙනවා. එයාලට අමතරව මුදලකුත් අතට ලැබෙනවා. හැමදාමත් ඔවුන් රැකියාවට එනවා.”

ශානිකා පෙරේරා මහත්මිය සේවක ප්‍රශ්නයට පිළිතුර එසේ සොයද්දී ඇගේ බොෂිටේලෙ ෂූස් වෙයාර් ආයතනය පවත්වාගෙන යන්නේ පවුලේම නිෂ්පාදනයක් ලෙසය.

“ අපේ ආයතනයේ මා බලන්නේ ප්‍රොඩක්ෂන් අංශය. මගේ දුවත්, ලේළිත් ඩිසයින් අංශය බලනවා. ඒ වගේම අපේ ෂූස් අන්තර්ජාලය ඔස්සේ ගෙන්වා ගන්නත් පුළුවන්. ඒ ආකාරයටයි අප සපත්තු නිෂ්පාදනය කරන්නේ. අන්තර්ජාලය මඟින් ඔන්ලයින් සපත්තු ව්‍යාපාරය කිරීම අපට පහසුවක්. ඒ වගේම මේ වගේ පාවහන් සල්පිල්වලටත් අපි එනවා. අපට තිබෙන අනෙක් ප්‍රශ්නය කුඩා කර්මාන්තකරුවන් විදියට ණයක් ගන්න ගියාට පස්සේ විදින්න වන කරදරයි. බැංකුවලින් ණය ගන්න ගියාට පස්සේ ඒ අය ඉල්ලන සමහර දේ දෙන්න අපට පහසුකම් නැහැ. මේ සමහර නිෂ්පාදන අපි දමන්නේ එක් එක් සාප්පුවටයි. ඒ අයටත් බඩු විකිණෙන්නේ නැතිව අපට සල්ලි දෙන්න බැහැ. ඒ නිසා අපි කබළෙන් ලිපටයි වැටෙන්නේ. පසුගිය දවස්වල අපට විදේශ රටකින් සපත්තු ඕඩර් එකක් ආවා. ඒක දෙන්න අපි ළඟ මුදල් නැහැ. ඒත් බැංකු මඟින් අපට සහනයක් සපයලා තිබෙනවා නම් ඒ වගේ නිෂ්පාදන අරගෙන අපට කරන්න පුළුවන්. මේ සපත්තු නිෂ්පාදනයේ යෙදෙන අය අතරත් ලොකු තරගයක් තිබෙනවා. ඒ නිසා අප නිතරම උත්සාහ ගන්නේ වෙනස්ම ආකාරයට සපත්තු නිෂ්පාදනය කරන්න. මේ සඳහා රජයෙන් යම් උදවුවක් ලැබේවි කියන බලාපොරොත්තුවෙනුයි අප කාලය ගත කරන්නේ.”

මෙවැනි ගැටලුවලට මුහුණ දී සිටින්නේ මේ ආකාරයට කතාබහේ යෙදුණු කිහිපදෙනා පමණක් නොවේ. ඔවුන්ගෙන් පැවසෙන්නේ ඒ සපත්තු කර්මාන්තයේ යෙදෙන මේ දේශීය සපත්තු කර්මාන්ත හිමියන් සිය සපත්තු නිෂ්පාදනයේ නියැළීමේදී මතු වී ඇති ගැටලු කිහිපයක් පමණි. ඒ නිසා ඔවුන්ට යම් සහනයක් සලසා දීම මඟින් දේශීය සපත්තු කර්මාන්තය නැංවීම අප සැමගේ මෙන්ම රජයේ ද වගකීමයි.

තිලානි ශානිකා විතානාච්චි
සේයා රූ - රුක්මල් ගමගේ

ගෞරවය දිනූ සමාගම් අතරින් ජෝන් කීල්ස් මුල් තැනට

ජෝන් කීල්ස් හෝල්ඩින්ස් සමාගම (John Keells Holdings PLC - JKH) අඛණ්ඩව 15 වන වරටත් ශ්‍රී ලංකාවේ වඩාත්ම ගෞරවය දිනූ සමාගම ලෙස නම්කිරීමට LMD සඟරාවේ නවතම “Most Respected Entities’ කලාපය කටයුතු කර තිබේ. මේ සඳහා අදාළ වූ ශ්‍රේණිගත කිරීම් කාණ්ඩ 10 අතරින් කාණ්ඩ 5 ක, එනම් තත්ත්වය පිළිබඳ දක්වන සැලකිල්ල, කළමනාකරණය, ගතිකත්වය, ආයතනික සංස්කෘතිය සහ දැක්ම යන කාණ්ඩවල පෙරමුණටම පැමිණීමට ජෝන් කීල්ස් හෝල්ඩින්ස් සමත් වී ඇත. මෙම ඇගයුම සඳහා LMD හි සංකල්පයක් අනුව නීල්සන් විසින් පවත්වන ලද ඡන්ද විමසීමකදී වැඩිම ඡන්ද සංඛ්‍යාක් (1,125) ලබාගනිමින්, මෙරට වඩාත්ම ගෞරවය දිනූ සමාගම ලෙස සිය ස්ථානය නැවත වරක් තහවුරු කරගැනීමට සමාගමට හැකියාව ලැබිතිබේ. ඡන්දය ප්‍රකාශ කරන්නන්ගේ දැක්ම අනුව ශ්‍රී ලංකාවේ වඩාත්ම ගෞරවය දිනූ සමාගම් මොනවාද යන්න සහ, ඔවුන් එසේ සිතන්නේ කුමන හේතූන් නිසාද යන්න හඳුනාගත හැකි වන ආකාරයට මෙම ඡන්ද විමසීම සැලසුම් කර තිබූ අතර, ලැයිස්තුගත සමාගම් වල සාමාජික සාමාජිකාවන් අතරින් කළමනාකාර මට්ටම් සහ ඊට ඉහළ මට්ටම් වල සේවයේ නියුතු පුද්ගලයෝ 800 දෙනෙක් මේ සඳහා දායකවී ඇත.

2020 වසරේදී සිය 150 වන සංවත්සරය සමරන ජෝන් කීල්ස් හෝල්ඩින්ස් සමූහ ව්‍යාපාරය, 2005 වසරේදී LMD සඟරාව මෙරට වඩාත්ම ගෞරවය දිනූ සමාගම් ශ්‍රේණිගත කිරීම ආරම්භ කිරීමේ සිට මේ දක්වා වසර 15ක් එම ලැයිස්තුවේ අංක 01 ස්ථානයේ රැඳී සිටීමට සමත් වී තිබේ. 2020 අගෝස්තු මාසයේ LMD කලාපය සඳහා සංවාදයකට එක්වෙමින් සමාගමේ සභාපති ක්‍රිෂ්ණ බාලේන්ද්‍ර මහතා මෙසේ පැවසී ය. “අපගේ ප්‍රධානතම ලක්ෂණය වන්නේ, අපගේ මූලික වටිනාකම් වන අව්‍යාජත්වය, දයාව, විශ්වාසනීයත්වය, නවෝත්පාදනය හා විශිෂ්ටත්වය යන ගුණාංග යථාර්ථයක් බවට පත්කිරීම සඳහා අප තුළ ඇති කැපවීමයි. අපගේ ශක්තිමත් ආයතනික පාලන ව්‍යුහය, වෘත්තීය කළමනාකරණය සහ තිරසාර සංවර්ධන ක්‍රියාවලීන් උපත ලබන්නේ මේ වටිනාකම් තුළිනුයි. එමෙන්ම අපගේ වසර 150 ප්‍රෞඪ ඉතිහාසය අපට සෑම විටම යහපත් දේ කිරීමටත්, අපගේ සාමාජිකයන් වෙනුවෙන් යහපත් රැකියා පරිසරයක් තහවුරු කිරීමටත්, ව්‍යාපාරික හවුල්කරුවන් සමග ශක්තිමත් සම්බන්ධතා ගොඩනංවා ගැනීමටත්, ජනතාව සවිබල ගැන්වීමටත් අවශ්‍යය පන්නරය අපට ලබා දී තිබෙනවා.

කොවිඩ්-19 සුරක්ෂා කළමනාකරණ පද්ධති සහතිකයෙන් THE EXTERMINATORS සමාගම පිදුම් ලබයි

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම පරිසර වර්ධක විසඳුම් සම්පාදකයකු වන THE EXTERMINATORS සමාගම කොවිඩ් - 19 සුරක්ෂා කළමනාකරණ පද්ධති සහතිකය හිමි කර ගත් මෙරට ප්‍රථම සුළු හා මධ්‍ය පරිමාණ සහ කෘමි පාලන සමාගම (SLS 1672-2020) බවට පත් විය. එම සමාගමේ සියලු මෙහෙයුම් අංශ ආවරණය කරමින් සිදු කළ පරිපූර්ණ විගණන දෙකකින් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය එම සමාගමට ජූලි මස 7 වැනිදු කොවිඩ් - 19 පාලන පාරිසරික සහතිකය පිරිනැමීය. කාර්යමණ්ඩල සාමාජිකයන්, අමුත්තන්, පාරිභෝගිකයන් සහ සියලු පාර්ශ්වකරුවන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් මෙන්ම අවට ප්‍රජාව අතර කොවිඩ් - 19 වෛරසය ව්‍යාප්තියෙන් වළක්වා ගැනීම සඳහා සුරක්ෂිත රැකියා පරිසරයක් හඳුන්වා දීම එම සහතිකය පිරිනැමීමේ මූලික අරමුණ විය.

කාබන් විමෝචනයෙන් තොර ආසියාවේ ප්‍රථම කෘමි පාලන සමාගම වන THE EXTERMINATORS සමාගම 2020 ජූලි මාසයේදී අඛණ්ඩව හය වැනි වරටත් කාබන් විමෝචනයෙන් තොර සමාගමක් ලෙස සහතික කෙරුණු අතර ‘තිරසර අනාගත සමූහය’ 2020 ජූලි මසදී කාබන් විමෝචනයෙන් තොර සමාගමක් ලෙස එම සමාගම සහතික කිරීමත් සමඟ එම සහතිකය හිමි කර ගත් ලොව ප්‍රථම ප්‍රති-ක්ෂුද්‍රජීවී විෂබීජහරණ සේවා සම්පාදකයා බවටද පත් විය. EXTERMINATORS සමාගම 1998 සිට පාරිසරය ආරක්ෂා කිරීමේ සහ මහජන සෞඛ්‍ය ආරක්ෂණ විසඳුම් ක්ෂේත්‍රයේ වසර 22කට අධික පුරෝගාමී මෙහෙවරක් කරයි. ඒකාබද්ධ කළමනාකරණ පද්ධති සහතිකය (IMS) හිමි කර ගත් මෙරට ප්‍රථම සුළු හා මධ්‍ය පරිමාණ සහ කෘමි පාලන සමාගම (ISO 9001" ISO 14001" OHSAS 45001" ISO 22000) වන EXTERMINATORS සමාගම ව්‍යාපාරික, සත්තාම විශිෂ්ටත්වය, ව්‍යවසායකත්වය සහ පාරිසරික නායකත්වය වෙනුවෙන් දෙස්-විදෙස් සම්මාන 50කින් පිදුම් ලබා ඇති අතර 7 වරක් ශ්‍රී ලාංකේය ජයග්‍රාහී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සන්තාමය බවටද පත් විය. එම සමාගම සම්පාදනය කරන සියලු සේවා සම්පූර්ණයෙන්ම කාබන් විමෝචනයෙන් තොරවීමද විශේෂත්වයකි.

සිංගර් ෆැෂන් ඇකඩමියේ විලාසිතා නිර්මාණකරණ පාඨමාලාවට අයදුම්පත් කැඳවයි

වසර 60කට අධික කාලයක් පුරා මෙරට විලාසිතා නිර්මාණකරණ ක්ෂේත්‍රයට පිවිසීමට කැමැත්තෙන් පසු වන තරුණ තරුණියන් සඳහා නිවැරදි මාවත කියා දුන් සිංගර් ෆැෂන් ඇකඩමිය විසින් විලාසිතා නිර්මාණකරණ සහතික පත්‍ර පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවා තිබේ. විලාසිතා නිර්මාණකරණ ක්ෂේත්‍රය සඳහා ලොව ප්‍රමුඛයන් මෙන්ම, අන්තර්ජාතික පිළිගැනීමට පත් බ්‍රිතාන්‍යයේ Chartered Society of Designers (CSD) වෙතින් විලාසිතා නිර්මාණකරණ පාඨමාලාව සඳහා සහතික පත්‍රයක් හිමි වන ශ්‍රී ලංකාවේ මුල්ම සහ එකම වෘත්තීය අධ්‍යාපනික ආයතනය සිංගර් ෆැෂන් ඇකඩමියයි.

සිසු සිසුවියන් සඳහා වඩාත් පහසු හා ආරක්ෂිත ලෙසින් පාඨමාලාවන්ට සහභාගි වීම සහතික කරමින්, විලාසිතා නිර්මාණකරණ සහතික පත්‍ර වැඩසටහනේ සැප්තැම්බර් මස නවක බඳවා ගැනීම සඳහා අයදුම්පත් භාර ගැනීම දැන් ආරම්භ කර ඇති අතර, සැප්තැම්බර් 30 වැනිදා දක්වා ඒ සඳහා ලියාපදිංචි විය හැකිය. සිංගර් ෆැෂන් ඇකඩමිය මඟින් පැවැත්වෙන පාඨමාලාවන් අතර, විලාසිතා නිර්මාණකරණ පාඨමාලාව ක්ෂේත්‍රයේ ඉහළ පිළිගැනීමක් සහිත දේශීය හා විදේශීය වශයෙන් අවස්ථාවන් රැසක් සිසුන්ට විවර කර දෙන පාඨමාලාවකි. දිවයින පුරා සිංගර් ප්‍රදර්ශනාගාරවලට අනුබද්ධිතව පිහිටුවන ලද ෆැෂන් ඇකඩමි 65 කට අධික සංඛ්‍යාවක් කේන්ද්‍ර කර ගනිමින්, සිය කුසලතාවන් ඔප් නංවා ගැනීමට සිංගර් ෆැෂන් ඇකඩමිය මඟ පාදා තිබේ. එහිදී වඩාත් ආරක්ෂාකාරී පරිසරයක ප්‍රායෝගික හැදෑරීම්වලට සම්බන්ධ වෙමින්, ඇඳුම් මැසීම හා ඇඳුම් නිර්මාණය පිළිබඳ සියලු දේ ඉගෙන ගැනීමට සිසුන්ට අවස්ථාව හිමි වේ.

ආසියානු තරගාවලියට වූෂු සංචිත තේරීම ලබන මාසයේ

2022 වසරේ චීනයේදී පැවැත්වීමට නියමිත 19 වැනි ආසියානු ක්‍රීඩා උලෙළ ඉලක්ක කරමින් පිහිටු වන ජාතික සංචිත සඳහා නව ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරා ගැනීමට ශ්‍රී ලංකා වූෂු සම්මේලනය කටයුතු කරයි.

ඒ අනුව මේ තෝරා ගැනීම් සඳහා අදියර දෙකක් යටතේ විශේෂ පරීක්ෂණ දෙකක් පැවැත්වෙන අතර, එහි පළමු පරීක්ෂණ ලබන මස 10 සහ 11 දෙදින මහනුවර දිගන ගෘහස්ථ ක්‍රීඩාංගණයේදීත්, දෙවැනි පරීක්ෂණය ඔක්තෝබර් 31 සහ නොවැම්බර් 1 වැනිදා මාතර කොටවිල ගෘහස්ථ ක්‍රීඩා සංකීර්ණයේදීත් පැවැත්වේ.

මේ සඳහා අවුරුදු 18 - 25ත් අතර, තරුණ තරුණියන්ට අයැදුම් කළ හැකි අතර, පරීක්ෂණ පැවැත්වෙන දෙදින තුළ උදැසන එම ස්ථානයට පැමිණ සහභාගි විය හැකි බවත් සම්මේලනය දන්වා සිටී. මේ සඳහා එක්වීමට වූෂු ක්‍රීඩා කර තිබීම අනිවාර්ය නොවන අතර, ක්‍රීඩාව පිළිබඳ උනන්දුවක් දක්වන අයට ද එක්වීමේ අවස්ථාව ලබාදී තිබේ.

මින් තෝරා ගන්නා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට චීන ජාතික විශේෂඥ පුහුණුකරුවන් යටතේ ශ්‍රී ලංකාවේදී සහ චීනයේදී විශේෂ පුහුණු සැසි සඳහා සහභාගිවීමට අවස්ථාව උදාවන බව ශ්‍රී ලංකා වූෂු සම්මේලනයේ සභාපති මානෙල් ධර්මකීර්ති මහතා පවසයි.

මේ පිළිබඳ වැඩි විස්තර ජාතික වූෂු පුහුණුකරු රුචිර බෝධිනාගොඩ හෝ ජාතික සන්ද පුහුණුකරු කපිල සභාපති (075 0351008/ 0710432592) මගින් ලබා ගත හැකිය.

නයෝමි අවසන් පූර්ව වටයට

අමෙරිකානු විවෘත ටෙනිස් තරගාවලියේ වැඩි අවධානයක් යොමු වී ඇති කාන්තා තේවල ඉසව්වේ අවසන් පූර්ව වටයට පිවිසීමට ජපානයේ නයෝමි ඔසාකා සමත් වූවාය.

ඊයේ පැවැති අර්ධ අවසන් පූර්ව වටයේ තරගයේදී නයෝමි හමුවේ අමෙරිකාවේ ෂෙල්බි රොජර්ස් වට 2-0කින් පරාජයට පත් වූවාය. එහි ලකුණු තත්ත්වය වූයේ 6-3ක් සහ 6-4ක් ලෙසිනි.

හෙට (11) පැවැත්වෙන අවසන් පූර්ව වටයේදී නයෝමි අමෙරිකාවේ ජෙනිෆර් බ්‍රැඩි සමඟින් තරග වැදීමට නියමිතය.

මේ අතර, 7 වැනි අමෙරිකානු ශූරතාව පසුපස හඹායන සුපිරි ක්‍රීඩිකා සෙරීනා විලියම්ස් ඊයේ රාත්‍රියේ අර්ධ අවසන් පූර්ව වටයේදී බල්ගේරියාවේ ටිස්වේටානා පිරොන්කෝවා සමඟ තරග වැදීමට නියමිත තිබූ අතර, අද (10) එම වටයේදී බෙලරුස්හී වික්ටෝරියා ඇසරෙන්කා බෙල්ජියම් ක්‍රීඩිකා එලිස් මර්ටෙන්ස් සමඟ තරග බිමට පිවිසෙයි.

යුපුන් අබේකෝන් දකුණු ආසියාව හොල්ලයි

මී.100 වාර්තා බිඳ දමා වේගවත්ම ක්‍රීඩකයා වෙයි

නිරෝෂාන් ප්‍රියංකර

මීටර් 100 පිරිමි ඉසව්වෙන් නව ශ්‍රී ලංකා වාර්තාවක් සහ දකුණු ආසියානු වාර්තාවක් බිහි කිරීමට කෙටි දුර ධාවන ශූර යුපුන් අබේකෝන් සමත් විය.

ජර්මනියේ ඩොසෝවිහි පැවැති ඇන්හාල්ට් ජර්මන් ජාත්‍යන්තර තරගාවලියේදී යුපුන් මේ ඉසවුව තත්පර 10.16කින් නිම කරමින් මේ වාර්තා බිහි කළ අතර, යුපුන් හමුවේ බිඳ වැටුණේ හිමාෂ ඒෂාන් විසින් තත්පර 10.22කින් තබා තිබූ වාර්තාවය.

පසුගිය වසරේ කොළඹ පැවැති ජාතික මලල ක්‍රීඩා තේරීම් තරගාවලියේදී හිමාෂ මේ ශ්‍රී ලංකා සහ දකුණු ආසියානු වාර්තා පිහිටුවූයේ ඔහු විසින්ම 2016 වසරේ ඉන්දියාවේ පැවැති 12 වැනි දකුණු ආසියානු ක්‍රීඩා උළෙලේදී තබා තිබූ වාර්තාව බිඳ දමමිනි.

මේ තරගයේදී ජර්මනියේ මීටර් 100 ඉසවුවේ ශූරයා වන ඩෙනිස් අල්මාස් 25 හැවිරිදි යුපුන් හමුවේ පරාජයට පත් වීම කැපී පෙනිණි. අල්මාස් තත්පර 10.18කින් තරගය නිම කරමින් දෙවැනි ස්ථානයට පත් වූ අතර, ජර්මනියේම මියිකල් පෝල් (10.41) තෙවැනි ස්ථානයට පත් විය.

පන්නල ජාතික පාසලෙන් සහ වෙන්නප්පුව සාන්ත ජෝශප් වාස් විදුහලෙන් ක්‍රීඩා පිටියට පිවිසි යුපුන්ගේ මින් පෙර හොඳම පෞද්ගලික කාලය තත්. 10.51කි. එය පසුගිය අගෝස්තුවේදී තත්.10.29 දක්වා ගෙන දියුණු කර ගැනීමට සමත් වූ ඔහු පසුගිය වසරේ නේපාලයේ පැවැති 13 වැනි දකුණු ආසියානු ක්‍රීඩා උළෙළේදී මීටර් 100 සහාය ඉසව්වේ රන් පදක්කම දිනා ගත් ශ්‍රී ලංකා කණ්ඩායමේ සාමාජිකයෙක් ද විය. එම තරගාවලියේදී ශ්‍රී ලංකා කණ්ඩායම නව දකුණු ආසියානු තරග වාර්තාවක් (තත්.39.14) බිහි කිරීම ද කැපී පෙනිණි.

වසර 2015දී ශිෂ්‍යත්වයක් ලබා ඉතාලියේ පදිංචියට ගිය යුපුන් එහි නේවාසික පුහුණුවීම්වල නිරතව සිටින අතර, ඔහුගේ අරමුණ වී ඇත්තේ ලබන වසරේ ජපානයේ ටෝකියෝහිදී පැවැත්වෙන ඔලිම්පික් උළෙළට සුදුසුකම් ලබා ගැනීමයි. එම ක්‍රීඩා උළෙළේ පරිසාදන මට්ටම ඉක්මවා යෑමට මීටර් 100 ඉසව්ව තත්පර 10.05කට අඩු කාලයකින් නිම කළ යුතුව තිබේ.

ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා ට්විටර් සටහනක් තබමින් යුපුන්ට සුබ පැතුම් එක් කර තිබිණි. මේ විශිෂ්ට ජයග්‍රහණය සියලු ලාංකිකයන්ට ආඩම්බර විය හැකි අවස්ථාවක් බව ද ඇමැතිවරයා සටහන් කර තිබිණි.

ට්‍රිනිබෑගෝ - සූක්ස් අවසන් සටනට

බටහිර ඉන්දීය කොදෙව්හිදී පැවැත්වෙන කැරිබියන් ප්‍රිමියර් ලීග් විස්සයි20 ක්‍රිකට් තරගාවලියේ අවසන් තරගයට සුදුසුකම් ලබා ගැනීමට කිරන් පොලාඩ්ගේ නායකත්වයෙන් යුත් ට්‍රිනිබෑගෝ නයිට් රයිඩර්ස් කණ්ඩායම සහ ඩැරන් සැමී මෙහෙය වන සාන්ත ලුසියා සූක්ස් කණ්ඩායම සමත් විය.

මේ දෙපිල අතර, අවසන් තරගය අද (10) ට්‍රිනිඩෑඩ්හි බ්‍රයන් ලාරා ක්‍රීඩාංගණයේදී පැවැත්වේ.

ජැමෙයිකා ටලාවාස් පිල සමඟ පැවැති පළමු අවසන් පූර්ව තරගය කඩුලු 9කින් ජයගත් ට්‍රිනිබෑගෝ පිල අපරාජිතවම අවසන් තරගයට පිවිසීම විශේෂත්වයකි.

තරගයේ පළමුව පන්දුවට පහර දුන් ජැමෙයිකා පිල ලබා දුන් ලකුණු 108ක ඉලක්කය හඹා ගිය ට්‍රිනිබෑගෝ පිල පන්දු 30ක් ඉතිරිව තිබියදී ජය හිමිකර ගත්තේ කඩුල්ලක් පමණක් අහිමි කර ගනිමිනි.

ලෙන්ඩ්ල් සීමන්ස් පන්දු 44කදී නොදැවී ලකුණු 54ක් සහ වියොන් වෙබ්ස්ටර් නොදැවී ලකුණු 44ක් රැස් කරමින් ට්‍රිනිබෑගෝ ජයග්‍රහණය කරා ගෙන ගියහ.

මේ අතර, දෙවැනි අවසන් පූර්ව තරගයෙන් ගයානා ඇමසන් පිලට දැවැන්ත පරාජයක් අත් කර දීමට සාන්ත ලුසියා සූක්ස් කණ්ඩායමට හැකි විය. තරගයේ පළමුව පන්දුවට පහර දුන් ගයානා අසීරු තත්ත්වයන් හමුවේ මුහුණ දිය යුතු ආකාරය මෙන්ම ක්‍රීඩා මනෝවිද්‍යාව ඇතුළු විෂයයන් රැසක් මේ පාඨමාලාවට ඇතුළත් බව තරිඳු පැවැසීය.

ඔස්ට්‍රේලියාව 20විස්සෙන් යළිත් එකට

එංගලන්තය සමඟ පැවැති තෙවැනි සහ අවසන් විස්සයි20 ක්‍රිකට් තරගය කඩුලු 5කින් ජය ගැනීමට සංචාරක ඔස්ට්‍රේලියානු කණ්ඩායම සමත් විය.

මේ ජය සමඟින් යළිත් ලෝක විස්සයි20 ක්‍රිකට් ශ්‍රේණිගත කිරීම්වල පළමු ස්ථානයට පත් වීමට ඔස්ට්‍රේලියාවට හැකි විය. කෙසේ වෙතත් තරගාවලියේ මුල් තරග 2ක ජයගත් එංගලන්තය 2-1ක් ලෙස තරගාවලියේ ජය හිමිකර ගත්තේය.

එංගලන්තය දෙවැනි තරගය ජය ගැනීමත් සමඟ ඔස්ට්‍රේලියාව අබිබවා ලෝක ශ්‍රේණිගත කිරීම්වල පළමු ස්ථානයට පත් විය.

සඳම්ප්ටන්හිදී පැවැති තරගයේ පළමුව පන්දුවට පහර දුන් එංගලන්තය කඩුලු 6කට ලකුණු 145ක් රැස් කළ අතර, එම ඉලක්කය හඹාගිය ඔස්ට්‍රේලියාව පන්දු 3ක් ඉතිරිව තිබියදී ජය හිමිකර ගත්තේ කඩුලු 5ක් දැවී තිබියදීය.

ඔස්ට්‍රේලියානු පිල වෙනුවෙන් නායක ඇරොන් ෆින්ච් සහ මිචෙස් මාෂ් ලකුණු 39 බැගින් රැස් කළහ. පන්දු යැවීමේදී අදිල් රෂීඩ් කඩුලු 3ක් බිඳ දැමීමට සමත් විය. වේගවත් ඉනිමක් දියත් කළ ජොනි බෙයාර්ස්ටෝව් පළමුව පන්දුවට පහර දුන් එංගලන්ත පිල වෙනුවෙන් ලකුණු 55ක් රැස් කළේ පන්දු 44කිනි. ජෝ ඩෙන්ලි ලකුණු 29ක් සහ නායක මොයින් අලි ලකුණු 23ක් ඉනිමට එක් කළහ. ඇඩම් සම්පා කඩුලු 2ක් බිඳ දැමීමට සමත් විය.

මිචෙල් මාෂ් අවසන් තරගයේ වීරයා ලෙසත්, එංගලන්ත කණ්ඩායමේ ජොස් බට්ලර් තරගාවලියේ වීරයා ලෙසත් සම්මාන දිනා ගත්හ.

ක්‍රිකට් පුහුණු ශාස්ත්‍රපති උපාධිය හදාරන පළමු ආසියාතිකයා තරිඳු

ජාත්‍යන්තර ක්‍රිකට් පිටියේ සිටි වැනි මට්ටමේ (Level 4) සුදුසුකම් ඇති පුහුණුකරුවන් සිටින්නේ අතළොස්සක් පමණි. එය හඳුන්වනු ලබන්නේ ක්‍රිකට් පුහුණුකාර ශාස්ත්‍රපති උපාධිය (Masters Degree) ලෙසිනි. ලොව ටෙස්ට් රටවල ක්‍රිකට් පුහුණුකරුවන් මෙන්ම මෙරට ජාතික කණ්ඩායමේ ප්‍රධාන පුහුණුකරුවන් ලෙස පසුගිය කාලයේ කටයුතු කළ විදෙස් ජාතිකයන්ට ද ඇත්තේ තෙවැනි මට්ටමේ පුහුණුකාර සහතිකයක් පමණි. මෙවැනි විරල සුදුසුකම සපුරාලමින් සිවි වැනි මට්ටමේ පුහුණුකාර පාඨමාලාව හැදෑරීමේ භාග්‍යය උදා කර ගැනීමට පසුගියදා ශ්‍රී ලාංකිකයෙක් සමත් විය. එම අවස්ථාව ලැබූ පළමු ආසියාතිකයා ද ඔහුය.

ඔහු තරිඳු පෙරේරාය. එංගලන්තයේ පමණක් පවත්වනු ලබන මේ විශේෂිත සිවි වැනි මට්ටමේ පුහුණුකාර පාඨමාලාව හැදෑරීම සඳහා පසුගියදා ඔහු තෝරා ගැනුණේ ඒ සඳහා පවත්වනු ලැබූ සම්මුඛ පරීක්ෂණයෙන් ඉහළින්ම සමත්වීමෙනි.

37 හැවිරිදි වියෙහි පසු වන මේ විශිෂ්ට පුහුණුකරු මෙරට කෙසේ වුවත් එංගලන්තයේ නම් ජනප්‍රිය පුහුණුකරුවෙකි. හෙතෙම එංගලන්තයේ ප්‍රභූ පන්තියේ සුදු ජාතිකයන් වාසය කරන යෝක්ෂයර් ප්‍රාන්තයේ කාන්තා ක්‍රිකට් කණ්ඩායමේ ප්‍රධාන පුහුණුකරු ලෙස පසුගිය වසරේදී කටයුතු කළේය. එවැනි අවස්ථාවක් ශ්‍රී ලාංකිකයකු ලැබුවේ ද පළමු වරටය. වර්තමානයේ දී ඔහු වොර්ක්ෂයර් ප්‍රාන්ත පිලේ ක්‍රිකට් අධ්‍යක්ෂවරයා වන පෝල් ෆාබ්‍රේස් යටතේ අධිතාක්ෂණ (High performance) පුහුණුකරු ලෙස සේවය කරයි. පෝල් ෆාබ්‍රේස් කලක් මෙරට ජාතික කණ්ඩායමේ හිටපු ප්‍රධාන පුහුණුකරු ද වේ.

ක්‍රිකට් පරිපාලනය, නායකත්වය, ප්‍රධාන පුහුණුකරුවකුගේ භූමිකාව, ජෛව විද්‍යා තාක්ෂණය, හැකියාව හඳුනා ගැනීම සහ දස්කම් විශ්ලේෂණය, ක්‍රීඩා මනෝවිද්‍යාව ඇතුළු විෂයයන් රැසක් මේ පාඨමාලාවට ඇතුළත් බව තරිඳු පැවැසීය.

කොළඹ අශෝක විදුහලෙන් ක්‍රිකට් ක්‍රීඩාවට පිවිසි තරිඳු අවුරුදු 17න් පහළ ජාතික සංචිතයට ඇතුළත් වූ අතර, කෝල්ට්ස් සහ එස්.එස්.සී. කණ්ඩායම්වලට ද ක්‍රීඩා කළේය. වසර 2005දී ක්‍රීඩා විද්‍යාව පිළිබඳ උපාධියක් හැදෑරීම සඳහා එංගලන්තයට ගිය තරිඳු එය අතරමඟ නතර කළේ ක්‍රිකට් ක්‍රීඩාවේ නිරතවෙමින් පුහුණුකරුවකු ලෙස සිය අනාගතය සැලසුම් කර ගැනීමේ බලාපොරොත්තුවෙනි.

යෝක්ෂයර් ප්‍රාන්තයේ ලීඩ්ස් නුවර බෙකට් විශ්වවිද්‍යාලයේ දී වසර තුනක ක්‍රීඩා පුහුණුකාර උපාධිය (bachelor's degree) සම්පූර්ණ කිරීමෙන් පසු 2016දී පළමුවරට එම ප්‍රාන්තයේ අවුරුදු 10න් පහළ පුහුණුකරු ලෙස ඔහු සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේය.

මීට අමතරව එංගලන්තයේ සිට මෙරට අඩුපහසුකම් ඇති ග්‍රාමීය මට්ටමේ පාසල් සඳහා ක්‍රිකට් උපකරණ බෙදා දීමේ සුබසාධන සංවිධානයක් ද පවත්වාගෙන යමින් නිහඬ සේවයකයෙදී සිටින තරිඳු පාසල් ක්‍රීඩකයන්ට එංගලන්තයේ ඉහළ මට්ටමේ පුහුණුකරුවන්ගෙන් පුහුණුව ලබාදීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක කරමින් සිටී.

"මගේ පවුලේ මම විතරයි. මගේ තාත්තා (වෝල්ටර් පෙරේරා) මෙලොවින් සමුගත්තේ මට අවුරුදු 21දියි. අම්මා (රේණුකා වීරසිංහ) විතරයි දැන් ඉන්නේ. ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් හැකි උපරිම සේවයක් ලබා දීමත්, අඩුපහසුකම් සහිත පාසල්වල ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීමට දායකත්වය ලබාදීමත් මගේ ලොකු අරමුණක්." ඔහු කීවේය.

- ෆවුස් මොහොමඩ්

පුහුණුවීම් අතරතුර

තරිඳු සිය මව සමඟ මෙරට ග්‍රාමීය පාසල් දරුවන්ට ක්‍රිකට් උපකරණ බෙදා දෙමින්

SINCE 1978 42nd OBSERVER MOBITEL SCHOOL CRICKETER OF THE YEAR 2020

Recognizing talent, inspiring greatness.

Sri Lanka Telecom Mobitel

42 වන ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව - 2020

ඔබේ ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයාට / ක්‍රීඩිකාවට මනාපය පළ කර ඔහුව / ඇයව වසරේ ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව කිරුළ දක්වා රැගෙන යන්න.

☐ **වඩාත්ම ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/2020 වයස අවු. 19 න් පහළ "පළමු, දෙවන සහ තෙවන කාණ්ඩ" අන්තර් පාඨශාලීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩකයින්, මනාප ලැබීමට සුදුසු වේ.

☐ **වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/20 වයස අවු. 19 න් පහළ "සමස්ත ලංකා අංශයේ" අන්තර් පාඨශාලීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩිකාවන් මනාප ලැබීමට සුදුසු වේ.

ඔබේ ක්‍රීඩකයා : .....

අංශය: පළමු කාණ්ඩය ☐ දෙවන කාණ්ඩය ☐ තෙවන කාණ්ඩය ☐

සමස්ත ලංකා ක්‍රීඩිකාව: .....

(එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ)

පාසල : .....

ඔබේ නම : .....

ලිපිනය : .....

ජංගම දුරකථන අංකය : .....

SUNDAY OBSERVER

vote.schoolcricketer.lk වෙත පිවිසීමෙන්ද ඔබගේ මනාපය ප්‍රකාශ කළ හැක.

කූපන්පත් එවා සතිපතා ත්‍යාග දිනාගන්න.

ප්‍රථම ත්‍යාගය : Mobitel 4G Wi-Fi router **දෙවන ත්‍යාගය** : රු. 2,500/-
තෙවන ත්‍යාගය : රු. 1,500/- **හතරවන ත්‍යාගය** : රු. 1,000/-

42 වන ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව නම් කිරීමේ තරඟාවලිය දැන් ආරම්භ කර ඇත. සම්පූර්ණ කරනලද ඉහත කූපනය ක්‍රීඩා සංස්කාරක, සන්ඩේ ඔබ්සවර්, ලේක්හවුස්, කොළඹ 10 වෙත තැපැල් කරන්න.

කොන්දේසි :

1) එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ.
2) ලේක්හවුස් හෝ මොබිටෙල් ආයතනයේ සේවක / සේවිකාවන්ගේ දූ දරුවන්ට තරගයට සහභාගි විය නොහැක.
3) ජයග්‍රහණය කරනු ලබන අයට මුදල් / කුසලාන හා සහතිකපත් හිමි වේ. සෑම කූපනයකම එක් ක්‍රීඩකයෙකු පමණක් නම් කළ හැකි අතර, එය එක් තරඟ වාරයක් සඳහා පමණක් වලංගු වේ. තරඟාවලියේ අවසාන තීරණය සන්ඩේ ඔබ්සවර් ක්‍රීඩා සංස්කාරක සතු වේ.

දිනය 2020-09-12 **අංකය** 27

UNLIMITED Facebook Instagram Twitter LinkedIn

රු. 99 + බදු අදාළ වේ සඳිය කිරීමට අමතන්න #170# Sri Lanka Telecom Mobitel

2020 සැප්තැම්බර් 10 බ්‍රහස්පතින්දා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

දිනමිණ දිසත දස අත ම එක තැන

■ ප්‍රසාද් පූර්ණමාල් - පුත්තලම දිසා සමූහ

මාර ගස කඩා වැටී පාර අවහිර වෙයි

හලාවත - කොළඹ ප්‍රධාන මාර්ගයට මාදම්පේ ප්‍රදේශයේදී මාර ගසක් කඩා වැටීම හේතුවෙන් පැය එකහමාරකට ආසන්න කාලයක් එම මාර්ගයේ ගමනාගමන කටයුතු මුළුමනින්ම ඇණහිට තිබූ අතර ඊයේ (09) පැය දෙකකට ආසන්න කාලයක් ගමනාගමන කටයුතුවලට ද දැඩි බධා එල්ල වී තිබිණි.

මේ මාර්ගයේ ගමන්ගත් කන්ටේනරයක් පෙරේදා (08) පස්වරුවේ මෙම මාර ගසේ අත්තක වැදී ඇති අතර ඒ අවස්ථාවේ සිට ගස ප්‍රධාන මාර්ගයට බර වී තිබී ඇති බවට ප්‍රදේශවාසීහු පවසති.

ප්‍රදේශවාසියකු විසින් කළ දැනුම් දීමක් මත මාදම්පේ පොලීසිය ක්‍රියාත්මකව මෙම මාර ගස කපා ඉවත් කිරීමට කටයුතු කර තිබිණි. පසුගිය දින කිහිපයේ හලාවත - කොළඹ මාර්ගයට ගස් කඩා වැටීම හේතුවෙන් මාර්ගයේ ගමන් ගත් වාහනවලට ද අනතුරු සිදු වී තිබේ.

■ රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ

එකම පවුලේ 4කට බඹරු ඇන තුන් හැවිරිදි දැරිය මිය යයි

වවිනියාව නොවිමුටිටේ ප්‍රදේශයේ අවුරුදු තුනක වයසැති දැරියක් පෙරේදා (08) රාත්‍රී බඹරුන් දෂ්ට කිරීම හේතුවෙන් මියගොස් ඇති අතර ඇයගේ පවුලේ තිදෙනකු ද වවිනියාව මහ රෝහලට ඇතුළත් කොට තිබේ.

මෙසේ මියගොස් ඇත්තේ අරුල් රාජා සමිත්සා නමැති දැරියකි.

නිවෙසේ උදව්ය සිය ගෙවත්තේ සවස් කාලයේ වගා කටයුත්තක නියැළී සිටි අවස්ථාවේදී බඹර කූඩුවක් ඇවිස්සී බඹරුන් දෂ්ට කොට තිබේ. බඹර ප්‍රහාරයෙන් පසුව දැරියත් දැරියගේ මව හා දැරියගේ සහෝදරියක් හා ඇගේ තුන් මස් වයසැති බිළිඳා වවිනියාව මහ රෝහලට ඇතුළත් කොට ඇති අතර දැරිය මියගොස් තිබේ.

ඕමන්ත පොලීසිය සිද්ධිය පිළිබඳව පරීක්ෂණ පවත්වයි.

■ සිරි අබයසිරි - මාතලේ මධ්‍යම සමූහ

පැණි බීමක් දී රන් භාණ්ඩ ගලවලා

රජයේ රැකියා ලක්ෂයේ වැඩසටහන යටතේ රැකියාවක් දෙන බවට පවසා කාන්තාවක් රවටා ඇය ලැගුමහලක් වෙත ගෙනගොස් පැලඳ සිටි රුපියල් පක්ෂ තුනක් පමණ වටිනා රන් භාණ්ඩ කොල්ලකෑ අඹුසැමි යුවළක් අත්අඩංගුවට ගැනීමට පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇතැයි මාතලේ පොලීසිය ප්‍රකාශ කළේය.

අඹුසැමි යුවළ සමඟ කුරුණෑගල ප්‍රදේශයේදී හිතවත් වී ඇති මෙම කාන්තාවට පැණි බීමක් බොන්නට දී මාතලේ අලුවිහාරය වෙත රැගෙන විත් මද වේලාවක් රැඳී සිට අවන්හලක් වෙත රැගෙන ගොස් පැලඳ සිටි රන් භාණ්ඩ සොරාගෙන තිබේ.

අදාළ සැකකාර අඹුසැමි යුවළ අත්අඩංගුවට ගැනීම සඳහා මාතලේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අනුරුද්ධ බණ්ඩාරනායක මහතාගේ උපදෙස් පරිදි මාතලේ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක චානක ද සිල්වා මහතාගේ මෙහෙයවීමෙන් මාතලේ අපරාධ අංශයේ නිලධාරීහු පරීක්ෂණ පවත්වති.

■ ඩී. එස්. ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ

සුළඟින් හානි වූ නිවාසවලට මූල්‍යාධාර

බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගෝනගංආර ප්‍රදේශයට මීට සති 2 පමණ ඉහතදී හමාගිය සුළි සුළඟින් අලාභ හානි වූ නිවාස 27කට මූල්‍ය ආධාර පිරිනැමීම පසුගියදා සිදුකෙරිණි. එම අවස්ථාවට සහභාගි වූ ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා හානි වූ නිවෙසක හිමිකරුවකුට මූල්‍ය ආධාර පිරිනැමූ අයුරුයි මේ.

■ ඊ. සී. ප්‍රනාන්දු - මුන්නේශ්වරම සමූහ

පාලමේ ප්‍රතිසංස්කරණ කටයුතු අරඹයි

දිනමිණ පුවත එලෙ දරයි

හලාවත කලපුව මතින් දමා ඇති පාලමේ පදික වේදිකාව හා දෙපස ඇඳි දිරාපත් වීම හේතුවෙන් ගමන් කරනා පදිකයන් අසීරුතාවට පත්ව ඇති බව විටින් විට 'දිනමිණ' පුවත් පත මඟින් පසුගිය දිනවල පෙන්වා දීමෙන් අනතුරුව වයඹ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මෙම පාලම පූර්ණ ප්‍රතිසංස්කරණයකට ලක් කිරීමට පියවර ගෙන ඇත. හලාවත විධායක ඉංජිනේරු කාර්යාලය මඟින් මෙම ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන අතර මෙයට රුපියල් ලක්ෂ 44ක් පමණ වැය වන බවට ගණන් බලා ඇත. මීටර් 65ක දිගින් යුත් මෙම පාලම අවසන් වරට ප්‍රතිසංස්කරණය කර ඇත්තේ 1997 වසරේදීය.

■ සුමිත්‍රා කුමාරිහාමි - කන්තලේ සමූහ

මොරවැව නව සහකාර පොලිස් අධිකාරි

කන්තලේ පොලිස් බල ප්‍රදේශයට අයත් මොරවැව පොලිස් කොට්ඨාසයේ නව සහකාර පොලිස් අධිකාරිවරයා ලෙස දීර්ඝ කාලීන සේවා ඉතිහාසයක් ඇති ඩබ්. එම්. ඩී. ආර්. වනිගසේකර මහතා පසුගියදා වැඩ භාර ගත්තේය. 1986 වර්ෂයේදී උප පොලිස් පරීක්ෂකවරයකු ලෙස සේවයට එක් වූ ඒ මහතා අම්පාර දිසාවෙන් පළමුව රාජකාරි අරඹා තිබිණි.

අනතුරුව 1996දී පොලිස් පරීක්ෂකවරයකු ලෙස ද 2006දී ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයකු ලෙස ද කඩුගන්නාව ප්‍රදේශයේ සේවය කිරීමෙන් අනතුරුව 2020දී සහකාර පොලිස් අධිකාරිවරයකු ලෙස බදුල්ල හා මහනුවර ප්‍රදේශවල සේවය කොට ඇත.

ඒ මහතා මිනුවන්ගොඩ මධ්‍ය මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු වන අතර යුද සමයේ නැඟෙනහිර පළාත තුළ කොටි ත්‍රස්තවාදීන්ට එරෙහිව මෙහෙයුම් ක්‍රියාන්විතයේදී මහත් උද්යෝගයකින් සටන් බිමේ සිටි දක්ෂ නිලධාරියෙකි.

■ ජයසිරි පේදුරුආරච්චි - ගන්දර සමූහ

දේශීය ඖෂධ රූපලාවණ්‍යයට

දේශීය වශයෙන් නිපදවා ඇති ඖෂධ රූපලාවණ්‍ය කටයුතු සඳහා භාවිත කිරීමට හා ඒ සඳහා අවශ්‍ය ඖෂධ පැළෑටි වගා කිරීමේ වැඩසටහනක් පසුගියදා පැවැත්විණි. මේ වෙනුවෙන් දේශීය රූපලාවණ්‍යයට අදාළ ඖෂධ පැළෑටි වගා කිරීම හා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් රූපලාවණ්‍ය පිළිබඳ ආයුර්වේදමය දැනුම්වත් කිරීමේ හා ප්‍රායෝගික වැඩසටහනක් පසුගියදා කිරින්ද විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානයේදී ඉතා සාර්ථකව පැවැත්විණි.

මෙහි සම්පත් දායකත්වය සපයන ලද්දේ හක්මන ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ගීතානි වීරසූරිය මහත්මිය, හෂානි ලේල්වල මහත්මිය හා කිරින්ද පුහුල්වැල්ල ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ලතා විදානගම මහත්මියන් විසිනි. කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දේශීය වෛද්‍ය කටයුතු අංශය හා විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානය එක්ව වැඩසටහන සංවිධානය කරන ලදි.

■ රූපිකා කේ. බණ්ඩාර කුරුවිට සමූහ

අමුණ අවලන් වීමෙන් කුඹුරු පුරන් වෙලා

කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාහේන්ගම හා කොස්ගොඩ වසම්වල කුඹුරු අක්කර සියයකට වැඩි ප්‍රමාණයක් වගා කිරීම සඳහා ඒදණ්ඩවෙල අමුණ සකස් කර දෙන ලෙස ගොවි ජනතාව ඉල්ලා සිටිති. 1915දී පමණ ඉදි කර තිබෙන මෙම අමුණ වරින්වර පිළිසකර කළ ද දැන් කිසිදු ප්‍රයෝජනයක් ගත නොහැකිව අබලන් වී තිබෙන බවට ගොවීහු මැසිවිලි නඟති. අමුණ පිළිසකර කිරීම්වලදී නිසිපරිදි එම කටයුතු සිදු නොකිරීම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගතව තිබේ. අලුත්වැඩියා කළහොත් මාස තුන හතරකට ජලය රැස් කර තබාගත හැකි මෙම අමුණින් දැනට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන විශාල ජල කඳක් අපතේ යන බවට ඔවුහු පවසති.

■ අයි. එම්. වී. සී. ගුණසේකර - ඇල්පිටිය සමූහ සහ ඩී. ජේ. විජේසිංහ - ඇල්පිටිය විශේෂ

ඇල්පිටියේ සෞඛ්‍ය සායනය

ඇල්පිටිය ඕමත්ත සහයෝගිතා සංවර්ධන සමිතිය හා ඕමත්ත කනිෂ්ඨ විද්‍යාලය එක්ව සංවිධානය කළ අක්ෂි සහ සෞඛ්‍ය සායනයක් ඉකුත්දා පහළ ඕමත්ත සුදර්ශනාරාම විහාරස්ථානයේදී පැවැත්විණි.

හෙල්පේජ් ශ්‍රී ලංකා ආයතනයේ අනුග්‍රහය ඇතිව පැවැත් වූ මෙම සායනයට ප්‍රදේශයේ රෝගීන් එකසිය දාසය දෙනකු සහභාගී වූ අතර ඉන් 24 දෙනකුට කාච දැමීමට ද 59 දෙනකුට ඇස් කණ්ණාඩි පිරිනැමීමට ද තෝරාගත් අතර තවත් පිරිසක් සායන සඳහා යොමු කිරීමට ද පියවර ගන්නා ලදි. වයස අවුරුදු පනස්පහට වැඩි සිංහල හා දවිඩ පවුල්වල රෝගීහු ද මේ සඳහා සහභාගි වූහ.

■ නන්දසිරි වැලිගමගේ - ගාල්ල දිසා සමූහ

ගාල්ලට ජල පවිත්‍රාගාර දෙකක්

ගාල්ල දිස්ත්‍රික්කයේ පවතින ජල අවශ්‍යතාවට පිළියමක් වශයෙන් ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කිරීමට නියමිත බව ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ගාල්ල කළමනාකරු පසුගියදා පැවති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී පැවසීය.

දැනට පොරොත්තු ලේඛනයේ ජල සම්බන්ධතා අපේක්ෂාවෙන් 14,500ක් ඉල්ලුම් කර ඇති බවත් කරාපිටිය උප නගර සහ රෝහල් සංවර්ධන කටයුතු යටතේ මෙන්ම සංචාරක කර්මාන්ත සහ මහල් නිවාස සඳහා දැනට පවතින ජල ධාරිතාව ප්‍රමාණවත් නොවන බවත් ඒ හේතුවෙන් ජල පවිත්‍රාගාර දෙකක් ඉදි කිරීමට නියමිත බවත් ඒ මහතා වැඩිදුරටත් පවසා සිටියේය. වක්වැල්ල ජල පවිත්‍රාගාරයේ දැනට පවතින ධාරිතාව ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එහි වෙනත් පවිත්‍රාගාරයක් ඉදි කිරීමට දෙසැම්බර් වන විට ටෙන්ඩර් කැඳවීමට නියමිතය.

■ රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ

වළලා තිබූ බෝම්බ තොගයක් ගොඩ ගනී

නාවික හමුදාවේ නිලධාරීන් පිරිසක් පොලිස් විශේෂ කාර්ය බළකායේ නිලධාරීන් සමඟ එක්ව මුලතිව් උඩයාර්කට්ටුව ප්‍රදේශයේ වළලා තිබූ මෝටාර් උණ්ඩ 15ක් ඇතුළු යුද උපකරණ රැසක් පෙරේදා (08) සොයාගෙන තිබේ.

මෙම සෝදිසියේදී වළඳමා තිබූ මිලිමීටර 60 සහ 81 යන ප්‍රමාණයන්ගෙන් යුත් බෝම්බ 02ක්, මිලිමීටර 120 ප්‍රමාණයේ මෝටාර් බෝම්බ 02ක්, මිලිමීටර 60 ප්‍රමාණයේ ඉලුම්නේෂන් පැරා මෝටාර් බෝම්බ 12ක් සහ හඳුනාගත නොහැකි තවත් එක් මෝටාර් බෝම්බයක කොටස් සොයා ගැනීමට හැකි වී ඇත.

මෙලෙස සොයා ගන්නා ලද මෝටාර් බෝම්බ නිශ්ක්‍රිය කිරීමට කිලිනොච්චිය පොලිස් විශේෂ කාර්ය බළකායේ බෝම්බ නිශ්ක්‍රිය අංශය වෙත බාර දී තිබිණි.

■ ජී. අයි. ආර්. ගරුසිංහ - වැල්ලවාය විශේෂ

එක බලපත්‍රයෙන් ගස් 138ක් කපලා

නීති විරෝධීව කැපූ තේක්ක ගස් 138ක් සමඟ සැකකරුවන් දෙදෙනකු මැදගම පොලිස් බල ප්‍රදේශයට අයත් අලුත්වෙල ප්‍රදේශයේදී අත්අඩංගුවට ගැනීමට මොනරාගල මූලස්ථාන පොලිස් ස්ථානයේ වැටලීම් අංශයේ නිලධාරීන් පසුගියදා (07) සමත් වී ඇත.

සැකකරුවන් විසින් අලුත්වෙල ප්‍රදේශයේ පිහිටි ඉඩමක තිබූ තේක්ක ගස් දහයක් සඳහා ගත් බලපත්‍රයක් භාවිත කරමින් සුක්ෂ්මව ගස් 138ක් කපා ඇති බව පොලීසිය සිදු කළ පරීක්ෂණවලදී අනාවරණය වී තිබේ.

සැකකරුවන් මොනරාගල හා අලුත්වෙල ප්‍රදේශවල පදිංචිකරුවන් වන අතර අත්අඩංගුවට ගත් දැව තොගයේ වටිනාකම මෙතෙක් තක්සේරු කර නැත. සැකකරුවන් හා දැව තොගය මැදගම පොලිස් ස්ථානයට භාර දී තිබූ අතර සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන මැදගම පොලීසිය හා මොනරාගල මූලස්ථාන පොලිස් ස්ථානයේ වැටලීම් ඒකකයේ නිලධාරීහු සිදු කරති.

දැනමිණ දිසත්
දස අත ම එක තැන

■ නාඋල සමූහ

2020 ජගත් සංචාරක දින සැමරුම රත්තොටදී

මෙවර අන්තර්ජාතික සංචාරක දින සැමරුම් උළෙල සැප්තැම්බර් 29 අඟහරුවාදා දවස පුරා රත්තොටදී පැවැත්වීමට නියමිතය. දුම්බර වනපෙතේ පරිසර පද්ධති ආශ්‍රිතව හරිත සංචාරක අවකාශය සඳහා අගය එකතු කිරීමේ අරමුණින් දුම්බර වනපෙත ආශ්‍රිත මාතලේ රත්තොට මැදවත්ත රාජ්‍ය වතුයායේ දන්කන්ද වැව ආශ්‍රිතව එය පැවැත්වීමට කටයුතු යොදා තිබේ. මෙහිදී සෞඛ්‍ය උපදෙස් වලට අනුව පුද්ගලයන් 50ක ගේ සහභාගිත්වයෙන් හා දහ දෙනකුගේ සේවා සම්බන්ධීකරණය සහිතව එකට නොවැඩි සහභාගිත්වයක් තහවුරු කරගෙන උත්සවයේ සිදු කරනු ලබන බව සංවිධායකයෝ කියා සිටිති. මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්තොට ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, මධ්‍යම පළාත් සංචාරක දෙපාර්තමේන්තුව, දුම්බර වන පාලක කාර් යාලය, මැදවත්ත රාජ්‍ය වතුයාය හා ග්‍රැෆික් ශ්‍රී ලංකා ආයතනය වැඩසටහන සඳහා සත්කාරක දායකත්වය සපයයි.

■ ඩබ්ලිව්.පී. ධර්මසේන - මාතර සමූහ

සිරකරුවන්ට හෙරොයින් දෙන්න මාන බැලූ ජාවාරමුන් තිදෙනෙක් දැලේ

බන්ධනාගාර ගතව සිටින සැකකරුවන්ට හෙරොයින් ලබාදීම සඳහා මාතර මහඩිකරණය අසල ගැවසුණු හෙරොයින් ජාවාරම් කරුවන් තිදෙනෙක් හොරොයින් ග්‍රෑම් 62යි මිලිග්‍රෑම් 180ක් සමඟ මාතර කොටියාස දූෂණ මර්දන අංශයේ නිලධාරින් විසින් අත්අඩංගුවට ගෙන තිබේ.මෙසේ අත්අඩංගුවට ගෙන ඇති ප්‍රධාන සැකකරු හෙරොයින් ජාවාරම් සම්බන්ධයෙන් මහඩිකරණයෙන් ඇප පිට සිටින ගන්දර තල්ලල ප්‍රදේශයේ පදිංචි 37හැවිරිදි අයකු වන අතර ඔහුගේ යට ඇඳුමේ සඟවා තිබියදී අත්අඩංගුවට ගෙන ඇති හොරොයින් ප්‍රමාණය හෙරොයින් ග්‍රෑම් 59යි මිලිග්‍රෑම් 940කි. කැරටි නමැති අන්වර්ථ නාමයෙන් හඳුන්වන 24 හැවිරිදි සැකකරු සන්තකයේ තිබී හෙරොයින් මිලි ග්‍රෑම් 1200ක් සොයාගෙන ඇති අතර ඔහු මාතර හිත්තැටිය කුමාරදාස මාවතේ පදිංචිකරුවෙකි. අනිත් සැකකරු බීට නමැති අන්වර්ථ නාමයෙන් හඳුන්වන මාතර බතුතා පාරේ පදිංචි 27 හැවිරිදි අයෙක් වන අතර ඔහු සන්තකයේ තිබී හෙරොයින් මිලි ග්‍රෑම් 1040ක් පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ. මේ සැකකරුට ගංජා ජාවරම පිළිබඳ මහාධිකරණයේ නඩු දෙකක් පවතින බව හෙළිවේ. ප්‍රධාන සැකකරු සහ ඔහුගේ බිරියත් බිරියගේ පියාත් හෙරොයින් ජාවාරමේ චුදිතයන් ලෙස දිර්ඝ කාලයක් බන්ධනාගාර ගතව සිට ඇප මත නිදහස්ව පැමිණ සිටින අතර බිරියගේ පියා මේ වනවිටත් අගුණකොලපැලැස්ස බන්ධනාගාරයේ රක්ෂිත

බන්ධනාගාර ගතව සිටිමින් මේ සිද්ධියේ ප්‍රධාන සැකකරු වන බෑනා ලවා බන්ධනාගාර ගතව සිටින ද්විවිධ සැකකරුවකුට හොරොයින් ලබාදීමට උත්සාහ කර ඇත. බන්ධනාගාරව ගතවන සැකකරුවන්ට හෙරොයින් සැපයීමේ ජාවාරම් කරුවන් කිහිප දෙනකු මාතර මහාධිකරණය අසල ගැවසෙන බවට මාතර කොටියාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි චන්දන හේරත් මහතාට ලැබුණු ඔත්තුවකට අනුව සිවිල් ඇඳුමෙන් සැරසුණු පොලිස් නිලධාරින් එම ප්‍රදේශයේ සෝදිසියෙන් සිටිමන් එක් සැකකරුවකු මාතර නීතිඥ සංකිර්ණයට යන මාර්ගයේදී අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමේදි අනිත් සැකකරුවන් දෙදෙනාද අත්අඩංගුවට ගෙන තිබිණි. මෙම පුද්ගලයන් සමඟ යතුරුපැදියක් සහ ජංගම දුරකතනයක් පොලිස් භාරයට ගෙන ඇති අතර එම යතුර පැදිය බන්ධනාගාර නිලධාරියකුට අයත් එකක් බවට තොරතු ලැබී ඇත. මේ යතුරු පැදිය උපයෝගී කර ගනිමින් සැකකරුවන් හොරොයින් බෙදා ඇද්ද ? එයට යතුරුපැදි අයිතිකරු වන බන්ධනාගාර නිලධාරියාගෙන් අනුග්‍රහයක් ලැබී ඇතිද? යනුවෙන් පොලිසිය දැඩි විමර්ශනයක් ආරම්භ කර ඇත. මාතර කොටියාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි චන්දන හේරත්, මාතර පොලිස් අධිකාරි (1) විජේවර්ධන යන මහත්වරුන්ගේ උපදෙස් පරිදි මාතර කොටියාස දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරික්ෂක අජිත් මෙන්ඩිස්,විෂ මත්ද්‍රව්‍ය මැඩලීමේ ඒකකයේ ස්ථානාධිපති උප පොලිස් පරික්ෂක අශෝක ප්‍රියංකර, පො.සැ.56615 සුනිල්, පො.සැ.37066 පතිරණ, පො.සැ. 6403 අනුර , පො. සැ. 55836 ක්‍රිෂාන්ත, පො.කො. 66649 ජනක , පො.කො .68160 වසන්ත, පො.කො. රි. 80437 වසන්ත යන නිලධාරින් වැටලීම සිදුකර ඇත.

■ වෝල්ටර් දයාරත්න - අනුරාධපුර දිසා විශේෂ

අනුරාධපුර මල්වතු ලෙන් මිහින්තලා පටුමග අලුත් වෙයි

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සපිරි ගමක් සංවර්ධන වැඩපිළිවෙළ යටතේ අනුරාධපුර මල්වතු ලෙන් මිහින්තලා පටුමග වාහන ගමනා ගමනයට පවා සුදුසු තත්වයෙන් සංවර්ධන කර ජනතා අයිතියට පැවරීම පසුගියදා අනුරාධපුර දිස්ත්‍රික් මන්ත්‍රී කේ.පී.සරත් කුමාර සිරි මහතා අතින් සිදු කෙරිණි.

අධික වර්ෂා දිනවලදී මල්වතු ඔය පිටාර ගැලීමෙදන් ජනතාවට සිදු වන විවිධ බාධක හා කරදර මගහරවා ගැනීමට පිවිතුරු හෙළ උරුමයේ අනුරාධපුර දිස්ත්‍රික් සංවිධානයක ක්‍රිෂාන්ත සම්පත් මානවඩු මහතාගේ මගපෙන්වීම මත පුරා විද්‍යා අධ්‍යක්ෂක ජනරාල් සෙනරත් දිසානායක මහතාගේ අධික්ෂණය හා අනුමැතිය මත මල්වතු ලෙන් මිහින්තලා පටු මග වාහන ගමනා ගමනයට මෙසේ සංවර්ධන කර ජනතා අයිතියට පැවරිණි. මේ සඳහා මධ්‍යම නුවර ගම් පළාත ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හරහා රජය මගින් රුපියල් ලක්ෂ විස්සක් ලබා දී ඇත.

මෙතෙක් කල් පැවැති ජනතාවගේ ගංවතුර බිය නැතිකරමින් අංග සම්පූර්ණ මාර්ගයක් ලබා දීමේ උත්සව අවස්ථාවට නාගරික මන්ත්‍රීවරුන් වන විනෝදනී වීජේසුරිය, නදීර ප්‍රභාත් ධර්මදාස, එල්. පී.ප්‍රේමවන්ද්‍ර යන මහත් මහත්මීන් ප්‍රධාන විශාල පිරිසක් එක්ව සිටියහ.

■ සී. එම්. ආරියපාල - තඹුත්තේගම සමූහ

තහනම් දෑ ළඟ: පුද්ගලයකුට දඩ

තහනම් කරන ලද ග්ලයිපෝ සෙට් පැකට් 142 ද තහනම් කෘමිනාශක පැකට් 50 ද ළඟ තබාගෙන අධිකරණ යේදී වෝදනා පිළිගත් තඹුත්තේගම තම්මැන්නාපුර පදිංචි අයකුට රුපියල් 50,000.00 ක දඩ මුදලක් අධිකරණයට ගෙවන ලෙසට තඹුත්තේගම මහේන්ත්‍රාත් කේ.ඒ .ආර් නදීශානි මහත්මිය නියෝග කළාය.

■ ඩී.එස්. ගුණතිලක උඹව වෙල්ලස්ස විශේෂ

බැකෝවකට යට වී පුද්ගලයෙක් මරුට

බිබිල නගරයේ ප්‍රාදේශීය සභාව ඉදිරිපිටදී ඉකුත්දා ස්කැවේටර් යන්ත්‍රයකට යටවීමෙන් 77 හැවිරිදි අටදරු පියකු ජීවිතක්ෂයට පත්වී ඇතැයි බිබිල පොලීසිය පවසයි.

මෙලෙස ජීවිතක්ෂයට පත්වී ඇත්තේ බිබිල රදලියද්ද වැවපාර පදිංචිව සිටි දිසානායක මුදියාන්සේලාගේ අභයරත්න (77) නමැති අයෙකි. හෙතෙම මාර්ගයේ ගමන් කරමින් සිටියදී ස්කැවේටර් යන්ත්‍රයට යටවී බරපතළ තුවාල ලබා බිබිල මූලික රෝහලට ඇතුළත් කරන අතරතුර මියගොස් ඇත.

මියගිය අයගේ මරණය පිළිබඳව පශ්චාත් මරණ පරීක්ෂණය බිබිල මූලික රෝහලේදී පැවැත්වීමට නියමිතව තිබිණි. බැකෝ යන්ත්‍රයේ රියැදුරු වන ගලගෙදර පදිංචි දහනව හැවිරිදි තරුණයකු බිබිල පොලීසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇත.

සිද්ධිය පිළිබඳව බිබිල පොලිස් ස්ථානාධිපති ඒ.එස්. පී.සී.කේ. සෙනරත් මහතා වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

■ ඩී.එස් ගුණතිලක - උඹව වෙල්ලස්ස විශේෂ

පැල්පත් නිවැසියන්ට නව නිවහන්වල උරුමය

අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස සාදාදීමේ ජනාධිපතිතුමාගේ වැඩසටහනට යටතේ සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මඟින් අඩු ආදායම්ලාභී පැල්පත් නිවාසවල ජීවත් වන පවුල් සඳහා නව නිවාස ඉදිකිරීමේ වැඩසටහන යටතේ සෙවනගල සමඟිපුර ප්‍රදේශයේ පවුලක් සඳහා ඉදිකරන ලද නව නිවසක් නිවැසියන්ට භාරදීම පසුගියදා සිදුකෙරිණි.

මෙම අවස්ථාවට පැමිණි කෘෂිකර්ම රාජ්‍ය ඇමති ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා නව නිවස විවෘත කොට නිවැසියන්ට භාරදුන්නේය.

■ නාඋල සමූහ

ලග්ගල - කණුමුල්ල ගමට පාරක්

ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කණුමුල්ල ග්‍රාම සේවා වසමේ දුෂ්කර පිවිසුම් මාර්ගය කිලෝමීටරයක දුරක් කොන්ක්‍රීට් දමා අවසන් කළ බව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පවසයි.

'සපිරි ගමක්' ව්‍යාපෘතිය යටතේ රුපියල් ලක්ෂ විස්සක වියදමින් මාර්ගය නිමකර තිබේ.

නුදකලා වී තිබූ කණුමුල්ල ගම්මානයට පහසුවෙන් ළඟා වීමට රාජ්‍ය ප්‍රතිපාදන යටතේ මෙම මාර්ගය ඉදිවීම සම්බන්ධයෙන් කණුමුල්ල ප්‍රදේශවාසිහු රජයට සිය සතුට පළ කරති.

■ රූපිකා කේ.බණ්ඩාර - කුරුවිට සමූහ

දේශපාලනඥයන් හා නිලධාරීන් ගහට පොත්ත වගේ වැඩ කරන්න ඕනෑ

සභාපති

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන යෝජනාවලට අදාළ තොරතුරු,වාර්තා එම ආයතන මඟින් දින 7ක් තුළ ලබාදිය යුතුයි. ඒවා ලද පසු දේශපාලන අධිකාරියට බෙදා හරිනවා.අපි කටයුතු කළ යුත්තේ විෂයානුබද්ධවයි.අපි දේශපාලකයෝ.ඔබ නිලධාරීන්. ගහට පොත්ත වගේ වැඩකරන්න ඕනෑ.දිස්ත්‍රික්කවලට ආවේණික ප්‍රශ්න තිබෙනවා. ඒවාට දිස්ත්‍රික් මට්ටමින් කටයුතු කළයුතු වෙනවා.ජනතාවට උත්තරිතර සේවයක් කිරීම අරමුණයි.රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය බස්නාහිර පළාතට ගෙන යනවාට අපි විරුද්ධ යැයි රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මහතා රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී පැවැසුවේය.කම්කරු කාර්යාලය පවත්වාගෙන යන තැනට දැනට මසකට රුපියල් ලක්ෂයක් කුලිය ගෙවනවා. අලුතෙන් ගෙන යන තැනට ඊටත් වැඩි මුදලක් ගෙවිය යුතුයි.මා කෙරෙහි විශ්වාසය තබා රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සමසභාපති ධුරයට පත්කිරීම පිළිබඳ ජනාධිපතිවරයාට ස්තූතිවන්ත වෙනවා යැයිද ඒ මහතා වැඩදුරටත් කීය. රත්නපුර දිස්ත්‍රික් ලේකම් මාලනී ලොකුපෝතාගම මහත්මියගේ කැඳවීමෙන්,සබරගමු පළාත් ආණ්ඩුකාර ටිකිරි කොබ්බෑකඩුව හා රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මහත්වරුන්ගේ සභාපතිත්වයෙන් මේ රැස්වීම පැවැත්විණි.

අපනයන ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති - ජානක වක්කුඹුර මහතා

ඇස්තමේන්තු හදලාවත් නැති යෝජනා තිබෙනවා.හතළිස් පහක්ම කලවානේ.සංගෝධනය කරලත් නෑ. ඡන්ද කාලෙ නිසාද දන්නෙ නෑ. තව මේ වසරේ මාස 9යි තිබෙන්නේ. වැස්සත් පටන් ගන්නවා.ආයතනවල නිලධාරින් නෑ කියා වැඩ ප්‍රමාද වීමට බෑ.විසිතුරු මත්ස්‍ය පැටවුන් වවා අපනයනය කරනවා නම් සියයට පනහක මුදලක් නිකම් දෙනවා.මෙය විදේශ විනිමය ගෙන ඒමේ හොඳ ව්‍යාපෘතියක් .දිස්ත්‍රික්කයේ බඩඉරිඟු වවන ප්‍රමාණය මදි. ලංකාවේම වගාකර ඇත්තේ හෙක්ටයාර් අසූදාහයි.අලුතෙන් හෙක්ටයාර් තිස්දහසක් වගාකළ යුතුයි.50%.බීජ හා පොහොර සහනාධාර දෙනවා.

සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය

දිස්ත්‍රික්කයේ රෝහල් විසිදෙකක සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන හයසිය විසිපහක් ලබා දුන්නා. පළාත් ආණ්ඩුකාරවරයා එක්ක රෝහල්වලට ගිහින් බලලයි මුදල් දුන්නේ. ඉදිකිරීම් පිළිබඳ ප්‍රගති සමාලෝචනයක් කරනවා. ජාතික පාසලක් ලෙස නොවුණත් කොට්ඨාසයකින් එක පාසලක්වත් සංවර්ධනය කළ යුතුයි.මත්ද්‍රව්‍ය විශාල වශයෙන් ඇල්ලීම ගැන මව්වරු ප්‍රශංසා කරනවා.දිගටම මේ තත්ත්වයෙන් කටයුතු කළ යුතුයි.ඩෙංගු මර්දන කටයුතු නොනවත්වාම කරන්න ඕනෑ.

ජලසම්පාදන ඇමැති වාසුදේව නානායක්කාර මහතා

පසුගිය කාලයේ ආරම්භ නොකළ ව්‍යාපෘති පටන් ගන්න එපා. පටන්ගත් ඒවා කරගෙන යන්න.දැන් තිබෙන්නේ අලුත් දේශපාලන අධිකාරියක්.රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දෙයියන්ගේගම ප්‍රදේශයේ පවුල් 300කට පමණ

රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව

ජලය බෙදා දෙන ජල මූලාශ්‍රයක් තම ඉඩමට අයත් බව පවසමින් නාගරික මන්ත්‍රීවරයකු විසින් විනාශ කරනවා. පොලීසියට කියා බෙල්ලෙන් අල්ලා එළියට දාන්න.කටුපොල් වගාව නවත්තලයි තිබෙන්නේ. එහෙත් නිවිතිගල ප්‍රදේශයේ වවන බව කියනවා. මේ ගැන සොයා බලන්න.රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති නගර හා කුඩා නගරවලට සනීපාරක්ෂක පහසුකම් සැපයිය යුතු අතර (මිල ගෙවන) පානීය ජලය සඳහා පිංතාලියක් ඒ අසල සවිකළ යුතුයි.

පළාත් ආණ්ඩුකාර ටිකිරි කොබ්බෑකඩුව මහතා

දෙදෙනස් අටෙදී කොළොන්න,කැල්ල ප්‍රදේශයට මැටි පිළිස්සුම් යන්ත්‍රයක් දී තිබුණත් මෙතෙක් විවෘත කරලාවත් නෑ.කුරුඳුතෙල් කර්මාන්තයත් වෙන්කර තිබෙනවා. පළාත් මාර්ග හදපුවා වැඩිකල් තිබෙන්නෙ නෑ.පසු විපරමක් කරන්න ඕනෑ.පාරේ නම හා වැය කරන මුදල ජනතාව දැනගන්න ඕනෑ.කොන්ත්‍රාත්කරුගේ නමත් යටින් දානවා නම් හොඳයි.

රත්නපුර දිස්ත්‍රික් ලේකම් මාලනී ලොකුපෝතාගම මහත්මිය

රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය බස්නාහිර පළාතට රැගෙන යෑම ගැන ගැටලුව සාකච්ඡා කිරීමට කම්කරු කොමසාරිස්වරයාට පැමිණෙන ලෙස දැන්වුවා. සහභාගි වීමට නොහැකි බව දන්වා ලිපියක් එවා තිබෙනවා. කම්කරු ඇමැතිවරයාගේ නියෝගය මත අවිස්සාවේල්ල කම්කරු කාර්යාලයේ ගොඩනැගිල්ලක මෙය ස්ථාපිත කිරීමට පියවර ගෙන තිබෙන බවත් මේ ගැන කම්ටුවට දන්වන ලෙසත් ඉල්ලා තිබෙනවා.ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වවන බව කියනවා. මේ ගැන සොයා බලන්න.රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති නගර හා කුඩා නගරවලට සනීපාරක්ෂක පහසුකම් සැපයිය යුතු අතර (මිල ගෙවන) පානීය ජලය සඳහා පිංතාලියක් ඒ අසල සවිකළ යුතුයි.

■ කේ. විජේසිරි නිශ්ශංක - කරල්ලියද්ද සමූහ

සිරගෙදර මිතුරන්ට මත් ගෙන ගිහින්

මොරටුව හා වස්කඩුව යන ප්‍රදේශවල සිට පැමිණ දුම්බර බන්ධනාගාරයට ගංජා ගෙන යන්න තැත් කළ සැකකරුවන් තිදෙනකු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට තෙල්දෙනිය වැඩබලන මහෙස්ත්‍රාත් නිතිඥ ශිරෝමී ප්‍රබෝධිකා නියාගම මහත්මිය නියෝග කළාය.

රක්ෂිත බන්ධනාගාර ගත කර සිටින සිය මිතුරන් බැලීමට පැමිණි සැකකරුවන් තිදෙනා වන මොවුන් මොරටුව රාවතාවත්ත . වස්කඩුව . මොරටුව. කටුබැද්ද යන ප්‍රදේශවල යන පදිංචි තරුණයන් තිදෙනෙකි.

■ ආර්.එම්.විජේරත්න - හාලිඇළ සමූහ

මහියංගණයේ 11 වියැති පාසල් සිසුවෙක් මත්කුඩුවලට ඇබ්බැහි වෙලා

සභාපති

වෙනත් බොහෝ නගරවල මෙන්ම බදුල්ල දිස්ත්‍රික්කයේ පාසල් ආශ්‍රිතවද මේ වන විට මත්ද්‍රව්‍ය ජාවාරම බරපතළ ලෙස ක්‍රියාත්මක වන බව පෙන්වා දුන් බදුල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී (ශ්‍රී ලං.පො.පෙ.) මේජර් සුදර්ශන දෙණිපිටිය මහතා, මහියංගණය ප්‍රදේශයේ පදිංචි 11 හැවිරිදි පාසල් දරුවෙක් පවා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී ඇති බව අනාවරණය වී ඇතැයිද පැවැසීය. බදුල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව හමුවේ මත්ද්‍රව්‍ය ගැටලු පිළිබඳ අදහස් දක්වමින් සභාපතිවරයා මේ බව කීය. මත්ද්‍රව්‍ය ජාවාරමිකරුවන් පාසල් ළමුන් මත්ද්‍රව්‍යවලට යොමුකර ගැනීමට විවිධ උපායන් යොදමින් සිටින බැවින් මත් ජාවාරම මර්දනය කිරීම උදෙසා දිස්ත්‍රික්කයේ පාසල් ආශ්‍රිතව විශේෂ ආරක්ෂක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන ලෙසද ඒ මහතා පොලීසිය දැනුවත් කළේය. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ බව කියන මහියංගණය ප්‍රදේශයේ පාසල් දරුවා පිළිබඳ අනාවරණය කළ එම දරුවාගේ මව විසින්ම අදාළ ජාවාරම්කරුවන් එම පාසල තුළටද මේ දරුවා හරහා මත්ද්‍රව්‍ය යවා ඇති බවත් හෙළිවී ඇතැයිද සභාපතිවරයා පැවැසීය.

මේ වන විට දැඩි ලෙස නාගරීකරණය නොවූ ප්‍රදේශයක් වන මහියංගණය ප්‍රදේශයේ තත්ත්වය මෙසේ නම් නගරය තුළ පාසල්, උසස් අධ්‍යාපන ආයතන හා පෞද්ගලික උපකාරක පන්ති විශාල සංඛ්‍යාවක් පවතින බදුල්ල, බණ්ඩාරවෙල වැනි නගරයන් හි තත්ත්වය කෙසේ විය හැකිදැයි විමසූ ඒ මහතා, එම තත්ත්වය ධාරණය කළේය.

එසේම පොලීසිය ඇතුළු ආරක්ෂක අංශය මඟින් දිස්ත්‍රික්කය තුළ මේ වන විටත් ක්‍රියාත්මක කෙරෙන මත්ද්‍රව්‍ය මර්දන කටයුතු පුළුල් කරමින් පාසල් දරුවන් ඉලක්ක කරගත් මත්ද්‍රව්‍ය ජාවාරම මර්දනය කිරීම උදෙසා දැඩි පියවර ගන්නා ලෙසද සභාපතිවරයා පොලීසියට දැන්වීය.

බදුල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය පැරණි ශ්‍රවනාගාරයේදී පැවැති මේ රැස්වීමට කම්කරු ඇමැති නිමල් සිරිපාල ද සිල්වා මහතා ඇතුළු දිස්ත්‍රික්කයේ දේශපාලන නායකත්වය සහ බදුල්ල දිස්ත්‍රික් ලේකම් දමයන්ති පරණගම මහත්මිය ඇතුළු රාජ්‍ය නිලධාරිනු විශාල පිරිසක්ද එක්ව සිටියහ.

■ ප්‍රසන්න පත්මසිරි - උඟව පළාත් සමූහ

බිබිල හෙවෙල්වල ගල්පාලම අවදානම්

බදුල්ල-බිබිල මාර්ගයේ බිබිල හෙවෙල්වල ගල්පාලම කැඩීයෑමේ අවදානමකට ලක්ව තිබෙන බව ප්‍රදේශවාසීහු කියති.

1818 වසරේදී ඉංග්‍රීසින් විසින් උඩ රට තේ කර්මාන්තයේ ප්‍රවාහන කටයුතු සඳහා ගල ඔයෙන් එගොඩවීමට ගල් වලින් පාලම ඉදිකර තිබේ.මේ දිනවල පවතින අධික වර්ෂාවත් සමග ගල ඔයේ සැඩ පහරට අඩි හැටක් පමණ දිග, අඩි තිහක් පමණ උස පාලමේ කුලුනු වල තිබෙන ගල් හා ආරක්ෂිත බැම් කැඩීයෑමට පටන්ගෙන තිබෙන බව ප්‍රදේශවාසීහු කියති.

ආර්ථික පුනර්ජීවන බළකාය
සබරගමුවේ සමුපකාර වෙළෙඳසල් 115ක් නවීකරණය කරයි

රජය මගින් ක්‍රියාත්මක කර ඇති ආර්ථික පුනර්ජීවන බළකාය යටතේ රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්ක දෙකේ සමුපකාර වෙළෙඳසල් 115ක් මුළුමනින්ම නවීකරණය කිරීමට කටයුතුකර ඇතැයි සබරගමුව පළාත් ප්‍රධාන ලේකම් රංජනී ජයකොඩි මහත්මිය සඳහන් කරයි. වැඩිදුරටත් අදහස් දක්වමින් රංජනී ජයකොඩි මහත්මිය පවසනුයේ සබරගමු පළාතේ විවිධ සේවා සමුපකාර සමිති 23 මගින් සිල්ලර වෙළෙඳ සල්, කෝප් සිටි, මිනි කෝප් සිටි 115 ක් මේ යටතේනවීකරණය කරන බවය.

මෙම වෙළෙඳ ආයතන 115 Best-Cop නමින් නාමකරණය කරන බවද ප්‍රධාන ලේකම්වරිය වැඩිදුරටත් සඳහන් කළාය.එමෙන්ම මෙම වෙළෙඳ ආයතන සියල්ල මුළුමනින්ම නවීකරණය කර ඒවාට අවශ්‍ය උපකරණ පද්ධති කඩිනමින් ලබා දෙන බවද එම මහත්මිය පවසයි.

වැඩිදුරටත් අදහස් දක්වන රංජනී ජයකොඩි මහත්මිය සඳහන් කරනුයේ ඉහළ ප්‍රමිතියෙන් යුත් එළවළු, පලතුරු, සහල් ඇතුළු ආහාර ද්‍රව්‍ය මෙම වෙළෙඳ ආයතන තුළින් පාරිභෝගිකයන්ට වෙළෙඳ පොළේ අවම මිලකට අලෙවි කිරීමට කටයුතු කරන බවය.

මේ යටතේ පුද්ගලික අංශයේද දායකත්වයලබා ගෙන සමුපකාර ව්‍යාපාරය ශක්තිමත් කිරීමට කටයුතුකර ඇතැයි පවසන සබරගමු පළාත් ආණ්ඩුකාර ටිකිරි කොබ්බෑකඩුව මහතා දැනටමත් ඒ සඳහා යුනිලීවර් සමාගම සිය දායකත්වය මීට ලබා දී ඇතැයි ද සඳහන් කරයි.

රැකියා පුහුණුව, තොග කළමණාකරණය, පාරිභෝගික සත්කාර, තොරතුරුතාක්ෂණය, කාර්යක්ෂමතාවය ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක පුහුණුවක් මේ යටතේ 2000 ක් පමණ වන සබරගමුවේ සමුපකාර සේවකයන් සඳහා ලබා දෙන බවද රංජනී ජයකොඩි මහත්මිය පවසයි.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දක්වන සබරගමුව පළාත් ප්‍රධාන ලේකම්වරිය පවසනුයේ ආර්ථික පුනර්ජීවන බළකායේ සභාපති ලෙස බැසිල් රාජපක්ෂ මහතාගේ උපදෙස් අනුව මෙම Best-CopBest-Cop වැඩසටහන ක්‍රියාත්මකකරන බවය.

පසුගිය Covid 19 වසංගත තත්ත්වයේදී මෙන්ම ගංවතුරහා නාය යෑම් වැනි ආපදාඅවස්ථාවන් වලදීද සමුපකාර ව්‍යාපාරය විශාල මෙහෙයක් රට වෙනුවෙන් ඉටු කළ බවද රංජනී ජයකොඩි මහත්මිය පවසයි.

මෙම ව්‍යාපෘතිය සඳහා සබරගමුව පළාත් සභාව මගින් රුපියල් ලක්ෂ 35 ක මුදලක් සමුපකාර සමිති වෙත ප්‍රදානය කර ඇත.

මේ යටතේ සමුපකාර සේවකයන් දැනුවත්කිරීමේ වැඩසටහනක් පසුගියදා (11) රත්නපුර කේතුමතී උත්සව ශාලාවේදී පැවැත්විණි. එම අවස්ථාවට සමුපකාර කොමසාරිස් සුමින්ද සිංගප්පුලි පළාත් සමුපකාර කොමසාරිස් මයුර අරන්දර යන මහත්ම මහත්මිහු පිරිසක් සහභාගී වූහ.

දිනමිණ දිසත දස අත ම එක තැන

■ සුමිත්‍රා කුමාරිහාමි-කන්තලේ සමූහ

පිත්තල භාණ්ඩ සොරාගත්තැයි සැකකරුවන්ට ඇප

නිවෙසක ගබඩා කාමරයේ තිබූ පිත්තල භාණ්ඩ සොරා ගැනීම සම්බන්ධයෙන් අධිකරණය හමුවට පමුණුවා සිටි පුද්ගලයන් දෙදෙනකු රුපියල් ලක්ෂ 2 ක බැගින් ශරීර ඇප මත නිදහස් කිරීමට කන්තලේ වැඩ බලන මහේස්ත්‍රාත් දමයන්ති කුමාරි මහත්මිය නියෝග කළාය.කරුණු විමර්ශනය කොට සැකකරු මෙම 21 යළි අධිකරණය හමුවට පමුණුවන ලෙසටද මහෙස්ත්‍රාත් වරිය පොලිසියට නියෝග කළාය. ඇප මත නිදහස් වූයේ කන්තලේ වැවිසිරිගම පදිංචි 24, 50 යන වයස වල දෙදෙනෙකි.

පසුව සැකකරු නිදහස් වී පැමිණිවිට අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමේ දී හොර බඩු හා ඒවා මිල දී ගත් තැනැත්තා ද අත්අඩංගුවට ගැනීමට පොලිසිය සමත්ව ඇත. කන්තලේ මූලස්ථාන පොලිසියේ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක රන්දික තුෂාන් මහතා ඇතුළු නිළධාරීහු වැඩි දුර පරීක්ෂණ මෙහෙයවති.

■ සේන වී.ගමගේ ඇඹිලිපිටිය සමූහ

දිනමිණ පුවතින් පසු ගල්කන්ද විහාරයට පුරාවිද්‍යා නිලධාරීන්ගේ අවධානය

දිනමිණ පුවත්පත මගින් ඉකුත් 08.19 දින පල කරන ලද ගල්කන්ද රාජමහා ලෙන් විහාරයට නිදන් සොරුන්ගේ බැල්ම පුරා විද්‍යා නිලධාරීන්ගේ අවධානය පිණිසයි නමින් පල වූ වාර්තාවට අනුව පසුගියදා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ විශේෂ නිලධාරීන් කණ්ඩායමක් එම විහාරස්ථානයට ගොස් එම ස්ථාන නිරීක්ෂණයට ලක්කොට ඇත. පුරාවිද්‍යා දෙපාර්තමේන්තු කොමසාරිස්වරයාගේ උපදෙස් පරිදි ගාල්ල පුරා විද්‍යා සහකාර අධ්‍යක්ෂිකා වසන්තා අලහකෝන් මහත්මියගේ අධීක්ෂණය යටතේ විශේෂ ගවේෂණ නිලධාරීන් පිරිසක් මෙම අවස්ථාවට එක්ව ඇත.

මේ පිළිබඳව අදහස් දක්වන මීමන ගල්කන්ද රාජමහා විහාරාධිපති දෙයියන්දර මහා විද්‍යාලයේ ආචාර්ය, ශාස්ත්‍රපති තඹලපැලැස්සේ තිලකානන්ද හිමියෝ - වසර 2000 ක් පැරණි වළගම්බා රජු විසින් ඉදිකරන ලද මෙම ලෙන් විහාර පද්ධතිය ඉතා වටිනා වස්තූන්, සෙල්ලිපි නිදන් හොරුන්ට මෙන්ම ස්වාභාවික විපත්වලට ලක්වෙලා. මේ පිළිබඳව වගකිවයුතු නිලධාරීන් මෙතෙක් පැමිණ නැහැ.

ඉකුත්දා පුවත්පත් මගින් පළමුවරට හෙළි කිරීමෙන් පසු පසුගියදා පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ විශේෂ කණ්ඩායමක් පැමිණියා. ලෙන් විහාර ඇතුළු ප්‍රදේශය නිරීක්ෂණය කරලා මේ පිළිබඳව විශේෂ පරීක්ෂණ කණ්ඩායමක් ඉදිරියේදී ගවේෂණ කටයුතු සඳහා පැමිණෙන බව පවසමින් පිටත්ව ගියා. අපි ඉල්ලා සිටින්නේ මේ වටිනා ජාතිය සතු උරුමය පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ වගකීමක් ලෙස සංරක්ෂණය කර මතු පරපුර සඳහා ආරක්ෂා කරදෙන ලෙසයයි පැවසීය.

■ අරුණි ප්‍රාර්ථනා ලියනගේ - හිනිඳුම සමූහ

ගිනි අවි 2ක් සමඟ දෙදෙනෙක් කොටු වෙති

මෙරට නිෂ්පාදිත බෝර 12 වර්ගයේ ගිනි අවිදෙකක් සමග පුද්ගලයන් දෙදෙනෙක් යක්කලමුල්ල පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ.මෙසේ අත්අඩංගුවට පත්ව ඇත්තේ වයස අවුරුදු 30 සහ 35 පමණ වනවයස්වල පසුවන යක්කලමුල්ල මාගෙදර ප්‍රදේශයේ පදිංචිකරුවන් දෙදෙනෙකි. ඉකුත් සතියේද යක්කලමුල්ල පොලිස් වසමෙන් ගිනි අවි තුනක් පොලිසිය විසින් සොයගෙන තිබුණි.

යක්කලමුල්ල පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක දමිත පෙරේරා මහතාගේ උපදෙස්මත වැටලීම සිදුකර තිබුණි.

හුලංදාව ඔය ඉවුර දෙපස කුඹුක් පැළ 1000ක් සිටුවීමේ වැඩසටහනක්

මොනරාගල හුලංදාව ඔය ඉවුර දෙපස කුඹුක් පැළ1000ක් සිටු වීමේ වැඩසටහනක් නියෝජ්‍ය පොලිස්පති මොනරාගල දිසාව එච්.ඒ.එන්.කේ. දමයන්ත විජය ශ්‍රී මහතාගේ මෙහෙයවීමෙන් 2020/08/28 දින ආරම්භ කරන ලදී.

මේ සඳහා අවශ්‍ය පැළ වැල්ලවාය අඩවි වන නිලධාරී එච්.එම්.ඒ.ඩී. හේරත් මහතා විසින් සපයා දෙන අතර කුඹුක්කන 121 බල සේනා මූලස්ථානයේ නිලධාරීන්ද ශ්‍රී ලංකා පොලීසිය සමඟ මෙම සද්කාර්ය සඳහා දායකත්වය ලබා දෙන ලදී.

■ අනුරාධ ප්‍රියදර්ශන-කරන්දෙනිය සමූහ

ගිනි අවි සමඟ ඇල්ලූ හිටපු ප්‍රා.සභා මන්ත්‍රී සීඅයිඩියට

බද්දේගම ගනේගම වලව්වත්තේ දී ගිනිඅවි සමඟ අත්අඩංගුවට ගත් බද්දේගම ප්‍රාදේශීය සභාවේ හිටපු මන්ත්‍රීවරයකු වූ ගැමුණු ඒකනායක වැඩිදුර පරීක්ෂණ සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාරදීම සිදු කරන ලදී.

ගනේගම වලව්වත්ත ප්‍රදේශයේ දී විශේෂ කාර්ය බළකාය සහ බද්දේගම පොලිසිය ඒකාබද්ධව 07 දින කළ වැටලීමකදී ගිනි අවි ඇතුළු ආයුධ රාශියක් සොයා ගැනීමට හැකි විය. මේ සම්බන්ධයෙන් බද්දේගම ප්‍රාදේශීය සභාවේ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකු වූ ගැමුණු ඒකනායක නැමැත්තා අත්අඩංගුවට ගෙන තිබේ. අත්අඩංගුවට ගත් අවි අතර ටී 56 වර්ගයේ ගිනි අවියක්, ඊව උණ්ඩ හයක්, මැගසින් එකක්, වායු රයිෆලයක්, ඊව අත්බෝම්බයක්, රම්බෝ වර්ගයේ පිහි පහක් පිස්තෝල රඳවන තුනක් ආයුධ තබන යකඩ පෙට්ටියක් සොයා ගැනීමට හැකිවිය. අත් අඩංගුවට ගත් මන්ත්‍රීවරයා වැඩිදුර පරීක්ෂණ සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දෙන ලදී.

■ සිසිල ගුණතිලක ගම්පහ දිස්ත්‍රික් විශේෂ සහ ඔලිවර් පෙරේරා ගම්පහ මධ්‍යම සමූහ

සිසු නායක නායිකාවන්ට නිල ලාංඡන

ගම්පහ ගෝතමී විද්‍යාලයේ 2020 ශිෂ්‍යනායක නායිකාවන්ට නිල ලාංඡන පැළඳවීමේ උත්සවය විදුහල්පති උපාලි විජේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී 07 වැනිදා පෙරවරුවේදී පැවැත්විණි.

එහිදී විදුහල්පති උපාලි විජේවර්ධන මහතා විසින් 5 වසරේ යුමේත් පලිහවඩන සිසුවාට පදක්කම් පළඳවන අයුරු.

■ බී.එම්.විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

රජයේ රැකියා දෙන බව කියා
ලක්ෂ 30ක් වංචා කරලා

රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයකු ලෙස පෙනී සිටිමින් රජයේ රැකියා ලබාදෙන බව පවසා තරුණ තරුණියන් හතළිහකට අධික පිරිසකගෙන් රුපියල් තිස් ලක්ෂයක මුදලක් වංචා කළ බව කියන සිද්ධියකට සැකපිට අත්අඩංගුවට ගෙන දින දහඅටකට ආසන්න කාලයක් රක්ෂිත බන්ධනාගාර ගතව සිටි උතුරුමැද පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ හිටපු සභාපතිවරයාව රුපියල් ලක්ෂ පහ බැගින් වූ ශරීර ඇප දෙකක්මත මුදාහරින ලෙස අනුරාධපුර අතිරේක මහේස්ත්‍රාත් අතිරේක දිසා විනිසුරු එන්.ටී හේමන්ත පුෂ්පකුමාර මහතා (07දා) නියෝග කළේය.

මෙසේ ඇපමත මුදාහැරියේ ගල්වඩුවාගම පහේ ඇළ ග්‍රාවස්තිපුර අනුරාධපුර ලිපිනයේ පදිංචි උතුරුමැද පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ හිටපු සභාපති රත්නායක මුදියන්සේලාගේ නුවන් චාමර යන අයයි.සැකකරු මෙම සිද්ධියට රක්ෂිත බන්ධනාගාර ගතවීමත් සමග සභාපතිවරයාගේ වැඩ තාවකාලිකව අත්හිටුවීමට උතුරුමැද පළාත් ආණ්ඩුකාරවරයා මඟින් පියවර ගෙන තිබුණි.

සැකකරු පෙරේදා (07දා) දිනයේ අධිකරණයට ඉදිරිපත් කළ අවස්ථාවේ අනුරාධපුර මූලස්ථාන පොලිසියේ විශේෂ අපරාධ විමර්ශන අංශය මුදල් වංචාව සම්බන්ධයෙන් සිදුකරනා පරීක්ෂණ අවසන්ව නැති බවත් එම විමර්ශන තවදුරටත් සිදුවන බවත් අධිකරණයට දැන්වුවේය.

සැකකරු වෙනුවෙන් පෙනී සිටි ජ්‍යෙෂ්ඨ නීතිඥ රංජිත් රාජකරුණා මහතා අධිකරණය හමුවේ කරුණු දක්වමින් කියා සිටියේ සිය සේවාදායකයා රැකියා ලබාදෙන බව පවසමින් කිසිදු මුදලක් වංචාකර නැති බවත් එම චෝදනා තරයේ ප්‍රතික්ෂේප කරන බවයි. ඔහු රජයේ රැකියා දෙන බව පවසා මුදල් එක්කාසු කිරීමක් හෝ බැංකු ගිණුම්වලට මුදල් බැරකරගෙන නොමැති බවත් පැවසූ නීතිඥවරයා අධිකරණයට සුදුසු යැයි හැඟෙන ඕනෑම ඇප කොන්දේසියක් මත සිය සේවාදායකයා මුදාහරින ලෙස අධිකරණයෙන් අයැද සිටියේය.

සියලු කරුණු සැලකිල්ලට ගත් මහේස්ත්‍රාත්වරයා සැකකරුට රුපියල් ලක්ෂ පහ බැගින්වූ ශරීර ඇප දෙකක් නියමකළ අතර පදිංචි සහතික ග්‍රාමනිලධාරී සහතික ඇපකරුවන් අධිකරණයට ඉදිරිපත් කළ යුතු බවට නියෝග කළේය.

■ ගාල්ල දිසා සමූහ

පිරිමි දරුවන් දෙදෙනකු අපයෝජනයට ලක්කළැයි

හැත්තෑ හැවිරිදි තිදරු පියා අත්අඩංගුවට

දහතුන් හැවිරිදි බාලවයස්කාර පිරිමි දරුවන් දෙදෙනකු බරපතළ ලෙස ලිංගික අපයෝජනයට ලක් කරනු ලැබූ හැත්තෑ හැවිරිදි තිදරු පියකු අත්අඩංගුවට ගත් බැව් ගාල්ල කොටියාස ළමා හා කාන්තා කාර්යාංශය පවසයි.

ගාල්ල බටදූව ප්‍රදේශයේ දී සැකකාර පුද්ගලයා පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇත. සැකකරු වෙළෙඳසලක් පවත්වාගෙන යන පුද්ගලයකු බව විමර්ශනවලදී අනාවරණය වී ඇත. මෙකී සැකකරු විසින් දැනට වසර දෙකක කාලයක සිට මෙකී පිරිමි දරුවන් දෙදෙනා බරපතළ ලෙස ලිංගික අපයෝජනයට ලක්කොට ඇති බව විමර්ශනවලදී අනාවරණය වී ඇත.

මින් එක් පිරිමි දරුවකු විසින් මෙකී පුද්ගලයාගෙන් තමන්ට සිදුවන ලිංගික අතවර ඉවසා දරාගැනීමට නොහැකිව පාසලේ ගුරුවරයකුට පවසා ඇත. ඔහු මේ පිළිබඳ විදුහල්පතිවරයාට දන්වා තිබේ.පසුව මේ පිළිබඳ පොලිසියට ලද තොරතුරකට අනුව ගාල්ල කොටියාස ළමා හා කාන්තාකාර්යාංශය මඟින් සැකකරු අත්අඩංගුවට ගෙන ඇත. මෙකී පිරිමි දරුවා මව හා පියා නොමැති අතර ආච්චි ළඟ හැදී වැඩී ඇති බව පොලිසිය පවසයි.

පසුව මෙම පිරිමි දරුවා විසින් ලබාදුන් ප්‍රකාශමත තවත් පිරිමි දරුවන් කිහිප දෙනෙකුට මෙම සැකකරු විසින් ලිංගික අතවර කොට ඇති බව පරීක්ෂණවලදී අනාවරණය වී ඇත. සැකකරු විසින් ලිංගික අතවර කළ අනිකුත් දරුවන් පිළිබඳවද විමර්ශන කටයුතු ආරම්භ කරන බව පොලිසිය පවසයි. සැකකරු විසින් දරුවන් සංරූගල් යවන අවස්ථාවල දී මෙන්ම සිය කාමරය තුළ වෙළෙඳසලට පැමිණෙන අවස්ථාවල දී මෙම දරුවන් අපයෝජනයට ලක්කොට ඇති බව විමර්ශනවලදී අනාවරණය වී ඇත.

■ ඩී.එස් ගුණතිලක - උඟව වෙල්ලස්ස විශේෂ

බුත්තල ග්‍රාමීය වැඩිහිටි කමිටුවලට උපකරණ

බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි ග්‍රාමීය වැඩිහිටි කමිටු සඳහා උපකරණ පිරිනැමීම බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී සිදුකෙරිණි. බුත්තල ප්‍රාදේශීය ලේකම් ආර්. එම්.එස් තිලකරත්න මහතා විසින් වැඩිහිටි කමිටු සාමාජිකාවකට උපකරණ කට්ටල සඳහාවූ ලිපිය භාරදුන් අයුරුයි මේ.

■ අරුණි ප්‍රාර්ථනා ලියනගේ - හිනිඳුම සමූහ

කාරයේ හැපුණු තරුණයා ගිංගඟට වැටිලා

ගාල්ල මාපලගම පාරේ නාගොඩ ඉහළ ප්‍රදේශයේදී මාර්ගයේ ධාවනයවූ කාරයක් පාරෙන් ඉවතට පැනීමෙන් අනතුරක් සිදුවී තිබේ.මෙහිදී ඒ මොහොතේ බස් රථයකින් බැස පාර මාරුවීම සඳහා පාර අයිනේ සිටි තරුණයෙක්ද හප්පා දුරකතන කණුවක හැපී කාරය පෙරළී තිබේ.මේ අතර අනතුරටපත් තරුණයා කාරයේ හැපී විසිවී ගිං ගඟට වැටෙන්නට ඇතැයි පොලිසිය සැකකරයි. මෙසේ අතුරුදන්ව ඇත්තේ නාගොඩ ඉහළ ප්‍රදේශයේම පදිංචි සමන් ප්‍රියන්ත (37) තිදරු පියෙකි.කාරය පැදවූ රියැදුරාද නාගොඩ ප්‍රදේශයේම අයකු වන අතර ඔහුද තුවාල ලබා රෝහල් ගතකර ඇත.ගඟට විසිවී අතුරුදන්ව ඇතැයි සැකකරන පුද්ගලයා සොයා නාගොඩ පොලිසියෙන් පරීක්ෂාවන් සිදුකෙරේ.

■ රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ

යාපනය කෝවිලේ මංගල්‍යයට මහ සෙනඟක්

දැනමිණ දසස

දස අත ම එක තැන

යාපනයේ කෝවිලේ වාර්ෂික මංගල්‍යය බැතිමතුන් 5,000කගේ පමණ සහභාගීත්වයෙන් පසුගියදා අවසන් විය. මෙම කෝවිලේ වාර්ෂික මංගල්‍යය සැප්තැම්බර් 02 රාත්‍රී පැවති විශේෂ පූජාවෙන් පසුව අවසන් වූ අතර මෙවර කොරෝනා වසංගතය නිසා දානය පිරිනැමීමේ අවස්ථාව අවලංගු කිරීමට කෝවිල් බාරකාර මණ්ඩලය තීරණය කොට තිබිණි. කෝවිලේ වාර්ෂික මංගල්‍යය සඳහා දිනකට බැතිමතුන් 350කට පමණක් සෞඛ්‍ය අංශවලින් අවසර ලැබී තිබුණද කෝවිලේ වාර්ෂික මංගල්‍යයට පැමිණි පිරිස පාලනය කිරීමට කවරකුටවත් නොහැකි විණි.

දින දාහතරක් තිස්සේ මෙම කෝවිලේ වාර්ෂික මංගල්‍ය වෙනුවෙන් විවිධ දේව පූජා පැවැත්විණි.

■ ප්‍රියන්ත සුමනසේන - මාතලේ දිස්ත්‍රික් සංචාරක

උකුවෙල තැන්න පාර පුළුල් කෙරේ

වසර 17ක් තිස්සේ මාර්ගයක් පුළුල් කර ගැනීමට නොහැකිව දුක් විඳි පිරිසකට උකුවෙල ප්‍රාදේශීය සභාවේ සභාපති ඩී.ඩබ්.එම්. වෙතියරත්න මහතාගෙන් ගම්වාසීන් කරන ලද ඉල්ලීමක් මත පිළිසකර කර දීමට පියවර ගන්නා ලදී. උකුවෙල ප්‍රාදේශීය සභා බල කොටඨාසයේ කුඹියන්ගොඩ මාතලේ පාරේ තැන්න අතුරු මාර්ගයක් මෙලෙස සකස් කර ගැනීමට නොහැකිව සිටියදී නිලධාරීන් යොදවා අවහිරව තිබූ ගස්වල අතු කපා සකස් කර දීමට කටයුතු කරනු ලැබිය.

■ ආර්. ගනේගොඩ - මැදකොළඹ සමූහ

අඩු ආදායම්ලාභීන්ට සමෘද්ධි සහන

කොළඹ මහ නගර සභා බලප්‍රදේශයේ අඩු ආදායම්ලාභීන්ට සමෘද්ධි සහනාධාර පිරිනැමීමේ උත්සවයක් කොළඹ පුරපතිනි රෝසි සේනානායක මහත්මියගේ ප්‍රධානත්වයෙන් කොළඹ නව නගර ශාලාවේදී පැවැත්විණි.

එම අවස්ථාවට සහභාගී වූ අඩු ආදායම්ලාභිනියකගෙන් ඉතා සුභදව පුරපතිනිය කරුණු විමසූ අතර මේ අවස්ථාවට ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ටයිටස් පෙරේරා, නාගරික මන්ත්‍රිනි චාමිකා පතිරණ, ඒ.ඒ.ඩී. සුගත් කුමාර, තුෂාර මනම්පේරි ආරුමුගම් කන්නා යන නාගරික මන්ත්‍රීවරුද සහභාගී වී සිටියහ.

■ ඒ.ජී. ගුණරත්න - මාදම්පේ සමූහ

මුන්නේශ්වරම් දෙවොලේ ගිනි පෑගීමේ උත්සවය

හලාවත මුන්නේෂ්වරම් ඊශ්වර මහා දේවාලයේ වාර්ෂික නිකිණි මංගල්‍යයේ චාරිත්‍රානුකූල ගිනි පෑගීමේ උත්සවය පසුගියදා පැවැත්විණි.

කොරෝනා වසංගතය හේතුවෙන් මෙවර ගිනි පෑගීම එක් පූජකවරයකුට පමණක් සීමා විය. ගිනි පෑගීමේ උත්සවයේ පාරම්පරික භාරකරු වන ජෙයානන්දසිං කෝකිලනාත්සිං පූජකතුමා සෙසු පූජකවරුන් සමඟ ගිනි පෑගීම සිදු කළේ මෙලෙසිනි.

■ එම්.පී. කුමාර - කොටදෙණියාව සමූහ

වල් ඌරන් හා ඉබ්බන් මරා විකුණන තැනක් කදිරානේ

විවිධ ප්‍රදේශවල රක්ෂිත කැලෑවලින් අල්ලාගෙන එනු ලබන ආරක්ෂිත සත්ත්වයන් ලෙස සැලකෙන වල් ඌරන් හා ඉබ්බන් මරා මස් විකිණීමේ යෙදුණු බව කියන දෙදෙනකු එසේ විකිණීමට තබා තිබූ මස් හා අබිලි ද්‍රව්‍ය තොගයක් සමඟ පසුගියදා (03) සවස අත්අඩංගුවට ගත් බව ගම්පහ දිස්ත්‍රික් වනජීවී සහකාර අධ්‍යක්ෂ කාර්යාලය පවසයි.

බුද්ධි අංශවලින් ලද තොරතුරක් අනුව මෙම වැටලීම කරනු ලැබුයේ කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කදිරාන ප්‍රදේශයේදීය.

පෞද්ගලික නිවසක් ආශ්‍රිතව පිහිටි ඉඩමක මෙසේ ආරක්ෂිත සතුන්ගේ මස් විකිණීම කරගෙන යන බවට ලැබුණු තොරතුරක් අනුව ගම්පහ දිස්ත්‍රික් වනජීවී සහකාර අධ්‍යක්ෂ නීතිඥ ලලිත් කුමාර මහතාගේ අධීක්ෂණය යටතේ මෙම වැටලීම කෙරිණි.

සැකකරුවන් වසරකටත් අධික කාලයක් තිස්සේ මේ ආකාරයට මස් විකිණීමේ ජාවාරම කරගෙන ගොස් ඇතැයි හෙළිවී ඇත. තොරතුර අනුව පසුගියදා (03) සවස හදිසි සෝදිසියකදී ඉබ්බන් ගණනාවකගේ කටු ඇතුළු මස් තොගයක් අත්අඩංගුවට ගැනීමට හැකිවී ඇත. මස් කැපීමට යොදාගත් පිහි ආදියද අත්අඩංගුවට ගත් බව ගම්පහ දිස්ත්‍රික් වනජීවී සහකාර අධ්‍යක්ෂ කාර්යාලය කියයි.

සැකකරුවන් හා නඩු භාණ්ඩ පසුගියදා (04) මීගමුව අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය. මුතුරාජවෙල වනජීවී කලාපීය කාර්යාලයේ අඩවි ආරක්ෂක ලසන්ත ගුණවර්ධන, ගම්පහ දිස්ත්‍රික් වනජීවී සහකාර අධ්‍යක්ෂ කාර්යාලයේ අඩවි සහකාර එරංග සඳුන්, වන සත්ත්ව නියාමකවරුන් වන ශානුක රණවක ආරච්චි, සේරම් යන නිලධාරීහු මෙම වැටලීමට එක්වූහ.

■ ලෙස්ලි පෙරේරා - ජාඇළ මධ්‍යම

ජා - ඇළ සෝවිස් මාවතේ අලුත් නළ ජලය මහ පාරේ දෝරේ ගලයි

ජා -ඇළ කලඑළිය සෝවිස් මාවතේ ජල නළ එළීමේ කටයුතු නිසි ලෙස සිදු කර නොමැති වීමෙන් ජලය අපතේ යෑමට පටන්ගෙන ඇත. මෙම තත්ත්වයට මේ වනතුරු නිසි පිළියමක් ලබාදී නොමැති බවට ජනතාව චෝදනා කරති.

■ එස්. දියගහගේ - දකුණු පළාත් සංචාරක

කරාපිටියේ නව රෝහලේ ඉදිකිරීම් අවසන් අදියරේ

ගාල්ල කරාපිටියේ ඉදි කරමින් පවතින නව මාතෘ රෝහල දකුණු ආසියාවේ විශාලතම මාතෘ රෝහල බවත් එම රෝහල ලබන වසරේ මුලදී විවෘත කිරීමට නියමිත බවත් එම රෝහල හෙල්මුට් කෝල් අනුස්මරණ රෝහල යනුවෙන් නම් කිරීමට තීරණය කර ඇති බවත් රෝහල් ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ වෛද්‍ය ප්‍රියන්ත අතපත්තු මහතා පැවසීය.

මේ වන විට නව රෝහල් ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු සියයට අනුවකින් පමණ අවසන් කර අතැයිද ඒ මහතා සඳහන් කළේය. මහල් හයකින් යුත් නව රෝහලේ ඇඳන් හය සියයකින්, ශල්‍යාගාර හයකින්, හදිසි ප්‍රතිකාර ඒකක, දඩි සත්කාර ඒකක, රසායනාගාර, ළදරු දැඩි සත්කාර ඒකක, විශේෂ ළමා ඒකක ඇතුළු නවීන වෛද්‍ය පහසුකම්වලින් යුක්ත වන අතර මේ සඳහා ජර්මන් රජය විසින් ලබාදී ඇති ණය ආධාර මුදල යුරෝ මිලියන විසි පහකි. නිවාඩුවක් ගත කිරීම සඳහා 2004 දෙසැම්බර් මාසයේ ශ්‍රී ලංකාවට පැමිණි හබරාදුව තල්පේ ප්‍රදේශයේ සංචාරක හෝටලයක නවාතැන්ගෙන සිටි ජර්මනියේ හිටපු චාන්සලර් හෙල්මුට් කෝල් මහතා සුනාමියෙන් දකුණු පළාතේ විශාලතම මාතෘ රෝහලවූ ගාල්ල මහමෝදර රෝහලට සිදුවූ හානිය දැක අලුතෙන් මාතෘ රෝහලක් ඉදි කිරීම සඳහා රුපියල් කෝටි තුන් දහසක පරිත්‍යාගයක් කළ අතර එවකට අගමැතිවරයා ලෙස සිටි රත්නසිරි වික්‍රමනායක මහතා 2007 වසරේදී මෙම රෝහල සඳහා මුල් ගල් තැබීය.

■ ඒ.ටී.එම්. ගුණානන්ද - ත්‍රිකුණාමලය විශේෂ

වන අලි පහරින් අයකුට බරපතළයි

සේරුනුවර පොලිස් වසමට අයත් සිරිමංගලපුර ට්‍රාන්ස්ෆෝමරය අසල වෙල්යායේදී පසුගියදා (03) රාත්‍රී වන අලි ප්‍රහාරයකට ලක් වූ අයකු තුවාල ලබා රෝහල්ගත කළ බව සේරුනුවර පොලිසිය පවසයි.

මෙසේ තුවාල ලබා ඇත්තේ සේරුනුවර සිරිමංගලපුර පදිංචි එම්.ජී. ගාමිණි පුෂ්පකුමාර (48) නමැති අයෙකි. වනඅලි ප්‍රහාරයෙන් තුවාල ලැබූ අය සේරුනුවර ප්‍රාදේශීය රෝහලට ඇතුළත් කිරීමෙන් පසු ත්‍රිකුණාමල මහා රෝහලට මාරු කර යවා තිබේ. වෙල්යායට පැමිණි අලියා මෙම පහරදීම සිදු කර කෑගසා පලා යෑමත් සමඟ මේ සම්බන්ධයෙන් විමසිලිමත් වූ ප්‍රදේශවාසීන් තුවාලකරු රෝහලට රැගෙන විත් තිබේ.

ඉතිහාස

ස්වර්ණභූමියේ අතීතාවලෝකනය

පිටුව 22
› අපේ මුල්ම පොත

පිටුව 23
› ඩොයිලි සාන්තුවරයෙක් ද?

පිටුව 24
› කළුඳිය පොකුණ

ඉතිහාසය ගැන අලුතෙන් චින්තන

මහාචාර්ය රොමිලා තාපර්

පරිවර්තනය
මහාචාර්ය රාජ් සෝමදේව

ජවහර්ලාල් නේරු විශ්වවිද්‍යාලයේ ඉතිහාස අංශයේ ආචාර්යවරයකු වන රන්ධීර් චක්‍රවර්ති විසින්, එම විශ්වවිද්‍යාලයේ සේවාර්පිත මහාචාර්යවරියක වන රොමිලා තාපර් සමඟ කළ සංවාදයක් ඇසුරෙන් මේ ලිපිය සකසා තිබේ. එම සංවාදය 2015 වසරේ දී ඉන්දියාවේ ප්‍රකට ප්‍රකාශනයක් වන ෆ්රන්ට් ලයින් සඟරාවේ 32 වැනි වෙළුමේ පළ විය. 'අතීතය වර්තමානය ලෙස' යනුවෙන් නම් කර තිබෙන මේ ලිපිය, මුල්වරට ඉංග්‍රීසි භාෂාවෙන් පළ වූ The Past as Present නම් වූ එම දීර්ඝ ලිපියේ තෝරා ගත් කොටසක සිංහල පරිවර්තනයයි මේ.

සංවාදයේ දී මහාචාර්ය තාපර්ගේ අවධානයට ලක්ව තිබෙන්නේ ඉන්දීය සමාජය වුවත්, ඇය විසින් ප්‍රකාශිත අදහස්, ඉතිහාසය සම්බන්ධයෙන් වර්තමානයේ මෙරට පවතින ඇතැම් සංවාදවලට සහ ඒවාට සහභාගී වී සිටින්නන්ටද අදාළ වන බව පෙනේ.

ඔබගේ නවතම කෘතිය වූ 'අතීතය වර්තමානය ලෙස' යන්න කියවන පාඨකයකුට, ඉන්දියාවේ ඉතිහාසය ඉගෙන ගන්නා ආකාරය ගැනත්, ඒ ගැන තිබෙන සාමාන්‍ය දැක්ම ගැනත් ඔබ තරමක ශෝකී බවකින් පසුවන්නේ යැයි හැඟීමක් ඇති වෙනවා. ඔබ ඒ කාරණා ගැන සුබවාදීව නොසිතන බව පැහැදිලියි. ඒත් ඔබ ඒ ගැන, අසුබවාදී නොවන බවත් එහි දක්වා තිබෙනවා. මේ තත්ත්වය පැහැදිලි කළ හැකිද?

ඔබගේ ප්‍රශ්නය අදාළ වන්නේ පසුගිය දශක කිහිපය තුළ ඉන්දියාවේ ඉතිහාස ශික්ෂණය ගමන් කළේ කොයිබටද? යන කාරණයටයි. ඉන්දියාව තුළ ඉතිහාසය හැදෑරීමත්, ඉතිහාසය ගැන කතා කිරීමත් මටටම් දෙකක පවතින බව පැවසීමට මට ඉඩ දෙන්න. ඉන් පළමු වැන්නට අයත් වන්නේ ශාස්ත්‍රීය ඉතිහාසඥයන්, සිත් ගන්නා ආකාරයට ඉතිහාසය ලිවීමයි. ඒ ඉතිහාසඥයන්, ඉහළ මටටමේ විශ්වවිද්‍යාලවලත්, විශ්වවිද්‍යාල ආයතනවලත් සේවය කරන අයයි. මීට වසර පනහකට පෙර ඉතිහාසය ඉගැන්වූ ආකාරය වෙනස් කරලා, එය නව මාවතකට ගෙන ඒමට ඒ කාලයේ අප කළ අරගල දෙස බලද්දි, දැන් ඉතා සතුටුදායක වෙනසක් ඇති වී තිබෙන බව පෙනෙනවා. සිදු වී ඇති වෙනස ජාත්‍යන්තර වශයෙන් තම විශ්වවිද්‍යාලවල දකින්න නොලැබෙනවා. බොහෝමයක් එවැනි ආයතන ලෝකයේ විශිෂ්ට මධ්‍යස්ථානවල ඉතිහාසය උගන්වන ආකාරය ග්‍රහණය කර ගැනීමට පවා තවමත් අපොහොසත් වෙලා තිබෙන බව පෙනෙනවා. ඉතිහාසඥයන් කිහිපදෙනෙක්, ඉතිහාසය සමාජවිද්‍යාවක් විදිහට පිළිගන්නවා වුණත්, එහි බුද්ධිමය පදනම හඳුනාගෙන තිබෙනවා.

මේ ප්‍රවේශය තව දුරටත් පැතිර යාවි යැයි කෙනකුට බලාපොරොත්තු තැබිය හැකියි. ඉතිහාසයට අදාළව පෙනෙන අනෙක් ආකාරය පෙන්නුම් කරන්නේ, මෙහි විරුද්ධ පැත්තයි. මෙය අදාළ වෙන්නේ, සාමාන්‍ය ජනතාව හොඳින් දන්නා ජනප්‍රිය ඉතිහාසයටයි. ඒ ඉතිහාසය නම් මීට සියවසකට ඉහත උගන්වන ලද, යල්පිනූ ඉතිහාසයයි. එසේ නොවේ නම්, ඉතිහාසයට අයත් දේ නෙමෙයි. සාමාන්‍යයෙන් බොහෝ අවස්ථාවල ඔවුන් නගන අරුත් සුන් ප්‍රශ්නවලින් ඉතිහාසය ගැන ඔවුන්ට තිබෙන අඩු දැනුම පිළිබිඹු වෙනවා. මහජනයා අතර ඉතිහාසය පතුරවන අය, වෘත්තීය ඉතිහාසඥයන් නෙමෙයි. ඔවුන් කරන්නේ තමන්ට පාසලේ දී ඉතිහාසය උගන්වන ආකාරය අනුව, සමාජයට ඉතිහාසය කියා දීමට උත්සාහ දැරීමයි. ඉතිහාසය ඉගැන්වීමට අප තවමත් භාවිත කරන්නේ යල්පැන ගිය ඓතිහාසික වටහා ගැනීම් සහ ක්‍රමවේදයි. එහිදි වඩාත් අවධානය යොමු කරන්නේ, ඉතිහාසය යනු මතක තබා ගත යුතු දිනවකවානු සහ සිද්ධි ඇතුළත් තොරතුරු සම්භාරයක් විදිහට සැලකීමටයි. ඉතිහාස පාඩමේ දී ගුරුවරයා ශිෂ්‍යයන්ට දෙන සටහන්, එක් පැත්තක අංක සහ අනෙක් පැත්තේ ඒ අංක හිමි පුද්ගලයන්ගේ නම් ඇතුළත් දුරකථන නාමාවලියකට සමාන කළ හැකි යැයි අවශ්‍ය නම් කෙනකුට කිව හැකියි.

ඉතිහාස ක්‍රමවේදය පිළිබඳ කනගාටුවට කරුණ නම්, ඉතිහාසය යනු අතීතයට අයත් කරුණු යැයි මහජනයා සිතා සිටීමයි. ඉතිහාසය ගැන පර්යේෂණවල නිරත වන විට, මේ අදහස ඉතා සීමිත වුවක් බව දැන් පෙනෙනවා. අප මෙහි දී අවධාරණය කරන්නේ, දන්නා මූලාශ්‍රවලින් තොරතුරු ලබා ගන්නවා වගේම, වෙනත් නව මූලාශ්‍රවල ආශ්‍රය සෙවිය යුතු බවයි. ඒ වගේම, අතීතය තේරුම් ගැනීමටත්, එය අර්ථ දැක්වීමටත් පෙර පවතින සාක්ෂ්‍යවල සත්‍යවාදී බව වෙනදාටත් වඩා ප්‍රවේසමසහගතව පරීක්ෂා කළ යුතුයි. අතීතයට අයත් තොරතුරු ගවේෂණයට භාවිත කරන ඉහත සඳහන් කළ සංකල්ප දෙක සහ ඒවා ආශ්‍රයෙන් අතීතයේ දී සිදු වූයේ කුමක්දැයි අර්ථ දැක්වීම වර්තමානයේ අප විසින් හඳුන්වන්නේ ඉතිහාස ක්‍රමවේදය යනුවෙනුයි. අප ශිෂ්‍යයන් ලෙස සිටි කාලයේ, අපට මෙවැනි කාරණා ඉගැන්වූයේ නැහැ. ඊට හේතුව, එකළ ඒ ආකාරයට කල්පනා කළ අය සිටියේ අතළොස්සක් නිසා විය හැකියි. ඒත්, වර්තමානයේ ඉතිහාසය ගැන නව්‍යතාවකින් කල්පනා කිරීම දැඩි අවශ්‍යතාවක්. අවාසනාව නම්, පාසල්වල උසස් පන්තිවලටත්, විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂක මටටමේදීත් මේ ක්‍රමයට ඉගැන්වීම ගැන ප්‍රාමාණික අවධානයක් නොමැති වීමයි.

මෙහි දී අත්‍යවශ්‍ය වන දේ නම්, පළමු පියවර විදිහට සාක්ෂි සහ දත්ත එකතු කිරීමයි. දෙවැනි පියවර වෙන්නේ, දත්තවල සත්‍යතාව පරීක්ෂා කිරීමෙන් තමා ආශ්‍රය කරන්නේ, විශ්වාස සහගත ලෙස පරීක්ෂා කර තහවුරු කරන ලද තොරතුරු මිස, තැනින් තැනින් අහුලා ගත් කරුණු හෝ ඇතැම් අයගේ මනෝවිකාර හෝ නොවන බව තහවුරු කිරීමයි. තෙවැනි පියවර වෙන්නේ, අතීතයේ සිදු වූ සිද්ධි අතර තිබෙන හේතුඵල සබඳතාව දැක ගැනීමයි. අංක 2 දරන සිද්ධිය අංක 1 දරන සිද්ධියේ ප්‍රතිඵලයක් ද? එකම තැනක සිදු වූ සිද්ධි දෙකක කිසියම් සබඳතාවක් තිබේද? ඒ සබඳතාව ඇති වුණේ, සිද්ධි සිදු වීමෙන්ම ද? කලකට පසුව ද? වැනි හේතු ප්‍රත්‍යමය සබඳතාව තාර්කික අනුමානිත විශ්ලේෂණයක දී වැදගත් අංගයක්. සෑම විශ්ලේෂණයක්ම පදනම් විය යුත්තේ, දත්ත පිළිබඳ කරන විවේචනාත්මක ඇගැයීමක් මතයි. ඉතිහාසඥයන් විදිහට වෘත්තීමය ලෙස පුහුණු වූ අය ඇතත්, ඔවුන් තවමත් අනුගමනය නොකරන්නේ මේ පියවරයි. ඉහතින් සඳහන් කළ පියවර ඔස්සේ ගමන් කළ විට, ඓතිහාසික සාමාන්‍යකරණය යනුවෙන් හැඳින්වෙන ප්‍රකාශනය තනාගත හැකියි. ඓතිහාසික විශ්ලේෂණයන්, අතීතය පිළිබඳ කියැවෙන මනෝවිකාරත් අතර විශාල වෙනසක් තිබෙනවා. ජනප්‍රිය ඉතිහාසය අරක් ගෙන තිබෙන්නේ තාර්කික විශ්ලේෂණවලට වඩා, එක් එක් පුද්ගලයන් රුචි කරන පෞද්ගලික මනෝභාව මත බව පෙනෙනවා. ඓතිහාසික තොරතුරු කියන්නේ විශ්ලේෂණය කළ යුතු, එමෙන්ම හේතුඵල සම්බන්ධතාවකින් කාර්කිකව සැලකිල්ලට ගත යුතු දෙයක් විදිහට කල්පනා කිරීම, පසුගිය දශක කිහිපය තුළ ඓතිහාසික පර්යේෂණවල ඇති වූ තත්ත්වයක්. මේ තත්ත්වය මීට පෙර පැවතියත්, එය සීමා වූණේ විශිෂ්ට ගණයේ ඉතිහාසඥයන්ට විතරයි. වර්තමානයේ එය ඉතිහාසය ඉගෙන ගන්නා සිය ශිෂ්‍යයන් දැන ගැනීම අවශ්‍යයි. එහෙත් එම ක්‍රමවේදයේ තිබෙන දැඩි බව, තම ශිෂ්‍යයන්ට දැරිය නොහැකි වේවි.

මේ අනුව ඓතිහාසික තොරතුරු යනුවෙන් අප හඳුන්වන දේ, දත්ත එකතු කිරීම සහ ඒවා විශ්ලේෂණය කිරීමට අදාළ ඉතා දැඩි ක්‍රියාවලියක් බවත්, ඒ සඳහා නියමානුකූල පුහුණුවක් අවශ්‍ය බවත්, එය ආධුනිකයකුගේ උනන්දුව මඟින් ග්‍රහණය කළ හැකි දෙයක් නොවන බවත්, සමහර විට ඔබ විසින්ම යෝජනා කරනු ඇති. අතීතයට අයත් යම් දෙයක් ගැන ආධුනික මහජනයා තුළ පවතින උනන්දුවත් දැඩි ක්‍රමවේදයක් අනුගමනය කරමින් දත්ත එකතු කිරීමත් ඒ අනුව තාර්කික පදනමක මත පිහිටා ඉතිහාසඥයා විසින් කරන අතීතය පිළිබඳ අර්ථදැක්වීම් අතර පැහැදිලි වෙනස්කමක් තිබෙනවාද?

ඔබ නිවැරදියි. ඉතා නිවැරදියි. එය සෑම දෙයකම ඉතිහාසය සඳහා සාධාරණයි. ඒත් එය ඉන්දියාවේ ආදි ඉතිහාසය සම්බන්ධයෙන් වඩා සංකීර්ණයි. ඒ සඳහා ඇසුරු කළ යුතු මූලාශ්‍රය ඉතා පුළුල් පරාසයකට අයත් වෙනවා. ඒ සඳහා ඉන්දීය ඉතිහාසය ගැන පොත් දුසිම් ගණනක් කියවීම ප්‍රමාණවත් වෙන්නේ නැහැ. එමඟින් ඔබ විශේෂඥයකු වෙන්නේ නැහැ. ඔබ මූලාශ්‍රය දැන ගත යුතු වන අතර එය විශ්ලේෂණය කරන ආකාරයද දැන ගත යුතුයි. මූලාශ්‍රය මොනවාදැයි යන්න දැන ගන්නා සේම, ඒ කාලයේ භාවිත කළ භාෂා ගැනද අවබෝධයක් තිබිය යුතුයි. නිදසුනක් ලෙස මෞර්ය අධිරාජයාගේ සෙල්ලිපි ලියා ඇති ප්‍රාකෘත භාෂාව ඔබ විසින් දැන ගත යුතු වන අතර එය විශ්ලේෂණය කිරීමටද සමත් විය යුතුයි. එමෙන්ම කෞටිල්‍යගේ අර්ථශාස්ත්‍රය ආදි සංස්කෘත භාෂාවෙන් ලියා ඇති ලේඛන ගැන දැනගත යුතුයි. ඔබට පුරාවිද්‍යාව ගැනද යම් වැටහීමක් තිබිය යුතුයි. වර්තමාන පුරාවිද්‍යාව විද්‍යාත්මක ක්‍රමය සහ විද්‍යාත්මක දැනුම මත පදනම් වූ ශීඝ්‍ර තාක්ෂණීකරණයකට ලක් වෙමින් පවතිනවා. විද්‍යාව තව දුරටත් පුරාවිද්‍යාත්මක පර්යේෂණවලට හඳුන්වා දෙමින් තිබෙනවා. සමහර අවස්ථාවල නූතන පුරාවිද්‍යාත්මක වාර්තා කියවද්දි, මට නම් ඒවා සම්පූර්ණයෙන් වටහා ගැනීම අපහසුයි. ඒවා කියවා තේරුම් ගැනීමට විද්‍යාත්මක ශික්ෂණවල පුහුණුවක් ලබා තිබීම අවශ්‍යයි.

රන්ධීර් චක්‍රවර්තී

අනෙක් අංශය නම් වාග්විද්‍යාවයි. එහිදී, කිසියම් මූලාශ්‍රයක් ලියා තිබෙන භාෂාව පමණක් දැන ගැනීම ප්‍රමාණවත් වෙන්නේ නැහැ. භාෂාවක පවතින වාග්විද්‍යාත්මක නීතිරීති, එනම් වාක්කෝෂයේ එකිනෙකට වෙනස්ව සකස් වීම්, ව්‍යාකරණය සහ අක්ෂර සංයෝජන ආදිය වගේම, භාෂාවක් බෙදී යෑමට සහ එකිනෙක ප්‍රතික්‍රියා කිරීමට බලපාන හේතු, අවබෝධ කර ගත යුතුයි. වර්තමානයේ බෙහෙවින් කතාබහට ලක්ව තිබෙන නිදසුනක් මෙහි ඉදිරිපත් කිරීමට මට ඉඩ දෙන්න. අප ශිෂ්‍යයන් හැටියට ගත කළ කාලයේ අපට ඉගැන්නුවේ සෘග්වේදය රචනා කර තිබෙන භාෂාව ඉන්දු-ආර්ය බවත්, ඉන් ඔබ්බට යමක් එහි නොමැති බවත් ගැනයි. දැන් ඔබ එවැනි අදහසක් ප්‍රකාශ කළහොත්, වෛදික සමාජය පිළිබඳ විසතුන් කිසිවෙක් ඔබ සමඟ එකඟ වෙන එකක් නැහැ. ඊට හේතුව, සෘග්වේද භාෂාවේ ප්‍රධාන සංයුතිය ඉන්දු ආර්ය වුණත්, එහි ද්‍රවිඩියානු භාෂාවට අයත් ඇතැම් ලක්ෂණ පවතින බව වාග්විද්‍යාත්මක ආදේශන අනුව පෙන්වා දී තිබීමයි. එහි දී සෘග්වේදයේ භාෂාව පිළිබඳ ආකල්පය වෙනස් කළේ, ඉතිහාසඥයකු නෙමෙයි, වාග් විද්‍යාඥයන් විසින් බව අප තේරුම් ගත යුතුයි. එම ලේඛනය අයත් වෙන්නේ, 'නිශ්චිත භාෂාවක් කථා කළ එක්තරා නිශ්චිත ජනකණ්ඩායමකට'යැයි කිසිවකුට හෝ කිව නොහැකි නිසා, එම අදහස වෙනස් වුණා. දැන් ඉතිහාසඥයා විසින් කිව යුත්තේ, 'හොඳයි. සෘග්වේද භාෂාවේ ඉන්දු ආර්ය භාෂා පවුලට අයත් නොවන අංග තිබේ නම්, ද්‍රවිඩියානු භාෂාව ඉන්දු ආර්ය භාෂාවට වඩා වෙනස් එකක් වන බවයි හැඟෙන්නේ කියලයි.

භාෂා දෙකක් කථා කළ කණ්ඩායම් දෙකක් සිටි බවත්, ඔවුන් අතර අන්තර්ක්‍රියාවක් පැවැති බවත් එමඟින් අදහස් කරනවා.' එහි දී ඔබ ප්‍රශ්න කළ යුත්තේ, එකල ද්විභාෂාකරණයක් තිබුණේද? එසේ නොවේ නම් එවැන්නක් සනාථ කිරීමට ප්‍රමාණවත් තරමින් සාක්ෂ්‍ය නොමැත්තේද? යන්නයි. මෙය විවිධ භාෂා කථා කරන කණ්ඩායම් එකිනෙකා ආසන්නයේ ජීවත් වීම නිසා ඇති වූ තත්ත්වයක්ද? මේ පසුබිම මඟින් සෘග්වේදය සිත්ගන්නා සුළු ඓතිහාසික සන්දර්භයකට පමුණුවනවා. එමඟින්, එම සංස්කෘතිය තනි වූවක් නෙමෙයි, ඊට සමගාමීව පැවැති තවත් සංස්කෘතීන් අතර ප්‍රමුඛස්ථානයක ගත් එකක් බව පෙන්වා දෙනවා. මෙහි දී ඉතිහාසඥයන් විසින්, එම අවශේෂ සංස්කෘති මොනවාද යන්න සොයා බැලිය යුතුයි.

සෘග්වේදය අයත් යුගය ගැන වර්තමානයේ කරන අධ්‍යයන, වෙනත් ආකාරයේ මූලාශ්‍රය වෙත අවධානය යොමු කළ යුතුව තිබෙනවා. ඒවා මීට දශක කිහිපයකට පෙර නොදැන සිටි ඒවායි. සෘග්වේදය භාවිතයේ පැවැති පෙදෙස් හරහා ගලා යන ගංගාවල ජල විද්‍යානුකූල හැසිරීම පිළිබඳ කර තිබෙන අධ්‍යයන ගැන, ඉතිහාසඥයකු විමසිලිමත් විම ඊට නිදසුනක් ලෙස දැක්විය හැකියි. මේ අනුව යමින්, සරස්වතී ගංගාවේ ඓතිහාසික හැසිරීම මේ වන විට ඉතිහාසඥයන් අතර විවාදාපන්න මාතෘකාවක් බවට පත්ව තිබෙනවා. එහි අනන්‍යතාවත්, එහි ඉතිහාසයත් අවිනිශ්චිතතාවකට පත්ව තිබෙනවා. සරස්වතී ගංගාව සැලකිය යුතු තරමින් මෝසම් වර්ෂාවෙන් පෝෂණය වූවක් ද? එසේ නොවේ නම් ග්ලැසියර නමින් හැඳින්වෙන හිම කුට්ටි දිය වීමෙන් පෝෂණය ලැබූවක්ද? එහි ගලා ගිය ජලය යමුනා ගංගාව සහ සත්ලේජ් ගංගා මඟින් පැහැර ගැනීම හේතුවෙන්, සරස්වතී ගංගාව අතුරුදහන් වූයේ ද? මේ වෘත්තාන්තයට ආලෝකය පතිත කරන අනෙක් මූලාශ්‍රය නම්, ජාන අධ්‍යයන දැක්වෙන වාර්තායි. ඒවා මඟින් පෙන්වන කරුණු අතිශයින් විවාදාපන්නයි.

සෘග්වේදය භාවිතයේ පැවැති ප්‍රදේශවලට සංක්‍රමණිකයන් පැමිණියේ නිශ්චිත කාලයක ද? එසේ නොවේ නම්, එහි විසූ ප්‍රජාවගේ සංයුතිය සාපේක්ෂව ස්ථාවර ලෙස පැවතියේ ද? මෙවැනි දේ විවාදාපන්න කරුණු සේ සැලකිය හැකියි. සාක්ෂිවල තිබෙන විවාදාපන්න ස්වරූපයත්, ඒවායේ පවතින විවිධත්වය පදනම් කරමින් ඓතිහාසික ගැටලුවක දී සෑම අවස්ථාවකම ඔව් හෝ නැත යන පිළිතුරු අපේක්ෂා කළ නොහැකියැයි පැවසීම අවශ්‍යයි. ඉතිහාසය ප්‍රශ්න කිරීමේ දී, විෂයමූලික ගැටලු යන අදහසට එතරම් වලංගුතාවක් ඇති බව පෙනෙන්නේ නැහැ. ඉතිහාසඥයන් ඔවුන්ගේ අර්ථනිරූපණවල පවතින තර්කය මත පදනම් විය යුතුයි. සාක්ෂි වෙනස් වෙනකොට මේ තත්ත්වය වෙනස් විම සාමාන්‍ය ස්වරූපයයි. ඒ අනුව දහනම වැනි සියවසේ දී නගන ලද තර්කයක්, 21 වැනි සියවසේ දී වෙනස් විය හැකියි. ඓතිහාසික අර්ථදැක්වීමක් හැඩ ගන්වන්නේ, කාලයේ එක්තරා නිශ්චිත තැනක දී කිසියම් ශික්ෂණයක් සම්බන්ධයෙන් පවත්නා දැනුම මඟිනුයි. ඉතිහාසඥයා විසින් කුමන කාරණයක් අරමුණු කර ගන්නේද යන අපේක්ෂාව, එවැනි අර්ථනිරූපණයට වර්ණයක් ලබා දීමට බලපාන තවත් හේතුවක් විය හැකියි.

මම දැන් තරමක පුළුල් එළැඹුමක් වෙත පිවිසිය යුතුයි. සාමාන්‍ය මටටමේ දී ජනතාව ඓතිහාසික අධ්‍යයන සිදු කිරීමේ පුහුණුවක් ලද අය නෙමෙයි. එබැවින් ඔවුන් ඉතිහාසය ගැන අනතුරුදායක වැරදි අවබෝධයකින් පසුවෙනවා. එහි දී ඔවුන් ඉතිහාසයේ ජීවත් වූ එක්තරා නිශ්චිත කණ්ඩායමක් ගැනත්, නිශ්චිත ආගමික ප්‍රවණතාවක් ගැනත්, ඒ වගේම නිශ්චිත, මානව අනන්‍යතාවක් ගැනත් සිතමින්, අතීතය යනු සමජාතීය පැවැත්මක් ය යනුවෙන් දකින්නට පුරුදු වී සිටිනවා. අප දන්නා පරිදි අතීතය යනු සමජාතීය සිද්ධිදාමයක පිළිබිඹුවක් නෙමෙයි. සෘග්වේදය කියන්නේ, ඉන්දු-ආර්ය සම්ප්‍රදායක පිළිබිඹුවක් පමණක් නොවේ යැයි මා ඔබට පැවසුවා. එය තනි භාෂාවකින් රචනා කළ එකක් නෙමෙයි. එහි භාෂා කිහිපයක ලක්ෂණ අන්තර්ගත වන නිසා, එය බහු සංස්කෘතික සහභාගීත්වයක් පෙන්නුම් කරනවා. මහජනයාගේ මටටමේ පැතිර තිබෙන තර්ක ගැන විස්තර කිරීමට මම මෙහි දී අදහස් කරන්නේ නැහැ. ඒත්, නැවත වරක් සඳහන් කළ යුතු වෙන්නේ, පුරාණ ඉන්දියාව ගැන පර්යේෂණවල යෙදෙන ජාතික සහ අන්තර්ජාතික විද්වතුන් විසින් ආර්ය භාෂා ගැන දරන මතය, එය මධ්‍යම ආසියාවේ සිට ඉරානය හරහා ඉන්දියාවට ළඟා වූ බවයි. මේ අතර ආර්ය භාෂා කථා කරන සියලුදෙනා, දේශීය ඉන්දියානුවන් බවට අදහසක්, විවිධ පුද්ගලයන් විසින් ඉන්දියාව පුරා පතළ කර තිබෙනවා.

හරප්පා ශිෂ්ටාචාරයේ නිර්මාතෘන් පවා ආර්යයන් බවට සමහරදෙනා තර්ක කරමින්, ඉන්දීය ශිෂ්ටාචාරය ප්‍රභවය වීමට ආර්ය නොවන කිසිදු අංගයක් දායක වූ බව පිළිගැනීම බැහැර කර තිබෙනවා. විවිධ හේතු නිසා කෙනකුට පිළිගත නොහැකි පළමු වැනි තර්කය මෙයයි. ජාතීන්ගේ විවිධත්වය සහ අන්‍යෝන්‍යතා දේශපාලනය බොහෝ අවස්ථාවල අපට දැකිය හැකි වෙන්නේ, බලය අයත් වන පිරිස විසින් සංස්කෘතියේ තනි ලක්ෂණයක් දකින්නට වෑයම් කිරීමයි. එහි දී බලය වෙනුවෙන් එක්තරා නිශ්චිත ලකුණක හඬ පමණක් ඉස්මතු කිරීමට ඔවුන් වෑයම් කරන බව පෙනෙනවා. මෙහි දී බලය යනු හුදෙක්ම දේශපාලන බලය වෙනවා මිසක්, එය සංස්කෘතික පණිවිඩයක් හෝ සංස්කෘතික ප්‍රකාශනයක් හෝ නොවේ. එය මුළුමනින්ම පිරිසුදු දේශපාලනික අරමුණු සහිත දේශපාලන බලයක් බව තේරුම් ගත යුතුයි. ඒ වනාහි සමාජයේ ජීවත් වන එක්තරා සුවිශේෂී කණ්ඩායමකට අයත් දැක්මක්. ඉතා බලවත් ආධිපත්‍යමය තැනකට පත් වීමේ හැකියාවක් එය සතුව තිබෙනවා. ඉතිහාසය හැදෑරීමේ දී එය අනතුරුදායී පරිසරයක් නිර්මාණය කරන බව සත්‍යයක්. එමඟින් ඉතිහාසය අධ්‍යයනය කිරීමට සීමා පනවනවා. එහෙත්, ප්‍රමිතියක් ඇති විද්වතුන්, විවිධත්වය සොයා බැලීමට උත්සාහ දරනවා. ඉතිහාසය පුරා ජීවත් වෙමින්, මේ දක්වා ජීවත් වන සියලුම ප්‍රජා කණ්ඩායම්වලට සමාන අයිතිවාසිකම් ලබා දිය යුතු යැයි මේ මඟින් කිසිසේත් අදහස් කරන්නේ නැහැ. එමඟින් අදහස් කරන්නේ, එක් සුවිශේෂී ජන කණ්ඩායමක ඉතිහාසය ලියන අවස්ථාවක දී හැර, අන් අවස්ථාවල දී ඉතිහාසඥයන් විසින් එක් ජනකණ්ඩායමක් වෙත පමණක් අවධානය යොමු නොකළ යුතු ය යන අදහසයි.

මුල් ඉන්දීය ඉතිහාසය හැදෑරීමේ දී සාම්ප්‍රදායික ඓතිහාසික රචනා පමණක් මූලාශ්‍රය ලෙස ගැනීම නොකළ යුතු බව, ඔබ විශේෂයෙන් පෙන්වා දී තිබෙනවා. තවත් ඉතිහාසඥයන් කිහිපදෙනෙක්, මේ කාරණය පෙන්වා දී ඇති දෙයක්. අතිශය විස්තරාත්මක සම්ප්‍රදායික මූලාශ්‍රයවල වෙනස ඔබ විසින් පැහැදිලිව අවධාරණය කර තිබෙනවා?

මෙය, ඉතිහාසඥයන් විසින් මූලාශ්‍රයවල පිහිට ඡායාමාත්‍රිකව ලබා ගන්නා වෘත්තීය ප්‍රවේශයයි. මෙහි දී ඉතිහාසය පිළිබඳ විශේෂඥයන් නොවන අය, වෘත්තීය ඉතිහාසඥයන්ගේ මේ භාවිතය ගැන දැන ගත යුතුයි. ඒ වගේම එය ඇගැයීමට හුරු විය යුතුයි. ඉතිහාඥයන් මේ වන විට සාම්ප්‍රදායික මූලාශ්‍රයවල පවසා ඇති දේ ගැන ප්‍රශ්න කරනවා. ඒවායේ ප්‍රකාශිත සම්ප්‍රදාය ගොඩ නගන ලද්දේ කුමක් නිසාදැයි විමසිල්මත් වෙනවා. අප විසින් ඉතිහාසය පුරා දැන ගත් පරිදි සම්ප්‍රදායයන් ජනනය වී තිබෙන්නේ, පරම්පරා ගණනාවක් හරහායි. එබැවින් අද අප සියදෙනා භුක්ති විඳින සම්ප්‍රදායයන් නොඉඳුල් ඒවා බවත්, ඒ නොයිඳුල් බව වර්ෂ සහශ්‍රක ගණනක් තිස්සේ පැවත ආ බවත් සිතීම, සාධාරණ වෙන්නේ නැති බව අවධාරණයෙන් කිව යුතුයි.

2020 සැප්තැම්බර් 10 බ්‍රහස්පතින්දා

ඤාණාරම

දෙමටමල්ගෙන් දුටුගැමුණු කුමරුට ඓතිහාසික රන්පතක්

මැණික් නදී තෙරින් නැඟුණු මයුර කූජනය සඳුන් නුවරටම ඇසේ. මහාසේනගේ මයුරා කූජන නංවන පැයටම කටගමුවේ ඇතා කුංචනාද පවත්වන්නේ කිම! දෙමටමල්ගේ හද පොට්ට ළපටි වියේ පටන් අහපු ප්‍රශ්නයට කිසිවෙකුට උත්තරයක් නම් නොවීය. සඳමල්පැලැස්සේ අත්තම්මා , ඒ කීවේ දෙමටමල්ගේ මව්ගේ මවිය. ඇයට සඳමල් පැලැස්සේ අත්තම්මා කීවේ සඳුන් නුවර ළපටියන් කුසින් වඩින දා වින්නඹු අත්තම්මා වූ නිසාය. එතැන් පටන් සඳමල්පැලැස්සේ අම්මා සඳ මල් අත්තම්මා විය. ඇගේ දුව කහ මල් එක්ක රුකුලේ පැදලා උපන්නේ දෙමටමල්ය. දෙමට මල් උපන්නේ දෙමටමල් යායක් යටදීය. කහමල්, දෙමටමල් නම්න් තම පුතු නම් කළේ එබැවිනි. දෙමටමල්ගේ පියාණන් වූ කහමල් සිත්තම්ගල ආචාර්යගේ පුත්‍රයාය. සිත්තම්ගල ආචාර්ය වූයේ රත්මලේ කන්ද ගෙදර උපන් තුරඟ ලපයාය. තුරඟ ලපයක් උපන් ලපයක් විදිහට නිතඹ පිපුණු පුතෙක් උපන්නාම ඒ කොලුවා ශිල්ප ෂාස්තර දෙකටම අධිපති වන බව කීවේ රන්මල් කන්දේ වැඩ උන් සරඹු මහ රහතුන් වහන්සේය. කාල අවකාශ විද්‍යාවේ නියත කර්ම විවරණය හරියටම හරි විය. තුරඟ ලපයා සිත්තම්ගල ආචාර්ය විය. සිත්තම්ගල ආචාර්ය මූලයේ ශිල්ප හදාරපු පයෝධර වංශයේ ස්ත්‍රිය නීලපුලාය. තනනෙරුමලයේ පාෂාණ්ඩියක් වූ ඈ කුසට කහ මල්ගේ උපතට බීජ ලැබුණේ කහ මල් පැළැස්සේදීය. එදාම තම පුතාට කහ මල් යැයි නම් තබන්න නීලපුලා එක්ක සිත්තම්ගල ආචාර්ය ගිවිස ගති.

දෙමටමල්ට සඳමල්පැලැස්සේ ආත්තම්මා ජීවිත කථාවම කියා දුන්නාය. ඒත් මැණික් නදී තෙර මයුර කූජනයටම කටගමුවේ ඇතා කුංචනාද වයන්නේ කිමදැයි ඇසූ විට අත්තම්මා නිහඬව හිනා පෑවාය. "දෙමටෝ නුඹේ තුරඟ ලපේ තොළේ" යැයි කියමින් සඳ මල් පැළැස්සේ ආත්තම්මා කථා වරුණ නවතා කවි වරුණාවක් පද බැඳ ගයන්නට විය.

මල් මල් කහ මල් වැටුනා
නිල් නිල් කොමුතොල් ඇරුණා
රත් රත් රුහුරේ වැල් එබුණා
තොල් තොල් තුරඟ මල් පිපුණා
(උද්ධෘතය - කුල විත්ති)

සිතුල් පව්ව නැගලා නීල පුලාගේ අතේ එල්ලී දෙමට මල් බූන්දල මහ තෙරිඳු ළඟට ගියපු දවසය. එදා තමයි හිත පැනේ වියමන් බැඳුණේ. වලා වලා වලා යායවල් නිල්ල යායට පායපු පුළුන් වලා වගේමය. දෙමටමල්ගේ දැස දුටුව හිත වහා මුමුණන විටමය මහ තෙරිඳු දෙතොල දුටුවේ. පැන් විතකින් තොල තෙමා ගත් මහ තෙරිඳු බුලත් දළුවක මී පැණි තවරා ලූවේය. මී මුට්ටියෙන් පැණි අරන් බුලත් දළුවේ පැණි තවරණ විටම මහසේනගේ මයුරා කූජන නැංවිය. ඇසිල්ලේ කටගමුවේ ඇතා නාද සරින් කුංච නාද පෑවේය. බූන්දල තෙරිඳුගේ කොපුල් තලා පලාගෙන නැඟුණු පුළුල් හිනාවට නීලපුලාගේ නෙත් කෙවිනි පලාගෙන තුටු කඳුළු උනා වැටුණේය. තුටු සතුටේ හිනැහෙන මව් මිත්තනි දෙනතින් නෙත් ගත් දෙමටමල් දුටුවේ මුවපුරා හිනා නගා බලා හිඳින මහ තෙරිඳුය.

තවර පවර නරවන සිරි තුමු ගම
නිවර ගතර තෙරවන ගිරි බුමු ගම
සුවර රඟර කරවන තරි පුමු ගම
කුමර සවර බරවන පරි දුටු ගම
(උපුටනය - කුල විත්ති)

" නීල පුලා ..... !

අපේ හාමුදුරුවනේ .....

දෙමටමල් ආචාර්ය මූලයේම තැබීම අයෝග්‍යය නීල පුලා .... "

එලෙස තෙපලූ මහ තෙරිඳු පැණි තැවරූ නාග බුලත් දල්ල දෙමටමල්ගේ දෙතොල තැබුවේය. පැණි බුලත් හපපු දෙමටමල්ගේ දබරගිල්ල රඟෙන කිරි බඳුනට ඔබාපු මහ තෙරිඳු වැලි පිල්ලට තැබුවේය. පැණි බුලත් රහ උරමින් මව් බසේ රහ උරන්න දෙමටමල් පටන් ගත්තේ එලෙසිනිය. පව්ව උඩ ආකාස මාලකය දිගේ ඇදෙන යතිවර පෙළ දුටුව දෙමටමල් දුටුවේ අමුතු තෙර නමකි. ඒ අමුතු තෙරගේ නෙත් දෙමටමල්ගේ දෙතොල ළඟ නතර විය. තුරඟ ලපය දුටුව අමුතු තෙර විත් මහතෙර හමුවන්නේ පසුදා පාන්දර හීල් දානයට ගෙඩිය වැයුණු යාමයේය.

මේ මහා විහාරය අතහැර සිතුල් පව්වට මහා සංඝයා පලා එන සමයය. පාෂණ්ඩ භික්ෂුව නාථගණද එලෙසින් මහා විහාරයේ සිතුල්පව් වන වාසයට විත් සිටි භික්ෂුවකි. නාථගණ හිමියන්ට දෙමටමල් හමුවීම උන්වහන්සේගේ ශාස්ත්‍ර පථයට ජීවය ගෙන ආයේය. තරු කැට පොළවටම රැස් විහිදන මධ්‍ය ලක්ෂ්‍යයන් සොයමින් දෙදෙනා අමුතු ශාස්ත්‍රවල කිමිද යන්නට විය. කාලය ගෙවී යන විට දෙමටමල්ගේ හිත යළි උපන්නේ මයුර කූජනය හා හස්ති කුංච නාදය අතර බැඳීමටය. ඔහුට යළි පැනය අසන්නට සිතුණේය. නාථගණ හිමියන්ට පැනය කී විට උන්වහන්සේ දෙමටමල් සමඟ සඳුන් නුවරට (චන්දනගාම - කතරගම) පිවිසෙන්න හිතාගෙන ගමන පිටත් විය. සිතුල් පව්වෙන් කටගමුවට පිවිසෙන විට තරු පිරිවැරූ අහස සිත්තමය. සිත්තම් තරු යාය ඔමරි පාන විට දෙදෙනාම දුටුවේ තරු රටාවෙන් අහස මැද ඊතලයකි. දෙදෙනාම තරු රෑනේ පැටලී අමුතු තරු රැසින් උමතුව බලා සිටියෝය.

ඊ තලය තුඩුව රැඳුණු රැස් පතිත වන ඉම සොයමින් දෙදෙනා පියනඟන්නට විය. ඊතලය තුඩුව වැටුණු තරු රැස් පතිතව තිබුණේ කිහිරිවනයටය. කිහිරි වනය මැද ඊතල තරු වැල නතරව සිටින රුව දුටු දෙදෙනාම නතර විය. මැණික් නදී වැලි ඉවුරේ කුඹුකේ පන්හිඳෙන් රටා මැන මැන තරු ගණන ලියන්නට පටන් ගති. තරු වැල පුදුමය. ඊතලයේ තුඩුව අනෙක් පසට හැරිනි. නාථගණ හිමියන් දෙමට මල් දෙසම බැලුවේය.

"දෙමට මල් !

හිමියනේ !

ශිල්ප දැරිය හැකි සීමාව පැමිණ අහවරය....

ඉක්බිතිව

සීමාව අසිමාන්තික වනුයේ නුඹටය

ඒ කිම ...

තුරඟ ලපැති දෙතොළ ඇත්තාට ආකාස ධාතුව විද්‍යමාන වනු නොවනුමානය...."

සදෙව් ලොව බලමින
නාලොව තිලොව බලමින
කෙනෙක් නැත සිරිලක
දෙමට මල යැයි නමක් පවතින
(උපුටනය - කුල විත්ති)

නාථගණ තෙර එලෙස පවසත්ම, දෙමටමල් දෙමට මලක් ගෙන කිහිරි රුක නියෙන් සූරා කිහිරි කිරි මලට ගන්නේය. දෙමටමල කිරි සුදෝ සුදට කිරි සුදුවිය. කිරි සුදු දෙමට මල ගං දියට විසි කොට දෙමට මල් අහස දෙස බැලීය. අහස් වලා යානාවක නැඟී මහාසේන දෙවිඳු මයුරාසනයේමය. අහස සිත්තමකද ? නොවේ නම් සිදු වීමක්ද ? නාථගණ හිමි විමනි නුවන් විහිදා බලයි. දෙමට මල පාවි පාවි ගංදිය දිගේ ගොස්ය.

" පැතුම ඉටු වනු නොඅනුමානය...

කවර පැතුමක්ද හිමියනි ?

දෙමට මල්, මා ගුරු දේවාචාර්ය වෙස්සගිරි පබ්බත වාසී නාග බද්ධ මහ තෙරය. එකල්හි එළාර රජුගේ සේනා පාෂණ්ඩයන් වනසමින් ශාස්ත්‍ර උදුරා ගන්න මාන බැලීය..

ඉක්බිති හිමියනේ...

නුඹේ මිත්තනිය රුහුණටත් මා වෙස්සගිරියටත් පලා ගියෙමි.

ඉක්බිතිව !

වෙස්සගිරි වාසේ මහණ දම් පුරන්නට වූයේ නිවන පිණිසම නොවිණි.

එසේ නම් ?

ශාස්ත්‍ර පිණිසය...

එවිට මා මිත්තනී !

ඈ පයෝධර වංශයට ජීවය පිණිස රුහුණට පලාවිත් සිත්තම්ගල ආචාර්ය මූලයේ සැඟවිනි. නුඹ පියා කහ මල් සමඟ රාග වත් පුරන්නේ එහිදීය.

එවිට ඔබ වහන්සේ රුහුණට පලා වැඩියේ ?

රන්පත රැක ශිල්ප දායාද පිණිසමය.

රන්පත !!!

දෙමටමල් , රන්පත මහ මිහිඳු මහ රහතුන් වහන්සේ වෙස්සගිරි පරපුරට පද අක්ෂර බැඳ දායාද කොට දුන් රන්පතයි !

කවරක් අරභයාද හිමියනි ?

තරු සොළොසක් රැස විහිදුවන මධ්‍ය ලක්ෂ්‍යයන් සොළොසේ ගණිත මිනිත දෙමට මල් !

ත රු සොළොසක් රැ.. ස... වි..හි...දු...වන... ම.....ධ්‍ය ..... ලක්ෂ්‍ය .....ය... න් සො..ළො... සේ... ග...ණි...ත මිනි...ත....! ?

එසේය දෙමටමල්.... තරු සොළොසක් රැස විහිදුවන මධ්‍ය ලක්ෂ්‍යයන් සොළොස් ගණිත මිනිතය. ඒ තරු සොළොස එක මිනිතක එකට බැඳෙන දින නැකත බැඳුණු මහ මිහිඳු මහ අරිය තෙරුන් වහන්සේගේ පද අක්ෂරය.

එවිට.... එවිට හිමියනේ තරු සොළොසක් එකට එක මිනිතක එකට බැඳෙන දින නැකත !

ඒ රහස සොයමින් තමයි එළාර මහ රජුගේ සේනා අනුරපුර මහ විහාර මහ පොත් ගුල පෙරලුවේ දෙමට මල් ... !

ඉක්බිතිව...

එදා තමයි රන් තෙළඹුවේ රත්නවල්ලි දේවියට පූජා තබලා නගයි මමයි පලා යමින් සිටියේ. පාෂාණ ද්වාරය හැර නුඹ මිත්තනිය රුහුණට එවිවා. මා වෙස්ගිරි පබ්බතයට පළා ගියෙමි...

ඉක්බිතිව

ඉක්බිතිව දෙමට මල් වෙස්සගිරි පබ්බත වාසී මහතෙර නාග බද්ධ මගේ තුරඟ ලපය දුටුවා

කිම? ඔබ වහන්සේ තුරඟ ලපයෙක් ? "

දෙමටමල් විමතියෙන් විසල් වූ දැසින් නාථ ගණ හිමියන්ගෙන් එසේ අසත්ම තෙරිඳු සිවුර මැත් කළහ. මැත් කර නිතඹේ තුරඟ ලපය දෙමට මල්ට පෙන්වූහ. දෙමටමල්ට ඒ ඇසිල්ලේ වහා සිහි වූයේ තම පියතුම කහමල් තෙපලූ කථාවකි.

"ව්‍යහාර ශිල්ප හෝ ආචාරමූල ශිල්ප වනපොත් කොට පලක් නොවේ.! තුරඟ ලපයන් කාල අවකාශ අන්තරය දකින ශිල්ප හිමි මානව සංසාරිකයන්ය...!"

මතක මතින් මිදී දෙමට මල් නාථගණ තෙර දෙස බැලීය. උන්වහන්සේ සිවුර හැර සතර පොට නවා වැඳ වැටේ. තම ගුරු දේවාචාර්යා සිවුර හැර දමා ගිහි වෙස ගෙනය. දෙමටමල් විපිලිසරය. අවැතක් සිදුවිය ද? නොවේ නම් සිවුර හැර දමන්නට කරුණ කිම. ගං දැලට බට නාථගණ සිහිල් දියේ පැන නා පීනන්නට විය. මැණික් නදිය දියේ පාවිගිය දෙමට මල සිටි තැනට විත්ය. ඒ කිරි කිරි කිරි සුදෙන්මය.

පා ගිය මල දෙමට
යා විය ගඟ මැදට
සා පිය තෙර මුලට
ආ වුව සෑ අඟට
(උපුටනය - කුල විත්ති)

" හිමියනේ !!!

හිමි නොව මා ගිහිය දෙමටමල් !

ගිහිවත් දරන්නට කාරුණ කිම. අවැතක් වියද ?

අවැත වූයේ වත පිණිසමය

ඒ කිම....?

නාග බද්ධ මහ තෙරිඳු තුරඟ ලපය මුවා කිරීමට මහණ කළේය. ශිල්ප දායාද වන තුරු පමණක් කසාවත දරන්නට මා ගිවිසුණේය.

ඒ කීවේ..?

තුරඟ ලපැත්තන් අත පමණක් රකිනු යැයි ආචාර වත් විරිත් පනවා රන්පත් අක්ෂර බන්ධනය මහ මිහිඳු මහ රහතන් වහන්සේ වෙස්සගිරි පබ්බත භික්ෂූන්ට පවරා ඇත්තේ දෙමටමල් !

ඉක්බිතිව !

සෑ ගිරි වැඩ වාසය කළ ධම්මචෙත මහතෙර සැල කොට එළාර රජු රහස් දැන ගනු ලැබුවා...

කිම රහස් ?

රන්පත හි රහස. ඒ කීවේ දෙමටමල් රන්පත් හි රහස් යැයි කීවේ ඒ සඳහන් නැකත් දවස. තරු සොළොසක් එක මිනිතක පිහිටන දවස සොයා ගැන්මට... !

ඒ කුමක් අරභයාද ?

මහ රජ එළාර ඒ දවස සොයා මහ සෑය බැඳ මහා ප්‍රතාපයා වන්න සිහින මවා පෑවේ දෙමටමල් !

ඉක්බිතිව !

එබැවිනි මා නිතඹ තුරඟ ලපය දුටු ඇසිල්ලේ නාග බද්ධ මහ තෙරිඳු භික්ෂූත්වයෙහි බන්ධවා රන්පත සුරක්ෂිත පිණිස සිතුල්පව්වට පලා යන ලෙස දන්වා හිටියේ. සිවුරු දරණ මොහොතේ ගිවිස ගනු ලැබුවේ ශිල්ප අසීමාන්තිකව ලද සැණින් සිවුරු හැර වර්ග පූරණය පිණිස ගිහි වත් දරණ බැවිය.

නාථගණ සිවුරු සමඟ රන්පත දෙමටමල්ට භාර කළේය. යළිත් අහස් සිත්තමේ ඊතල තරු වැල පායන තුරු දෙදෙනාම කිහිරි වනය පුරා කිහිරි කිරි රැස් කරමින් කල් යැවිය. දින දින රැස් කර කිහිරි කිරි ගල්වා කිහිරි වෙහෙර කිරි කිරි සුදෝ සුදු කළේය. කිහිරි වෙහෙර කිරි වෙහෙර වූවේය. හරියටම අනූවන දින රැයේ කිරි වෙහෙර උඩින් ඊතල තරු වැල පායා පතිත විය. ඊතල තරු රැස තුඩ විහිදුණු දිශාව බලා දෙදෙනා නික්ම ගියහ. තරු තුඩ ලම්බකව පතිත වූ මධ්‍ය ලක්ෂ්‍ය හිමි භූ තලය වූයේ දෙමට මල් උපන් දෙමටමල් පැළැස්සේ දෙමට මල් යායය. එහි සිවුර තබා රන් පත භූ ගර්භ ශෛල කුටියක් තනා තැබූ පසු නාථගණ සමුගෙන ගියේය. දෙමටමල්, දෙමට මල් වනයේ රැඳී රහස් රකිමින් බලා සිටියේය. ඉන් විසි එක් වසරකට පසු දුටුගැමුණු කුමරු දෙමට මල් වනයට පැමිණියේ කොත්මලේ සිට රහස් කතාවකටය. ඒ දසමහ යෝධයන් හමු වීමටය. ඒ හමුව සිදු වූයේ දෙමටමල් වන වාසයේය. එදින මේ ඓතිහාසික රන්පත දුටුගැමුණු කුමාරයා අතට පත් කළ දෙමටමල් කුමාරයා, සිවුරු දරා භික්ෂූත්වයට එක් විය. රන්පත අක්ෂර පද බන්ධන රහස නැකත අනුව රාජ්‍යත්වය දුටු ගැමුණු කුමාරාට හිමිවිය. දුටුගැමුණු නිරිඳු රන්පත් හි සඳහන් වූ සොළොස් තරු රැස එකට මිනිතක වූ නැකතේ මහසෑ ගර්භය බැඳ බලා සිටියේය. ගෞතම තථාගතයාණන් වහන්සේගේ සර්වඥ ධාතු ද්‍රෝණය මහසෑය ගැබ නිධන් වූයේ ඒ නැකතටය.

දෙමටමල් කුමරු දෙමටමල් මහතෙර වෙමින් ඇරඹි දෙමටමල් විහාර සංඝ පාර්ශ්වය, කතරගම කිරිවෙහෙර ඇතුළු විහාර ගණයේ නිර්මිත සහ අධිපති පරපුර විය. එය අද දක්වාම නොනැසී පවතින සංඝ පරපුරකි. මහ මිහිඳු මහ රහතන් වහන්සේගේ පද අක්ෂර බන්ධිත රන්පත රුවන්මැලි මහා සෑයේ ධාතු නිධානෝත්සවයෙන් පසු ගැමුණු නිරිඳු විසින් ලෝවාමහාපායේ තැන්පත් කළේය. ක්‍රි. පූ. 127 දී සද්ධාතිස්ස රජ දවස ඇතිවූ හදිසි ගින්නකින් ලෝවාමහාපාය දැවී පිලිස්සී ගියේය. (මහාවංශය-27 වැනි පරිච්ඡේදය). ඒ, අනුබුදු මහ මිහිඳු මහතෙර සුරතින් පද බන්ධිත ඓතිහාසික රන්පත ලෝක ශිෂ්ටාචාරයටම අහිමි වෙමිනි.

සුජීත් අක්කරවත්ත

අපේ මුල්ම පොත

සිංහල පොත් පත් ඉතිහාසයේ මී මුත්තා ලෙස සැලකිය හැක්කේ යාච්ඤා හැල්ලය. එම පොතට සිංහල අකුරු සැදුවේ තුවක්කු ගබඩාවේ බාස්වූ ගේබ්‍රියල් සේඩිය. සිංහල මුද්‍රිත අකුරු ඉතිහාසයේ ආරම්භකයා ලන්දේසි ගේබ්‍රියෙල් සෙඩ්බාස් ලෙස ගෞරවය හිමි කරගෙන තිබේ. ඔහු, සිංහල අකුරු පිත්තල තහඩුවේ කපා ගත්තේය. එම අකුරු එකල පුස්කොළ පොත්වල තිබූ පන්සල් අකුරුය.

ලෝකයේ පැරණිම මුද්‍රිත ලේඛනය ලෙස දැනට පවතිනුයේ ජපානයේ ෂොතොකු අධිරාජිනිය විසින් ක්‍රිස්තු වර්ෂ 770 දී මුද්‍රණය කළ මහායාන ධර්ම ග්‍රන්ථයකින් උපුටාගත් 'ධරනී' පාඨයි. එයින් පිටපත් දසලක්ෂයක් මුද්‍රණය කර බෙදාහැරි බව කියැවේ. දෙවැනි ශත වර්ෂයේදී චීන ජාතිකයන් විසින් කඩදාසි සොයා ගැනීමෙන් පසු, ලිපි ද්‍රව්‍යයක් ලෙසින් කඩදාසි භාවිතය ප්‍රචලිතව විය. මුලින්ම ඔවුන් මුද්‍රණය කළ 'ඵලක මුද්‍රණය' බ්ලොක් ප්‍රින්ටින් වශයෙනි. ලී පුවරුවක අකුරු සමඟින් ලිපියේ බ්ලොක් එක කපා, ඒ මත තීන්ත තවරා, කඩදාසි එලා මුද්‍රණ කටයුතු කර ඇත.

මේ ක්‍රමයට එක් පිටුවකට එක් පුවරුව බැගින් කපන්න සිදු විය. 1050 වසර වන විට ඔවුන්, අමුණන අකුරු සොයා ගැනීමත් සමඟ මහා නිර්මාණවලට දායක වීමට හැකියාව ලැබිණි.

ශ්‍රී ලංකාවට කඩදාසි පුරුදු වූයේ යුරෝපා ජාතිකයන්ගෙනි. චීනයේ ආරම්භ වූ කඩදාසි මත ලිවීම 1505දී පෘතුගීසීන් ලංකාවට පැමිණීමත් සමඟ ප්‍රචලිත විය. ශ්‍රී ලංකාවේ පැරණි ලිපිද්‍රව්‍ය වූයේ ගල්පුවරු, තඹපත්, රිදීපත්, රන්පත් හා පුස්කොළ පොත්ය.

1450 දී ජර්මනියේ ජොහැන්නස් ගුටෙන්බර්ග් ජෙලි 42 බයිබලයක් මුද්‍රණය කළේය. ක්‍රි.ව.1556 වන විට ඉන්දියාව පුරා මුද්‍රණ ශිල්පය පැතිර ගියද, ලංකාවට මුද්‍රණ ශිල්පය පැමිණෙන්නේ ක්‍රි.ව.1658 දී ලන්දේසීන් පැමිණීමෙන් පසුවය.

ලන්දේසීන් ලංකාවේ තම පාලනය පවතින ප්‍රදේශවල බදු අය කර ගැනීම සඳහා, මහජනයාට දැන ගැනීම පිණිස ආඥා හා නියෝග පත්‍ර පිටපත් බොහෝ ප්‍රමාණයක් විසුරුවා හැරීමට වුවමනා විය. සිංහලයන්ට සිංහල බසිනුත්, දෙමළ වැසියන්ට දෙමළ බසිනුත් පිටපත් බොහෝ ප්‍රමාණයක් අතින් ලිවීම මහත් වෙහෙසකර කටයුත්තක් වූ නිසා, මුද්‍රණ ශිල්පයේ පිහිට පැතීමට ලන්දේසීන්ට සිදු විය. 1707දී ලීයෙන් කපන ලද බ්ලොක්වලින් සිංහල බසින් නියෝග හා ආඥා මුද්‍රණය කිරීම පටන් ගත් ඔවුන්, වෙන් වෙන් වශයෙන් ඇමිණිය හැකි සිංහල අකුරු, නැතිනම් කර්ය, ලන්දේසි ආයුධ ගබඩාවේ ප්‍රධාන කාර්මික ශිල්පියා වූ ගෙබ්‍රියෙල් ස්කාද් වෙත පැවරුහ. ආණ්ඩුකාරවරු වෙනස්වීමත් සමඟ අකුරු සෑදීමේ කාර්ය පමා විය. 1737 වන විට එම අකුරු සෑදීමේ කාර්ය නිම කිරීමට හැකි විය.

1737දී ප්‍රථම සිංහල මුද්‍රිත පොත බිහි විය. එහෙත් එහි ප්‍රීතිය භුක්ති විඳීමට එහි නිර්මාතෘවරයාට නොහැකි විය. ඔහු ඊට මාස කිහිපයකට පෙර සිය දිවියෙන් සමු ගත්තේය. එහි ඇතුළු පිටුවල හැඳින්වීමේ සඳහන් වන්නේ 'ප්‍රදාන වූ යාඥාවල් පහද අපේ ක්‍රිස්තියානි ඇදහිල්ලේ පංගු දොළහ සහ දෙවි ස්වාමීන් දරුවන් වහන්සේට අහස් තුළින් දෙවා වදාළ ආඥාවල් දහසයද මෙහි ඇත.' ඊට යටින් දීප්තිමත් වූ කොමපඤ්ඤය වෙනුවෙන් අවිවි ගැසුවේ වර්ෂ 1737 යනුවෙන් සඳහන් වුහ.

මෙම 1737 දී මුද්‍රණය කළ ලංකාවේ ප්‍රථම සිංහල පොතේ පිටපතක් දැනට කොළඹ ජාතික කෞතුකාගාර පුස්තකාලයේද, කොළඹ ජාතික පුස්තකාලයේද, කොළඹ ජාතික ලේඛනාගාරයේ ද සංරක්ෂිතව පවතී.

විශේෂ ස්තුතිය
ජාතික කෞතුකාගාරයේ සේවක මඬුල්ලට

නන්දික බැද්දේගම
ඡායාරූපය - සමන් ශ්‍රී වෙදගේ

කටාරමට ලියන්න

ඓතිහාසික, පුරාවිද්‍යාත්මක තතු ඇසුරෙන් දන මන නව දැනුම්න් සුපෝෂණය කිරීමට ඔබටත් හැකිනම්, මනබන්ධනීය අයුරින් අකුරු කිරීමේ හැකියාව ඇත්නම්, ඔබේ පර්යේෂණ අත්දැකීම් ඇසුරින් අපේ උරුමය නැවත කියවීමට අප සූදානම්. ඔබේ ලියැවිල්ල වචන 1500කට පමණ සීමා කර, iskoolapotha අකුරින් නෝට්පැඩය මත සටහන් කර, ඔබේ පර්යේෂණ අත්දැකීම් පිළිබඳ කෙටියෙන් ලියා, ලිපියට අදාළව මැත කාලයේ ගත් ඡායාරූප සමඟ katarama@lakehouse.lk විද්‍යුත් තැපෑල් ලිපිනය වෙත හෝ සංස්කාරක, 'කටාරම', දිනමිණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් ලිපිනය වෙත හෝ යොමු කරන්න.



සිංහලේ අදිකාරම්වරුන් වූ ඇහැලේපොළ අදිකාරම්, මොල්ලිගොඩ අදිකාරම් සහ කපුවත්තේ අදිකාරම් සමඟ ජෝන් ඩොයිලි

1505 දී පෘතුගීසීහු ලංකාවට ගොඩ බටහ. එතැන් පටන් ගෙවුණු කාලය, මෙරට ජනතාවට හොඳ කලක් උදා කළේ නැත. 1948දී නිදහස ලබන තෙක් සෘජු ලෙස බටහිර අධිරාජ්‍යයේ විවිධ බලපෑම්වලට යටත් වීමට ස්වදේශීය ජනතාවට සිදු විය. ලාංකිකයන්ට මේ පාලන සමයන්හි වැඩිම බලපෑමක් එල්ල වූ විදෙස් පුද්ගල චරිත ගණනාවකි. ඔවුන් ගැන අනාවරණය වූ තොරතුරු මෙන්ම, ඉතිහාසය විසින් සඟවාලනු ලැබූ තොරතුරු රැසකි. එවැනි පුද්ගලයන් පිළිබඳ කතා කරන ලිපිමාලාවක ආරම්භයයි මේ.

උඩරට රාජ්‍ය බිඳ දැමීමේ මහ මොළකරු ජෝන් ඩොයිලි බව ප්‍රකටම මතයකි. 1798දී මෙරට ආණ්ඩුකාර ධුරයට පත්වූ ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරයා, උඩරට ආක්‍රමණය කර රටම ඉංග්‍රීසි පාලනයට නතු කර ගැනීමට උත්සුක විය. ඒ අනුව 1803 වර්ෂයේදී ඉංග්‍රීසීන් විසින් උපක්‍රමිකව යුද වැද, උඩරට රාජ්‍ය අල්ලා ගැනීමට වෙර දරන ලදී. එහෙත් එහි අවසානය ලියැවුණේ, ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගෙන් ඉංග්‍රීසීන් අමතක නොවන පාඩමක් ඉගෙන ගනිමිනි. එහිදී, ඉංග්‍රීසි හමුදාව සමූල ඝාතනය කිරීමට හැකිවූ අතර, එම වසරේ ජූලි මාසය වනවිට එක් ඉංග්‍රීසි භටයෙක්වත් මහනුවර නොවුණු බව වාර්තාවේ. මේ අනුව යුද ශක්තිය මත පමණක් උඩරට ආක්‍රමණය කළ නොහැකි බව ඉංග්‍රීසීන්ට අවබෝධ විය.

ඒ අනුව උඩරට රජු හා රදළයන් අතර පැවැති අන්‍යෝන්‍ය සම්බන්ධතා සහ පරස්පරකම් පිළිබඳ හඳුනා ගනිමින්, උඩරට අල්ලා ගැනීමේ නව සැලසුම් ක්‍රියාත්මක කිරීමට ඉංග්‍රීසීන් පෙලඹිණි. එම කාර්යය ඉටු කර ගත හැකි නිලධාරිහු ඒ වනවිටත් ලංකාවට පැමිණ සිටියෝය. ජෝන් ඩොයිලි එහි ප්‍රධානම චරිතය විය.

බ්‍රිතාන්‍යයේ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ උපාධිධරයකු වූ ඩොයිලි, 1801 වසරේදී ලංකාවට පැමිණියේය. ඒ, ලිපිකරුවකු ලෙස පත්වීම් ලබමිනි. 1803 වසරේදී ගාල්ල, මාතර ප්‍රදේශවල ඒජන්ත තනතුර ඉසුලූ ඔහු, විවිධ ක්ෂේත්‍රවල ප්‍රකට සිංහල විද්වතුන්, ප්‍රභූන් ඇසුරු කළේය. කොරතොට ධර්මාරාම, මොරතොට ධම්මානන්ද හිමිවරු ඇසුරේ සිංහල භාෂාව පිළිබඳ දැනුමක් ලැබීමට ඩොයිලිට හැකියාව ලැබිණි.

බොහෝ ලේඛනවල ඩොයිලිගේ ගුණ වැයෙන බව පෙනෙන කරුණකි. ඇතැමුන්ට අනුව හෙතෙම ශ්‍රමණයකු බඳුය. එහෙත්, සැබැවින්ම ඔහු එබන්දකුද යන්න විමසා බැලිය යුතුය. ඔහු අධ්‍යාපනය ලැබූ ක්‍රෙම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේදී, ඔහුට සුවිශේෂී විනෝදාංශ පැවතුණි. ඉන් එකක් නම් කුරුලු දඩයමයි.

“වෙඩි තැබීම මගේ විනෝදාංශයයි “

“වෙඩි පහර පහකින් ජෝඩුවක් මරා දැමීමට හැකි වීම මහත් වික්‍රමයකි.“

“පාට්‍රිජ් රැනක් වෙඩි පහර තුනකින් මරා දැමීමට මගේ ජීවිතයේ මුල්වරට හැකි විය.“

මේ, ඩොයිලි තමන්ගේ දඩයම් කිරීම් ගැන පාරම්බා තිබූ අවස්ථා කිහිපයකි. මෙසේ කුරුල්ලන් දඩයම් කරන ඩොයිලි, ඒවා කදමලු බැඳ තම මිතුරන්ට තෑගි ලෙස යැවීය. තාරාවුන්, වටුවන්, රෑන, වකෝරයන්, කැළෑ කුකුළන්, වල් තාරාවුන්, වටුවන්, ගේ කුරුල්ලන් ඔහුගේ තෑගි මලුවල දක්නට තිබුණු බව කියැවේ. මේ හැරුණුකොට මාළු බෑමටද ඩොයිලි රුසියෙක් වී සිටි බව ප්‍රකටය.

ලංකාවට පැමිණීමෙන් පසු ද ඔහු මහත් අභිමානයෙන් මේ විනෝදාංශය කරගෙන ගිය බව පිළිගැනේ. එහෙත්, ක්‍රමයෙන් භික්ෂූන් වහන්සේ ඇසුරට පත් වීමත් සමඟ, කුරුලු දඩයම නවතා තිබිණි. බෞද්ධ ආභාෂය අනුව යමින්, පවෙහි ආදීනව අවබෝධ කර ගනිමින් කළ කාර්යකට වඩා, එය තම වරපුරුෂ සේවාව සාර්ථක කරගෙන යෑමට භික්ෂූන්ගේ හිත් දිනා ගැනීමක් ලෙස දැක්විය හැකිය. විශේෂයෙන්ම තමන්ට ලංකාවේදී ලොව හොඳම දඩයම් ක්‍රීඩාව ලැබුණු බව ඩොයිලි වරෙක සඳහන් කරයි. එය අලි දඩයම විය හැකි බවට මහාචාර්ය ගණනාථ ඔබේසේකරයන් විශ්වාස කරයි. ඔහු මේ අලි දඩයම රහසේ කරගෙන ගියා වන්නට පුළුවන.

විශේෂයෙන්ම සිංහල සංස්කෘතිය, බුදු දහමට ලබාදී තිබූ තත්ත්වය පිළිබඳ ඩොයිලිට අවබෝධයක් තිබෙන්නට ඇත. ඒ අනුව ඔහු සෑම විටෙකම ක්‍රියාකර තිබේ.

ඩොයිලි එකල මාතර සුප්‍රකට කිවිඳිය වූ ගජමන් නෝනා සමඟ සමීප ඇසුරක් පැවැත්වූ බව කියැවේ. ඇතැම් තැනක කියැවෙන්නේ ගජමන් නෝනා සහ ඩොයිලි අතර අනියම් පෙමක් තිබූ බවය. තවත් තැනක ඇත්තේ ගජමන් නෝනා ඩොයිලිට පෙම් බැඳි බවය. විටෙක එම සබඳතාව හැඳින්වෙන්නේ ආදර සබඳතාවක් නොවූ ලිංගික සබඳතාවක් ලෙසය. කෙසේ වෙතත් තමන් යස ඉසුරින් පිරිහී ඇති බවත්, තම දරුවනට පිහිට වන ලෙසත් අයදිමින් ගජමන් නෝනා ඩොයිලිට හසුනක් යවා තිබිණි. ඩොයිලි ඇයට පිහිටට ආ බවට ඇති සාක්ෂිය නම්, අද නෝනා ගම ලෙස හැඳින්වෙන ගමය. ඇතැම් පිරිස් තර්ක කරන්නේ එම ප්‍රධානය සඳහා ඉල්ලීමක් කළ බවට කිසිම ලියවිල්ලක් සොයාගත නොහැකි බවයි. ඒ අනුව එහි එකම ගනුදෙනුව දෙදෙනා අතර තිබූ ලිංගික සබඳතාව බවටද ජනප්‍රවාද පවතී.

තවත් ලේඛනවල සඳහන්ව ඇත්තේ, ඩොයිලිගේ මව විසින් ඔහුට අවස්ථා කිහිපයකදීම විවාහ යෝජනා ගෙන ආ බවය. එය ඩොයිලි දිගින් දිගටම ප්‍රතික්ෂේප කර තිබූ අතර, මියැදෙන තෙක්ම ඔහු අවිවාහකයෙක් විය. ඇතැම් වාර්තා ඔහු සමලිංගික චර්යාවට නුරුව සිටි අයකු බව ප්‍රකාශ කරයි. එවකට බ්‍රිතාන්‍යයන් අතර සමලිංගිකත්වය තහනම් ව පැවැති හෙයින්, ඩොයිලිගේ එම ජීවිතය පිළිබඳ තොරතුරු සැඟව පවතින බවටද මතයක් පවතී.

ඩොයිලි සාන්තුවරයෙක් ද?

ඔහු, සිංහලයන්ට කොතරම් හොඳින් ළංවී සිටියාද කියතහොත්, හමේ පැහැය නොවන්නට, ඩොයිලි ස්වදේශිකයන්ගෙන් වෙන්කොට හඳුනා ගැනීමට අසීරුව සිටි බවද ප්‍රකට කියමනකි. ස්වදේශිකයන් මෙන් පාවහන් රහිතව ඇවිදීම, දිග රැවුලක් වවාගෙන සිටීම මෙන්ම, බුලත් විට හැපීමට පවා ඩොයිලි හුරුවී තිබිණි. මේ සියලු දේ ඔහු සිය වර පුරුෂ සේවාව වෙනුවෙන් ඉටු කළා මිස, ලාංකිකයන් කෙරේ ඇති ගෞරවයක් නිසා ඇති වූවක් බව නොපෙනේ.

ශ්‍රීපාදයට යෑමටද ඩොයිලි මහත් සේ ප්‍රිය කළ බව වාර්තාවේ. වරක් ඩොයිලි තම තෘණ විද්‍යඥයා වන හූකර්ට, විද්‍යාත්මක පර්යේෂණයක් සඳහා ශ්‍රීපාද අඩවියට පිටත් කිරීමට අවසර පතා තිබිණි. ඔහුගේ තවත් විශේෂත්වයක් නිසා ඔහු ප්‍රකට විය. ඒ, කෙසෙල් ගෙඩි කෑමේ නොනිත් ආශාවය. ඉතිහාසඥයකු වූ සර් ජේම්ස් මැකින්ටොෂ් ද මේ බව තහවුරු කරයි.

ඔහුගේ සිංහල භාෂා දැනුම පිළිබඳ බොහෝ පිරිස් ඩොයිලිට ගරු කරති. එහෙත් ඩොයිලිගේ ලේඛන කිහිපයක් තමන් පරීක්ෂා කර බැලූ බව ප්‍රකාශ කරන මහාචාර්ය ගණනාථ ඔබේසේකරයන් ප්‍රකාශ කරන්නේ, ඒවා රාජකාරීමය අවශ්‍යතා සඳහා ලියැවුණු සරල ලියවිලි පමණක් බවය. මෙහිදී තවත් කිවයුතු දෙයක් තිබේ. පන්සලට ඇතුළු වීමේදී පාවහන් ගැලවීම, බෞද්ධ සිරිතට, පෙරහරට සහභාගි වීම, භික්ෂූන්ට ගරු කිරීම වැනි මේ හැම දෙයකම ඔහු බ්‍රිතාන්‍ය වෙනුවෙන් අවංකව රාජකාරය කළ නිලධාරියකු බව සපත කරවයි. පන්සලට වඩාත් ළංවීම හරහා ඔහු සිය වරපුරුෂ සේවාව සඳහා භික්ෂූන් රැසකගේ සහයද ලබා ගැනීමට සමත්ව තිබේ. බඹසර රැකි මිනිසකු ලෙස අවිවාහකව සිටීමද, භික්ෂූන්ට ළංවීමට ඔහු යොදාගත් තවත් උපක්‍රමයක් බව පෙනේ. මේ සෑම දේ කළේ රාජකාරියට වඩා සිංහලයන්ට ඇති ගෞරවයකට නොවන බව පෙනීයයි.

“සිංහලයන්ගේ භාෂාව හා පුරුදු ගැන මට තියෙන අවබෝධය නිසා ඔවුන් සමඟ ගනුදෙනු කිරීමට පහසුය. මම මේ දරුණු මිලේච්ඡයන් හා එක්ව ඔවුන්ගේ වනාන්තරවල සැරි සරමි. ඔවුන්ගේ දඩබිම් භුක්ති විඳිමි“ මේ එක්තරා අවස්ථාවක ඔහු කළ ප්‍රකාශයකි.

උඩරට ගිවිසුම ඩොයිලිගේ මැදිහත් වීම මත අස්සන් කෙරුණු සුප්‍රකටම ලේඛනයයි. එහි සිංහල භාෂා පිටපත සහ ඉංග්‍රීසි භාෂා පිටපතෙහි වෙනස්කම් දක්නට තිබේ. සිංහල ප්‍රකාශනයේ වැදගත් වගන්ති ඉංග්‍රීසි ප්‍රකාශනයේ ඒ අයුරින් දක්නට නැත. එමෙන්ම පස්වෙනි වගන්තිය වන ආගම සම්බන්ධ වගන්තිය ඇතුළත් කරන ලද්දේ ඩොයිලිගේ පෙලඹවීම මතය යන්න පිළිගැනේ. මේ වගන්තියේ ආගම, බුද්ධ ශාසනය වැනි වදන් සිංහල ප්‍රභූන් මෙන්ම මහානායක හිමිවරුන්ද නොමඟ යැවීමේ අරමුණින් ඇතුළත් කරන්නට ඇති බව විශ්වාස කෙරේ.

“බුදු සසුන මින් මතුවට බැබළෙනු ඇතැයි” මහානායක හිමිගේ වදන්වලින් ඒ බව මැනවින් තහවුරු වේ.

කොතරම් දක්ෂ සේවකයකු ලෙස කැපවීම් කළද, ඩොයිලිගේ සේවය නිසි ආකාරයට සිදු වූ බව නොපෙනේ. ඇතැම් විට ඔහුගේ වාර්තා පරස්පර විරෝධී වී තිබේ. ඔහු තමන් යටතේ සිටි ඔත්තුකරුවන් කියූ සෑම දෙයක්ම විශ්වාස කර තිබිණි. ඒවා බොහෝ විට විශ්ලේෂණයට භාජනය වී තිබුණු බවක් නොපෙනේ. ඩොයිලිගේ සේවයේ ලොකුම හිඩැස වන්නේ, සිංහලයන් නිහඬ කර, 1815 දී රටම ඉංග්‍රීසීන් අතට නතු කර ගත්තද, ඉන් ටික කලකට පසු සටන්කරුවන්ගේ නැගී සිටීමය. ඩොයිලි සැබෑ ලෙසම සූක්ෂ්ම ලෙස සිය කාර්ය ඉටු කළේ නම්, 1818 නැගිටීම සිදු නොවන්නට තිබිණි.

බ්‍රිතාන්‍ය කිරීටය වෙනුවෙන් කළ සේවය සලකා 1821 දී නයිට් නාමයකින් පිදුම් ලැබූ ජෝන් ඩොයිලි, උණ සන්නිපාත රෝගයෙන් මිය ගියේය. ඔහුගේ දේහය පිහිටි සොහොන් කොත මහනුවර ගැරිසන් සුසානයේ අද ද දක්නට තිබේ.

මලික් චමින්ද ධර්මවර්ධන

අලි ගහේ කතාව

මන්නාරම කියූ සැණින් මතකය අවදි වන්නේ, එහි පිහිටා ඇති සුවිශේෂ, පෞරාණික මෙන්ම ඓතිහාසික වැදගත්කමක් කැටි වූ විවිධ පුරාවිද්‍යාත්මක ස්ථාන කෙරෙහිය.

එක් පසෙකින් රමණීය මුහුදු තීරයකින් අලංකාර මන්නාරම තුළ, ඩොරික් බංගලාව, අල්ලිරාණි කොටුව, අරිප්පු කොටුව වැනි නොයෙකුත් ස්ථාන, එහි යන කාගෙත් නෙත් සිත් පැහැර ගන්නාසුලුය. එකී විවිධ ස්ථානවලට අමතරව, ස්භාවිකව පිහිටි ජෛව විවිධත්වය මන්නාරමේ සුන්දරත්වය තවත් ඉහළ නැංවීමට ඉවහල් වෙයි. එවැනි ජෛව විවිධත්වයේ සහ ශාක ප්‍රජාවගේ අපූර්වතම නිර්මාණයක් වන මන්නාරමේ පිහිටි බයෝබැබ් ගස හමුවන්නේ, පල්ලිමුනේ මාර්ගයේ ඇතුළට වන්නටය. මන්නාරමේ සිට පේසාලේ හරහා තලෙමන්නාරමට ගමන් කරන A 14 මාර්ගයේදී මෙය දැක ගත හැකිය.

මේ ගසේ පොත්ත අලියකුගේ සමට සමාන ලක්ෂණ පෙන්නුම් කරන නිසා, “අලි ගහ” ලෙසින් හඳුන්වයි. එහි උස මීටර් 7.5ක් පමණ වේ. ගසෙහි වට ප්‍රමාණය මීටර් 19.5කි. අරාබි වෙළෙන්දන් විසින් ශ්‍රී ලංකාවට බයෝබැබ් ගස (අලි ගස) ගෙන එන්නට ඇතැයි විශ්වාස කෙරේ. 2003 වසරේ කරන ලද සමීක්ෂණයකට අනුව, මෙරට අලි ගස් 40ක් පමණ තිබේ. ඉන් 34ක් පමණ මන්නාරමේ පිහිටා ඇත. මින් පල්ලිමුනේ පිහිටා තිබෙන අලි ගස, වර්ෂ 800ක් පමණ පැරණි යැයි විශ්වාස කෙරේ. වර්තමානයේ මෙය පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරකයක් වශයෙන් එය නම් කර තිබේ.

අශ්වයන්ට බෙහෙත් සකස් කිරීම සඳහා ලංකාවේ වගා කළ බව සමහරුන්ගේ මතය වී තිබේ. මේ ශාකය එවකට පෘතුගීසීන් ඇති කළ අශ්වයන්, දැනට කැලෑ අශ්වයන් ලෙස ජීවත් වන ඩෙල්ෆ්ට් දූපතේ, මෙවැනිම බයෝබැබ් ශාක වගා කර ඇත.

“බයෝබැබ්’ ශාකය අප්‍රිකාවේ තෘණ වනාන්තරයන්ට අයත්වේ. ඉන්දීය විද්‍යාඥයන්ගේ අනුමානවලට අනුව, මේ ශාකය අප්‍රිකාවේ ප්‍රභවය ලබා, වෙනත් රටවල රෝපණය වූ ශාකයක් ලෙස පිළිගැනේ. අප්‍රිකා බන්ටු ගෝත්‍රිකයන්ගේ “බුහු - බැඩ්” යන බන්ටු වචනයෙන් බිඳී සැකසුණු මේ ගසේ උද්භිද විද්‍යාත්මක නාමය වන්නේ, ඇඩන්සෝනියා ඩිජිටාටා (*Adansonia digitata*) ය. Adans කොටස එක්වී ඇත්තේ එනමින් විසූ ජෛව විද්‍යාඥයාට උපහාර පිණිසය.

ඩිජිට් (Digit) යනු ඇඟිලි සඳහා ජර්මන් භාෂාවේ යෙදෙන වචනයකි. ගස, දිග හරින ලද ඇඟිලි සහිත අල්ලක් වැනි ආකාරයට සැකසී ඇත. මේ ශාකයේ විද්‍යාත්මක නාමය සැකසීමේදී, එහි ස්වභාවය හේතු වන්නට ඇතැයි විශ්වාස කළ හැකිය.

මේ ගස බොම්බකාසේ (Bombacaceae) ශාක කුලයට අයත්වේ. මේ ගස හැඳින්වීම සඳහා ඉංග්‍රීසි බසින් Baobab, Calabash, Monkey Bread tree යන නම් භාවිතවේ. Monkey Bread tree නම භාවිත වන්නේ, මේ ගසේ ගෙඩි වඳුරන් කෑමට ඉතා ප්‍රිය නිසාය.

බයෝබැබ් මුල් කර ගත් විවිධ ජනප්‍රවාද ඇත. අතීතයේදී වනාන්තරයේ සිටි සියලු සතුන්ට ගස් සිටුවීමට විධානයක් ලැබුණු අතර, එහිදී හයිනා සත්ත්වයාට ලැබුණේ බයෝබැබ් ශාකයකි. හයිනා, මේ ශාකයේ ගස කොටස යට් අතටත්, මුල් කොටස උඩු අතටත් සිටුවූ නිසා, මෙහි ස්වරූපය වෙනස් ලක්ෂණ ගත් බැව් එම ජනප්‍රවාදයයි. හින්දූන්ගේ භගවත් ගීතාවේද මේ අන්දමින් මුල ඉහළට සහ අතු පහළට විහිදුණු ශාකයක් ගැන සඳහන් කර ඇත. එම ශාකයට බෙහෙවින් සමාන වන්නේ, මේ බයෝබැබ් ශාකයයි. මෙහි ඇති වෙනස් පෙනුම නිසාම, බන්ටු ගෝත්‍රිකයන්ගේ පිළිගැනීම වන්නේ මෙය යක්ෂයාගේ ගසක් බවය.

මෙහි පත්‍ර තද කොළ පැහැතිය. එහි අන්තර්ගත ඖෂධීය ගුණය නිසා, වකුගඩු රෝගීන්ට බෙහෙවින් ගුණදායක වේ. ශුෂ්ක පරිසරයට අනුවර්තනය වී ඇති බයෝබැබ් ගසට ආවේණික වූ විශේෂ ලක්ෂණ අතර, එහි විශාල තද කොළ පැහැති පත්‍ර කැපී පෙනේ. ඒවා මිනිස් අතක ඇඟිලිවලට සමානය. පත්‍ර කුඩු කර, ආහාර රසකාරකයක් ලෙස යොදා ගැනේ. දෙසැම්බර් මාසයේදී ඵල දරන මේ ගෙඩි, වඳුරන්ගේ කෑමක් බවට පත් වන නිසා, “වඳුරු දෙල් ගස” ලෙසින්ද, බයෝබැබ් ගෙඩියක ඇට 30ක් තිබීම නිසා “ජුදාස්ගේ මල්ල” ලෙසද හැඳින්වේ. එයට හේතුව පේසුතුමන් ජුදාස් විසින් පාවා දෙනු ලැබුවේ රිදී 30කට යැයි කියැවෙන නිසාය. මෙහි ඵලය අප්‍රිකානුවන් අතර රසවත් පානයකි.

මෙහි රාත්‍රියට පිපෙන එල්ලා වැටෙන විශාල සුදු තනි මල්, අඟල් 6ක් පමණ පළලය. මලේ පිළුනු සුවඳට විවිධ මැස්සන්, සලබයන්, වවුලන් ආදී සතුන් ආකර්ෂණයවේ. එම සත්තු මල්වල පරාග පෝෂණය කරති. බයෝබැබ් ගස අවුරුද්දේ මුල් මාස නවය තුළ පත්‍ර රහිතවේ. එම වියළි මාස නවය තුළදී එහි මහත පොරොප්ප මෙන් පිම්බුණු සහ ගින්නට ඔරොත්තු දෙන පොත්ත ඇතුළත, වතුර ලීටර 120,000ක් පමණ රඳවා තබාගත හැකිය. ගසේ විරලභාවය හා ඉපැරණිභාවය නිසා, එය ශ්‍රී ලංකාවේ ආරක්ෂිත ශාක විශේෂයක් බවට පත්ව ඇත. කිසිදු හැඩයක් නොමැති විකාර රූප පෙනුමැති මේ ගස, අසාමාන්‍ය ලෙස අත්පා කේඳෑරි වූ හස්තියකුගේ ඉරියවුවෙන් නැගී සිටී.

බයෝබැබ් ගසක් පල දැරීමට, වසර තිහක පමණ කාලයක් ගත වේ. ගෙඩි හටගන්නේ අතුවලය. මේ ගෙඩි, ඉහළ පෝෂණ ගුණයෙන් යුක්තය. පලතුරු වියළා කොටා ගැනීමෙන් පාන වර්ග, ධාන්‍ය ආහාර, චොක්ලට් නිෂ්පාදනය කරයි. මේ ගෙඩිවල, කාබෝහයිඩ්‍රේට, තන්තු, යකඩ, මැග්නීසියම්, පොටෑසියම් සහ විටමින් සී අන්තර්ගතය. මේ ඵල රස විඳිනු රිසි බූරුවන්, අස්වනු ඇති කාලයේදී ගස අතර ගැවසීම සුලබ දසුනකි. ගස් කඳ හාරා සකස් කර ගත් බෙණයන් නිවාස ලෙසින් භාවිත කළ හැකිය. ගසේ ඉහළ කොටසේ ජල ටැංකි තනා ගත හැකිය. මෙවැනි බෙණවල මිනිසුන් විසි තිස් දෙනකුට වුව අපහසුවක් නොමැතිව සැඟව සිටිය හැකිය. මෙහි මුල්, ජලය සොයාගෙන මීටර් සිය ගණනක් වුව ඈතට දිවෙන හැකියාව ඇත. එනිසාම, අලි පවා නියං කාලයේදී ආහාරයට ගන්නේ මේ ශාකයේ පොත්තයි. ගස් පොත්ත, කඹ, මාළු දැල්, ගෝණි ආදිය සකස් කිරීමටත්, මතුපිට පොත්ත මුවහත් පිහි ලෙසින් සකසා යොදා ගනී. මෙහි යුෂ, හම් පදම් කිරීමට භාවිත කරයි. ගංවතුර, සුළි කුණාටුවලින් ආරක්ෂා වී වසර සිය ගණනක් වුව ජීවත් වීමේ හැකියාව ඇති නිසාම, බයෝබැබ් ශාකයට ‘කල්ප වෘක්ෂය‘ (කප්රුක) යන අන්වර්ථ නාමය යොදා ගනී.

විල්පත්තු ජාතික වනෝද්‍යානයේද, කලා වැව් නිම්නයේ ගඟේ වාඩිය ප්‍රදේශයේද, ඩෙල්ෆ්ට් දූපතේද බයෝබැබ් ශාක දැකිය හැකිය. අප්‍රිකානු කලාපය තුළ සිදු වුණු වනාන්තර විනාශය නිසා, ශාක ගහනය අඩු වී තිබේ. ලෝක වන සත්ත්ව අරමුදලට ආධාර පිණිස 2015 වසරේ නිකුත් කළ ප්‍රංශ ෆ්‍රෑන්ක් 100 කාසියේ, මේ ශාකය සටහන් කර ඇත.

දකුණු ආසියාවේ ඇති විශාලතම ගස වශයෙන් නම් කර ඇති මන්නාරමේ ‘බයෝබැබ්’ ගස සුරැකීම සැමගේම වගකීමකි.

පොතපත ඇසුරිනි

යශෝදා ඉන්දීවරී

දිනමිණ
ඉතිහාසය
2020 සැප්තැම්බර් 10 බ්‍රහස්පතින්දා

පත්ල ඇස නොගැටෙන කළුදිය පොකුණ

මිහින්තලා පව්ව අබියස වන අරණක පිහිටි, කඳුගැටවලින් වටවූ කළුදිය පොකුණ, ලක්දිව පිහිටි පොකුණු අතර, සුන්දරම ස්ථානයකි. කිසිවෙකුත් පතුල නොදුටු කළුදිය පොකුණෙහි පත්ල, කේතුවක් අනෙක් පසට හැරවූවා වැනි හැඩයකින් යුක්ත බව කියැවේ. පොකුණේ පතුල කළු ගලින් සාදා තිබීම හා පොකුණ අවට ඇති රුස්ස ගස්වල හා කඳුවල සෙවණැල්ල මෙහි දිය මතට වැටීම හේතුවෙන්, පොකුණේ ජලය කළු පැහැයක් ගනී. ඒ නිසා මෙයට කළුදිය පොකුණ යැයි ව්‍යවහාරවේ.

මේ පොකුණ හා බැඳුණු ජනප්‍රවාදවලට අනුව, මෙහි අතීත කතාව රාවණා රජ සමය දක්වා දිවෙයි. මෙතෙක් හෙළිවුණ මෙන්ම, තවමත් හෙළි වෙමින් පවතින හා මේ වනවිට හෙළි වී ඇතත් ඔප්පු කරගත නොහැකි අතීත තොරතුරු, මේ පොකුණ පිළිබඳ අපූර්ව බවක් එක්කරයි. අනුරාධපුර පුජා නගරය ආශ්‍රිතව ඇති අනෙකුත් ස්ථාන සමඟ සසඳන කල, කළුදිය පොකුණ යනු ජනතාව නිතර යන එන තැනක් නොවේ. මේ හේතුව නිසාම, නොඉදුල් කුඩා වන පෙතක් මැද නිහඬව විරාජමාන වන සුන්දර වැව් පොඩිත්තක අසිරිය කළුදිය පොකුණ බලන්නට යන එන ජනතාවට විඳ ගැනීමට නොහැකිව ඇත.

කළුදිය පොකුණ ඉදිරියෙහි ඇති කළු තිඹිරි ගස මෙන්ම, කළු දිය පොකුණ හා බැඳුණු ජනප්‍රිය ජනප්‍රවාද බොහොමයකි. කළුදිය පොකුණ ආරණ්‍යයෙහි වැඩ වාසය කළ කළු බුද්ධරක්ඛිත හිමියන්, කළුදිය පොකුණ ඉදිරියෙහි ඇති කළු තිඹිරි ගස පාමුල වැඩ හිඳිමින්, කළුවර පොහොය දිනයක රාත්‍රිය පුරාවට කාලකාරාම සුත්‍රය දේශනා කළ බව එබඳු එක් මතයකි. කළුදිය පොකුණ ඉදිරිපිට දක්නට ලැබෙන ආසන මත හිඳ, අතීතයේ කළුදිය පොකුණ ආරාමයෙහි වැඩ සිටි භාවනායෝගී හිමිවරු, පොකුණ අද්දර බවුන් වඩන්නට ඇතැයි විශ්වාස කළ හැකිය. මේ ආසන අතර කළු බුද්ධරක්ඛිත හිමියන් වැඩහුන් ආසනය යැයි විශ්වාස කරන ආසනයක්ද දැක ගැනීමට පුළුවනි.

මෙය, රාවණා රජු සක්වළ සමඟ සම්බන්ධතා පැවැත්වූ ස්ථානයක් ලෙස ද විශ්වාසයක් පවතී. අතීතයේ රාවණා රජු කළුදිය පොකුණ පරිශ්‍රයේ ඇති තාරකා දොරටුවකින් එහා සක්වළට ඇතුළු වී, සක්වළ ජීවීන් සමඟ සටන් වැද, ඔවුන් ජීවග්‍රහයෙන් රැගෙන විත් සඟවා තැබූ සිරකුටි මේ පොකුණ පතුලෙහි ඇති බව ජනප්‍රවාදයේ

සක්මන් මළුවට පිවිසෙන ප්‍රධාන දොරටුව

විහාරාරාම සංකීර්ණ නටබුන්

කළුදිය පොකුණ ආශ්‍රිතව පිහිටි විහාරාරාම සංකීර්ණය

කියවේ. එසේම මේ පොකුණ පතුලේ හතර කොනේ රනින් කළ ඇතුන් සතර දෙනකු රඳවා ඇති බව ද පැවසෙයි.

පෙර කළ චේතිය පබ්බත සෑගිරිය යන නම්වලින් හැඳින්වූ මිහින්තලය වෙත යන ජනතාවට, බොහෝ වටිනා කළුදිය පොකුණ දැකබලා ගැනීම වෙහෙසකර කාර්යයක් නොවේ. මිහින්තලා පුදබිම අසලින් දිවෙන නුවර - යාපනය මාර්ගයේ මීටර් 600 ක් පමණ දුරක් ගමන් කළ විට හමු වන කළුදිය පොකුණට පිවිසීම සඳහා මඟ පෙන්වන පුවරුවකි. එම පුවරුව ඇති තැනින් ඇතුළු වූ විට, නැගෙනහිර දෙසට හා දකුණු දෙසට යොමු වූ දොරටු දෙකකින් ආරමයට පිවිසිය හැකි දොරටු හමු වෙයි. ඒ අසල උතුරු දෙසින් උස් බිමක ඇති ස්තූපයක නටබුන්ය. ඒ අතරින් නිරතුරු රැහැයි හඬ ඇසෙන රුස්ස ගස් වැල්වලින් ගහන පරිසරයේ ඇතුළට ගමන් කළ විට හමුවන්නේ, කළුදිය පොකුණ හා කළුදිය පොකුණ ආරාම පරිශ්‍රයේ නටබුන්ය. උපෝසථාගාර ගලින් කළ කුටි, ස්වාභාවික ගල් ගෙවල්වල පියසි වැසිකිළි කැසිකිළි ආදියෙහි නටබුන් මේ පරිසරයේ කළුදිය පොකුණට අමතරව දැකගත හැකිය.

අඩි 1000ක් පමණ උස මිහින්තලා කන්ද හා සබැඳි ඇත්වෙහෙර කන්ද, රාජගිරි කන්ද කණ්ඨක සෑය පිහිටි කන්ද, අනෙයිකුට්ටි කන්ද ආදි ශේෂ කඳුවලින් වට වූ පරිසරයක්, කළුදිය පොකුණ ආරාම පරිශ්‍ර නිර්මාණය කිරීමට අතීත නිර්මාණකරුවා තෝරාගෙන තිබීමම විශේෂත්වයකි. මේ කඳු වළලූ අතරින් කළුදිය පොකුණ නිර්මාණය කර ඇත්තේ, ඇත්වෙහෙර කන්දත්, අනායිකුට්ටි කන්දත් (ඇත්පැටියා කන්ද) අතර ඇති මිටියාවතෙහි වේල්ලක් බැඳීමෙනි. ඉහත දැක්වූ සියලු කඳුවල ඇති ජල උල්පත්වලින් ගලා එන ජලයෙන් මේ පොකුණ පෝෂණය වන නිසාදෝ, කිසිදාක නොසිඳෙන පොකුණක් ලෙස කළුදිය පොකුණ ප්‍රකටව තිබේ.

පොකුණෙහි ජලය වැඩි වූ විට එම ජලය ඉවත් කිරීමට කළු ගලින් සාදා තිබූ නලයක්ද පුරාවිද්‍යා කැනීම්වල දී සොයාගෙන තිබීම වැනි කාරණා නිසා, කළුදිය පොකුණ සමඟම අතීත දියුණු වාරිතාක්ෂණ අපට සිහිගන්වයි. වර්ග අඩි 1700ක පමණ විශාලත්වයක් දරන මේ පොකුණ වටා ඇති ස්වාභාවිකව පිහිටි ගල් පොකුණේ ඉවුරු ලෙස යොදාගෙන ඇත. පොකුණ, නිශ්චිත හැඩයක් නොදරණ නමුත්, මෙයින් දිස් වන්නේ ශෛලමය රාමුවකට අදුරු පැහැයෙන් දිදුලන අගනා මාණික්‍යයක් එබබවූවා වැනි පෙනුමකි.

ඕවැනි කාශ්‍යප රජු (ක්‍රි ව 898 - ක්‍රි ව 914) ඉලංගසේන නමැති සෙන්පතියා ලවා චේතිය පබ්බත හදයුන්හ නමැති පිරිවෙන කරවා, ධම්මරුචි හික්ෂූන්ට පුජා කළ බව මහාවංශයේ ගාථාවකින් සඳහන් වී ඇත. මහාවංශයේ සඳහන් එම ගාථාව පාදක කර ගනිමින් මෙය හදයුණ්හ නම් පිරිවෙන හා කළුදිය පොකුණ නම් ආරාම පරිශ්‍රය විය හැකි බවත්, එහි නිර්මාතෘ සිවිවැනි කාශ්‍යප රජු බවත් එච්. සී. පී. බෙල් සඳහන් කර තිබේ. ඉලංගසේන සෙන්පතියා එම ආරාමයෙහි එක් එක් කුටිය බැගින් සාදා, ආරාමික හින්ෂූන්ට දුන් බව මහාවංශයේ සඳහන් වන අතර, කළුදිය පොකුණ ඉස්මත්තේ අනෙයිකුට් කන්දේ පිහිටි ලෙන් එම කුටි විය හැකි බව, බෙල් වැඩිදුරටත් සඳහන් කර ඇත. අතීතයේ දී කළුදිය පොකුණ ආශ්‍රිතව පිහිටා ඇති ළෙන් 18 තුළ භාවනානුයෝගී භික්ෂූන් වහන්සේලා වැඩ වාසය කර ඇති බවත්, උන් වහන්සේලාගේ ජල අවශ්‍යතා මේ පොකුණ ඇසුරේ ඉටු කෙරුණු බවත් පැවසේ. වර්තමානයේද කළුදිය පොකුණ ආරාම පරිශ්‍රයේ භික්ෂූන් වහන්සේලා වැඩ වාසය කරනු ලබන නමුත්, එම භික්ෂූන් වහන්සේලාගේ ජල අවශ්‍යතා සඳහා කළුදිය පොකුණ භාවිත වන බවට නම් සලකුණු නැත.

ධම්මිකා සුරංජී පතිරණ
ජායාරූප
ආසිරි උපේන්ද්‍ර ඛයස්

දන්නව ද? දවාල රෑ වුණු එදවස

1955 ජූනි 20 වැනිදා ලංකාවටම අමතක නොවන දිනයකි. ඒ, එදා දහවල රටම මහා රෑ ඝන අඳුර මෙන් කරුවල වී ගිය හෙයිනි. එදා ජූනි 20 වැනි සඳුදාවකි. සූර්යග්‍රහණය තිසා ලංකාවේ සියලුම පාසල්වලට රජය නිවාඩු දී තිබිණි. 20 වැනිදා උදේ 8.11ත් ඇරඹෙන මේ අපූරු සිදුවීම දැකබලා ගැනීමට, විදෙස් රටවල ග්‍රහ විද්‍යාඥයෝ ලංකාවට පැමිණ, පොලොත්තරුව, කදුරුවෙල, හිතුරක්ගොඩ, සීගිරිය, ත්‍රිකුණාමලය යන ප්‍රදේශවලට වී කඳවුරු බැඳගෙන, ඒ මොහොත එළැඹෙන තුරු බලා සිටියෝය.

සූර්යග්‍රහණය බැලීමට, වෛද්‍යවරුන් එදා අනුමත කළ කණ්ණාඩි බොහෝ සෙයින් විකිතිණි. ඒ මොහොතේ, රට පුරා විහාරස්ථානවල සෙත්පිරිත් සජ්ඣායනයට සූදානම් කර තිබිණි. සමහරු මන්ත්‍ර ජප කළහ. සෝවියට් සමූහාණ්ඩුව ඉල්ලීම් කළත්, එවකට මෙරට සිටි බලධාරීන් මෙය අධ්‍යයනය කිරීම සඳහා ඔවුන්ට මෙරටට ඒමට අවසර නොදුන් බව පැවසේ.

එවකට සිටි එක්තරා දේශීය වෛද්‍යවරයකු විසින්, සූර්යග්‍රහණ වෙලාවේදී පානය කිරීම සඳහා සුදුසු අපූරු බෙහෙතක්, 1955 ජූනි 19 වැනි දින පළ වූ ඉරිදා ලංකාදීප පුවත්පතේ මූල් පිටුවේ සඳහන් කර තිබිණි. ඒ, වද කහ යුෂයි. වද කහ සියුම්ව අඹරා, ඒ සඳහා විවිධ අනුපාතවලින් පානය කළහොත්, ශරීරයේ විවිධ ආබාධ දුරු වී, සුවදායක තත්ත්වයක් මතුවන බව, එහි සඳහන්ව තිබිණි.

තැඹිලි වතුරෙන් බී විට බුද්ධිය වර්ධනය වන බවත්, කොත්තමල්ලි වතුරෙන් බී විට රූප ශෝභාව වැඩිවන බවත් ආදී ලෙසින් මාත්‍රා පහකින් වදකහ බීමට නියම කර තිබිණි. වතුර බේසමකට තිල් දිය කර සූර්යග්‍රහණය බැලීමට හෝ කළු කණ්ණාඩියකින් හෝ කළු සෙලෝටේප් පටියකින් හෝ බැලීමට නියම කර තිබිණි. කෙළින්ම සූර්යග්‍රහණය පියවි ඇසින් බැලුව හොත් ඇස් අන්ධ වන බව එදා පුවත්පත්වල සඳහන් විය. හැම වෙද ගෙදරකම වදකහ බෙහෙත නියමිත මාත්‍රාවලින් සකස් කර, ජනයාට ලබා දුනි. බෙහෙත් බඳුන් කඩෙන් ගත් විවිධ පුද්ගලයන්, තමන්ට සිතැඟි මාත්‍රාවලින් වද කහ සාදා ගත්තේය.

සූර්යග්‍රහණය වෙලාවේ විවිධ මාත්‍රාවලින් වද කහ බීමෙන් රූපශෝභාව වැඩි වීමට, බුද්ධිය වර්ධනයට, කාලාන්තරයක් තිස්සේ පැවැති ලෙඩ රෝග සුව වීමට හා කටපාඩම් හිටීම සිදු වේ යැයි සිතූ අය, වද කහ බීමට යුහුසුළුව බලා සිටියේය.

නියමිත ජූනි 20 වැනි දිනය උදාවූ බව පවසමින්, වටින් ගොඩින් එළි වන්නට විය. එම සඳුදා උදේ ඔර්ලෝසු මත 8.11 සිට 8.15 වේලාව සටහන් වන විට, සූර්යග්‍රහණය ඇරඹිණි. රටම අඳුරේ ගිලී ගියේය. කපුටන් ඇතුළු කුරුලු රැත් කෑ ගසමින්, සිය කූඩු කරා නැවත පියඹා යන්නට විය. උදේ දිගෙලි කර වතුවල තණ කමින් සිටි හරකුන්, රාත්‍රිය එළැඹී ඇතැයි සිතා, ගාල් නොකළ බැවින්, බියවී කෑ ගසන්ට විය. රාත්‍රියේ පිපෙන මල්, පිපෙන්නට විය. නැවත එළිය වැටීමත් සමඟ ඇත මැන පියාඹමින් වල්මත් වී සිටි පක්ෂීන්, කිවි බිවි හඬ නඟමින් මහත් ප්‍රීතියෙන් යුතුව නැවතත් පුරුදු ජීවන රටාවේ නියැළුණු අයුරු, එකල පුවත්පත් මඟින් කියැවුණි. පක්ෂීන් පමණක් නොව, දෙගිඩිවල සත්ත්වෝද්‍යානයේ සිටි අලි ඇතුන්, ව්‍යාඝ්‍රයන් ඇතුළු සතුන් අමුතු ආකාරයකින් හඬනැඟීමට පටන් ගත් බවද කියැවේ.

බොහෝ පිරිස් විවිධ මාත්‍රාවලින් සෑදූ වදකහ බොන්නට ගත්හ. සමහරු වැරදි මාත්‍රාවෙන් වදකහ බොන්නට වූහ.

වද කහ බීවි බොහෝ දෙනාට වමනය හා බඩඑළිය යෑම ආදී රෝග මතු විය. රට පුරා එකවර වැඩිම පිරිසක් රෝහල්වලට ඇතුළු වූ ඉතිහාසයේ පළමු දවස මෙය විය. රූපශෝභාව වැඩි වීමටත්, බුද්ධිය වැඩි අරබයාත්, බොහෝ පිරිස් නියමිත මාත්‍රාව ඉක්මවා වදකහ බීවෝය.

සූර්යග්‍රහණය බැලීමට ගොස් දෙනෙක් මැරී වැටුණහ. දෙදෙනකුගේ ඇස් අන්ධ විය.

ලංකාදීප පුවත්පත පසු දිනයේදී වමනයට බෙහෙත් ද සඳහන් කර තිබිණි.

රටේම අය වද කහ බී ලෙඩ වීම නිසා, ලංකාදීප පුවත්පතේ වදකහ බෙහෙතට එරෙහිව දිනමිණ 'වද කහ' නමින් තීරු ලිපියක්ද පටන්ගෙන තිබිණි. ඉන්පසු එය ටික කලකින් නැවතුණි. ලංකාවට දර්ශනය වූ එම සූර්යග්‍රහණය පූර්ණ සූර්යග්‍රහණයක් ලෙස සටහන් වී ඇති අතර, ලංකාව හැරුණු විට එය දර්ශනය වී ඇත්තේ සියමය, වියට්නාමය, පිලිපීනය යන රටවලට පමණි. විනාඩි 7 යි තත්පර 8 ක් පුරා සිදු වූ මේ සූර්යග්‍රහණය, දර්ශනය වූ විශාලතම සූර්යග්‍රහණයක් ලෙස හැඳින්වේ. මෙකල සිටි ජනප්‍රිය බයිලා ගායක වොලී බැස්ටියන් විසින් තීර්මාණය කර ගායනා කරන්නට යෙදුණු, 'බ්ව්වා නේද වදකහ සුදිය' බයිලා ගීතය, අද වන විට සෑම සාජ්ජයකදීම ඇසෙන බයිලාවක් බවට පත්ව ඇත.

නන්දිකා බැද්දේගම

රේඩියෝ ගුරුවරයා

අංක 11 II පත්‍රය පැය 1 මිනිත්තු 15

2020 වසරේ 5 වසර ශිෂ්‍යත්ව විභාගය ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව මගින් ඉදිරිපත් කරන රේඩියෝ ගුරුවරයා වැඩසටහන් මාලාව ඇසුරින් සකස් කරන ලද පෙර පුහුණු ප්‍රශ්න පත්‍රය

EXAMINATION FOR GRADE FIVE STUDENT FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES AUGUST

2020 පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ

සිසුන් සඳහා පැවැත්වෙන විභාගය -2020

II පත්‍රය

පැය 1 මිනිත්තු 30

- පහත දැක්වෙන ඡේදය කියවා ඡේදයෙන්ම පිළිතුරු ලියන්න.

මුදු වෙරළේ සෙල්ලම් කිරීමට ළමයි ඉතා ආශා ඇත්තෝ ය.සමහර ළමයි රළ පාගමින් වෙරළේ ඔබ මොබ දුවති. වෙරළට ළංව බිඳ වැටෙන රළයක් වේගයෙන් ගොඩට දිවෙයි.රළ පාගමින් සිටින ළමයි ද රළයට හසු වී ඇඳුම් තෙමෙතැයි බයෙන් වහ වහා වෙරළට දුවති. රළය බිඳ වැටීමෙන් ගලන වතුරෙන් කොටසක්,තීන්ත පොවන කඩදාසියක් තීන්ත උරා ගන්නාක් මෙන්,බුරුල් පස් අතරින් පොළොව උරා ගනියි. ඉතුරු වන වතුර යළි වහ වහා මුදට ම ඇදී යයි. ළමයි ද ප්‍රීතියෙන් බැස යන වතුර පාගමින් දුවති.

(i) මෙයින් කියවෙන්දනේ කුමන ස්ථානයක් පිළිබඳව ද?..

(ii) මෙහි සඳහන් ආකාරයට ළමයි කැමති කුමක් කිරීමට ද?..

(iii) වේගයෙන් ගොඩට දිව යන්නේ මොනවා ද?..

(iv) මෙහි සඳහන් උපමාවක් තෝරා ලියන්න..

(v) ''වතුර යළි වහ වහා මුදට ම ඇදී යයි'' යන වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

....

(vi) ළමයි යන පදයෙහි අනුක්ත පදය ලියන්න..

(ලකුණු 06)

(02) මෙම කවියෙ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නයට පිළිතුරු ලියන්න.

පලා පැහැය හැම කල්හි ම
රැඳී දිලෙන පොළොවේ
ඉවත දමන දඬුව වුව ද
දලු ලා යළි පැළ වේ

'ඉවත දමන දඬුව වුව ද දලු ලා යළි පැළ වේ' මෙයින් අදහස් වන්නේ කුමක් ද?

....

(ලකුණු 01)

(03) සුදුසු වචනය යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

(i) .... වටා මුතු පර වැටිය යි. (වෙරල/වෙරළ)

(ii) ....පසුගිය වාර්තාව ඉදිරිපත් කළේ ය.(ලේකම්තුමා/ලේඛම්තුමා)

(iii) අම්මා .... (වළඳ/වලඳ) ගෙන කුස්සියට ගියා ය.

(iv)මිනිසා............................ (හොරණෑව/ හොරනෑව) ගෙන පිඹින්නට විය.

(ලකුණු 04)

(04) සුදුසු ඉගිවැකිය යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

(i) බලු පැටියා කෝප්පයේ තිබූ කිරි ටික .... බිවුවේ ය.

(ii) අයියා ළිඳට වැටෙන්න ගොස් .... බේරුණි.

(iii)ගුරුතුමිය මගේ රචනාව .... කියෙවුවා ය.

(ලකුණු 03)

(05) අතීතයේ මිනිසුන් දුර ගමන් යන අතරමග නවාතැන් ස්ථානය .... යනුවෙන් හඳුන්වයි.

(ලකුණු 01)

(06) 'එක කරදරයකින් නිදහස් වීමට සිතා කරන කටයුත්තකින් තවත් අපහසුතාවට පත් වීම' යන අදහස දෙන ප්‍රස්ථාව පිරුළ ලියන්න.

....

(ලකුණු 01)

(07) පහත දැක්වෙන කවියෙහි හතර වන පදය ලියන්න.

අපේ ගෙදර තුන් දෙන යි
උඩහ ගෙදර තුන් දෙන යි
පහළ ගෙදර තුන් දෙන යි
....

(ලකුණු 01)

(08) අතීතකාල ක්‍රියා පද යොදන්න

(i) ඈ වයලීනය අතට ....(ගනියි/ගත්තා ය)

(ii) සමනලයා මල් පැණි ....(බොයි/ බිව්වේ ය)

(ලකුණු 02)

(09) දී ඇති පද වලට සමාන පද ලියන්න

(i) දුර්ලභ-.................................... (ii) දිනිසුරු-....................................

(ලකුණු 02)

(10) ඉරි ඇඳි පදයට විරුද්ධ පදය යොදා වාක්‍ය නැවත ලියන්න.

(i) තරගය <u>ආරම්භයේ</u> දී ම නිපුන් පසුබට විය.

....

(ලකුණු 01)

(11) ''උද්‍යානක අසිරිය'' යන මාතෘකාව යටතේ නිර්මාණාත්මක වාක්‍ය තුනක් ලියන්න.

....
....
....
....
....
....

(ලකුණු 06)

(12) පහත දැක්වෙන වාක්‍යවල තේරුම සිංහලෙන් ලියන්න

(i) Listen to me please..

(ii) In which grade are you? ....

(ලකුණු 02)

(13) පහත දැක්වෙන වාක්‍ය ඉංග්‍රීසියට හරවා ලියන්න

(i) මෙහි මල් කීයක් තියෙනවා ද ? ....

(ලකුණු 01)




....

(14) පහත දැක්වෙන වාක්‍ය දෙමළ භාෂාවෙන් ලියන ආකාරය සිංහල අකුරෙන් ලියන්න

(i) ඌ සුදු පාටයි-...

(ලකුණු 01)

(15) පහත දැක්වෙන වාක්‍යයෙහි සිංහල තේරුම ලියන්න.

(i) උංගළුක්කු එත්තනෙ තංගෙමාර් ඉරුක්කිරාර්හළ්...

(ලකුණු 01)

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(16) සාමාන්‍ය ලිපියකට ඇලවිය යුතු මුද්දරයක වටිනාකම,

(i) රුපියල් 5 (ii) රුපියල් 10 (iii) රුපියල් 15

(17) ධීවරයන් මසුන් ඇල්ලීමට භාවිත කරන උපකරණයකි,

(i) අතංගුව (ii) මයිනහම (iii) වරක්කලය

(18) ඉස්කුරුප්පු ඇණයක් ඇල්ලීමට හා ගැලවීමට භාවිත කරන උපකරණය,

(i)

(ii)

(iii)

(19)ක්ලාන්ත වූ රෝගියෙකුට ලබා දිය යුතු ප්‍රථමාධාරය වන්නේ,

(i) ඇඳුම් බුරුල් කොට පවන් සැලීම (ii) හිස පහතට හරවා වාතාශ්‍රය ලබාදීමට කටයුතු කිරීම

(iii) වතුර ස්වල්පයක් පෙවීම

(20)පහත නම් සඳහන් ශාක පත්‍ර දෙකක් එක කාණ්ඩයකට අයත් ය. එසේ අයත් නොවන ශාක පත්‍රය වන්නේ,

(i) මඤ්ඤොක්කා (ii) බුලත් (iii) දෙල්

(21) සිතියමක කඳුකර ප්‍රදේශ පෙන්වා ඇත්තේ,

(i) රතු පැහැය (ii) දුඹුරු පැහැය (iii) කොළ පැහැය

(22) වොලිබෝල් ක්‍රීඩාව සඳහා එක් පිළිකට සිටිය යුතු ක්‍රීඩකයින් සංඛ්‍යාව වන්නේ,

(i) 7 (ii) 8 (iii) 6

(23)බොත්තම් කාසයක් මැසීමට යෝග්‍ය මැහුම් ක්‍රමය වන්නේ,


(i)

(ii)

(iii)

(24)අයඩීන් වැඩිපුර ඇත්තේ,

(i)තල (ii) මුහුදු මාළු (iii) පලා වර්ග

(25) පදිංචිය සනාථ කිරීමේ සහතිකයක් ලබා ගැනීම සඳහා අප යායුත්තේ,

(i) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට (ii) ග්‍රාම නිළධාරී කාර්යාලයට (iii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට

(26)අධිවේගී මාර්ගයක් සිතියමක දක්වන වර්ණය,

(i) රතු (ii) සුදු (iii) දම්

(27)අකුණු සැර වැදීමට වඩාත් හේතු විය හැක්කේ,

(i) නිවසේ සිටින විට (ii) කුඹුරක වැඩ කරමින් සිටින විට (iii) පාරේ ගමන් කරන විට

(28)'වයර්ලස් වර්ල්ඩ් " සඟරාවට ලිපියක් සැපයීම නිසා ප්‍රසිද්ධියට පත් ශ්‍රී ලාංකික පුරවැසියෙකි,

(i)

(ii)

(iii)

(29) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංඡනයේ සදාකාලික පැවැත්ම නිරූපණය වන්නේ,

(i) පුන්කලසෙනි (ii) පලා පෙති වලිනි (iii) ඉරහඳ දෙකෙනි

(30)කාන්දම් කැබැල්ලකට ඇදී එන ද්‍රව්‍යවලට අයත් කාණ්ඩය වන්නේ,

(i) පිත්තල හා යකඩ (ii) ඇලුමිනියම් හා පිත්තල (iii) යකඩ හා වානේ

(31)කජු ගම්මාලු, කිරල යන බීජ ව්‍යාප්ත වන්නේ පිළිවෙළින්,

(i) සුළඟින්,සතුන් මගින්,ජලය මගින් (iii) සතුන් මගින්, සුළඟින් ,ජලයෙන්

(iii) ජලයෙන් ,පිපිරීමෙන්, සුළඟින්

25 පිටුවෙන්

(32) පහත දැක්වෙන මාර්ග සංඥාවෙන් අදහස් වන්නේ,

(i) දුම්රිය හරස් මාර්ගය ඉදිරියෙනි

(ii) දුම්රිය හරස් මාර්ගය

(iii) ඉදිරියෙන් ගේට්ටුව සහිත දුම්රිය හරස් මාර්ගය ඇත

(33)මහාමාරිය රෝගය බෝවන්නේ,

(i) මදුරුවා මඟින් (ii) මීයා මඟින් (iii) හූනා මඟින්

(34)දිය වැඩියා රෝගය පාලනය කිරීමට වඩාත් යෝග්‍ය ආහාරය වන්නේ,

(i) පාන් (ii) කඩල (iii) බත්

(35) රෝපණය කිරීමට යෝග්‍ය බීජයක ලක්ෂණයක් නොවන්නේ,

(i) හොඳින් මෝරා තිබීම (ii) පිටපොත්ත පැල්ලම් සහිතව දිප්තිමත්ව තිබීම

(iii) පුෂ්ටිමත්ව තිබීම

(36)තවාන් වලින් ලබා ගන්නා පැල කාණ්ඩයට අයත් වන්නේ.

(i) රාබු,මිරිස්,නෝකෝල් (ii) ලීක්ස් ,ගෝවා , බෝංචි, (iii) මිරිස්, කැරට්, ගෝවා

(37)කෘත්‍රිම වර්ණක හා රස කාරක වැඩිපුර ආහාරයට ගැනීම නිසා ඇති විය හැකි රෝගයකි,

(i) ගලගණ්ඩය (ii) පිළිකා (iii) උණසන්නිපාතය

(38)සමාජ විරෝධී ක්‍රියාවක් නොවන්නේ,

(i) ළමා මෙහෙකාර සේවය (ii) කම්කරු සේවය (iii) මත්ද්‍රව්‍ය වෙළඳාම

(39) තැපැල් පෙට්ටියක වර්ණය වන්නේ,

(i) නිල් (ii) රතු (iii) කහ

(40) නැවත භාවිත කළ හැකි ඉවතලන දෙයක් වන්නේ,

(i)බැටරි (ii) ප්ලාස්ටික් බට (iii) බිදුණු විදුරු

(41) ගොයම් වගාවට හානි කරන සතුන් පමණක් අඩංගු පිළිතුර වන්නේ,

(i) ගොළුබෙල්ලා , කටුස්සා , පිටිමකුණා (ii) පුරුක් පණුවා , පැළ මැක්කා, කිඩෑවා

(iii) පුරුක් පණුවා ,කුරුමිනියා , දළඹුවා

(42)සිදුරු කැමරාවකින් නිවසක් දෙස බැලූ විට දැකිය හැකි වන්නේ,

(i) (ii) (iii)

(43)''මම අපේ පවුලේ අයට නිවසට ගුණ ගරුක හොඳ දරුවෙක් වෙනවාමයි.'' මෙය අයත් වන්නේ,

(i) ප්‍රාර්ථනය (ii) අධිෂ්ඨානය (iii) උදානය

(44) පරාක්‍රම සමුද්‍රය අයත් වන පළාත,

(i) උතුරු පළාත (ii) මධ්‍යම පළාත (iii) උතුරු මැද පළාත

(45)ලෝක ප්‍රකට බිතුසිතුවම් ඇති ස්ථානයකි,

(i) ඉසුරු මුණිය (ii) සීගිරිය (iii) ඇම්බැක්කේ දේවාලය

(46) කන මඟින් පමණක් තොරතුරු ලබා දෙන මාධ්‍යකි,

(i) පුවත්පත් (ii) රූපවාහිනිය (iii)ගුවන් විදුලිය

(ලකුණු 30)

- දී ඇති නිස්තැන් මත පිළිතුරු ලියන්න.

(47)පහත දැක්වෙන සංඛ්‍යාව විහිදුවා ලියන්න.

79 040 - .....

(48)පහත දැක්වෙන සංඛ්‍යා ආරෝහණ පටිපාටියට ලියන්න.

80 315 , 41 567, 89 475,98 175

.....

(49)



(i) පහත දැක්වෙන පත්‍රයේ ඇති කොළ ප්‍රමාණය රෝම ඉලක්කමෙන් ලියන්න.....

(ii) එම රෝම සංඛ්‍යාවෙන් පහක් අඩු කළ විට ලැබෙන පිළිතුර රෝම සංඛ්‍යාවෙන් ලියන්න.....

(51)මිනිසෙක් A නම් ස්ථානයේ සිට 30 m ක් බටහිරට ගමන් කොට තම වම් අත පැත්තට හැරී තවත් 20 m ක් ඉදිරියට ගමන් කොට නැවත තමන්ගේ වම් අත පැත්තට හැරී 60 m ක් ඉදිරියට ගමන් කර B ස්ථානයේ නතර වුණි. දැන් ඔහු සිටින්නේ A ස්ථානයේ සිට කුමන දිශාවෙන් ද? .....

(52)භාජනයක තිබූ 5 l 750 ml ජලය ටැංකියකට දැමූ විට ටැංකියේ ජලය 17 l 350ml විය. 5 l 750 ml දැමීමට පෙර ටැංකියේ තිබූ ජල ප්‍රමාණය කොපමණ ද?.....

(53)පහත දැක්වෙන මිල දර්ශනය ඇසුරෙන් දී ඇති වගුව පුරවන්න.

ද්‍රව්‍ය	1kg ක මිල රුපියල් සත
හාල්	85 00
සිනි	110 50
පරිප්පු	240 00
තේ කුඩු	560 00
මුං ඇට	270 00
කඩල	210 00

ද්‍රව්‍ය	1kg ක මිල රුපියල් සත
හාල් 3 kg	.....
සිනි 4 kg	.....
පරිප්පු 750 g	.....
තේ කුඩු 250 g	.....
මුං ඇට 1/2 kg	.....
මුළු මුදල	.....

(54) මගියෙකු 25 km 500m දුරක් දුම්රියෙන් ද ඉතිරි දුර බසයෙන් ද ගියේ ය. ගමනේ මුළු දුර 34km නම් බසයෙන් ගිය දුර මුළු දුරෙන් කොපමණ භාගයක් ද?.....

(55)



0.9 වීමට රූපයෙන් නව කොපමණ ප්‍රමාණයක් පාට කළ යුතු ද?.....

(56) ප්‍රස්තාරය අනුව වගුව සම්පූර්ණ කරන්න.

වගුවට අනුව ප්‍රස්තාරය සමුපූර්ණ කරන්න.



එළවළු වර්ගය	ප්‍රමාණය
ගෝවා	50
වට්ටක්කා	
කැරට්	55
ලීක්ස්	
බටු	45

(57) 1975 උපන් ක්‍රිෂාන්ත මහතා සිය 50 වන උපන් දිනය සමරන්නේ කුමන වර්ෂයේ ද?.....

(58) (i) පෙ.ව. 5.40ට නිවසින් පිටත් වූ රජීව පෙ.ව . 7.20 ට පාසලට පැමිණියේ ය. පාසලේ ඔරලෝසුවේ වේලාව මිනිත්තු 05 ක් අඩුවෙන් ගමන් කරයි නම් ඔහු පාසලට පැමිණි වේලාව කීය ද?.....

(ii) ඔහුට පාසලට පැමිණීමට කොපමණ කාලයක් ගත වී ඇත් ද?.....

(59)තේ හැන්දකට අල්ලන දියර ප්‍රමාණය 5 පක පහක් වේ. රෝගියෙකුට දිනකට තේ හැඳි 2 බැගින් සතියකට පානය කළ යුතු බෙහෙත් ප්‍රමාණය කොපමණ ද?.....

(60) 600 න් දෙකෙන් පංගුවට 200 ක් එකතු කර 8 න් බෙදු පසු ඉතිරිවන සංඛ්‍යාව කීය ද?.....

ඊයේ (09) පළ වූ පළමු පත්‍රයේ ඉතිරි කොටස

31. මධ්‍යම රාත්‍රිය පසු වී මිනිත්තු 30 ගොස් ඇත. මෙම වේලාව සම්මත ඔරලෝසු වේලාවෙන් නිවැරදිව දක්වා ඇත්තේ,
1. 00 : 30 2. 13 : 30 3. 12 : 30

32. ඝනකයක් නිර්මාණය කිරීමට ඇති නිවැරදි රූපය තෝරන්න.



1. 2. 3.

33. ගිණිකුරු 16 ඇත. මින් සෑදිය හැකි වැඩිම සමචතුරස්‍ර ගණන වන්නේ,
1. 6 2. 5 3. 4

- **උපමාව ගැළපෙන අවස්ථාව දක්වෙන පිළිතුර තෝරන්න.**

34. කළුවා මාරපන් ගියා වගේ,
1. නොදන්නේ දේ කිරීමට යාම. 2. මාරපනට යාම පහසු බව.
3. විමසීමකින් තොරව යමක් කිරීම.

35. හසඳු හවස පාර දිගේ ගමන් කරන විට ඔහුගේ දකුණු පැත්තට සෙවණැල්ල වැටී තිබුණි. ඔහු ගමන් කළේ කුමන දිශාවට ද?
1. දකුණු දිශාවට 2. නැගෙනහිර දිශාවට
3. උතුරු දිශාවට

- **මුල් වචන දෙකේ සම්බන්ධය අනුව හිස්තැනට යෙදෙන වචනය තෝරන්න.**

36. ගඟට - ඉවුර - මුහුදට - .....
1. සාගරය 2. වෙරළ 3. සිඳු

37. සොරොව්ව - වැව - වක්කඩ
1. දියහොල්මන 2. දෙපාව 3. කුඹුර

- **38 සහ 39 ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමට මෙය යොදා ගන්න**



38. හි අගය වනුයේ,
1. 9 2. 18 3. 14

39. හි අගය වනුයේ,
1. 3 2. 9 3. 6

40. රුවන් ළඟ වීදුරු බෝල 9 ක් ඇත. සමන් ළඟ වීදුරු බෝල 21 ඇත. දෙදෙනා ළඟම ඇති වීදුරු බෝල ගණන් සමාන වීමට සමන් රුවන්ට වීදුරු බෝල කීයක් දිය යුතුද?
1. 9 2. 6 3. 3

රේඩියෝ ගුරුවරයා ආචාර්ය මණ්ඩලය - ප්‍රියන්ත කේ හීගනගේ මහතා - කොළඹ ආනන්ද විද්‍යාලය, ශ්‍යාමලී ප්‍රියංගිකා කුමානායක මිය - කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය, සුභානි පල්ලෙවෙල මිය - කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය, ගයනි දේවරාජ මිය - කොළඹ ලුම්බිණි විද්‍යාලය, මංජුල උස්හෙට්ටි මහතා - ප්‍රාථමික පුහුණු (විද්‍යාපීඨ) සහ ශාස්ත්‍රවේදී (පේරාදෙණිය විශ්ව විද්‍යාලය),

රේඩියෝ ගුරුවරයා සෑම බදාදා සහ බ්‍රහස්පතින්දා දිනකම ප.ව. 4.00 – 5.30 දක්වා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ, ස්වදේශීය සේවය සහ විදුල ළමා ගුවන්විදුලියෙන් (තරංග මාලා 91.7 FM / 91.9 FM) ප්‍රචාරය වන අතර වැඩසටහනට අදාළ ප්‍රශ්න පත්‍රය සෑම බදාදා සහ බ්‍රහස්පතින්දාවකම දිනමිණ සමඟ ඔබට ලබා ගත හැකිය.නිෂ්පාදනය - සුමනා අබේසිංහ සහ සුභානි වැලිවිට

මංගල සමරවීර මහත්තයටත් හිටි හැටියේ ධන සෘණ මාරු වෙනවා

ගලගොඩඅත්තේ ඥානසාර හිමි

සුභාෂිණී සේනානායක

මංගල සමරවීර මහතා ගන්න මාත්‍රාවේ වෙනසක් සිදුව ඇති බවත් ඒ නිසා හිටි හැටියේ ඔහුගේ ධන සෘණ මාරු වෙන බවත් බොදුබල සේනා සංවිධානයේ මහ ලේකම් ගලගොඩඅත්තේ ඥානසාර හිමියෝ පවසති.

එවැනි පුද්ගලයන්ට අනුකම්පා කළ යුතු යැයිද උන්වහන්සේ කියා සිටී.

ගලගොඩඅත්තේ ඥානසාර හිමියන් මේ බව කියා සිටියේ මංගල සමරවීර මහතා පාස්කු ඉරිදා කොමිසමේ පොලිස් ඒකකය වෙත පැමිණි එහි ධර්මය ගැන දේශනයක් කළ බවත් සංඝයා වහන්සේ කොටසක් නිසා මේ ශාසනය වැනසෙනවා යන්න කළ ප්‍රකාශය ගැනත් මාධ්‍යයෙන් සිදු කළ විමසීමකදී අදහස් දක්වමිනි.

පාස්කු ඉරිදා ප්‍රහාරය සොයා බැලීමට පත් කළ ජනාධිපති කොමිසම හමුවේ සිදු කළ කැඳවීමක් අනුව ගලගොඩඅත්තේ ඥානසාර හිමියන් පෙනී සිටි අතර එහිදී උන්වහන්සේ කොමිසම හමුවේ ලබා දුන් සාක්ෂිවලට අදාළව හරස් ප්‍රශ්න විමසීමට සිදු කෙරිණි.

ඉන් අනතුරුව කොමිසමෙන් පිටතට පැමිණි උන්වහන්සේ මෙසේ මාධ්‍යයට අදහස් දැක්වූහ.

අප නිහඬව ඉන්නේ බැරිකමට නොවෙයි. අපට පේනවා මේ ආණ්ඩුවේ කාගේ හෝ බලවත් තැනක මැදිහත්වීමක් මත මේ සංඝයා වහන්සේ හංගගෙන ඉන්නවා.එළියට එන්නේ නැහැ. මේ රටේ මිනිස්සු 67000කට අධිකව ගෝනි බිල්ලෙකුට හරි සැඟවුණ අමුත්තෙකුට හරි



ඡන්දය දුන්නේ නැහැනේ. මේක මහදවාලේ මංකොල්ල කෑමක්. හෙට අනිද්දා හැර එළඹෙන දිනයකදී සම්පූර්ණ කතාව අප අනාවරණය කරනවා .කවුද මේකේ කෙරුමෝ කියන එක. කවුද මේකට උඩගෙඩි දෙන්නේ.කවුද අපේ ආගමනය වළක්වන්නේ. මොකක්ද හේතුව කියා අප කියනවා.

දැනට අනාවරණය වෙලා තියෙනවා මුද්‍රිත මාධ්‍ය ආයතනයක් හිමි මාධ්‍ය ආයතනයක මුදලාලි කෙනෙක්, විශේෂයෙන්ම විදුත් මාධ්‍ය නාලිකාවක අයිතිකාරයෙක් ඒ වගේම තවත් අමාත්‍යවරු කිහිප දෙනෙක් එක්ක එකතු වෙලා මේ නාඩගම කරලියට ගෙන එමින් තිබෙන බව. අප ඒවාට බය නැහැ. අප ඒකට මුහුණ දෙනවා සහ රටේ මිනිස්සුන්ට මේ ගැන හෙළිදරව් කරනවා.

අංක 609, වෛද්‍ය ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09, ශ්‍රී ලංකාව.
දුරකථන : 0094-11-5455330, 5455337
ෆැක්ස් : 0094-11-5455425

රැකියා ඇබෑර්තු

වැවිලි අමාත්‍යාංශය

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

තනතුරු පුරප්පාඩු

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ පහත සඳහන් තනතුරේ පවත්නා පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුර - **තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරී**
කළමනාකරණ සහකාර(තාක්ෂණික) MA 2-3 - III

පත්වීමේ ස්වභාවය - ස්ථිර, සේවක අර්ථසාධක අරමුදල සහ සේවා දයකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත තනතුරකි.

සුදුසුකම් - **(අ) බාහිර අයදුම්කරුවන්**

කෘෂිකර්මය, වැවිලි කළමනාකරණය හෝ වැවිලි ව්‍යාප්ති කළමනාකරණය පිළිබඳව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන්

ඉහත (අ) හි සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදළ වේ.

වැටුප් පරිමාණය - මෙම තනතුර සඳහා කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව 2016.01.01 දින සිට රු. 31,510-445X10-660X11-730X10-750X10= 58,020/- (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

මීට අමතරව රජය විසින් අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.

බඳවා ගැනීමේ ක්‍රමය - තරග විභාගයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදු කෙරේ.

ලිඛිත පරීක්ෂණය සඳහා වූ ක්‍රමවේදය

ප්‍රශ්න පත්‍ර දෙකකි.

(i) පත්‍රය : කාලය පැය 1 කි.
බහුවරණ ප්‍රශ්න 50 ක් අඩංගුය.

විෂය නිර්දේශය : සාමාන්‍ය දැනීම, බුද්ධි පරීක්ෂණය, කෘෂිකාර්මික සිද්ධාන්ත, තේ තාක්ෂණය, තේ කර්මාන්තයට අදළ කරුණු
ලකුණු ප්‍රශ්න 50 X ලකුණු 2 බැගින් ලකුණු 100

(ii) පත්‍රය : කාලය පැය 1 ½ කි.

විෂය නිර්දේශය : කෘෂිකාර්මික මූලධර්ම, තේ අංශයට අදළ කරුණු, තේ කර්මාන්තය හා තාක්ෂණය, කෘෂිකර්ම ව්‍යාප්තිය හා සන්නිවේදනය

ප්‍රශ්න හා ලකුණු :

(i) කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න
ඉන් 6 කට පිළිතුරු අපේක්ෂා කෙරේ.
ප්‍රශ්න 6 X ලකුණු 5- ලකුණු 30

(ii) කොටස
රචනාත්මක ප්‍රශ්න 7 කි.
ඉන් 5 කට පිළිතුරු අපේක්ෂා කෙරේ.
ප්‍රශ්න 5 X ලකුණු 14- ලකුණු 70
එකතුව ලකුණු 100

සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයකින් අවම වශයෙන් ලකුණු 40% ක්ද ප්‍රශ්න පත්‍ර 2 සඳහා එකතුව අවම වශයෙන් 50% ක්ද ලබාගත යුතුය.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

අදළ අමතර පළපුරුද්ද	ලකුණු 30
අදළ අමතර අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්	ලකුණු 30
වෙනත් කුසලතා හා කාර්යය සාධනයන්	ලකුණු 15
සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව	ලකුණු 25
මුළු ලකුණු ගණන	ලකුණු100

ලිඛිත තරග විභාගයෙන් ලබාගත් ලකුණු එකතුව 60% සහ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු 40% ක් වශයෙන් ගෙන කුසලතා අනුපිළිවෙළ මත තෝරා ගැනීම සිදු කෙරේ.

වයස අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදළ නොවේ.

වෙනත් - සෑම බඳවා ගැනීමක් සම්බන්ධයෙන්ම ආයතනික කාර්ය පරිපාටි සංග්‍රහයේ විධිවිධාන අදළ වේ.

අමතර ප්‍රතිලාභ - නේවාසික හා බාහිර වෛද්‍යාධාර යෝජනා ක්‍රමය යටතේ පහසුකම්.

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදලේ පනතට හෝ එකී පනත යටතේ ඇති සේවකයන්ගේ වෙනත් අර්ථසාධක අරමුදලකට හෝ තෝරාගනු ලබන අයදුම්කරු විසින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය යටතේ සේවය කරන සම්පූර්ණ කාලය තුළදී ඔහුගේ සම්පූර්ණ මාසික වැටුපෙන් 10% කට නොඅඩු මුදල් ප්‍රදානය කරනු ලබන අතර, අධිකාරිය විසින් 15% කට නොඅඩු මුදලක් සාමාජික මුදල් වශයෙන් ගෙවනු ඇත.

ඊට අමතරව සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා 3%ක් අධිකාරිය විසින් ගෙවනු ලැබේ.

අයදුම්පත් - අයදුම්කරුවන් සියලු විස්තර සමග තම අයදුම්පත් උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික සහ පළපුරුද්ද දක්වෙන සහතිකවල පිටපත් සමග පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදළ තනතුර සඳහන් කළ යුතුය.

රාජ්‍ය/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුක්තවූවන් තම සේවා ප්‍රධානියා මාර්ගයෙන් ඔහුගේ නිර්දේශ සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුවේ.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය - 2020 සැප්තැම්බර් මස 24 වැනි දින හෝ ඊට ප්‍රථම පහත සඳහන් අය වෙත ලැබෙන සේ එවිය යුතුය.

සභාපති,
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
අංක 70, පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

සුබසෙත
සත වෙත සිරිසෙත සලසන සතිපත
පලාඵල හස්තරේඛා වාස්තුවිද්‍යා යෝගවිද්‍යාව ආයුර්වේද
වෙදකමටද හෙදකමටද - ගුරු කමටද හුරුකමටද
ජ්‍යොතිෂායුර්වේද පන්හිද

ඇබෑර්තු

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

(2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ සංස්ථාපිත)

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී

ඉහත සඳහන් තනතුර සඳහා වයස අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අභ්‍යන්තර/රාජ්‍ය අංශයේ අයදුම්කරුවන්ට වයස් සීමාව බලපාන්නේ නැත. අයදුම්කරු නායකත්වයේ ගුණාංග සහිත ප්‍රජාතාන්ත්‍රික අගයන් සහ ක්‍රියාපටිපාටීන් පිළිබඳ අවබෝධයක් ඇති උයෝගීමත් පුද්ගලයකු විය යුතුය. ඔහුට/ ඇයට රාජ්‍ය භාෂාවන් අතුරෙන් එකක හා ඉංග්‍රීසි භාෂාවෙහි විශිෂ්ට සංනිවේදන නිපුණතා තිබිය යුතුය.

තනතුරට AR 2 - 2016 (රු.76,200 - 10X2,000 - 96,200) වැටුප් පරිමාණයක් හිමිය.

කළමනාකාර සේවා දෙපාර්තමේන්තු වකු ලේඛ AR 2 ට යටත්ව සහ සේවක අර්ථ සාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් වරප්‍රසාද හිමිවේ.

තනතුර වසර දෙකක නිශ්චිත කොන්ත්‍රාත් කාලයකට වන අතර, කොමිෂන් සභාවේ තීරණය පරිදි තවදුරටත් දීර්ඝ කිරීමේ හැකියාවද ඇත.

අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම්

01. සමාජයීය විද්‍ය, ජනමාධ්‍ය හෝ නීතිය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශේෂවේදී උපාධියක් **සමඟ**

අදාළ ක්ෂේත්‍රයේ පර්යේෂණයන්ට අදාළ වූ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම

සහ

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර අටක (08) ක පර්යේෂණ පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

02. සමාජයීය විද්‍ය, ජනමාධ්‍ය හෝ නීතිය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශේෂවේදී උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයකින් ආචාර්ය උපාධියක් (PhD). **සහ**

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර පහ (05) ක පර්යේෂණ පළපුරුද්දක් ලබා තිබීම.

කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් සමඟ ඥාතීන් නොවන නිර්දේශ කරනු ලබන්නන් දෙදෙනෙකුගේ විස්තරද සහිතව තමන් විසින් සකස් කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපැලෙන් 2020.09.30 වන දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් කෙළවරෙහි අයදුම් කරන තනතුර සටහන් කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්
තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව,
බලොක් 2, කාමර අංක 203-204,
බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය,
බෞද්ධාලෝක මාවත , කොළඹ 07.
විද්‍යුත් තැපෑල - rti.commission 16@gmail.com

1950 සිට දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොව ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011) 2 242 9491

LAKE HOUSE

1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීම (සංශෝධිත) පනතේ සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

ශුද්ධි පත්‍රයයි

මගේ අංකය : **GAL/LAN/ACQUIS/A13/22**

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය : **J73E724**

පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම පොදු කටයුත්තක් සඳහා රජයට අත්කර ගැනීමට අදහස් කර ඇත. වැඩි විස්තර සඳහා 2015.12.07 වැනි දිනැති අංක 1944/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය බලන්න.

සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඳුපිට පත්තුව උතුර සුළු කොට්ඨාසයේ, 69 බී ගලිගමුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ගලිගමුව ගමේ වල්අඹේහේන හෙවත් අඹන්පිටියවත්තේ අංක 5 හේ කොටස පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මු.පි.කැ. 1180 හා 1975.11.20 දිනැති පිඹුරේ කැබලි අංක 01 ලෙස සඳහන් ප්‍රමාණයෙන් අක්. 01, පර්. 04 වූ ඉඩම් කොටස.

හිමිකම් කියන අය :

01. කළමනාකාර අධ්‍යක්ෂ, කෑගලු වැවිලි සමාගම, අංක 310, හයිලෙවල් පාර, නාවින්න, මහරගම.

02. සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අංක සී82, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07.

එච්.එම්.සී. සුසන්ත හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
ගලිගමුව.

2020.09.07 වැනි දින
ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

වැවිලි අමාත්‍යාංශය

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

දැව ගස් අලෙවි කිරීම සඳහා ප්‍රසම්පාදන දැන්වීම

ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් ලෙවලන් වතුයායේ හෙලීමට නියමිත ඉයුකැලිප්ටස් මිශ්‍ර ගස් 393 ක ප්‍රමාණය විකිණීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

වතුයාය	කොටස	ක්ෂේත්‍ර අංකය	කට්ටි අංකය	ගස් වර්ගය	ගස් ගණන
ලෙවලන්	GK	03	I	ඉයුකැලිප්ටස් මිශ්‍ර	55 (01-55)
			II		50 (65-114)
			III		50 (115-164)
			IV		50 (165-214)
			V		50 (215-264)
			VI		50 (265-314)
			VII		50 (315-364)
			VIII		38 (365-402)

ටෙන්ඩර් අයදුම්පත් අදාළ වතු කාර්යාලයෙන් හෝ කොළඹ 02, වොක්ෂෝල් පටුමගෙහි පිහිටි ප්‍රධාන කාර්යාලයෙන් එක් ටෙන්ඩරයක් සඳහා රු. 2500/= ක ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුවක් ගෙවා 2020.09.10 දින සිට 2020.09.29 දින ප.ව. 3.00 දක්වා සතියේ වැඩ කරන දිනයන්හි ලබාගත හැක.

මුදු, තැබූ ටෙන්ඩර්පත් 2020.09.30 දින ප.ව. 2.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් පහත ලිපිනයට එවීම හෝ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය. ටෙන්ඩර්පත් එදිනම එම වේලාවටම විවෘත කරනු ලබන අතර, ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකුහට එම අවස්ථාවට සහභාගි විය හැකිය.

සභාපති,
ජනතා වතු සංවර්ධන මණ්ඩලය,
55/75, වොක්ෂෝල් පටුමග,
කොළඹ 02.

දුරකථන : 0115-733791

ආරක්ෂක අමාත්‍යාංශය

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

ප්‍රසම්පාදන දැන්වීමයි

බදු පදනම මත ප්‍රාදේශීය කාර්යාලයක් සඳහා ගොඩනැගිල්ලක් ලබාගැනීම

පුරාවිද්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයක් පවත්වාගෙනයාම සඳහා කෑගල්ල නගරය තුළ හෝ යාබදව ගොඩනැගිල්ලක් බදු / කුලී පදනමින් ලබාගැනීම සඳහා පහත සුදුසුකම් සහිතව මෙයින් ලංසු කැඳවනු ලැබේ.

පිරිවිතර	විස්තර
ගොඩනැගිල්ලේ ස්ථාපිතවීම	කෑගල්ල නගරය තුළ හෝ යාබදව පොදු ප්‍රවාහන ගමන් පහසුකම් සහිත ස්ථානයක ස්ථාපිත වී තිබිය යුතුය.
අභ්‍යන්තර භූමි ප්‍රමාණය	වර්ග අඩි 2500 - 3000 අතර ප්‍රමාණයේ ඉඩපහසුකම් සහිත ගොඩනැගිල්ලක් විය යුතුය.
අභ්‍යන්තර පරිශ්‍රය තුළ පහසුකම්	වායුසමීකරණය කරන ලද කාමර 01 ක් ද ජනේල, දොරවල් සහිත වැසිකිළි 04 ක් (නළ ජලය හා විදුලිය) සහිත අභ්‍යන්තර යෝග්‍ය පරිශ්‍රයක් විය යුතුය.
පිටත පරිශ්‍රය	අවම වශයෙන් වාහන 02 ක් ද යතුරු පැදි 10 ක් ද ගාල්කර තැබිය හැකි ප්‍රමාණයේ කොටසක් ද ගොඩනැගිල්ල වටා ආරක්ෂිත තාප්පයක් හා වාහන ඇතුල්වීමට හැකි ගේට්ටුවකින් සමන්විත විය යුතුය.
ගිවිසුම්ගත වීම	අවම වශයෙන් වසර 01 ක කාලයක් සඳහා ගිවිසුම් ගත වීමට එකඟ විය යුතුය.

02. එක් වර්ග අඩියක් සඳහා අපේක්ෂිත මිල ගණන් ද, පවත්නා ගොඩනැගිල්ලේ මුළු වර්ග අඩි ප්‍රමාණය ද, මාසික කුලිය ද, ගොඩනැගිල්ලේ පිඹුර ද, ඔප්පුවේ සහතික කළ පිටපතක් ද, ගොඩනැගිල්ල විදහා දක්වෙන ඡායාරූපයක් ද, යන කරුණු ද ඇතුලත් සියලු විස්තර සහිත මුදු, තැබූ අයදුම්පත් **සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, පුරාවිද්‍ය, දෙපාර්තමේන්තුව, කොළඹ 07** යන ලිපිනය වෙත ලියාපදිංචි තැපැලෙන් 2020.09.30 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර එවීමෙන් හෝ එම ලිපිනයේම තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමෙන් ලැබීමට සැලැස්විය යුතුය. ලිපි ලේඛන බහාලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"කෑගල්ල ප්‍රාදේශීය පුරාවිද්‍ය කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් ලබාගැනීම"** ලෙස සඳහන් කළ යුතුය.

03. භාර ගැනීමේ දිනය හා කාලය අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලබන අතර, ලංසුකරුට හෝ ඔහුගේ බලය පැවරූ ලිපියක් සහිත නියෝජිතයෙකුට එම අවස්ථාවට පැමිණිය හැකිය. මේ සඳහා වැඩි විස්තර සහකාර අධ්‍යක්ෂ (අවිස්සාවේල්ල) දුරකථන අංක 036-2232674 වීමසීමෙන් ලබාගත හැකිය.

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව,
ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම

රැකියා අවස්ථා

සීමාසහිත ලංකා විදුලි පෞද්ගලික සමාගම යනු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බෙදාහැරීමේ උපයෝගිතා ආයතනයක් වන අතර, මීගමුව සිට ගාල්ල දක්වා දිවයිනේ වෙරළ තීරයේ මෙහෙයුම් ප්‍රදේශ ආවරණය කරමින්, පාරිභෝගිකයන් 500,000 කට වැඩි ප්‍රමාණයක් සඳහා සේවා සපයනු ලබන ලබන අතර, කාර්ය මණ්ඩල සේවකයන් ප්‍රමාණය 1500 ක් වේ. ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. ජ්‍යෙෂ්ඨ මූල්‍ය ගණකාධිකාරි

අධ්‍යාපනික සුදුසුකම්	ගණකාධිකරණ මූල්‍ය ශෞරව උපාධියක් හෝ මූල්‍ය විශේෂඥතාවයේ උපාධියක්
වෘත්තීය සුදුසුකම්	කළමනාකරණ ගණකාධිකාරී වරලත් ආයතනයේ (CIMA) සාමාජිකත්වය, හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) සාමාජිකත්වය, වරලත් සහතිකලත් ගණකාධිකාරී සංගමයේ (ACCA) සාමාජිකත්වය
වෙනත් සුදුසුකම්	ව්‍යාපාර පරිපාලන විද්‍යුපති (MBA) උපාධිය සතුවීම අමතර වාසිදායක වනු ඇත.
පළපුරුද්ද	උපාධියක් ලබාගැනීමෙන් පසු, වගකිව යුතු තනතුරක වසර දහයක (10) සහාථ කළ පළපුරුද්ද. උපයෝගිතා කර්මාන්ත ක්ෂේත්‍රයේ විශාල සංවිධානයක පළපුරුද්ද සඳහා ප්‍රමුඛතාව.

2. මූල්‍ය ගණකාධිකාරි

සුදුසුකම් හා පළපුරුද්ද	* ගණකාධිකරණ/ මූල්‍ය කළමනාකරණ/ B.Com / ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයක ශෞරව උපාධියක් සමග ICASL / CIMA/ ACCA ආයතනයන්හි අන්තර් මධ්‍ය විභාගය සමත් වීම, සහ සුදුසුකම් ලැබීමෙන් පසු, සේවක සංඛ්‍යාව 100 ඉක්මවන ආයතනයක වගකිව යුතු තනතුරක, ගිණුම්කරණ/විගණන ක්ෂේත්‍රයේ වසර 08 ක පළපුරුද්ද, හෝ * ICASL / CIMA/ ACCA ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය සමග ගණකාධිකරණ / මූල්‍ය කළමනාකරණ / B.Com/ ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයක ශෞරව උපාධියක්, සහ සුදුසුකම් ලැබීමෙන් පසු, සේවක සංඛ්‍යාව 100 ඉක්මවන ආයතනයක වගකිව යුතු තනතුරක, ගිණුම්කරණ/විගණන ක්ෂේත්‍රයේ වසර 04 ක පළපුරුද්ද.

3. ගණකාධිකාරි

සුදුසුකම් හා පළපුරුද්ද	* ගණකාධිකරණ/ මූල්‍ය කළමනාකරණ/ B.Com / ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයක ශෞරව උපාධියක් සමග ICA / CIMA/ ACCA ආයතනයක අන්තර් මධ්‍ය විභාගය සමත් වීම, සහ සුදුසුකම් ලැබීමෙන් පසු, සේවක සංඛ්‍යාව 100 ඉක්මවන ආයතනයක වගකිව යුතු තනතුරක, ගිණුම්කරණ/විගණන ක්ෂේත්‍රයේ වසර 04 ක පළපුරුද්ද, හෝ * ICASL / CIMA/ ACCA ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය සමග ගණකාධිකරණ / මූල්‍ය කළමනාකරණ / B.Com/ ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයක ශෞරව උපාධියක්,

4. ගිණුම් සහකාර

අධ්‍යාපන සුදුසුකම්	අ.පො.ස. (සා/පෙළ) විභාගය සම්මාන සාමාර්ථ පහක් සමග සිංහල/දෙමළ භාෂා, ගණිතය හා ඉංග්‍රීසි භාෂාව ඇතුළත්ව විෂයයන් හයකින් දෙකකට නොවැඩි වාර ගණනකදී සමත්ව සිටිය යුතුය. සහ අ.පො.ස. (උ/පෙළ) විභාගය විෂයයන් තුනකින් (එක් වරකදී) සමත්ව සිටිය යුතුය.
වෘත්තීය සුදුසුකම්	අයදුම්කරුවන් හට පහත සඳහන් සුදුසුකම් එකක් හෝ වැඩි ගණනක් තිබිය යුතුය : 1) වරලත් ගණකාධිකාරී ආයතනයේ අර්ධ සුදුසුකම් : 2) කළමනාකරණ ගණකාධිකාරී වරලත් ආයතනයේ අර්ධ සුදුසුකම් : 3) පිරිවැය හා සහතිකලත් ගණකාධිකාරී සංගමයේ අර්ධ සුදුසුකම් : 4) ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අවසන් විභාගය : 5) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව : 6) ජාත්‍යන්තර පොත් තබන්නන්ගේ සංගමය/පොත් තබන්නන්ගේ සංගමයේ අවසන් විභාගය : 7) ගිණුම්කරණ ශිල්පී සංගමයේ අවසන් විභාගය.
පළපුරුද්ද	පොදු ලෙජරය හා ණය පාලන ක්‍රියාකාරකම් සම්බන්ධ අදාළ රැකියාවක වසර තුනක (03) පළපුරුද්ද. පරිගණක ගිණුම්කරණ පරිසරයක පළපුරුද්ද

ඉහත සියලුම තනතුරු සඳහා වයස් සීමාව, 2020.09.21 දිනට අවුරුදු 40 ට අඩු විය යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරුවන්හට ආකර්ෂණීය වැටුප් සමග ආන්තික ප්‍රතිලාභ රැසක් හිමිවේ.

ඔබගේ ජීවදන්ත ඇතුළත් විස්තරාත්මක අයදුම්පත්, අදාළ සහතිකවල පිටපත් සහිතව, ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා ඇමතුම් දුරකථන අංක සමග පහත සඳහන් අය වෙත, 2020 **සැප්තැම්බර්** 21 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

ඔබගේ ජීවදන්ත අයදුම්පතෙහි හා එය බහාලූ කවරයෙහි වම් ඉහළ කෙළවරේ, අයදුම්කරනු ලබන තනතුර සඳහන් කරන්න.

මානව සම්පත් හා පරිපාලන ප්‍රධානී,
සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම,
03 වන මහල, ඊ.එච්. කුරේ ගොඩනැගිල්ල,
411, ගාලු පාර, කොළඹ 03.

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම
(වැවිලි අමාත්‍යාංශය)

මිල ගණන් කැඳවීම - රබර් ගස් ගලවා ඉවත් කිරීම

සී/ස. කුරුණෑගල වැවිලි සමාගමකට අයත් අත්තනගල්ල පළාත් වතු කොට්ඨාසයේ දම්මුල්ලහේන වතු කොටසෙහි පහත සඳහන් රබර් ගස් විකිණීම සඳහා මුදු, තබන ලද මිල ගණන් පත් කැඳවනු ලැබේ.

ලොට් අංකය	ගස් ගණන
01	1190
02	1314
මුළු ගස් ගණන	2504

මේ පිළිබඳ විස්තර ඇතුළත් ටෙන්ඩර් පත්‍රිකා සතියේ වැඩ කරන දිනයන්හි **පෙරවරු** 9.00 සිට **පස්වරු** 4.00 දක්වා පහත සඳහන් ලිපිනයෙහි පිහිටි කුරුණෑගල වැවිලි සමාගමේ ප්‍රධාන කාර්යාලයට හෝ අදාළ පළාත් කාර්යාලයට **රු.** 1,000/= **ක** ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව ලබාගත හැකිය.

මුදු, තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 2020.09.30 **වන දින පස්වරු** 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ටෙන්ඩර් මණ්ඩලය, සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම, අංක 80 දඹුල්ල පාර, කුරුණෑගල යන ලිපිනයට එවීමට හෝ මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට කටයුතු කළ යුතු අතර, ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ වම් කෙළවරේ **"රබර් ගස් සඳහා මිල ගණන්"** යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබන්නේ 2020.09.30 **දින පස්වරු** 12.30 දක්වා පමණි.

ගැනුම්කරු විසින් තම මිල ගණන් පත ඉදිරිපත් කිරීමේදී මුළු ගස් ප්‍රමාණය සඳහා මිල ගණන් ඉදිරිපත් කළ හැකි අතර, ලොට් අංක 01 සඳහා ආපසු ගෙවන **රු.** 100,000.00 **ක** හා ලොට් අංක 02 සඳහා ආපසු ගෙවන **රු.** 100,000.00 **ක** තැන්පත් මුදලක් 2020.09.30 **දින පස්වරු** 2.00 ට හෝ ඊට පෙර මුදලින් කුරුණෑගල වැවිලි සමාගමේ ප්‍රධාන කාර්යාලයට ගෙවීමට කටයුතු කළ යුතුය.

ටෙන්ඩර්පත් භාර ගැනීම 2020.09.30 **වන දින පස්වරු** 2.00 ට අවසන් වන අතර, එම වේලාවෙන් පසුව ලැබෙන ටෙන්ඩර්පත් කිසිම හේතුවක් මත භාරගනු නොලැබේ. එදිනම **පස්වරු** 2.30 ට අදාළ ටෙන්ඩර්පත් සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම, අංක 80, දඹුල්ල පාර, කුරුණෑගල යන ලිපිනයෙහි පිහිටි ප්‍රධාන කාර්යාලයේදී විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරු හෝ බලයලත් නියෝජිතයෙකුට මේ සඳහා සහභාගි විය හැකිය. ටෙන්ඩර් පිරිතැමීමේ හෝ අවලංගු කිරීමේ සම්පූර්ණ බලය ආයතනයේ ටෙන්ඩර් මණ්ඩලය සතුවේ.

අදාළ ටෙන්ඩරය පිරිතැමීමේදී ටෙන්ඩර්ලාභියා හෝ ලාභීන් විසින් සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම් සමග මේ පිළිබඳ වූ ගිවිසුමකට අත්සන් තැබිය යුතුය.

කුරුණෑගල වැවිලි සමාගමේ ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය අවසාන තීරණය බව සලකන්න.

සභාපති, ටෙන්ඩර් මණ්ඩලය,
සී/ස කුරුණෑගල වැවිලි සමාගම,
අංක 80, දඹුල්ල පාර, කුරුණෑගල.
2020.09.10

ප්‍රසිද්ධ දැන්වීමයි
2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාර ප්‍රසිද්ධ දැන්වීමයි
සමාගමේ නාමය :
වෙබ්ඩිසයින් ඊරා (ජීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 81735, ලියාපදිංචි ලිපිනය : අංක 45, නාරන්වල, ගම්පහ,
සංස්ථාගත කළ දිනය : 2011 ඔක්තෝබර් 07.
ඉදිරිපත් කිරීම
බිස්නස් අයි මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් - සමාගමේ ලේකම්
දුරකථනය : 0714239284, 0777555210

ප්‍රසිද්ධ දැන්වීමයි
2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාර ප්‍රසිද්ධ දැන්වීමයි
සමාගමේ නාමය :
සොලිඩ් රිකවරිස් (ජීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 00225599,
ලියාපදිංචි ලිපිනය :
අංක 17/4බී, ලක්ෂපතිය පාර,
රාවතාවත්ත, මොරටුව.
සංස්ථාගත කළ දිනය :
2020 අගෝස්තු 07.
සමාගමේ ලේකම්

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය යටතේ දැනුම් දීමයි.

ගෝල්ඩ්මෙන් කන්සල්ටන්ට්ස් (ජීවීටී) එල්ටීඩී
PV 00222672
2020 ජූනි 08 දාතම
47/A, ශාන්ත ආනා පාර,
චීන කොටුව, බේරුවල.
ලේකම්,
කනේෂන් සිවනීපන්.

කෘෂි නවීකරණ ව්‍යාපෘතිය
விவசாய நவீனமயமாக்கல் திட்டம்
Agriculture Modernization Project

THE WORLD BANK

කෘෂිකර්ම අමාත්‍යාංශය

කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය
(ලෝක බැංකුව මගින් අරමුදල් සපයන)

ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම (මධ්‍යම පළාත)

සුළු පරිමාණ ගොවීන් හට තරගකාරී සහ අලෙවි කළ හැකි වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය කිරීමට , වෙළඳපල අවශ්‍යතා සපුරාලීම සඳහා ඔවුන්ගේ හැකියාවන් වැඩි දියුණු කිරීම සහ වාණිජකරණය කරා යොමු වීමට සහය වීමට රටවල් සමඟ හවුල්කාරිත්ව උපාය මාර්ගයක් (CPS) සමඟ අනුකූල වෙමින් කෘෂි නවීකරණ ව්‍යාපෘතිය සඳහා අරමුදල් සැපයීමට ලෝක බැංකුවේ අන්තර්ජාතික සංවර්ධන ඒජන්සිය මගින් එකඟ වී ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කාලය වසර 05ක් වන අතර , ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම ඇමරිකානු ඩොලර් මිලියන 58.63 වේ.

2019.03.15 දින දරන, කළමනාකරණ සේවා වක්‍රලේඛ අංක 01/2019 ට අනුව පහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය කරන සුදුසුකම් සහ පළපුරුද්ද සහිත අපේක්ෂකයින්ගෙන් මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් මධ්‍යම පළාතේ පළාත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

මූල්‍ය නිලධාරී (PS 6 - A) - තනතුර 01

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් සුදුසුකමක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් / ඒ හා සමාන වෘත්තීමය සුදුසුකමක් හෝ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික වෘත්තිය කොමිෂන් සභාව මගින් පිළිගත් තාක්ෂණික / වෘත්තිමය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 07 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාගැනීම.

   සහ

   විශේෂඥතාවය අවශ්‍ය කරන ක්ෂේත්‍රයේ අවම වසර 02 ක පළපුරුද්ද හෝ

2. තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික වෘත්තිය කොමිෂන් සභාව මගින් පිළිගත් තාක්ෂණික / වෘත්තිය පුහුණු ආයතනයක් මගින් නිකුත් කළ ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) 06 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   සහ

   විශේෂඥතාවය අවශ්‍ය කරන ක්ෂේත්‍රයේ අවම වසර 07 ක පළපුරුද්ද හෝ

   තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික වෘත්තිය කොමිෂන් සභාව මගින් පිළිගත් තාක්ෂණික / වෘත්තිය පුහුණු ආයතනයක් මගින් නිකුත් කළ ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) 05 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   සහ

   විශේෂඥතාවය අවශ්‍ය කරන ක්ෂේත්‍රයේ අවම වසර 12 ක පළපුරුද්ද

වැටුප : 2019.03.15 වන දින දරන කළමනාකරණ සේවා වක්‍රලේඛ අංක 01/2019 මත වැටුප පදනම් වේ.

පොදු කොන්දේසි

a. වයස් සීමාව - අයදුම්පත්‍ර භාරගත්තා අවසන් දිනයට වයස අවුරුදු 64 ට වැඩි අපේක්ෂිකයින් අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

b. රැකියා කොන්දේසි

   රාජ්‍ය සේවයට අයත් නිලධාරීන් ද්විතීයික පදනම යටතේ බඳවා ගනු ලබන අතර, රාජ්‍ය සේවයෙන් බැහැර පුද්ගලයින් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ. සෑම පත්වීමක් සහ සේවා දිර්ඝ කිරීමක්, 2019.03.15 දින දරන කළමනාකාර සේවා චක්‍රලේඛ අංක 01/2019ට අනුව සිදුකරනු ලැබේ.

c. සුදුසුකම් සහ පළපුරුද්ද මත තෝරාගනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

අයදුම්පත්‍ර

සෑම අයදුම්කරුවෙක්ම තම අයදුම්පත්‍ර ජීව දත්ත සහිතව , ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙක් සහ සහතික පත්‍රවල පිටපත් සමඟ, ලියාපදිංචි තැපෑලෙන් **"ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය, මධ්‍යම පළාත් සභා සංකීර්ණය, පල්ලෙකැලේ, කුණ්ඩසාලේ"** යන ලිපිනයට 2020-09-30 වන දිනට හෝ ඊට ප්‍රථම යොමු කළ යුතු වේ. දැනට රාජ්‍ය / අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්‍ර ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානී හරහා යොමු කළ යුතුය.

අයදුම් කරනු ලබන තනතුර, අයදුම්පත්‍රය බහා එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කර එවිය යුතුය.

ඉහත බඳවා ගැනීම සම්බන්ධව ප්‍රධාන ලේකම්වරයාගේ තීරණය අවසාන තීරණය වේ.

ගාමිණී රාජරත්න,
ප්‍රධාන ලේකම්,
මධ්‍යම පළාත.

ලංසු කැඳවීම
ලංකා විදුලිබල මණ්ඩලය

ලංසු අංකය - DD4/PHM/NCB/2020/014

මාසික කුලී පදනම මත නිවසක් ලබාගැනීම - කැස්බෑව, පිළියන්දල ප්‍රදේශය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යා හා අ.න.) බෙදාහැරීම් අංශ 4 කාර්යාලයේ විදුලි මාර්ග තැනීම් අංශයේ වැඩ කණ්ඩායමේ භාවිතය සහ වාහන ගාල් කිරීම සඳහා කැස්බෑව, පිළියන්දල ප්‍රදේශයෙන් කුලී පදනම මත මාස 08 ක් සඳහා නිවසක් ලබා ගැනීමට අවශ්‍යව ඇත. ඒ සඳහා පහත පහසුකම් සහිත නිවසක් සැපයීම වෙනුවෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

අදාළ නිවස පහත සඳහන් කරුණු වලින් සමන්විත විය යුතුය.

01. නිවසේ භූමි ප්‍රමාණය ච.අ. 1500-2000ත් අතර විය යුතුය
02. නිවස පිහිටි ඉඩම පර්චස් 10 කට වැඩි විය යුතුය
03. වැසිකිළි පහසුකම් තිබිය යුතුය
04. ජලය සහ විදුලිය පහසුකම් තිබිය යුතුය
05. වාහන 02ක් ගාල් කිරීමට පහසුකම් තිබිය යුතුය

මුදු, තබන ලද ලංසු 2020-09-30 දින පෙ.ව. 10.00 දක්වා භාර ගනු ලැබේ. ලංසු භාරගැනීමේ අවසන් වේලාව පසු වූ වහාම ලංසු විවෘත කරනු ඇත. ලංසුකරු හෝ ඔහු විසින් බලය පවරා ඇති නියෝජිතයකුට ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගි විය හැක.

ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කාර්යාලයට ගෙනැවිත් භාරදීම සිදු කළ හැකිය.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යා හා අ.න.) - බෙදාහැරීම් අංශ 4
ලංකා විදුලිබල මණ්ඩලය,
ශ්‍රී දේවානන්ද මාවත,
පිළියන්දල.

පහත දක්වා ඇති සියලු විස්තර තමා විසින් පිළියෙල කරගත් ලංසුවේ අඩංගු කළ යුතු අතර, කවරය වම්පස උඩ කෙළවරේ "මාසික කුලී පදනම මත නිවසක් ලබා ගැනීම - කැස්බෑව, පිළියන්දල ප්‍රදේශය, ලංසු අංක:**DD4/PHM/NCB/2020/014**"යනුවෙන් සඳහන් කර ලැබීමට සලස්වන්න.

01. කුලියට ලබා දෙනු ලබන නිවසේ අයිතිකරුගේ නම, ලිපිනය සහ දුරකථන අංකය
02. කුලියට ලබා දෙනු ලබන නිවස පිහිටි ස්ථානයේ ලිපිනය
03. නිවස පිහිටි ඉඩමෙහි ඔප්පුවේ පිටපතක්
04. ඉහත සඳහන් පහසුකම් පිළිබඳ විස්තර
05. අපේක්ෂිත මාසික කුලිය
06. ප්‍රධාන මාර්ගයේ සිට නිවසට පිවිසෙන මාර්ගය දක්වෙන දළ රූප සටහනක්

අයිතිකරුවන් පමණක් අයදුම් කරන්න.

මේ පිළිබඳව දැනගැනීමට අවශ්‍ය වෙනත් අමතර විස්තර ඇතොත් සතියේ රාජකාරි කෙරෙන දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලයේදී විදුලි ඉංජිනේරු (විදුලි මාර්ග තැනීම් හා නඩත්තු) වෙතින් **0112 608024 / 25** ඔස්සේ දැනගත හැක.

සාමාන්‍යාධිකාරී,
ලංකා විදුලිබල මණ්ඩලය.

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

මහජන බැංකුව
ටෙන්ඩර් දැන්වීමයි

ගිනි ආරක්ෂිත කබඩ් මිලදී ගැනීම

මහජන බැංකු ශාඛා සහ සේවා මධ්‍යස්ථාන සඳහා පහත සඳහන් අයිතමය සැපයීම, සවිකර භාරදීම, නඩත්තු කිරීම හා සේවා කිරීම පිළිබඳව ශ්‍රී ලංකාවේ පිළිගත් ප්‍රධාන ආයතන, නිෂ්පාදකයන් සහ සැපයුම්කරුවන්ගෙන් මුදු, තබන ලද ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

ටෙන්ඩර් අංකය	අයිතමය පිළිබඳ විස්තරය	අයදුම්පත් නිකුත් කරන අවසාන දිනය හා වේලාව	ටෙන්ඩරය වසනු ලබන දිනය හා වේලාව	ලංසු ඇපකරයේ වටිනාකම (රු.)	ලංසු ඇපකරයේ වලංගු කාලය
P-065-2020-A	ගිනි ආරක්ෂිත කබඩ් 100 ක් මිලදී ගැනීම	2020.09.29 දින ප.ව. 2.00 ට	2020.09.30 දින ප.ව. 2.00 ට	73,000/-	දින 180

01. ටෙන්ඩර් අයදුම්පත් 2020.09.10 දින සිට 2020.09.29 දින දක්වා බැංකු වැඩකරන දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා කොළඹ 02, කිව් පාර, 30/101, පිහිටි මහජන බැංකුවේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි අතර, ඒ සඳහා එක් ටෙන්ඩර් අයදුම් පතක් වෙනුවෙන් ආපසු නොගෙවනු ලබන රු. 1,500/- ක ගාස්තුවක් සැපයුම් දෙපාර්තමේන්තුව නමින් පවත්වාගෙන යනු ලබන මහජන බැංකුවේ ගිණුම් අංක 204100120011913 ට දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකදී තැන්පත් කොට එහි අනුපිටපත, අදාළ ආයතනයේ අයදුම් ලිපියක්ද සමඟ මහජන බැංකුව සැපයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

02. නිසි පරිදි සකස් කරන ලද ටෙන්ඩර් පත් සමඟ ඉහත සඳහන් වටිනාකම් වලින් යුත් ලංසු ඇපකරය පිළිගත් වාණිජ බැංකුවකින් (මහජන බැංකුව හැර) ලබාගෙන ඉදිරිපත් කළ යුතු අතර, එය ටෙන්ඩරය විවෘත කරන දින සිට දින 180 කට වලංගු විය යුතුය. මේ සඳහා ගෙවීම් ඇණවුම් හෝ අණකර (මහජන බැංකුව හැර - දින 180 කට වලංගු) ඉදිරිපත් කළ හැකි අතර, පුද්ගලික චෙක්පත් භාරගනු නොලැබේ.

03. මුදු, තබන ලද ටෙන්ඩර්පත් මහජන බැංකුව, සැපයීම් දෙපාර්තමේන්තුව, 30/101, කිව් පාර, කොළඹ 02 ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉහත දක්වා ඇති දිනවල ප.ව. 2.00 ට ටෙන්ඩර් වසනු ලබන අතර, එදින ප.ව. 2.00 න් පසු ලැබෙන ටෙන්ඩර් පත් විවෘත නොකරම ආපසු බාරදෙනු ලැබේ.

04. සියලුම හෝ ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සහ කිසිදු හේතුවක් නොදක්වා ටෙන්ඩරයක ඕනෑම කොටසක් හෝ පිළිගැනීමේ අයිතිය මහජන බැංකුව සතුය. අවම මිල පිළිගැනීමට බැංකුව බැඳී නොමැත.

05. මේ පිළිබඳ වැඩි විස්තර ප්‍රධාන කළමනාකර (සැපයීම්) වෙතින් පහත සඳහන් දුරකථන අංක මගින් ද ලබාගත හැකිය.

ප්‍රධාන කළමනාකාර (සැපයීම්),
මහජන බැංකුව,
සැපයීම් දෙපාර්තමේන්තුව,
30/101, කිව් පාර,
කොළඹ 02.

දුරකථන අංක : 2439577/8
ෆැක්ස් : 2439576
වෙබ් අඩවිය : www.peoplesbank.lk

මහජන බැංකුව
PEOPLE'S BANK
www.peoplesbank.lk
AA+ (lka) Fitch Rating, AA- Brand Finance Rating

දිනමිණ The Dinamina — ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

මහජන බැංකුව
ටෙන්ඩර් දැන්වීමයි

පහත සඳහන් අයිතම සැපයීම පිළිබඳව පිළිගත් සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

ටෙන්ඩර් අංකය	අයිතමය පිළිබඳ විස්තරය	ප්‍රමාණය	ලංසු ඇපකරයේ වටිනාකම (රු.)	ටෙන්ඩර්පත් තිකුත් කරන අවසාන දිනය හා වේලාව	ටෙන්ඩරය වසනු ලබන දිනය හා වේලාව
P/0065/2020	මුදල් තැන්පතු කිරීමේ ආකෘති පත්‍ර - 213/DP	20,000	ටෙන්ඩරයේ මුළු ඇස්තමේන්තුගත වටිනාකමින් 1%	2020.09.23 දින ප.ව. 2.00	2020.09.24 දින ප.ව. 2.00

01. ටෙන්ඩර් පත් 2020.09.10 දින සිට 2020.09.23 දින දක්වා බැංකු වැඩකරන දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා කොළඹ 02, කිව් පාර, 30/101, පිහිටි මහජන බැංකුවේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි අතර, ඒ සඳහා එක් ටෙන්ඩර් අයදුම් පතක් වෙනුවෙන් ආපසු නොගෙවනු ලබන රු. 1,500/- ක ශාස්තුවක් සැපයුම් දෙපාර්තමේන්තුව නමින් පවත්වාගෙන යනු ලබන මහජන බැංකුවේ ගිණුම් අංක 204100120011913 ට දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකදී තැන්පත් කොට එහි අනුපිටපත, අදාළ ආයතනයේ අයදුම් ලිපියක්ද සමග සැපයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

02. නිසි පරිදි සකස් කරන ලද ටෙන්ඩර් පත් සමග ඉහත සඳහන් වටිනාකමට පිළිගත් වාණිජ බැංකුවකින් මහජන බැංකුව නමට (මහජන බැංකුව හැර) ලබාගත් බැංකු ඇපකරයක්, බැඳුම්කරයක්, බැංකු ගෙවීම් ඇණවුමක් හෝ බැංකු අණකරයක් ඉදිරිපත් කළ යුතු අතර, එම ඉදිරිපත් කරන ඇපකරය, බැඳුම්කරය, ගෙවීම් ඇණවුම් හෝ බැංකු අණකරය ටෙන්ඩරය විවෘත කරන දින සිට දින 180 කට වලංගු විය යුතුවේ. පුද්ගලික චෙක්පත් භාරගනු නොලැබේ.

03. ටෙන්ඩරය ඉදිරිපත් කළයුතු අවසන් දිනය වන 2020.09.24 දින ප.ව. 2.00 ට ටෙන්ඩරය විවෘත කරනු ලබන අතර, ඊට පෙර ලැබෙන සේ අදාළ ටෙන්ඩර්පත් මහජන බැංකුව, සැපයීම් දෙපාර්තමේන්තුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු අතර, නැතහොත් 2020.09.24 දින ප.ව. .200 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. එම වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. සියලුම හෝ ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සහ කිසිදු හේතුවක් නොදක්වා ටෙන්ඩරයක ඕනෑම කොටසක් පමණක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය මහජන බැංකුව සතුය.

05. මේ පිළිබඳ වැඩි විස්තර ප්‍රධාන කළමනාකර (සැපයීම්) වෙතින් පහත සඳහන් දුරකථන අංක මගින් ද ලබාගත හැකිය.

ප්‍රධාන කළමනාකාර (සැපයීම්),
මහජන බැංකුව,
සැපයීම් දෙපාර්තමේන්තුව,
30/101, කිව් පාර,
කොළඹ 02.

දුරකථන අංක : 2439577, 2439578
ෆැක්ස් අංක : 2439576
වෙබ් අඩවිය : www.peoplesbank.lk

ලංසු කැඳවීම
බ්‍රේල් මුද්‍රණ යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා මිල ගණන් කැඳවීම

01. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති විසින් පහත දැක්වෙන බ්‍රේල් බොක්ස් යන්ත්‍ර 03 ක පහත සඳහන් කොටස් අලුතින් යොදා අලුත්වැඩියා කිරීමට ලංසු කැඳවනු ලැබේ.

බ්‍රේල් බොක්ස් මැෂින් 03 ක් සඳහා Enbossed Head - 09

බ්‍රේල් බොක්ස් මැෂින් 03 ක් සඳහා Rear Stop - 03

බ්‍රේල් බොක්ස් මැෂින් 03 ක් සඳහා Paper Feeding Roller - 03

02. බ්‍රේල් බොක්ස් මැෂින් 03 හි ඇති Sensor පරීක්ෂා කර බලා අලුත්වැඩියා කළ නොහැකි Sensor ඇත්නම් ඒවාද අලුතින් යොදා අලුත්වැඩියා කිරීම කළ යුතුය.

03. ලංසු ලියකියවිලි ලබාගැනීම සඳහා පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ යුතු වේ.

i. රු. 2,000/= ක ආපසු නොගෙවන ශාස්තුවක් අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් වෙත මුදලින් ගෙවූ බවට ලබාදෙන ලදුපත.

ii. මුද්‍රණ යන්ත්‍ර හෝ Index Brail මුද්‍රණ යන්ත්‍ර අලුත්වැඩියාව සම්බන්ධයෙන් පළපුරුද්දක් තිබීම හා ඒ සඳහා නිකුත් කර ඇති සහතිකයේ සමාදන විනිශ්චයකාරවරයකු හෝ නීතිඥවරයකු විසින් සහතික කරන ලද පිටපතක්.

04. ලංසු ඉදිරිපත් කළ යුත්තේ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ලංසු ලියවිලිවල පමණි.

05. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට 2020.09.10 දින සිට රජයේ වැඩ කරන දිනයන්හි **පෙ.ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා** මහරගම බ්‍රේල් මුද්‍රණාලයේ දී මුද්‍රණ යන්ත්‍ර නොමිලේ පරීක්ෂා කළ හැකිය.

06. ලංසු ලියවිලි **2020.09.10 දින සිට** 2020.09.24 දින දක්වා සතියේ රාජකාරී දිනවල **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00** දක්වා බත්තරමුල්ල, පැලවත්ත, "ඉසුරුපායේ" 6 වන මහලේ පිහිටි අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ මුදල් අංශයේ ප්‍රධාන ගණකාධිකාරී වෙතින් ලබාගත හැකිය.

07. මුද්‍රා තබන ලද ලංසු ලියවිලි **2020.09.24 වන දින පෙ.ව. 10.00 ට** පෙර බත්තරමුල්ල, පැලවත්ත, "ඉසුරුපාය" 6 වන මහලේ පිහිටි අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම හෝ එදිනට පෙර ලැබෙන සේ **"අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ඉසුරුපාය, පැලවත්ත, බත්තරමුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලංසු බහා ඉදිරිපත් කරන ලිපිකවරයේ ඉහළ වම් කෙළවරේ **"බ්‍රේල් මුද්‍රණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම"** යන්න සඳහන් කොට තිබිය යුතුවේ. **පෙ.ව. 10.00** ට ලංසු භාර ගැනීම අවසන් කළ වහාම ලංසු විවෘත කිරීම ආරම්භ කරන අතර, එම අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට සහභාගි විය හැකිය.

08. වැඩිදුර විස්තර සඳහා විමසීම්

දුරකථන අංක : 011-2160262 - බ්‍රේල් මුද්‍රණාලය - මහරගම

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
"ඉසුරුපාය", පැලවත්ත,
බත්තරමුල්ල.

ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් (JCT)
ලංසු සඳහා ආරාධනයයි (IFB)

ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් (JCT Ltd) සඳහා එහා මෙහා ගෙන යා හැකි මෝටරයක් මගින් ක්‍රියාකරන පොම්පයක් (Movable Motor Driven Pump Unit) සැපයීම

ශ්‍රී ලංකා වරාය අධිකාරියට පූර්ණ වශයෙන් අයත්, අනුබද්ධ සමාගමක් වන ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් (JCT Limited) මාගම විසින් නැව් ඉන්ධන (Marine Fuel Oil) HFO 380 Cst. පොම්ප කිරීමට යොදා ගනු ලබන එහා මෙහා ගෙන යා හැකි මාදිලියේ මෝටරයක් මගින් ක්‍රියාකරන පොම්පයක් (Movable Type Motor Driven Pump Unit) කොළඹ 15, වෝල්ස් පටුමගේ අංක 69 හි පිහිටි කොළඹ තෙල් බැංකුවේ (Colombo Oil Bank) හි පරිශ්‍රය සඳහා සැපයීම, ස්ථාපනය කිරීම හා ක්‍රියාත්මක කර පෙන්වීම සඳහා පිළිගත්, කීර්තිමත්, ශ්‍රී ලංකාවේ පිහිටි සමාගම් වෙතින් මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.

අදාළ ලංසු පෝරම සහ තොරතුරු පත්‍රිකා කාර්යාල වේලාවන් තුළදී පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා අතරතුර 2020-09-10 සිට 2020-09-29 වන දින දක්වා අතරතුර, (බදු ඇතුළුව) ආපසු ගෙවනු නොලබන රුපියල් 2,000/- ක ශාස්තුවක් ගෙවීමෙන් අනතුරුව, මූල්‍ය අංශයෙන් ලබාගත හැකිය. සෑම සියලු ලංසුවක් සමගම එම ලංසු විවෘත කරනු ලබන දින සිට දින 150 ක් දක්වා වලංගු හා රුපියල් හැත්තෑ දහසක (රු. 70,000/-) ක වටිනාකමින් යුත් ලංසු සුරක්ෂණ ඇපකරයක් ද ඉදිරිපත් කළ යුතුය.

සම්පූර්ණ කරන ලද ලංසු ලිපි ලේඛන 2020-09-30 වන දින ප.ව. 02.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ, ලියාපදිංචි කළ තැපෑලෙන්, කොළඹ 15, වෝල්ස් පටුමගේ, අංක 69 හි, ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්හි දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත, එවීම හෝ JCT ලිමිටඩ්හි මූල්‍ය අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ලංසු එම ලංසු භාර ගන්නා අවසාන වේලාව ඉක්මවූ වහාම විවෘත කරනු ලැබේ. ලංසු බහා ඉදිරිපත් කරන ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ, "චලනය කළ හැකි මෝටර් මගින් දිවෙන පොම්ප ඒකකයක් සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්,
අංක 69, වෝල්ස් පටුමග,
කොළඹ 15.

විමසීම් සඳහා 011-2540045

අත්හළ දේපළ සම්බන්ධයෙන් පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී.එල්.සී. ගනුදෙනුකරුවන්ට කරනු ලබන දැන්වීමයි.

- බැංකු පනතෙහි 72 වන පරිච්ඡේදයට අදාළව ගනුදෙනුකරුවන්ගේ ගිණුම්/භාණ්ඩ යන දෑ පහත සඳහන් කරුණු අනුව බැංකුවේ අත්හළ දේපළ වශයෙන් නම් කෙරෙයි
  1. බැංකු ගිණුමක පවත්නා තැන්පතු හෝ වෙනත් මුදලක් වසර 10ක් හෝ ඊට වඩා වැඩි කාලයක් සක්‍රීයව නොපැවතුනහොත් එය අත්හළ දේපළ වශයෙන් සැලකේ.
  2. ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂිත සේප්පුවල තිබෙන දේ අදාළ ගිවිසුම අවසන් වූ දින සිට බැංකුව විසින් සිදුකළ දැනුම්දීමට පාර්ශෝගිකයින් වසර 03 ක් තුළ බැංකුව සමඟ ඒ සම්බන්ධයෙන් කිසිඳු ප්‍රතිචාරයක් නොදක්වා වසර 10ක් ගතවූ විට.
- බැංකු පනතෙහි 73 වන පරිච්ඡේදයේ 1 වන වගන්තියට අදාළව පහත සඳහන් ලෙස ගනුදෙනුකරුවන්ගේ ගිණුම්/භාණ්ඩ අත්හළ දේපළ වශයෙන් සලකා, එම ගිණුම්වලට අදාළ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවට වාර්තා කර ඇත.
- පහත සඳහන් බැංකු ශාඛාවලට අදාළව යම් ගනුදෙනුකරුවකුගේ ගිණුම් අත්හළ දේපළ වශයෙන් සලකා ඇති බව තමන්ට හැඟී යන්නේ නම් ඊට අදාළ බැංකුවෙන් තොරතුරු විමසීමක් කළ හැකිය.
- අත්හළ දේපළ වශයෙන් සලකා ඇති තමන්ගේ ගිණුම් හෝ භාණ්ඩයන් නැවත සක්‍රීය කරගැනීම ගිණුමට මුදල් තැන්පත් කිරීම හෝ ආපසු ගැනීම්, අදාළ වේ නම් ලිපිනයන් වෙනස් කිරීමේ ලිපියක් එවීම, බැංකු පොත අදාළ බැංකුවට ගෙනැවිත් යාවත්කාලීන කිරීම යන ඕනෑම ක්‍රියාවක් මඟින් කරගත හැක. ආරක්ෂිත සේප්පු භාවිතා කරන්නෙකු නම් ඊට අදාළ වාරික මුදල ගෙවා නැවත තම ගිණුම් සක්‍රීය කරගත හැක.
- ආරක්ෂිත පියවරක් ලෙස අත්හළ දේපළ යටතට ගැනෙන ගිණුම් සහ දේපළ සම්බන්ධ සවිස්තර තොරතුරු ප්‍රකාශයට පත් කිරීමෙන් බැංකුව වැළකී සිටියි.
- අදාළ ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ අදාළ දේපළ අත්හළ දේපළ යටතට පත් කෙරෙන බවට දැන්වීමක් බැංකුව විසින් අවසාන වරට ගනුදෙනු කරන ලද ලිපිනයට එවනු ලබයි.

බැංකු ශාඛාව	දුරකතන අංක	ගිණුම් ගණන	
		ඉතිරි කිරීම්	ජංගම
අනුරාධපුර	025 - 4 976 777	12	1
බම්බලපිටිය	011 - 4 374 055	23	3
බොරැල්ල	011 - 4 374 207	5	5
වේල්ල වීදිය	011 - 4 374 130	28	4
දෙහිවල	011 - 4 374 077	14	1
ගාල්ල	091 - 4 976 777	6	-
ගම්පහ	033 - 4 976 777	49	2
ගම්පොල	081 - 4 944 625	26	-
කඩවත	011 - 4 374 185	20	2
කළුතර	034 - 4 976 777	6	-
නුවර	081 - 4 976 777	35	2
කටුගස්තොට	081 - 4 946 135	57	2
කෑගල්ල	035 - 4 976 777	26	-
කිරුළපන	011 - 4 374 152	12	5
කොල්ලුපිටිය	011 - 2 565 565	31	21
කොටහේන	011 - 4 374 066	23	2
කුරුණෑගල	037 - 4 976 777	66	4
මහරගම	011 - 4 374 163	7	2
මාලබේ	011 - 4 374 218	6	-
මාතර	041 - 4 976 777	23	1
මොරටුව	011 - 4 374 174	6	-
නාරහේන්පිට	011 - 4 374 141	12	1
මීගමුව	031 - 4 976 777	43	7
නුගේගොඩ	011 - 4 374 044	31	8
පරන යෝන් වීදිය	011 - 4 374 099	16	2
පානදුර	038 - 4 976 777	22	4
පංචිකාවත්ත	011 - 4 374 011	16	6
පිටකොටුව	011 - 4 374 022	23	12
රාජගිරිය	011 - 4 374 033	49	3
රත්නපුර	045 - 4 976 777	4	-
වව්නියාව	024 - 4 976 777	1	1
වත්තල	011 - 4 374 088	25	3
වැල්ලවත්ත	011 - 4 374 196	7	-
වෙන්නප්පුව	031 - 4 934 870	22	-
ලෝක වෙළඳ මධ්‍යස්ථානය	011 - 4 976 777	5	7
		757	111

Company Reg. No. PQ48

මේ සම්බන්ධව අවශ්‍ය ඕනෑම පැහැදිලි කිරීමක් හෝ තොරතුරක් ලබා ගැනීමට ඉහත දුරකථන අංක හෝ අපගේ ඇමතුම් මධ්‍යස්ථාන දුරකථන අංක 011 - 4 667 222 අමතන්න

25 වන සංවත්සරය පැන් ඒෂියා බැංකුව

* කොන්දේසි සහිතයි

පැන් ඒෂියා බැංකුව
සැබවින්ම ශ්‍රී ලාංකීයයි

www.sarva.lk

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
National Lotteries Board

මුදල් අමාත්‍යාංශය

ජාතික ලොතරැයි මණ්ඩලය

ලංසු සඳහා ආරාධනයයි

වසරක කාලයක් සඳහා ජාතික ලොතරැයි මණ්ඩලය වෙත පරිගණකාශ්‍රිත දිනුම් ඇදීම සඳහා (ගොවිසෙත, සුපිරි වාසනා, වාසනා සම්පත, ජාතික සම්පත, මෙගා පවර්, සෙවණ (දිනුම් අදිනු ලබන) නීරෝගා සහ දරුදිරි සම්පත) ලොතරැයිපත් මුද්‍රණය, සැපයීම හා ගෙනවිත් භාර දීම සඳහා වන ප්‍රසම්පාදනය

1. ජාතික ලොතරැයි මණ්ඩලය වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් ගිවිසුම් අත්සන් කරනු ලබන දින සිට වසරක කාලයක් සඳහා පහත සඳහන් කර ඇති පරිගණකාශ්‍රිත දිනුම් අදිනු ලබන ලොතරැයිපත් වර්ග මුද්‍රණය, සැපයීම සහ ගෙනවිත් භාර දීම වෙනුවෙන් යෝග්‍ය සහ සුදුසුකම්ලත් දේශීය සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

ලොතරැයි වර්ගය	ලංසු අංකය	ආපසු ගෙවනු නොලබන ගාස්තුව (වැට් බදු සමග)	ලංසු ඇපකරයේ වටිනාකම
ගොවිසෙත	N LB/SU P/PCDLT/2020-i	රු. 35,000.00	රු. 1,667,000.00
සුපිරි වාසනා	N LB/SU P/PCDLT/2020-ii	රු. 12,500.00	රු. 253,000.00
වාසනා සම්පත	N LB/SU P/PCDLT/2020-iii	රු. 12,500.00	රු. 242,000.00
ජාතික සම්පත	N LB/SU P/PCDLT/2020-iv	රු. 12,500.00	රු. 270,000.00
මෙගා පවර්	N LB/SUP/PCDLT/2020-v	රු. 35,000.00	රු. 1,402,000.00
ධන නිධානය	N LB/SU P/PCDLT/2020-vi	රු. 12,500.00	රු. 343,000.00
සෙවණ (දිනුම් අදිනු ලබන)	N LB/SU P/PCDLT/2020-vii	රු. 12,500.00	රු. 218,000.00
නීරෝගා	N LB/SU P/PCDLT/2020-viii	රු. 12,500.00	රු. 227,000.00
දරුදිරි සම්පත	N LB/SU P/PCDLT/2020-ix	රු. 12,500.00	රු. 154,000.00

2. ඉහත සඳහන් පරිගණකගත දිනුම් අදිනු ලබන ලොතරැයිපත් මුද්‍රණය, සැපයීම සහ ගෙනවිත් භාර දීම සඳහා උනන්දුවක් දක්වන දේශීය ලංසු ඉදිරිපත් කරන්නන්ට ලංසු ඉදිරිපත් කිරීමට අවශ්‍ය සම්පූර්ණ ලියවිලි 2020.09.10 දින සිට 2020.09.30 දින දක්වා (රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනවල හැර) සඳුදා සිට සිකුරාදා දිනයන්හි පෙ.ව. 10.00 සිට ප.ව. 2.30 අතර කාලය තුළ කොළඹ 01, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ. මුදලිගේ මාවත, අංක 32, ජාතික ලොතරැයි මණ්ඩලයේ සැපයුම් අංශය වෙතින් පහත සඳහන් පරිදි කටයුතු කිරීමෙන් ලබා ගත හැක.
   - I. ආපසු නොගෙවනු ලබන ඇප තැන්පතු මුදල් ඉහත අංක 02 යටතේ දක්වා ඇති ආකාරයට ලංසු සඳහා වෙන් වෙන් වශයෙන් තැන්පත් කිරීමෙන් සහ
   - II. ව්‍යාපාරික ආයතනයේ ලිපි ශීර්ෂයක් මගින් කොළඹ 01, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ. මුදලිගේ මාවත, අංක 32, දරන ස්ථානයේ පිහිටි ජාතික ලොතරැයි මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී වෙත ලිපියක් මගින් ඉදිරිපත් කිරීමෙන්

   ඉහත දක්වෙන දිනයන්හිදී සහ ලිපිනයේදී කිසිදු ගෙවීමකින් තොරව ලංසු ඉදිරිපත් කිරීමේ ලියවිලි පරීක්ෂා කර බැලිය හැකිය. එමෙන්ම ජාතික ලොතරැයි මණ්ඩලයේ www.nlb.lk වෙබ් අඩවියෙන් ද එම ලියවිලි පරීක්ෂා කර බැලිය හැකිය.
3. ඕනෑම ලංසුකරුවෙකුට ඉහත අංක 02 යටතේ සඳහන් ලංසු අතරින් එක් ලංසුවක්, එකකට වැඩි සංඛ්‍යාවක් හෝ සියලුම ලංසු සඳහා ලංසු ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත. මුද්‍රණ ධාරිතාව පිළිබඳ සම්පූර්ණ තක්සේරු කිරීමෙන් අනතුරුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත සුදුසුකම් ලැබූ ලංසුකරුවන් අතරින් එක් ලංසුකරුවෙකු වෙත ප්‍රදානය කරනු ලබන ලංසු ප්‍රමාණය තීරණය කිරීමේ සම්පූර්ණ බලය අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව සතු වේ. එක් එක් ලංසුව සඳහා වෙන් වෙන් වශයෙන් ලංසු ලියවිලි ලබාගතයුතු අතර, එක් එක් ලංසුව සඳහා වෙන් වෙන් වශයෙන් ලංසු ඇප බැඳුම්කර ලංසුපත් සමග ඉදිරිපත් කළ යුතුය.
4. ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන සෑම ලංසුවක් සඳහාම වෙන් වෙන් වශයෙන් පිටපත් දෙකකින් සමන්විත මුද්‍රා තැබූ ලංසු ලියවිලි සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව, ජාතික ලොතරැයි මණ්ඩලය, කොළඹ 32, එන්. ඩබ්ලිව්.ජේ. මුදලිගේ මාවත, කොළඹ 03 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ඉහත ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් බහාලුමට 2020.09.30 වන දින ප.ව. 2.30 ට පෙර යොමු කළ යුතු වේ.

   ලංසු බහාලනු ලබන කවරයන්හි වම් ඉහළ කෙළවර අදාළ ලොතරැයිපත් වර්ගයේ නම සහ ලංසු අංකය සඳහන් කරමින් "පරිගණකාශ්‍රිත දිනුම් ඇදීම සඳහා ..... (ලොතරැයිපතේ නම) ලොතරැයිපත් මුද්‍රණය, සැපයීම සහ ගෙනවිත් භාරදීම" යනුවෙන් සඳහන් කරන්න. ඉදිරිපත් කරනු ලබන සියලුම ලංසු ලියවිලි සඳහා වෙන් වෙන් වශයෙන් දින 150ක කාලයක් සඳහා වලංගු ඉහත අංක 02 හි දක්වා ඇති ලංසු ඇප බැඳුම්කර ශ්‍රී ලංකාවේ මහා බැංකුවේ ලියාපදිංචි ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ඕනෑම වාණිජ බැංකුවක් මගින් බැංකු ඇපකරයක්/ බැංකු අණකරයක්/ මුදලින් **සභාපති, ජාතික ලොතරැයි මණ්ඩලය, අංක 32, එන්.ඩබ්ලිව්.ජේ. මුදලිගේ මාවත, කොළඹ 03** යන නමට ඉදිරිපත් කළ යුතුය.
5. නැවත දැනුම්දීමකින් තොරව ලංසු ලියවිලි භාර ගැනීම අවසන් වීමෙන් අනතුරුව ඒ මොහොතේම ඉහත සඳහන් ලිපිනයේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට ඊට සහභාගි විය හැක. ප්‍රමාද වී ලැබෙන ලංසු ලියවිලි විවෘත නොකරම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ජාතික ලොතරැයි මණ්ඩලය,
අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථනය : 4607019

ශ්‍රී ලංකා වරාය අධිකාරිය

වෙන්දේසි දැන්වීම

නශ්‍ය නැව් බඩු විකිණීම

වෙන්දේසි දිනය : 2020.08.11

මගේ අංකය : **LD/S/CICT/2020/08/PC-07**
LD/S/CICT/2020/08/PC-09 **LD/S/CICT/2020/08/PC-10**

CICT අංගතයෙහි පවතින නිදහස් කරතොගත් නශ්‍ය නැව්බඩු වෙන්දේසියේ විකිණීම 2020.09.11 වන දින 10.00 පැයට BQ සුබසාධන ගොඩනැගිල්ලේදී පැවැත්වේ.

වෙන්දේසි ලේඛන, One stop ප්‍රලේඛන මධ්‍යස්ථානය, කැනල් යාඩ්, නො. 15, ලෝටස් පාර, කොළඹ 01 ලිපිනයේ පිහිටි ශ්‍රී ලංකා වරාය අධිකාරියේ, සැපයුම් අංශයේ, අලෙවි අංශයෙන් රු. 250/- (+VAT) ක නැවත නොගෙවෙන ගාස්තුවක් ගෙවීමෙන් 2020.09.10 දින 8.30 පැය සිට 12.00 පැය දක්වා ලබාගත හැක.

විකිණීම සඳහා ලැයිස්තුගත කර ඇති භාණ්ඩ එම දිනයේදීම අදාළ අංගනවල 13.30 පැය සිට 16.00 පැය දක්වා පරීක්ෂා කර බැලිය හැක.

වැඩි විස්තර සඳහා www.slpa.lk පිවිසෙන්න.

ප්‍රධාන කළමනාකරු (සැපයුම්)
2020.09.10.
ශ්‍රී ලංකා වරාය අධිකාරිය,
සැපයුම් අංශය,
නො. 15, ලෝටස් පාර, කොළඹ 01.

ටෙන්ඩර් දැන්වීමයි

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර් පත් කැඳවීම

ටෙන්ඩර් අංක : PGIM/GA/03/Canteen/2020(2)

අංක 85, රොඩ්නි විදියේ පිහිටි වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන මධ්‍යස්ථානයේ ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා පළපුරුදු ආපනශාලාකරුවන්ගෙන් 2020 සැප්තැම්බර් මස 22 වන දින ප.ව. 2.30 දක්වා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

ආපසු නොගෙවනු ලබන රු. 500/- ක ටෙන්ඩර් තැන්පතුවක් සහ ආපසු ගෙවනු ලබන රු. 2000/- ක ටෙන්ඩර් තැන්පතුවක් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, නො. 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07 යන ලිපිනයේ පිහිටි සරප් වෙත ගෙවා ලබාගත් කුවිතාන්සිය ආයතනයේ පාලන අංශයට ඉදිරිපත් කිරීමෙන් 2020 සැප්තැම්බර් මස 09 සිට සැප්තැම්බර් මස 21 වන දින ප.ව. 2.00 දක්වා ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද මුද්‍රා තැබූ ටෙන්ඩර් පත්‍රිකා අනු පිටපතකින් යුක්තව, (පිටපත් 2) මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් වෙන් වෙන්ව මුද්‍රා තබා එම කවර දෙකම එක් තනි කවරයක බහා ඇතුළත් කර කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර් පත් කැඳවීම**" යනුවෙන් සඳහන් කර 2020 සැප්තැම්බර් මස 22 දින පස්වරු 2.30 ට පෙර කොළඹ 08 රොඩ්නි විදියේ අංක 85 හි වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන මධ්‍යස්ථානය වෙත ලේඛන ගත තැපෑලෙන් එවීම හෝ කොළඹ 08, රොඩ්නි විදියේ අංක 85 හි වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන මධ්‍යස්ථානයේ සාමාන්‍ය පාලන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය.

2020 සැප්තැම්බර් මස 22 වන දින ප.ව. 2.30 ට නො. 85, රොඩ්නි විදිය, කොළඹ 08 යන ලිපිනයේ පිහිටි පාලන අංශයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ අයට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට (නියෝජිතයෙකු ලෙස පෙනී සිටීමට බලය පැවරූ ලිපිය සමගින්) එම අවස්ථාවට සහභාගී විය හැක.

අසම්පූර්ණ සහ ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති / ප්‍රසම්පාදන කමිටුව,
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,
160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත,
කොළඹ 07.

2020 සැප්තැම්බර් 09

Ceyesta®

කටුපොත පිහිටි සියෙස්ටා ගොවිපලේ පොල් එලදාව සහ කොප්පරා අලෙවි කිරීම සඳහා මිල ගණන් කැඳවීම.

පොල්, කටුපොල් වශයෙන් අලෙවි කිරීම සහ කොප්පරා සඳහා මිල ගණන් 2020.09.22 දිනට පෙර "කටුපොල් සහ කොප්පරා මිල ගණන්" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවීමට කටයුතු කරන්න.

පොල් ගෙඩි 12000 කට වැඩි ප්‍රමාණයක් ඇත.

විමසීම් :- කළමණාකරු - 0771581947

සභාපති,
සී/ස ශ්‍රී ලංකා සමූපකාර කර්මාන්ත මහා සංගමය,
"සියෙස්ටා මන්දිරය", අංක 327, ගාලු පාර, කොළඹ 03.

ලංසු කැඳවීමයි

කොළඹ 02

ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා ලංසු කැඳවීම - 2021

2021 වර්ෂය සඳහා ලංවිම ප්‍රධාන කාර්යාලයේ ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා කොන්ත්‍රාත්කරුවකුගේ සේවය අවශ්‍ය වේ.

ඒ සඳහා ලං.වි.ම. විසින් නිකුත් කරනු ලබන මිල කැඳවුම්පත් ප්‍රයෝජනයට ගනිමින් ලංසු ඉදිරිපත් කළ යුතුය. ආපසු නොගෙවනු ලබන රු.500/-ක ලංසු ගාස්තුවක් සාමාන්‍යාධිකාරී - ලං.වි.ම නමට මුදලින් ගෙවීමෙන් මිල කැඳවුම්පත් 2020-09-25 වන දින දක්වා කාර්යාලීය වේලාවන් තුළදී ලංකා විදුලිබල මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) කාර්යාලයෙන් ලබාගත හැකිය. මිල කැඳවීම්පත් භාරගැනීම 2020-10-05 දින පෙ.ව 10.00 අවසන් කරන අතර ඒවා විවෘත කිරීම වහාම සිදුකෙරේ.

මිල කැඳවුම්පත්, ලංසු කැඳවීමට අදාළ සාමාන්‍ය කොන්දේසි වලට සම්පූර්ණයෙන්ම අනුකූල වියයුතු අතර නියමිත දිනට පෙර මිල කැඳවුම්පත් එවිය යුතුය. කිසිදු හේතු දැන්වීමකින් තොරව ලංසු ප්‍රදානය කිරීමට හෝ සියලුම ලංසු පත්‍රිකා ප්‍රතික්ෂේප කිරීමට හෝ යන තීරණ ගැනීමේ පූර්ණ බලතල ලංකා විදුලිබල මණ්ඩලය සතු වේ.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්),
ලංකා විදුලිබල මණ්ඩලය,
තැ.පෙ.540,
කොළඹ 02.
2020-09-10

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

ලංසු කැඳවීම

කෘෂිකර්ම අමාත්‍යාංශය
උතුරු පළාත

කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා ආරක්ෂක සේවාවන් - 2020

NP/ 31/02/F01/2020/SS

1. සභාපති, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව විසින් (MPC - Major) කෘෂිකර්ම අමාත්‍යාංශය සහ අමාත්‍යාංශය යටතේ තියෙන දෙපාර්තමේන්තුවලට ආරක්ෂක සේවාවන් සැපයීමට සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා, සහිත ලංසු අයදුම්පත් කැඳවනු ලැබේ.
2. ලංසු කැඳවීම ජාතික තරහකාරී මිල කැඳවීමේ ක්‍රියාපටිපාටිය මගින් සිදු කරනු ලැබේ.
3. කොන්ත්‍රාත් පිරිනැමීමේ සුදුසුකම් ලැබීමට ජයග්‍රාහී ලංසුකරු අසාධු ලේඛනයේ ලැයිස්තුගත නොවිය යුතු අතර, පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.
   - a. ලංසුකරු සතුව වලංගු ව්‍යාපාර ලියාපදිංචිය තිබිය යුතුය.
   - b. ඒ සමඟ ආරක්ෂක සේවා සැපයීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ලබා තිබිය යුතුය.
   - c. ඒ සමඟ උතුරු පළාතේ ලියාපදිංචි කාර්යාලයක් හෝ ශාඛාවක් තමන් සතුව තිබිය යුතුය.
4. කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ සුදුසුකම ලබාදීමට ලංසුකරු විසින් අවම වශයෙන් ලංසු දත්ත කොටසේ 2 යටතේ සඳහන් නිර්ණායකයන් සපුරා තිබිය යුතුය.
5. ලංසු තැබීමට උනන්දුවක් දක්වන ලංසුකරුවන්, උතුරු පළාතේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ නො.655, නාවලර් පාර, යාපනය යන ලිපිනය වෙතින් වැඩි විස්තර ලබා ගැනීමට හැකිවන අතර, ලංසු ලේඛන වැඩ කරන දිනවල පෙරවරු පැය 09.00 සිට පැය 15.00 දක්වා වූ කාලසීමාව ඇතුළත උතුරු පළාතේ කෘෂිකර්ම අමාත්‍යාංශයේදී පරීක්ෂා කළ හැකිය.
6. උනන්දුවක් දක්වන ලංසුකරුවන් විසින් ඉංග්‍රීසි භාෂාවෙන් යුත් ලංසු පත්‍රිකා කට්ටලයක් උතුරු පළාතේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ නො.655, නාවලර් පාර, යාපනය යන ලිපිනය වෙතින් වැඩ කරන දිනවල 2020.09.10 වැනි දින සිට 2020.09.30 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ පැය 09.00 සිට පැය 15.00 දක්වා වූ කාලය ඇතුළත ලිඛිත ඉල්ලීමක් සමඟ මුදලින් රුපියල් 3,500.00ක් ආපසු නොගෙවන තැන්පතුව වශයෙන් ගෙවා ලබාගත හැකිය.
7. ලංසුපත් 2020.10.01 වැනි දින පැය 10.00ට පෙර උතුරු පළාතේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ නො.655, නාවලර් පාර, යාපනය යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුය. සියලුම ලංසුපත් ප්‍රසම්පාදන වේලාව අවසන්වීමත් සමඟ ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ වහාම විවෘත කරනු ලබන අතර, 2020.10.01 වැනි දින පැය 10.00න් පසුව ප්‍රමාදවන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
8. සියලුම ලංසු සමඟ රුපියල් 750,000.00ක් වටිනාකම ඇති ලංසු ඇපකරයක් ඇමිණිය යුතුය.

ඒ.සිවබාලසුන්දරන්
සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
කෘෂිකර්ම අමාත්‍යාංශය, උතුරු පළාත,
නො.655, නාවලර් පාර, යාපනය.

ශ්‍රී ලංකා ජාතික රෝහල

කොළඹ 10

ප්‍රසම්පාදන දැන්වීමයි

ශ්‍රී ලංකා ජාතික රෝහලේ පහත සඳහන් කාර්ය ඉටුකිරීම සඳහා ICTAD හි ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. 2020.09.10 වන දින පෙ.ව. 9.00 සිට 2020.09.30 වන දින ප.ව. 3.00 දක්වා ශ්‍රී ලංකා ජාතික රෝහලේ සරප් අංශය වෙත **රු. 2500.00 / රු. 4000.00 ක** ආපසු නොගෙවන ලංසු ආකෘතිපත්‍ර ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලය වෙතින් ලංසු ලිපිලේඛන ලබාගත හැකිය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු මුද්‍රා තබන ලද ලිපිකවරවල බහා එහි වම් කෙළවරෙහි කාර්යයේ නම සඳහන් කොට 2020.10.02 වන දින පෙ.ව. 10.00 ට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය හැකිය. ලංසු භාරගැනීම අවසාන වූ වහාම ලංසු විවෘත කරනු ලබන අතර කොන්ත්‍රාත්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට මෙම අවස්ථාවට පැමිණ සිටිය හැකිය.

අංකය	කාර්යාලය	ඇස්තමේන්තුගත පිරිවැය රු. ශත	ශ්‍රේණිය	ආපසු නොගෙවන ලංසු ඇපකරය රු. ශත	ආපසු නොගෙවන ටෙන්ඩර් ආකෘතිපත්‍ර ගාස්තුව රු. ශත	සංලක්ෂපය
01	බණ්ඩාරනායක ගොඩනැගිල්ලේ බැල්කනි ප්‍රදේශය සඳහා ඩෙකෝ මෙෂ් සැපයීම හා සවිකිරීම (AC-1/42/2020)	8,940,000.00	විශේෂඥතාවය : ගොඩනැගිලි ශ්‍රේණිය : C7 හෝ ඉහළ	135,000.00	2,500.00	ඇස්තමේන්තුගත ලංසුව රු. 5,000,000/= ඉක්මවන අවස්ථාවලදී ලංසු ලිපිලේඛන ලබාගැනීමේදී පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙතින් ලබාගත් සහතිකය ඉදිරිපත් කළ යුතුය.
02	වාට්ටු අංක 27 සහ වාට්ටු අංක 28 නවීකරණය කිරීම (AC-1/141/2019)	33,168,420.00	විශේෂඥතාවය : ගොඩනැගිලි ශ්‍රේණිය : C5 හෝ ඉහළ හා EM 4හෝ ඉහළ	500,000.00	4,000.00	

වෛද්‍ය ඩබ්.කේ. වික්‍රමසිංහ,
සභාපති, ප්‍රසම්පාදන කමිටුව සහ
ප්‍රසම්පාදන "F" කමිටුව,
